


Scanned by CamScanner

# 1

සවිමන් කබලාන වට–පිට බලා 'නාලිකා' යයි හඬගාමින් වාඩි වූයේ සැටියෙහි ය. අත්ඔර්ලෝසුව දෙස බැලූ ඔහු 'පහට විස්සයි' සිතින් කියමින් එය කනට ළංකෙළේ ය.

ඔප් නැඟීමෙන් දිලෙන ඔහුගේ කළු සපත්තු දෙක පිළිගත්තේ අලුත් බුමුතුරුණකි. කළුවර ලීයෙහි පාටත් ඔපයත් ඇති සැටිය, මැද මේසය, පුටු හා අළු බඳුන් ගත් කුඩා බංකු ද සාලයෙහි බිමත් උඩත් අවටත් පැතිර සිටි නිල් පැහැය වඩාත් මතු කොට දක්වන අලංකරණයක් වී ය.

කබලාන සිහි කෙළේ අවුරුදු හතරක් එංගලන්තයෙහි නැවතී ඉගෙන උපාධි ලබා පැමිණෙන තම පුත්‍රයා ය. කුඩා කාලයෙහිම ඉගෙනීමෙහි සමතෙක් වූ ඔහු රාජකීය විද්‍යාලයට ඇතුළුව ඉගෙනීමට පටන් ගත් තැන් සිට අවුරුද්දක් පාසා තෑගි දිනාගත්තේ ය. ඉගෙනීමෙහි ශූරයකු වූ නිසා දෝ ඔහු කුඩා කල සිට පුරුදු වූයේ පියා කියන දේ නොකිරීමට ය. තමා අණ කරන කාරියක් කරබාගෙන කරන ලියන්නන් හා කම්කරුවන් පාලනයෙහි ශූරයකු වූ කබලාන, තමාගේ දරුවන් හදන්ට වෑයම් කෙළේ ද අණ කිරීමෙනි. ඔහු කියන දේ නොකිරීමෙන් මාලින් කුඩා කල සන්තෝෂ වුණේ ය. කුඩා විය ඉක්මවූ පසු ඔහු, පියා කී දේ කෙළේ, අමාරුවෙන් මැඩගත් අසන්තෝෂයෙනි, එහෙත් පියා ඔහුට නොකීපුණේ ය.

සවිමන් කබලාන, මාලින්ගේ මුරංඩු කම දනියි. ඒ මුරංඩු කම මාලින් තුළ බහා දැඩි කෙළේ තමා විසින්යයි කබලාන කිසි විටක නොසිතයි. කම්කරුවන් හා ලියන්නන් මෙල්ල කිරීමෙන් ලැබූ අත්දැකීම ඇති ඔහු, තමාගේ විනිශ්චය හා හැඟීම් හරියයි හැම විටම සිතුවේ ය.

සිවිල් නිලධාරීන් උදෙසා පැවැත්වෙන විභාගයෙන් ජය ගැනීම වූ කලී උගැන්මෙහි සමත් මාලින්ට එතරම් අමාරු කාරියක් විය නොහැකි ය. එහෙත් පියා සිවිල් නිලධාරීන්ගේ විභාගය ගැන මතක් කළ හැම විටම මාලින් ඊට කන් දුන්නේ මැඩගත් අසන්තෝෂයෙනි. පියා නැවත නැවතත් මතක් කළ නිසාම මාලින් ඒ විභාගය නොගැනීමට ඉටාගත්තේ ය.

ගෝසාවක් නොනගා සෙමින් පෝටිකෝව යටට ළඟා වූ ජගුවර රථය. රියකරු බරේක් දමා නැවැත්වූයේ ය. ඇන්පීම



Scanned by CamScanner

සෙමින් හුස්ම පිටකරමින් නවතිනු ඇසූ සවිමන් කබලාන යළි තම අත් ඔර්ලෝසුව දෙස බැලුවේ ය. හැම කාරියක් නියමි වෙලාවටම කරන්ට පුරුදු වූ ඔහු සන්තෝෂයෙන් හුනස්නෙ නැංගේ ය.

“දැන් පහමාරයි! වේලාව හරි.” කබලාන මේ වදන් පැවසුවේ හැඳ පැළඳ සාලයට පැමිණි සිය බිරිඳ දෙස බලමිනි. මැද වියෙහි වූ ඇ කඩවසමින් යුතු කයක් ද සුන්දර මුහුණක් ද ඇත්තියකි.

“කෝ චමරී?”

“චමරි——”

“මේ එනවා අම්මා!”

තද පාට සාරියත් ඒ පාටට කැපෙන සැට්ටයත් නිසා මතුව බැබළෙන එළලු පැහැති සුන්දර මුහුණක් ඇති චමරී සාලයට පිවිසියේ මහත් සන්තෝෂයෙනි. සතර අවුරුද්දකට පසු එන තම සහෝදරයා දකින ආශාවෙන් පිම්බුණු ඇගේ සන්තෝෂයට ඇගේ මුහුණ පමණක් නොව ඇඟ-පත ද කැටපතක් වී ය. ඇගේ සන්තෝෂය ඇ පැහැපත් මුහුණින් පමණක් නොව සැහැල්ලු ගමනින් ද තුටු රැවින් ද පළ කළා ය.

මාලින් කරන්ට යන්නේ කුමක් ද? ඔහු එංගලන්තයෙහිදී බෙහෙවින් වෙනස් වී ද? ඔහුගේ අනාගතය කුමක් වේ ද? මේ හැඟීම් ප්‍රශ්නයන්ගේ වේෂයෙන් කබලාන මැතිණියගේ සිතට නැගිණ.

“නැව වරායට ඇතුල්වන්නේ පහට. නැවෙන් මිනිසුන් ගොඩ බසින්නේ පැයකට පමණ පස්සේ. බඩු ගොඩ බාන්න ඊටත් වඩා වේලා යාවි–”

“කොහොම උණත් දැන්ම පිටත් වන එක හොඳයි” කියමින් නාලිකා බරාඳයට ගියා ය. රියකරු විසින් හරින ලද දොරටුවෙන් මොටෝරියට නැගුණු නාලිකා කබලාන එහි කොනක වාඩි වී සාලය දෙස බැලුවා ය.

අනතුරුව රියට නැඟී තම මව ළඟින් වාඩි වූ චමරිගේ දෙනෙතට හමුවූයේ ගෙවුයන ය. තම සහෝදරයා එනු අසා සන්තෝෂ වන්නාක් මෙන් උයනෙහි ඇතැම් මල් පඳුරු පිපුණු මලින් බබළයි. මල් සුවඳ ඇදගෙන හමන වාතය, චමරීට සිහි කෙළේ සුවඳ කවන ලද උඩුවියනකි. උයනෙහි ඇත කෙළවරක මල් පඳුරුවලට වතුර විදින මහලු උයන් ගොවුවා බලා සිටින්නේ චමරී දෙස ය. ඈ ඔහුට සලකන්නේ දයානුකම්පාවෙනි.

සවිමන් කබලාන රියට නැඟුණ වහාම රියකරු හඩ නොනැ සෙන සේ දොර වැසුවේ ය. බරාඳයෙහි පඩි පෙළට ළංවූ කඩි

Scanned by CamScanner

රියෙහි උන් ගෘහිණිය ද ගෙහිමියා ද ඔවුන් ගේ දුව ද දෙස බලමින් නකුට සොලවයි.

''අද උඹ එක්ක යන්නේ නැහැ. පලයන් ගෙට–අපි එන කල් බලාගෙන ඉඳින්''යි නාලිකා කීවා ය.

කඩියා ආපසු සාලයට ගොස් බලාසිටියි. රියකරු පැටරල් යතුර කරකවා ඇන්ජිම ක්‍රියා කරවී ය. ඇන්ජිම ගෝසාවක් නොනැඟී ය. පැනුමෙන් හා ගැස්සුමෙන් තොරව පිටත් වූ රථය දියමන්ති මෙන් බැබළෙන සීන් තිරුවාණ කැට සහිත සුදු වැල්ලෙන් වැසුණු පාරෙහි සෙමින් ගමන් කරයි. රියෙහි රෝදවලට හසුව උඩට වීසිවන සුදු වැලි, පොද වැස්සක් මෙන්, රථය පිටිපස්සේ වැදි වැදී හඬ නඟයි. උයන කෙළවර උන් උයන් ගොවුවා මල්ගස්වලට දිය විදීම නවතා වම් පැත්තේ දොරටුවෙන් පිටත්වන රථය දෙස බලා සිටිනු වමරී දුටුවා ය. උයන් දොරටුවෙන් මහ පාරට බැස්ස රථය දකුණට හැරී ටිකින් ටික ඉහළ නඟින වේගයෙන් ගමන් කරයි.

සිවිල් නිලධාරීන්ගේ විභාගයෙන් ජය නොගත්තොත් මාලින්ට තමාගේ ව්‍යාපාරය පුහුණු කරන අදහසිනි කබලාන ඔහු එංගලන්තයට යැවූවේ. තම පුත්‍රයා හතර අවුරුද්දකට පසු ගමට එන්නේ සිවිල් නිලධාරියකු ලෙස නොව ඉතිහාසය හා අර්ථ ශාස්ත්‍රය උගත් ශූර උපාධිධාරියකු ලෙස ය. මාලින් සිවිල් නිලධාරීන්ගේ විභාගය නොගත්තේ එයින් ජය ගැනීම අමාරුයයි සිතූ නිසා නොවේ. පියාට අකීකරු වීමෙන් තම අදීනත්වය දක්වන්ට සිතූ නිසා ය. සුදු නිලධාරින් යට වැඩ කිරීම ද ඔහුට ප්‍රිය නොවී ය. අර්ථ ශාස්ත්‍රය උගතකු වීම නිසා මාලින් වඩාත් ශූර කර්මාන්ත හිමියකු වෙතියි කබලාන සිතුවේ ය.

මාලින්, මවුපියන්ගෙන් වියෝව එංගලන්තය බලා පිටත්වූ අවස්ථාවෙහි, කඳුළු නොසැලුවේ ය. මව ජැටියෙහිදී මාලින්ගේ මුහුණ සිපගත් අවස්ථාවෙහි ඔහුගේ මුහුණ පුරා පැතුරුණු සිනාව දූනුදු සවිමත් කබලානගේ සිතට විවිධාකාරයෙන් නැඟෙයි. මාලින් එංගලන්තයෙහි සිටි සිව් අවුරුද්ද තුළ තමාට එවූවේ ලියුම් හතරකියි කබලාන සිහි කෙළේ ය. ඒ හතර ද ඉතා කෙටි ලියුම් වී ය. තමා මාලින්ට ලියූවේ ලියුම් තුනක් හෝ හතරක් හෝ පමණක් බව කබලාන සිහි කෙළේ තමාටම දෙස් නඟන්නකු ලෙස ය. මුදල් සැපයීමේ ආසාවෙන් මඩනා ලද සවිමත් කබලාන සිතුවේ, තමාගේ ලිපිකරුවන් හා කම්කරුවන් ද තළා පෙළා ඔවුන්ගේ ශ්‍රම ශක්තිය මිරිකාගත හැකි උපාය ගැනය. වෙළඳ ලියුම් මිස නෑයන්ටත් මිතුරන්ටත් ලියුම් ලිවීම ඔහුට නුහුරු කාරියකි. පුත්‍රයාට ඔහු නිතර ලියුම් නොලිවේ එහෙයිනි. එහෙත් ලියුම් ලිවීමත් පොතපත කියවීමත් හැර අනික් කාරියක් නොකරන

Scanned by CamScanner

මාලින් දෙමසකට වරක්වත් තමාට ලියුම බැගින් නොලියුවේ කුමක් නිසා ද? ඔහුගේ උගැන්ම සඳහා වියදම් කරමින් ඔහුගේ දියුණුව මහත් ආශාවෙන් පතන පියාට නිතර ලියුම් ලිවීම ඔහුගේ යුතු කමකි.

ටොරින්ටන් පිටියත් රේස් පිටියත් ඉක්මවූ රථය කටුගෙය ද පසු කෙළේ ය. තුරු මුදුන්වලින් සෙවණ වුණු ඒ පාර ඇඳිරි ය. වම් පැත්තේ ඇතැම් විශාල මැදුරක ගෙවුයනෙහි අසුන්වල වාඩිවී කතා බහ කරමින් සිනාසෙන දූරියන් සමූහයක් දෙස බැලූ වමරී සිනා සී අත වැනුවා ය. ඇ හඳුනාගත් ඒ දූරියෝ ද පෙරළා අත් වැනුහ.

“අම්මේ! නීලාත්, සරලාත් ජැටියට එනවයි කිවුව නෙවද?”

“ඔව්! එයාලා හයට පමණ ඒවි”යි මව පිළිතුරු දුන්නා ය.

“එංගලන්තයේ ඉඳලා මේ නැවෙන් එන සිංහල මිනිස්සු හුඟාක් ඉන්නවා ද?”

“මම දන්නේ නැහැ. තාත්තා දන්නවා ඇති.”

කටුගෙය පසු කළ රථය දකුණට හැරී නගර ශාලාවට නුදුරින් වූ හන්දියෙන් යළිත් වමට හැරී ගමන් කෙළේ ය. ගැළවීමේ හමුදව දෙමහල් මැඳුර ඉදිරියෙහි වූ කුකුළ් කරමල් සේ රතු පාට කොළ හා කහපාට කොළ ද, හෙවුණ පාත්ති හතරක් හතර පැත්තේ ඇති වටවංගුවට වමින් ගොස් යළිත් දකුණට හැරුණු රථය තුන් මහල් පොලිස් බැරැක්කය ද පසු කෙළේ ය.

කබලාන තම පුතා පිළිබඳ තොරතුරු ඇසීමට ආශා කෙළේ ය. ඔහු මවට එවූ ලියුම කබලාන ද කියවූයේ ය. මාලින් තමාට නිතර ලියුම් නෝවුවේ මවට එවන ලියුම් තමා ද කියවන බව දත් නිසා ද යන ප්‍රශ්නය නොයෙක් වර කබලානගේ සිතට නැංගේ ය. ඔහු වරක් මවට එවූ ලියුමක මේ කියුම ද වී ය. “‘උක්දඬු මෙන් මිනිසුන් තළා මිරිකා උන්ගේ ශ්‍රම ශක්තිය නමැති සාරය උකහා ගෙන වස්තුව රැස් කරන මිනිසුන් නිසා සිදු වී තිබෙන්නේ මහා විපතකි.”

ඔහු එසේ ලියුවේ එංගලන්තයේ සුදු මිනිසුන්ටත් ලංකාවේ සුදු මිනිසුන්ටත් බැණ වැදී ඊට අනතුරුව ය. එය සුදු මිනිසුන් නිසා ඒ වේලාවේ සිතට නැඟුණු කෝපයෙන් හා ද්වේෂයෙන් ලියන ලද්දකි. එහෙත් ඔහුගේ ඒ චෝදනාව තමාට ද එල්ල කරන ලද්දක් ය යන හැඟීම ඒ ලියුම කියවූ අවස්ථාවෙහි තමාගේ සිතට නැඟුණු හැටි කබලානට මතක් වෙයි.

එංගලන්තයට යන්ට මාස දෙකකට පෙර දවසක මාලින් පියාට ද ඇසෙන සේ තම මවට කී කියුමක් මෙසේ ය.

Scanned by CamScanner

''කාත්තා මුදල් හම්බ කරන්නේත් මිනිස්සුන් ගෙන් වැඩ ගන්-නේත් උන්ට පඩි ගෙවන්නේත් නිර්දය මසුරකු ලෙසිනි. ලොකු මිනිස්සුන්ට සංග්‍රහ කිරීමටත් උත්සවවලටත් ලොකුකම් පෙන්-වීමටත් වියදම් කරන්නේ ලෝබ නැති ඉංගිරිසිකාරයකු ලෙසිනි.''

මේ කියුම මතක් කළ කබලාන තමාට මෙසේ කියාගත්තේ ඒ කියුම තමාගේ ශූරකම අරබයා කරන ලද වර්ණනයක් ලෙස සලකා ගර්විත වූ බැවිනි. ''මාලින්! උඹ මෝඩයෙක්. ධනවත් විය හැක්කේ එහෙම මුදල් හම්බ කිරීමෙන් තමා. වේදනාව, දුක, දිළිඳුකම, හැඬුම, දෙඩුම, ඇණුම, බැණුම ඇසූ දුටු හැටියේ සැලෙන හදවත් ඇති මිනිස්සු අනුන් නිසාත්, අනුන් උදෙසාත් ජීවත් වන්නෝ ය. උන්ගේ ශ්‍රම ශක්තිය රන් ආකරයක් වනුයේ ක්‍රියාශූර දඩි මිනිසුන් අතෙහි පමණි. ගසුත් පසුත් ගලුත් කිරි මැටිත් නිර්දය ලෙස කපා කොටා විනාශ කොට ඉවත දැමීමෙහි ශූරයන් පමණි මීරන් ගොඩ දමන්නේ. මිනිසුන් නොතළා ඔවුන්-ගේ ශ්‍රම ශක්තිය මුදලට හැරවිය නොහැකි ය! ශ්‍රම ශක්තිය රන් ආකරයක් ලෙස සලකන ශූරයා පස් ගල් තළා-පෙළා මීරන් ගොඩ දමන්නාක් මෙන් ශ්‍රම ශක්තිය මිරිකාගෙන එයින් ධනවත් වෙයි. එය ලජ්ජාවෙන් නොව ගර්වයෙන් සැලකිය යුතු කාරියකි.'

රිගල් සිනමාව අසල වූ, නොයෙක් පාට කොළින් මලින් බැබළෙන පාත්තියෙන් අලංකාර වුණු වංගු වටය පසු කළ රථය යෝර්ක් වීදියට බැස්සේ ය. රියකරු ඒ වීදියේ ගස් යටින් වඩාත් ඉක්මනින් රිය පැදවූයේ 'කා කා' යි හඬ ලන කපුටන්ට සිතින් සාප කරමිනි.

වෙළඳ සැල්වලින් හා කන්තෝරු වලින් ප්‍රමාදව පිට වී දෙතුන් දෙනා බැගින් කාණ්ඩ ගැසී යන ලිපිකරුවන් ද ඉඳහිට ගමන් කළ රික්සෝවක් ද මොටෝරියක් ද හැර අනික් බාධාවක් කබලානගේ මොටෝරියෙහි ගමන ප්‍රමාද නොකෙළේ ය.

''අද ජැටිය අසල කාර් වැළැක්ම නවත්වා තියෙනවා''යි වට පිට බලන්ට වූ චමරි කීවා ය.

''නැවෙන් ඇවිත් ගොඩ බසින මිනිස්සුන්ගේ නෑදෑ මිත්‍රයන්ගේ කාර් වෙන්න ඇති''යි නාලිකා කීවා ය.

ජැටිය දෙරටුව සෙවණ කරන සිමෙන්ති වියන යට නැවතුණු රියෙන් පළමුව සච්මන් කබලාන බැස්සේ ය. අනතුරුව බැස්සේ චමරි ය. තම බිරිඳ බැස්ස පසු කබලාන රියෙහි දෙර වැසුවේ ය. නොනවත්වන ලද ඇන්පීම ඇති රථය ඇදී යනු ඔහු බලා සිටියේ ය. වියන මැදින් දෙපැත්තට දිවෙන පාරවල් දෙකට මැදි වූ තැන නවත්වන ලද මොටෝ රථවල බොනට්වූ හා බඳවල් ද සැදෑ හිරු රැසින් බබළයි.

# 2

එංගලන්තය බලා ගිය තමන්ගේ නෑයන්ටත් මිතුරන්ටත් සුබ පතනු සඳහා ඉකුත් වූ මාසයෙහි දෙවරක් ජැටියට පැමිණි නාලිකා කබලානට හා වමරීට ද එය ඉතා හුරු පුරුදු තැනකි. මිනිසුන්ගේ ශ්‍රම ශක්තිය මිරිකා ගැනීම සඳහා සිතටත් කයටත් වධ දෙන කබලාන, දස මසකට පමණ පසු ජැටියට ඇතුළු වූයේ අද ය. ඔහු මීට දස මසකට පෙර ජැටියට පැමිණියේ එංගලන්තයේ මෝටර්රථ කර්මාන්තශාලාවක නියෝජිතයකු ඇරලනු පිණිස ය. ලංකාවට පැමිණ, දෙදවසක් කබලානගේ අමුත්තකු වශයෙන් සංග්‍රහ ලැබූ ඔහු සිංගප්පූරුව බලා නැවුනගින දවසෙහි ජැටියට ගෙන ගොස් ඇරලන ලද්දේ කබලාන විසිනි.

ජැටිය වම්පැත්තෙහි කන්තෝරුවෙහි සිට තුන් හතර දෙනා තමන්ට නියම වැඩ නිම කොට අලුත් වැඩ ලැබෙන තෙක් බලා සිටිති. එකාගේ ඇඟේ එකා හැපෙමින් සිටින මිනිසුන්ට ජැටියේ පාත මාලයට යනු පිණිස අවසර පත් දෙන පොලිස් නිලධාරීන් දෙදෙනකු ඉදිරියෙහි වූ කවුන්ටරයට කබලාන අමාරුවෙන් ළං වූයේ ය. බඩු කිරා බැලෙන තැනට නුදුරින් වූ ලොකු කවුළුව අසල සිටි සුදු ගැහැනු දෙදෙනෙක් මුහුද දෙස බලාගෙන කතාබහ කරති; සිනාසෙති. ජැටියේ දෙවැනි මාලයට බසින පඩි පෙළට නුදුරින් රැස්ව ඔවුනොවුන් හා කතාබහ කරන කාන්තාවෝ නාලිකා කබලානගේ බැල්මට හසුවූහ. ඇ හඳුනන කාන්තාවක් ඔවුන් අතර නොවූවා ය.

''නැව වරායට ඇතුල් උණේ දැන්'' ය යි ඔවුන්ගෙන් එකියක් කීවා ය.

''මම කලින් නාවේ ඒක නිසා''යයි තවත් එකියක් කීවා ය.

ඔවුන් අතරට ගිය එකෙක් ගැහැනියකට ආචාර කොට මෙසේ ඇසී ය. ''ජැටියට ආවේ. මේ නැවෙන් කවුරුවත් එන නිසා ද?''

''ඔව්'' ය යි ඇ කීවේ මුහුණ පුරා පැතුරුණු සිනාවක් ඇතිව ය.

''කවුද?''

''මහත්මයා!''

''දෙස්තර මහත්තයා! දෙයියෝ සාක්කි! අද එන බව මම දන්නේ නැහැ. අද මම ආවේ මගේ ඉතාම හොඳ යාළු මුදලාලි කෙනෙකුගේ පුතෙක් ඒංගලන්තෙ සිට එන නිසා.''



Scanned by CamScanner

''එන්නේ බැරිස්ටර් විභාගෙ පාස් කරලා වෙන්න ඇති.''

''නැහැ; දොස්තර විභාගෙ. මිනිහා බොහොම ඉහළින් පාස් කරලා තියෙනවා''.

ඇගේ කුහුල වැඩි වී ය. ඇගේ දුව තවම දහ නමය නොඉක්මවූ දැරියකි. මේ අවුරුද්ද අවසාන වන්ට පෙර තම දුව විසි ඇවිරිදි වියට පැමිණෙන බැවින් එංගලන්තයට ගොස් ඉහළම දොස්තර උපාධි පට බැඳගෙන එන තරුණයකු ගැන කුහුලක් ඈ තුළ හට ගැනීම පුදුමයක් ද?

''නම කොහොම ද?''

''අරවින්ද විහාරහේන.''

''අරවින්ද විහාරහේන? එයා ඇෆ්. ආර්. සී. ඇස්., විභාගෙ බොහොම ඉහළින් පාස් කරාය කියා පත්‍රයේ පළවී තිබුණා මට මතකයි.''

''ඔව්—ඔව්; එයා තමයි.''

''තාත්තා මුදලාලි කෙනෙක්ය කීවා නොවද?''

''ඔව්; ලොකු වෙළෙන්දෙක්; දෙණියායේ තේ වතු එහෙමත් තියෙනවා. අම්මයි තාත්තයි දෙන්නම තාම ඉන්නේ පිටිසර තාලෙට. පුතා හරි හපනා ඉගෙන ගන්න.''

''කෝ මිනිහා?'' යි ඈ තවත් කුහුල වඩමින් ඇසුවා ය.

''මුදලාලි පහළ ජැටියේ ඇති.''

''මිනිහා අඳුනා ගන්න ඕනැ''යි කියමින් ඈ කට කොනකට සිනාවක් නැගුවා ය.

''මම දෙන්නාම අඳුන්වා දෙන්නම්!'' යි වික්‍රමනායක කීවේ යටැසින් ඇගේ මුහුණ බලා සිනාවක් ද නගමිනි.

ඈ වික්‍රමනායක සමඟ දෙවැනි මාලය බලා බසිත්ම කබලාන අවසර පත් කිහිපයක් අතින් ගෙන තම බිරිඳක් දුවත් සිටි තැනට පැමිණියේ ය. මෙතෙක් වේලා සහෝදරයා දකින ආසාවෙන් නො ඉවසුම්ව සිටි චමරී, පියාගෙන් අවසර පතක් උදුරාගෙන 'ටක ටක' හඬ නගමින් පඩි පෙළින් බැස දෙවන මාලයට ඇතුළු වූවා ය.

පඩි පෙළ අවසාන වන තැන වම් පැත්තේ කවුන්ටරය ළඟ උන් මුදල් මාරු කරන්නා තෝරවු කොළ කිහිපයක් ලාච්චුවේ දමාගත්තේය. මඳක් ඈතින් වූ තේ මණ්ඩපය අසල රැස් වූ තරුණයන්ගෙන් කිහිප දෙනකු බලා ඉන්නේ උකුළු පෙදෙස නටවමින් පිටු පා යන චමරී දෙස ය.

''තව පැයකිනුත් මාලින්ට ගොඩ බසින්න ලැබෙන එකක් නැහැ''යි දෙවැනි මාලයට බැස්ස කබලාන කී ය.

"එමරීට ඉවසුමක් නැහැ; අයියා දකින්න ඇ හරියට ආසායි" නාලිකා කීවා ය. "පැයක් යන එකක් නැහැ. නැව වටෙ දැන් බෝට්ටු ඇති"

"වරායේ දෙස්තර ගොහින් සෝදිසි කරලා ආවාට පස්සෙ මිනිසුන්ට ගොඩ බහින්න ඉඩ දෙන්නෙ"යි කබලාන කී ය.

"වරායේ දෙස්තර නැවට ගොහින් ආවායයි කවුදෝ කියනවා මට ඇහුණා."

"උන් එහෙම කියන්නේ හරියට දැනගෙන නෙවි."

තමා කියන කියුමක්, කරණ තීරණයක්, වැරදියයි සිත්මට අනුබල දෙන තර්කයක් සන්තෝෂයෙන් ඉවසීම කබලානට නුහුරු කාරියකි.

ජැටියේ දෙවැනි මාල්යේ කෙළවර වූ ලී වැටට හාන්සි වී වරාය දෙස බලා උන් එමරීට වරායට ඇතුළුවන නැවක් පෙනිණ. මදක් ඈතින් සිටි සුදු ගැහැනු දෙදෙනෙක්, ජැටියට ළඟා වන බෝට්ටුව දෙස බල බලා කතා බහ කරති. වරාය වම් පැත්ත වටා බැඳි දිය-කඩනය උඩ යන එන මිනිසුන් සැඳෑ හිරු රැසින් බැබළෙන නිල් වියනක් බඳු අහස් තලය යට වූ කුඩා කළු රූකඩ පෙළක් ලෙසින් කබලානට පෙනෙන්නේ. දියකඩනය කෙළවරට පළමුව යොමු-වුණු කබලානගේ බැල්මට වරායෙහි නවත්වන ලද නැවු එකිනෙක ක්‍රමයෙන් ගොදුරු වී ය. දියකඩනය අනික් කෙළවර පහන් කණුව අසල නවත්වන ලද නැවේ කඳෙහි ඇඳි ASTARTE යන නම කබලාන යන්තම් අඳුනා ගත්තේ ය.

"අර තියෙන්නේ මාලින් ආ නැව."

"කෝ—කෝ!—"යි අසමින් නාලිකා තම සැමියාගේ ඇඟේ හැපෙන තෙක් ඔහුට ළං වූවා ය.

"අර—අර—බරේක්වෝටර් එක කෙළවර ලයිට් හවුස් එකට නුදුරින් නවත්වා තියෙන නැව"

"ඒ නැවෙන් මිනිසුන් බහිනවා නෙව!"

"ඔව්, මම හිතුවාට කලින් මාලින්ට ගොඩ බහින්න පුළුවන් වෙවි."

එමරී ද මවුපියන් සිටි තැනට ආවා ය.

"අම්මේ, අර තියෙන්නේ මාලින් අයියා ආ නැව!" යි කියමින් එමරි ඇඟිල්ල දික් කළා ය.

"ඔව් තාත්තා දැන් පෙන්නුවා."

"අපි යමු ද පහළ තට්ටුවට"

''මෙහේ සිටියාම බෝට්ටුවෙන් එන කොට අපට එයා අඳුනා-ගන්න පුළුවන් වේවි. අපි ජැටියට එන බෝට්ටු දෙස බලාගෙන ඉඳලා පස්සේ යමු පාත මාලෙට. දැන්ම පාත මාලෙට බැහැල තද වෙන්නේ මොකටද''යි කබලාන කී ය.

ලොකු කුඩා බෝට්ටු ජැටියෙහි දෙපැත්තට ළඟාවෙයි. බෝට්ටුවලින් එන මිනිසුන් හඳුනා ගනු පිණිස, චමරි, වරක් වම් පැත්තේ වැට අසලට ද නැවත දකුණු පැත්තේ වැට කරා ද දුවයි.

යුද්ධ නැවියන් කිහිප දෙනකු හා නිලධාරියකු ද නැඟුණු බෝට්ටුවක් කන් බිහිරි කරන හඬින් සයිරන් නළාව හඬවමින් පාත මාලයේ පාලම අසලින් පිටත්වනු කබලාන බලා සිටියේ ය. හැඩි-දැඩි නැවියෙක් දිලිසෙන පිත්තල කොක්කක් සහිත සුදු රිටක් බාල්කයෙහි ගසා පාලමෙහි හැපෙන්ට ගිය බෝට්ටුව වේගයෙන් පස්සට පැද්දුවේ ය. ජැටිය කරා එන බෝට්ටුවල හැපෙනු වළකනු පිණිස වරක් එක් අතකට ද නැවත අනික් අතට ද හැරෙමින් පැදෙන බෝට්ටුව යන මඟ බලා සිටි කබලානට සිහි වූයේ දිය නයෙකි. ජැටියේ දකුණු පැත්තට ළං වන විශාල බෝට්ටුවක නළාව උලමකු මෙන් නැඟූ හඬ ක්‍රමයෙන් අඩු වී සීන් කෙඳිරියකින් නැවතිණ.

''අර යන්නේ දෙණියායේ මුදලාලි කෙනෙක්''ය යි කබලාන මැතිනිය කීවා ය.

කාන්තාවක ද කලිසන්කාරයකු ද දෙපැත්තේ ඇතිව පාත මාලයට බසින්ට යන රෙදි කෝට් හැඳ සපත්තු පය ලාගත් කොණ්ඩයකු ඈ තම සැමියාට පෙන්නුවා ය. ලොකු හණු දෙකක් ද පටු නළල් තලයක් හා එකටෙක ගැටී සිටි සීන් තොල් සහලින් වැසුණු පළල් වූ කටක් ද ඇති ඔහු කබලාන ගේ සිත් ගත්තේ ය. වතුපිටි හිමි වෙළෙන්දකු විය යුතු ඔහු හඳුනා ගැනීම තමාගේ ලාභයට ද හේතු විය හැකියයි සිතූ කබලානගේ කුහුල වැඩිණ.

''අඳුනනවා නම් එයා එක්ක කතා නොකෙළේ මන්ද?''

''මම අඳුනන්නේ නැහැ. ජැටියේ උඩ තට්ටුවේදී අර කලිසන් කාරයාත් නෝනාත් එයා ගැන කතා කරනවා මම අහගෙන සිටියා. එයාගේ පුතෙක් ඉහළම විබාගෙකින් දෙස්තර වැඩේ පාස් කරලා මේ නැවෙන් එනවා.''

''ඒ නෝනා දෙණියායේ ගෑනියෙක් වෙන්න බැහැ; කොළඹදී මම දැකලා තිබෙනවා.''

''ඒ නෝනා මුදලාලිගෙ කවුරුවත් නෙවි. පුතා දෙස්තර විභාගෙ බොහොම ඉහළින් පාස් කරලා එනවායයි අර මිනිහා කිව්වාට පස්සේ ඒ නෝනා මුදලාලි හඳුනාගන්න ඕනෑය කිවුවා! එයාගේ මහත්තයා රට ගොහින් එන දෙස්තර කෙනෙක්.''

කබලාන ද ඔහුගේ බිරිඳ හා දුව ද පාත මාලයට බසින අදහසින් පඩි පෙළ බලා ගමන් ගත්හ. නාලිකා කබලානගේ සහෝදරයා හා ඔහුගේ බිරිඳත් දූවරු දෙදෙනාත් ඔවුන්ට එක්වූහ.

"දැන් ද ආවේ ?" යි නාලිකා ඇසුවා ය.

"අපි මේ ආවා විතරයි. තාම මාලින් ගොඩ බැස්සේ නැද්ද ?" වැලිවල නෝනා ඇසුවා ය.

"නැහැ. අපිත් මේ පහළ තට්ටුවට යන්ටයි අදහස් කෙළේ."

චමරීත් ඇගේ නැන්දගේ දූවරුත් 'ටක ටක' හඬ නඟමින් පඩි පෙළ ඉක්මවා ගොස් පාත මාලයට බැස්සෝ ය. සෙමින් පා තබමින් ගමන් කළ කබලානත් චන්ද්‍රසෝම වැලිවලත් පාත මාලයට බැස්සේ තමන්ගේ බිරියන්ට අනතුරුව ය. තම නෑනාලා සමඟ මිනිසුන් අතරින් රිංගා ගිය චමරී පාලම අද්දරට ම ළඟා වූවා ය. පාලමේ බාල්කයේ හැපෙන මාරියාවෙන් බිඳී විසිරෙන කරදියෙන් චමරීගේ සපත්තු කොණක් ද සාරි කෙළවර ද තෙමිණ. ඈ ටිකක් පස්සට වී පාලම කරා එන බෝට්ටු දෙස බැලුවා ය.

"මේ එන්නේ මාලින් අයියා!" යි බෝට්ටුවක් දෙස යළිත් වරක් බැලූ චමරී කීවා ය.

"කෝ ?" යි කියමින් නීලා චමරී පෙන්නූ බෝට්ටුව දෙස බැලුවාය.

"මාලින් අයියා හුඟාක් වෙනස් වෙලා වගෙයි."

ඔවුහු මිනිසුන් අතරින් ඇදී ඇදී මවුපියන් සොයා ගියෝ ය.

"අම්මේ, මාලින් අයියා ඔන්න එනවා!"

පාලමෙහි රැස්ව උන් ගෑනුත් පිරිමිත් පාලම අද්දරට ළං වෙති. ගෑනුන් හා පිරිමින් විසි දෙනෙකුන් ද පෙට්ටි හා පොදි රාශියක් ද ගත් විශාල බෝට්ටුවක් සෙමින් පාලමට ළඟාවෙයි. නැවියකුගේ ඇඳුමෙන් සැරසී බෝට්ටු කොණෙහි සිටි කළු දැවැන්තයෙක්, උණ ගහක් තරම් වූ රිටක් දික් කොට එහි කොක්ක බාල්කයක අවුනා ඇද්දේ ය. බෝට්ටු කොණ පාලමෙහි වදින තරම් වේගයෙන් ළං වනු දුටු ඔහු යළිත් රිට උස්සා පාලමෙහි ගැසී ය. අනික් කොණෙහි සිටි නැවියෙක් රිටක් දික් කොට එහි කොක්ක පාලමෙහි අවුනා ඇද්දේ ය. බෝට්ටුව පාලමෙහි හැපෙන තරම් ළං වූයෙන් පිරිමිහු පාලම උඩට පනින්ට වූහ. ගෑනු නැවියන්ගේත් අනික් පිරිමින්ගේත් අත්වල එල්ලී පාලමට නඟින්ට වූහ.

කලක් වියෝව සිටි නෑ මිතුරන් ද මවුපියන් හා දරුවන් ද බිරියන් හා සැමියන් ද පළමු වර හමු වූ තැන පහළ වන ආසාවක් ප්‍රීතියත් ඔවුනොවුන් වැළඳ ගැනීමෙන් හා ආචාර සමාචාර පැවැත්වීමෙන් ද පළකරනු ලැබී ය.

Scanned by CamScanner

පාලමෙහි කණුවල හැපෙන මාරියාව, සිනා උතුරුවන්නාක් මෙන් පෙන නහමින් විසිරෙයි. පාලම කරා එන තවත් විශාල බෝට්ටුවක සයිරන් නළාව හඬ නඟනු ඇසූ ඇතැම්හු තමන්ගේ නෑයන් ඒ බෝට්ටුවෙන් එනු ඇතැයි සිතා ඒ දෙසට නෙත් යොමු කළහ. රේගුව අසල නවත්වන ලද බත්තල් පෙළ, නගින බසින මාරියාව නිසා සෙමින් සෙමින් උස්වෙයි. පාත් වෙයි. ක්ෂිතිජ-යෙහි අහස, ගිනි ගත් රතු සායම් තැවැරුණු වහල් තලයක් සේ බබළයි. බැස යන හිරු රැස් සිපගත් මුහුදු දිය කඳ, රිදී දිය දහරින් තෙවුන නිල්මිණි තලයක් සේ පාලම උඩ සිට ඇතැමුන්ගේ ඇස් නිලාංකාර කරයි.

''මේ අරවින්ද විහාරහේන— ඉහළම සැත්කම් උපාධි ලබාගත් දොස්තරෙක්; මගේ ඉතාම හොඳ යහළුවා''යි කියමින් මාලින්, තම හිත මිතුරා මවටත් පියාටත් නංගිටත් අනික් නෑයන්ටත් හඳුන්වා දුන්නේය.

අරවින්ද, චමරීට ආචාර කෙළේ 'උෆයි' කියවන තරම් වේග-යෙන් ඇගේ අත මිරිකමිනි. ඇගේ රූ සපුවත් විලියෙන් මැඩගත් සිනාවත් දැකීමෙන් තමා තුළ හටගත් සන්තෝෂය සැඟවීමට ඔහු වෑයම් නො කෙළේ ය. ඔහු චමරීගෙ අත මිරිකනු ද එයින් හටගත් වේදනාව නිසා ඇගේ ඇසක් යන්තම් හැකිළෙනු ද නාලිකා කබලාන දුටුවාය.

අරවින්ද අනික් අමුත්තන්ට සමාචාර පැවැත්වූ වහාම යළිත් බැලුවේ චමරීගේ මුහුණ ය. චමරී සිනාසෙමින් ඉවත බලාගත්තා ය.

''ඒයැයි හිතාගෙන ඉන්නේ ලංකාවත් එංගලන්තෙ වගේය කියා!''යි නිලා චමරීගේ කනට කොඳුරා කීවා ය.

''තරුණයෝ සුන්දර තරුණියන් බලා සන්තෝෂ වෙති. කවුරුත් එය දනිති''යි අරවින්ද තමාටම කියා ගත්තේ නිලාට ඇසෙන සේ නොකිය හැකි බැවිනි. ඒ සන්තෝෂය සඟවන්ට වෑයම් කරන්නේ කුමටද? ඒ සන්තෝෂය අමාරුවෙන් යට කර ගැනීම කුහක වෙස් ගැනීමක් නො වන්නේ ද? නොදැන ඉමක් කොනක් නැති කුහක කමු කරන මිනිසුන් දැන දැන කුහක කම් කරන්නේ කුමටද?

අරවින්දගේ පියා තම පුතා දෙස බලා ඉන්නෙ මඳක් ලජ්ජා-වෙනි. ඒ ලජ්ජාවට හේතු වූයේ තම පුතා තරුණියන් හා කතාබහ කරන ආශාවෙන් ඔවුන්ට ළංවීම නොවේ. පිටිසරින් නගරයේ ලොක්කන් අතරට පැමිණි ඔහු සබකෝලය ඇත්තකු ලෙස ක්‍රියා කරන්නේ තම පුතා නිසා ය. අනික් තැනක දී නම් ඔහු තම කටට ආ බසක් කියයි; සිතුවක් කරයි: අනික් ලොකු ගෑනුන්ගේත් පිරිමින්-ගේත් සිනාව ඔහු නොසලකයි. ඇණුම් බැණුම් සරදම් හීවලින් සිදුරු නොකළ හැකි දැඩි කොපුවකින් වැසුණකි ඔහුගේ හදවත.

''සමා වෙන්න; මහත්මයා අඳුන්වා දෙන්න මතක නැති උණා'' යි කියමින් මාලින් අරවින්දගේ පියාගේ අත අල්ලාගත්තේ ය. ඔහු වත්තුහාමි මුදලාලි ඇදගෙන ගොස් තම මවට ළං කෙළේ ය.

''මේ අරවින්දගේ තාත්තා!''

නාලිකා කබලාන ආරූඪ කරගත් උදරත්වයකින් අත දිගු කළා ය. මුදලාලි හිස නමා ආචාර කරමින් ඇගේ අත අල්ලා ගත්තේ ය.

සචිමන් කබලාන අතට අත දී ඔහු හා කථා කෙළේ ළැදිකමිනි. ඒ ළැදිකමට යටින් ඇති වෙළෙඳ නුවණ සචිමන් කබලානට තේරුණේ දෙවන කට්ට වෙළෙන්දකු වූ වත්තුහාමි දුටුවේ ද? වෛද්‍ය උපාධි ලබාගෙන පැමිණි පුතාගේ තොරතුරු ඇසීමෙන් පසු කබලාන ඔහුගේ වෙළඳාමත් වතුපිටිත් ගැන විචාළේ ය.

''එතරම් විශාල වෙළඳාමක් නම් ලොරි හා වෑන් රථ කිහිපයක් තියෙන්න ඕනෑ නෙවැ''යි කබලාන කී ය.

''ලොරියක් තියෙනවා.''

''එක ලොරියක් මොකට ද? අප ළඟ හොඳ අලුත් ලොරි තියෙනවා. දැන් හොඳ අලුත් කාර් දෙකකුත් ගන්න එපාය? පුතාට එකක් මුදලාලි මහත්තයාට එකක්–''

මුදලාලි සිනාසුණේ ය.

''මට පරණ පෝඩ් කාර් එකක් තියෙනවා. පුතාට ඕනෑ එකක් එයා ගනීවී.''

''පෝඩ් කාර්වලින් යන්න දැන් ලැජ්ජා නැද්ද? ඒක විකුණාදමා හොඳ අලුත් කාර් එකක් ගන්න.''

''පුතා අපිත් එක්ක දැන් අපේ ගෙදරට යනවා. මහත්මයාත් එන්න අපේ ගෙදර යන්න''යි මාලින් අරවින්දගේ පියාට ආරාධනා කෙළේ ය.

''ඔව්, තාත්තා, අපි යමු දැන් මේ මහත්මයලයි ගෙදරට. මේ මහත්මයා මට එංගලන්තෙදී බොහොම උදවු කරා– මගේ හොඳම යාළුවා.''

''පුතා දෙස්තර විභාගෙ පාස් කෙරුවේ බොහොම ඉහළින්''යි කියමින් මාලින් තම යහළුවාගේ සූර කම් වර්ණනා කෙළේ ය. ''පුතා පාස් කෙරේ දෙස්තර විභාගෙ විතරක් නෙවි. වෙනත් ශාස්ත්‍ර හොඳටම ඉගෙනගත්තා. පසුගිය අවුරුදු පනහ ඇතුළත මේ තරම් සමර්ථ තරුණයෙක් ඉගෙනීම සඳහා එංගලන්තෙට ගියේ නැහැ. ලංකාව ගැන දන්නා කවුරුත් වාගේ කිවුවා.''

''මම ගැන බොරු වර්ණනා කරන්න එපා මාලින්.''

ජැටියේ පාත මාලය මිනිසුන්ගෙන් ක්‍රමයෙන් හිස්වෙයි. පළමුව විහාරහේනේ මුදලාලිත් ඔහුගේ පුතාත් ගැන කුහුලක් ඇති කරගත් කාන්තාව, තම සැමියා ද අරවින්දට හඳුන්වා දුන්නා ය. නාලිකා කබලාන, වැලිවල නෝනා දෙස බලා ඉඟිමැරුවේ එය කෙළින්ම ඇනුම් පදයක් කිය නොහැකි අවස්ථාවක් වූ බැවිනි. ඒ කාන්තාව හා ඇගේ සැමියා ද අරවින්දට ආචාර කොට ගිය පසු ඉතිරිව සිටි ගැහැනුන් ද පිරිමින ද පිරිවර කොටගත් මාලින් හා අරවින්ද ඉහළ මාලයට නඟින්ට වූහ. කබලාන හා නාලිකා ඉහළ මාලයේ දොරටුවට ළඟා වී ටික වේලාවකට පසු රියකරු මොටෝරිය පදවාගෙන ඇවිත් වියන් තලය යට නැවැත්වූයේ ය.

"මාලින් එන්න."

"අම්මා නගින්න"යි කියමින් මාලින් තම යහළුවා සොයන්ට ගියේ ය.

"එන්න අරවින්ද, අපේ කාර්එකේ නගින්න. වික්‍රමනායකත් නංවාගෙන තාත්තාට අපේ ගෙදරට එන්න කියන්න.

කබලාන ඉස්සරහ අසුනෙහි හිඳගත්තේ ය. චමරි මව ළඟින් වාඩිවූවා ය. අනතුරුව අරවින්දත් මාලිනුත් වාඩිවූ හ.

මහා හෝටලයෙන් ද පහන් කණුවලින් ද නික්මෙන් විදුලි එළියෙන් කොටුව එළිය වී ය. වරායේ නැව්වල එළිය, දිය කෙළි උළෙලක් නිමිත්තයෙන් නංවන ලද පහන් ඇඟෑ සේ පෙනිණ. වසන ලද දොරටු ඇති ගෝඩන් උයන පසු කළ මොටෝරිය ගාලු මුවදොර මාවතට බැස්සේ ය. එහි සක්මන් මළුව එළිය කරන පහන් පෙළ ඈතට පෙනෙන්නේ පහන් වැටක් ලෙසිනි. බටහිර අහසෙහි සුදු වලා කඩකින් වැසුණු අඩ සඳ, කාන්තාවකගේ සිනාවක් මෙන් සෙමින් මතු වෙයි.

"අරවින්දගේ තාත්තාගේ කාර් එක එනවා ද?" යි අසමින් මාලින් එබී පිටිපස බැලීය. බෙලෙක් තහඩු එකට වැදෙන කල නඟින හඬ වැනි කබල් හඬක් නඟමින් විහාරහේනගේ පෝඩ් රථය ළඟම එයි.

"අරවින්දගේ තාත්තාගේ කාර්එකෙන් එන්නේ හරි කබල් හඬක් නෙව!"

චමරී සිනාසුණා ය. අරවින්ද කුමක් කිව යුතුදැයි සිතාගත නොහැක්කේ සිනාසුණේ ය.

# 3

අනෝමා මැඳුරෙහි පෝර්ටිකෝව යට නවත්වන ලද ජගුව
යෙන් පළමුව බැස්සේ කබලානා ය. ඔහු අනතුරුව බෙලෙක් හ
නහමින් පැමිණි පෝඩ් රථයෙහි දොර හැරියේ ය.

''බහින්න මුදලාලි''

ඇලින්දයට නැගුණු විහාරහේන මුදලාලිගේ පයක් ලිස්සි
ඔහු නෙ වැටී බේරුණේ පුටුවකට අත ගසා ගැනීමෙනි. රතු ඉ
ඇල්ලීමෙන් ඔප් නහන ලද ගෙබිම දුටු විහාරහේන. තමාගේ ප
ලිස්සා ගියේ කෙසේදැයි වටහා ගත්තේ ය. ඔහු එතැන් සිට ප
නැඟුමේත් තැබුමේත් පියවර මනින්නකු සේ පරිස්සමිනි. ආලින්ද
යෙහි බිත්තිය බදගත් මුතු බෙලි කටුවල හැඩහුරු කම් ඇති කිරි
ගරුඬ පියන් පත්වලින් නික්මෙන මුදු මොළොක් එළිය දුටු මුදලා-
ලිගේ කුහුල වැඩි විය. සාලය මැද සීලිමෙහි එල්ලී සිටි විශාල
කිරිගරුඬ ගොලෝවෙන් සඳ රැස් දරාවක් මෙන් විදුලිය එළිය ගලයි.
සාලය උතුරා යන තරම් පිරුණු ඒ එළිය නිසා බැබලෙන බිත්ති,
වියන් තලය හා පලස ද දුටු මුදලාලි සිහිකෙළේ පැරණි බණ පොත්
වල දක්න ලැබෙන දෙව් මැදුරු පිළිබඳ වර්ණනා යකි.

හැඳගත් නොකිලිටි ඇඳුම්වල සුදු බබළවන කළුකෙස් වැටී ඇති
මෙහෙකාරයන් අතින් ගත් කැවිලි බන්දේසි සාලයටත් ආලින්දය-
ටත් එක විට පැමිණියේ ය.

''එංගලන්තෙ මිනිස්සු තාමත් අහංකාරයි'' කියමින් මාලින්
සැන්ඩිච් එකක් අතට ගත්තේ ය.

''ඔක්කොම නෙවි.''

''කම්කරු පන්තියේ මිනිස්සු ආසියාතිකයන්ට අහංකාර නැහැ.
අනිත් ඇයො කවුරුත් වගෙ අහංකාරයි.''

''ආසියාවෙ මිනිස්සුන් අඳුනා ගත්තාට පස්සේ ඒ මිනිස්සුන්
අහංකාර නැහැ''යි අරවින්ද කී ය.

''අප අඳුනාගන්න උන් කැමති නැහැ; ආස්සරය කරන්නත්
කැමති නැහැ.''

''පෙරදිගින් දෙකෙන් කොටසක් තරම් පාලනය කරන්නේ
ඉංග්‍රීසි කාරයන් විසින්. උන්ට වස්තුව ලැබෙනවා. පෙරදි
මිනිස්සුන් උන්ට දෙවියන්ට වගේ සලකනවා; උන්ගේ භාෂාවට
ඇඳුම් පැළඳුම්වලටත් වැඳුම් පිදුම් කරනවා. ඉතින් උ
අහංකාර කම් පෙන්නන එක පුදුමයක් ද?'



Scanned by CamScanner

"මැද පංතියේ ඉංග්‍රීසි කාරයෝ වඩාත් අහංකාරයි. උන් අදිරාජ්ජය සිහිකරන්නේ ලොකු ආඩම්බරේකින්."

"උන්ට වගේ අදිරාජ්ජයක් අපට තියෙනවා නම් අපි උන්ට වඩා අහංකාර වෙන්නේ නැද්ද? අපි උන් කෝට් අඳිනවාටත් විරුද්ධ වෙන්නේ නැද්ද?" අසමින් චමරි සිනාසුණා ය.

"බෙ හොම හරි!" යි කියමින් අරවින්ද ඇට රැකුල් දුන්නේය. "අල්ලක් විතර ඇති මේ ලංකාවේ ඉන්න අපි අපේ අතීතය වර්ණනා කරන්නේ කොයි තරම් අහංකාර කමකින් ද? ගමක ලොකුකම් කරන සමහර මිනිහෙක් ලේන්සුව කරින් නොගෙන තමා වෙතට එන මිනිහාට කිපෙනවා. ඒවාගේ මිනිස්සුන්ට අදිරාජ්ජයක් ඇත් නම් සුදු මිනිස්සුන්ට කෝට් අඳින්න ඉඩ දේවි ද?"

"අතීතය වර්ණනා කරන්නේ අපට අතීතයක් තියෙන නිසා නෙව"යි ම ලින්ගේ මව කීවා ය.

"අතීතයක් තියෙන්නේ අපට විතරක් ද"යි මාලින් ඇසුවේ ය. "දූන් වැද්දන්ගේ තැනට වැටී සිටින මිනිස්සුන්ටත් අතීතයක් තියෙනවා. අතීතය වර්ණනා කරන්නේ අනාගතයක් නැති මිනිස්සු."

"එංගලන්තෙට ගිය අලුත මම මැද පන්තියේ ඉංග්‍රීසි ගැහැනියෙකුගේ ගෙදරට ගියා. ඒ ගැනිත් දුවත් විතරයි උන්නෙ. ඉල්ලන තරමක් ගෙවන්නම්, මට කාමරයක් දෙන්න'යයි මම ඒ ගැනිට කිවුවා" කියමින් අරවින්ද නාලිකා කබලාන දෙස බැලුවේය.

"ඒ ගැනි එක පාරටම 'අපොයි බැහැ' කිවුවා; 'මීට ඉස්සර ඉන්දියානු ශිෂ්‍යයන් දෙන්නෙක් නවත්තාගත්තා. ඒ දෙන්නාම තලතෙල් දමා කැම හදගත්තා. ඒ දෙන්නාගේ පිඟන් පිරිසි හෝදන එක අපට මහ කරදරයක් උණා.' එතකොට මම කිවුවා 'මම ඉන්දියන් කාරයෙක් නෙවිය ලංකාවේ මිනිහෙක්' ය කියා. ඒ ගැනි පුදුම උණා! ලංකාව ය කියන්නේ වැද්දන්ගේ රටකට යයි ඒ ගැනි හිතා උන්නේ. 'ලංකාව දූන් කුඩා එංගලන්තයක්ය'යි මම කවට කමට කිවුවා. අන්තිමේ ඒ ගැනි මම නවාත්තා ගැනීමට කැමති උණා."

ඒ ගැනි ඩරිපිං ලාඩ් පාවිච්චි කරන්නේ නැද්ද? හින්දුකාරයා ඒ තෙල්වලට පිළිකුල් කරන්නේ ඒ ගැනි තලතෙල් වලට පිළිකුල් කරන්නා වාගේ නෙවිද?"යි අසමින් නීලා හොඳටම සිනාසුණාය.

"ඉන්දියන්කාරයා තලතෙල් පාවිච්චි කරන්නේ වැද්දෙක් වගේ!"යි අරවින්ද කී ය.

ආලින්දයෙහි වාඩිවී කැවිලිකමින් කතාබහ කරන පිරිමින් වෙතට මෙහෙකාරයන් අතින් ගියේ විස්කි හා බ්‍රැන්ඩි ඩිකැන්ටර

ඳෑකක් හා සෝඩා සයිෆන් බෝතලයක් ද පමණි. වික්‍රමනායක
වීදුරුවක් ගෙන එහි විස්කි වත්කෙළේ ය. අනතුරුව වැලිව
විස්කි ගත්තේ ය. විහාරහේන මුදලාලි සෝඩා පමණක් වත්කර
ගත්තේ ය.

''ඇයි මුදලාලි විස්කි බොන්නේ නැද්ද?''යි කබලාන ඇසී ය.

''මොක ද නැත්තේ!'' කියමින් වික්‍රමනායක සිනාසිණි.
''ගන්න මුදලාලි ටිකක්.''

''අද නොගන්ටයි හිතුවේ.''

''අද නොවෙන්නම් ගන්න ඕනෑ දවස!'' කියමින් වික්‍රමනායක
බ්‍රැන්ඩි බෝතලය මුදලාලිගේ අතට දුන්නේ ය. විහාරහේන
විස්කිවලට වඩා බ්‍රැන්ඩිවලට කැමැති බව ඔහු දනියි.

වත්තුහාමි මුදලාලි වීදුරුවෙන් බාගයක් පිරෙන තරම් බ්‍රැන්ඩි
වක්කරගෙන සෝඩා ටිකක් ද මිශ්‍ර කෙළේය. ඔහු වීදුරුව කනප්පුව
උඩ තැබුවේ එක හුස්මට බී එය හිස් කිරීමෙනි. මත් පැන් බිවූ
වහාම මුදලාලි ගොළු වත පුරන්නේ නතන නතනා කල්පනා
කරන්ට වන බැවිනි.

විහාරහේන ඉහළ සමාජයේ ඉහළ තැනටම නැඟීමේ ආශා-
වෙන් මඩනා ලද්දෙකි. අවුරුදු කීපයකට පෙර මුහන්දිරම් නමක්
පුදන ලද නමුත් ඔහු එය නොපිළිගත්තේය. මුදලි නමට අඩු
ගරු නමක් තමාට නුවුවමනා ය යි ඔහු කීවේ ය. තම පුත්‍රයා
එංගලන්තයට යැවූ අවස්ථාවෙහි ද විහාරහේනගේ සිතෙහි වූ යසස්
කාමය මතු වී ය. තම පුතාට 'දෙස්තර හාමුදුරුවෝ'යි අනායයන්
කියනු ඇසීමට විහාරහේන කැමැති ය. කබලානගේ ගෙයත්
රතු පැහැයෙන් බැබළෙන ගෙබිමත් සාලයෙහි අතුරන ලද වටනා
පලසත් සැටි පුටු ආදියත් මුදලාලි සිහි කෙළේ සන්තෝෂයට
එක් වූ මඳ ඊෂ්‍යාවකිනි. ලොක්කන් වසන පෙදෙසක, ලොකු
ගෙයක් තනවා, තම පුතාත් සමඟ එහි වාසය කරන්ට ඔහු සිතුවේ
පුතා එංගලන්තය බලා යාත්‍රා කළ දවසෙහි ය. වැඩ කාරයන්
විසින් ඉටි අල්ලා ඔප් නඟන ලද බිම, වටනා පලස් අතුළ සාලය,
කිරිගරුඬ ගොළෝවෙන් ගලන එළිය දරාව යන ආදියෙහි ද තම
පුතා හමුවීමට එන නෝනාවරුන් හා මහත්වරුන්, සුදු කෝට්
හැඳගෙන ඔවුන්ට සේවය කරන වැඩකාරයන් යන ආදීන්ගේ ද
ස්වරූප බ්‍රැන්ඩි මතින් බැමෙන්ට වූ මුදලාලිගේ සිතෙහි ඇදි ඇදී
මැකෙන්ට වී ය.

තමාගේ දුර නෑයකු වූ සිරිමත් කොක්වත්තේගේ මුහුණ
විහාරහේනගේ සිත්විලි දමෙහි එක් පුරුකක් සේ මතු වී ය.
දිස්ත්‍රික් නඩු කාරයෙක් වූ සිරිමත් කොක්වත්තේ මාතයෙන්
පිම්බුණු හිසක් ඇත්තෙකි. මීට අවුරුදු දහයකට පමණ පෙර

විහාරහේන තම පුතාත් සමඟ ඔහු දකීමට ගියේ නැකම අලුත් කරගන්නා ආසාවෙන් නොව, තම පුතාට ඉගැන්විය යුතු විෂයන් අරබයා, උවදෙස් ලබනු පිණිස ය. කොක්වත්තේ ඔවුන් පිළිගත්තේ ගර්වයෙන් දළදඬු කරගත් සිතත් කයත් ඇතිව ය. කන්තෝරු කාමරයෙහි යම් කිසි කාරියක් කරමින් උන් කොක්වත්තේ, මුදලාලිත් පුතාත් සාලයට නොකැඳවූයේ ය. තම බිරිඳට ඔවුන් හඳුන්වා නුදුන්නේ ය.

''මෙ මගේ පුතා; එයාට හොඳට ඉගෙනගන්න පුළුවනි. දෙස්තර විබාගෙ ගන්න එයා රට අරින්නයි මම හිතාගෙන ඉන්නේ. මම ආවේ අපේ නඩුකාර හාමුදුරුවන්ගෙන් ගුණදහමුතු කමක් ලබාගන්නයි'' විහාරහේන කීවේ ය.

සිරිමන්ගේ කට කොනට නැඟුණේ සරදම් සිනාවකි.

''ඒවා උඹලාට කරන්න පුළුවන් වැඩ නෙවි. එංගලන්තෙට ගියාම උඹේ ළමයාගේ ඔළුව නරක් වේවි. සල්ලි තිවුණාට ඒවා උඹලාට කරන්න පුළුවන් වැඩ නෙවි. සෑහෙන ආස්සරයක් නැතිව හැදුණු ළමයෙක් එංගලන්ත වැනි රටකට අරින එක හොඳ නැහැ.''

මුදලාලි තමාගේ හිසට නඟින්ට වූ කෝපය මැඩගත්තේ ඉතා අමාරුවෙනි.

''හැදුණොත් හැදුණාවේ; නැති උණොත් නැති උණාවේ ඒක එයැයිගෙ කරුමෙ හැටියට වෙන එකක් මම හිතාගෙන ඉන්නේ මෙයා එංගලන්තෙට යවන්නයි.''

''ඒක උඹෙ වැඩක්. ඇයි මේ කොල්ලට තැපැල් මහත්තයෙක් වෙන්න ඉගැන්නුවම මදි ද?''

මුදලාලි ආපසු ගෙදර ගියේ දැඩි.කෝපයෙනි. ගෙදරට ළඟාවූ වහාම ඔහු තම බිරිඳ අමතා මෙසේ කීවේ ය.

''මෙයාට තේරෙනවද? මම කවද හරි සිරිමන් කොක්වත්තේ නඩුකාරයා මගේ පුතාගේ කකුල් දෙක ළඟට ගෙන්නනවා; හොඳට හිතට ගන්න. ඇහුණද?''

විහාරහේනගේ බිරිඳ අන්ද-මන්දව තම පුතා දෙස බැලුවා ය. සිරිමන් නඩුකාරයා තම පියාටත් තමාටත් කළ නින්දාව යන්තම් වටහාගත හැකි වයසෙහි සිටි අරවින්ද තම මව දෙස බැලුවේ දැඩි අධිෂ්ඨානයෙන් නිසන්සල වුණු දෙනෙතිනි. විහාරහේන තර්ජනයක විලාසයෙන් අර වදන් තම බිරිඳට කීවේ, කොක්වත්තේ තමාගේ නෑයකු වූයේ ඇගේ නෑකම නිසා බව සිහි කිරීමෙනි.

මේ අතීත පුවත සිහි කළ විහාරහේනගේ සිත දැඩි වී ය. දෙඇස දිලිසිණි. ඔහුගේ මිට මෙලවුණු දකුණු අත පිළිගත් කනප්පුව දෙදරිණි.

"මොකද මුදලාලි? තනියම කල්පනා කරලා කේන්ති උණ ද?"යි වැලිවල ඇසී ය: "තව ටිකක් ගන්න."

ඔහු බරන්ඩි බෝතලය මුදලාලිට දුන්නේ ය.

අතීතය නමැති අඳුරු ගුහාවෙහි වැදී අතපත ගාමින් උන් විහාරහේන වර්තමානය නමැති එළිමහනට පිවිසියේ ය. ඔහු වීදුරුවෙන් බාගයක් පිරෙන තරම් යළිත් බරන්ඩි වක්කරගෙන එක හුස්මට බීවේ ය. අනතුරු ව ඔහුගේ දෙඩීම නැවතුනි. සිතීම අඩු වී ය. අඩුවූයේ පෙර තරම් විවිධාකාරයෙන් සිතිවිලි නොනැ-ගෙන බැවිනි.

බැස ගිය අඩ සඳ ඇති අහසෙහි පළින් පළ වූ තරුවලින් නික්මෙන රැස් කැන්, රතු සායමින් පාට වුණු දිය කඳක් මැදින් බසින රිදී ඉදිකටු සේ අඳුර අතරින් බසියි. අඹ ගස්, සියඹලා ගස් අරලිය ගස් ආදියෙන් හෙවණ වුණු උයනෙහි ඈත කෙළවර අඳුර වඩාත් දැඩි වී ය. වියලුණු තණකොළයෙන් ද පොළොවෙන් ද අරලිය මලින් ද නඟින සුවඳත් සීත් දූවිල්ලත් ඇදගෙන එන වාතය ආශ්වාස කළ ඇතැමෙක් කිවිසින්ට වී ය. අතරක් නැතිව නඟින ගීතයක් සේ නික්මෙන පලා ගිරවුන්ගේ හැඬීම බල්ලකු ගේ බිරුම හඬ නිසා මොහොතකට නැවතිණ.

"පුතාට නවතින්ට දූන් කොළඹ ගෙයක් ඕනෑ නෙවවද?"යි වැලිවල ඇසුවේ ය.

"ඔවු ගෙයක් ගන්න තමයි ඉන්නේ" යි මුදලාලි පිළිතුරු දුන්නේ ය.

"ගෙයක් ගන්න ඉන්නේ කොයි පැත්තෙන් ද?"

"පුතා කියන තැනකින් ගන්නවා."

විහාරහේන සුරුට්ටුවක් පත්තු කොට දුම් වලා පිට කරයි. නැළවෙමින් නැඟී විසිරෙන දුම් වලා මෙන් ඔහුගේ සිතිවිලි ද නැඟී නැඟී අතුරුදහන් වෙයි.

විහාරහේනත් ඔහුගේ පුතාත් මවත් කොළඹ ලොක්කන් වාසය කරන පෙදෙසෙහි ලොකු බංගලාවක් වෙසෙති. ඒ ගෙයි ආලින්දයට ඇතුළු වන තැන කණුවෙහි විදුලි සීනුවක් වෙයි. ආලින්දය දෙරටුවට උඩින් වූ සිමෙන්ති වියන් තලය යටට පැමිණ නැවතුණු මොටෝරියෙන්, වටනා සාරියක් ඇඳ කැස්බෑ ලෙලි රාමුවක් සහිත කන්නාඩියක් ගත් ඉතා සුන්දර නැහැයක් හා වීදුරු ඇස් දෙක පිටිපසින් වූ උදර බැල්මෙන් එළිය වුණු තද නිල් පැහැ ඇස් දෙකකුත් ඇති කාන්තාවක් ද සීන් කයක් ඇති අහංකාර පිරිමියෙක් ද රථයෙන් බැස ආලින්දයට නඟිති. කාන්තාව වට පිට බලා කණුවේ සීනුවේ ඇණය ඔබයි. සුදු කමිසයක් ...

සරමක් හැඳගත් වැඩකාරයෙක් ආලින්දයට ගොස් අමුත්තන් කථාකරන්නටත් පෙර මෙසේ කියයි.

"දෙස්තර හාමුදුරුවෝ ගෙදර නැහැ. පහමාරටයි ආපසු එන්නේ."

"ගෙදර වෙන කවුරුවත් නැද්ද''යි කලිසන්කාරයා අසයි.

"මුදලාලි මහත්තයා ඉන්නවා.''

"අහා! මම කිවුවේ නැද්ද කොක්වත්තේ, උඹ මගේ පුතාගේ කකුල් දෙක ළඟට ගෙන්වනවාය කියා?' කියමින් විහාරහේන ආලින්දයට යයි.

බ්රැන්ඩි මතින් බැමෙන විහාරහේනගේ හිසෙහි දක්වෙන්ට වූ නාටකයකි මේ විස්තර කෙළේ. එය වූ කලී ඔහුට නොදනන සේ මීට අවුරුදු කිහිපයකට පෙර ඔහුගේ අඳුරු යටි සිතෙහි කිහිප වරක් දක්වුණු නාටකයකි. මෙතෙක් කල් ඔහුගේ යටි සිතෙහි මුළු-ගැන්නී සිටි ඒ සිතිවිලි නමැති නළුවන්ටත් නිළියන්ටත් විළිබිය දුර හැර රඟපෑමට ඉඩ කඩ ලැබුණේ අද ය.

සාලයෙන් එළියට ආ කඩියා විහාරහේනට ළංව ඔහුගේ මුහුණ බලා ඉව අල්ලා අනතුරුව කබලාන උන් තැන බිම වැතිර ඉස්සරහ ගාත් දෙක දිග හැර එහි හිස තබා ගත්තේ ය. විල්ලුද වැනි ලෝම පටලයක් ඇති දුවැන්ත බළලෙක් නැඟී වල්ගය උස්සා පිට නමා දත් විරිත්තා සර්පයකු මෙන් පිඹ කකුලක් කඩියා දෙසට දික් කොට සොලවා වහා පස්සට ගත්තේ ය. කඩියා හිස කෙලින් කොට සිනා සෙන්නාක් මෙන් නෙත් විදහා ගත්තේ ය.

තරුණ කතුන්ගේ සිනා හඬට අනතුරුව මාලින්ගේ කට හඬ සාලයෙන් නික්මිණ.

"මම කිවුවෙ ඇත්තේ කතාවක්—බොරු නෙවි.''

"අපි සිනාසුණේ ඒක බොරුය කියා හිතූ නිසා නෙවි.''

පළාගිරවුන්ගේ ගීතය යළිත් ඇසෙයි. පොළොවෙන් පිට වන උෂ්ණය වලා කුලින් තොර වූ අහසට වහා නැඟී විසිරෙන නිසා වාතය වඩාත් සිහිල් වෙයි. පාරෙහි ගමන් කළ දුවැන්ත මොටෝ-රියක නළා හඬ ඇසූ කඩියා හිස උස්සා කන් දෙක කෙළින් කොට ගත්තේය. උගේ දෙනාසාපුටු පිම්බිණ; හොටයෙහි මස් පිඬු නැටිණ.

"වික්‍රමනායක මහත්තයා. ඉතින් අපි යමු ද?''යි විහාරහේන තම යහළුවාගෙන් ඇසුවේ ය.

"යමු''.

විහාරහේන අසුනෙන් නැංගේ ය.

''කෝ දෙස්තර මහත්තයා ?''

සාලයේ උන් අරවින්ද නැගී පියා වෙතට ගියේ ය.

''අපි අද නවතින්නේ නැල්සන් හෝටලේ-උඹට ඒ හෝටලේ මදි නෙව.''

''තාත්තා වික්‍රමනායක මහත්තයාත් එක්ක ඒ හෝටලේ නවතින්න. අද රෑ මම මාලින් එක්ක මෙහේ ඉඳලා හෙට තාත්තා එක්ක ගමට යනවා.''

''අම්මා උඹ එනකල් මග බල බලා ඉන්නවා ඇති........

''අම්මා එක්ක නාවේ ඇයි ?''

''අම්මා කොහේ එනවද''යි කියමින් විහාරහේන දයාබර සිනාවක් පහළ කෙළේ ය.

පිටිසර වාසයට පුරුදු වුණු තම බිරිඳ එක රැයක් පවා නැවතීමට නගරයට එන්ට හොඳටම අකැමැති බව විහාරහේන මුදලාලි දනී. කොළඹ පදිංචි වීමට ඈ කැමැති කරවා ගත යුත්තේ පුතා විසිනි.

''හෙට එනවාය කියා අම්මාට ටැලිග්‍රාම් එකක් ගහන එක හොඳයි නෙව ?''

''ලියා දුන්නොත් දූන් යන ගමන් ඒක තැපැල් කන්තෝරුවට දෙන්න පුළුවනි'' යි විහාරහේන කී ය.

''තාත්තා යන්න. මාලිනුයි මමයි දූන් ජැටියට යනවා. අපේ බෑග් ගෙනෙන්න. ජැටියට යන ගමන් අපි ටැලිග්‍රාම් එක යවන්නම්.''

Scanned by CamScanner

# 4

පියා සමඟ උයන් දොරටුව තෙක් පයින් ගමන් කළ අරවින්ද ආපසු ඇවිත් සාලයට ඇතුළු වී ය.

''තාත්තා ගියා ද?'' යි නාලිකා කබලාන ඇසුවා ය.

අරවින්ද උත්තර නුදුන්නේ ය. තම පියා නික්ම ගියේ ආලින්දයෙහි උන් සියල්ලන්ටම ආචාර කිරීමෙනි. නාලිකා සාලයෙන් එළියට නොගිය බැවින් ඔහු ඇට ආචාර නොකෙළේ ය. නගරයේ ඉහළ සමාජය නුහුරු ගැමියකු වූ තම පියා සිනාවට ඉලක්ක කරන අදහසින් ද නාලිකා කබලාන 'තාත්තා ගියාද?' යි තමාගෙන් ප්‍රශ්න කෙළේ? ඈ ඔහු නික්ම යනු නුදුටු නමුදු දනියි. ඔහු සාලයට ගොස් නාලිකා කබලානට තුති පුද යා යුතු වී ය. ගැමියකු වූ ඔහු එසේ කිරීම, තම සතු යුතුකමක් බව නොදනියි. ඔහු දන්නේ ඔහු ඇසුරු කරන ගැමි සමාජයේ හොඳ සිරිත් මිස නගරයේ ඉහළ සමාජයේ හොඳ සිරිත් නොවේ. ගම්වලට ගොස් ගැමි සිරිත් කඩ කරන ඉහළ සමාජයේ ගැහැනු සිනාවට භාජන නොවෙති. හැඳි ගැරුප්පු භාවිතා කරන්නන් සමඟ කෑමට මේසයට වාඩි වන ගැමියා හැඳි ගැරුප්පු හරඹය කරන්ට වෑයම් කරයි.

අරවින්දගේ සිතට මේ සිතිවිලි නැංගේ නාලිකා කබලාන ''තාත්තා ගියා ද?'' යි ඇසූ නිසාම නොවේ. තමා කොළඹ නැවතී උගන්නා කාලයෙහි නගරයේ සමහර ස්ත්‍රීන් ඇතැම් විට දැනගෙන ද ඇතැම් විට නොදැන ද තමා සිනාවට ඉලක්ක කළ සැටි-සිහි වූ බැවිනි. තමා ගැමියෙක්ය යන දැනුම නිසා උපදින දීන හැඟී-මෙන් ඔහු එකල නිදහස් නොවී ය. ඒ හැඟීම ඔහු කෙරෙන් දුරුවූයේ එංගලන්තයේ වාසය කළ අවදියෙහි ය.

නාලිකා කබලාන අනුන්ගේ සිත් රිදවීමෙන් සන්තෝෂ වන අහංකාර ගැහැනියක් යයි අරවින්ද කල්පනා කෙළේ ය. එහෙයින් ඇගේ සිත රිදවීමට අවස්ථාවක් ලැබුණොත් එයින් ප්‍රයෝජන නොගතයුත්තේ කුමක් නිසා ද?

''දැන් ලංකාවේ ගෑනු ඉස්සර වගෙ එංගලන්තෙට යන්නේ නෑ නෙව ද?''යි නාලිකා ඇසුවා ය.

''නොයන එක නුවණට හුරුයි'' අරවින්ද කී ය.

''නුවණට හුරුයි!''

''ඔව්; දැන් ලන්ඩන් නුවර පිරිමි නැති පිට රට ගෑනු හතළිස් දහක් පමණ ඉන්නවා.''



Scanned by CamScanner

''පිරිමින් නැති ගෑනුය කියන්නේ කාට ද?''යි නීලා ඇසුවා ය.

''මොකටද අරවින්ද හංග හංගා කතා කරන්නේ? දූන් අලුත් පන්නෙට හැදෙන ගෑනු ඒවා ඔක්කොම දන්නවා''යි කියමින් මාලින් තරුණ කතුන් දෙස බලා සිනාසුණේ ය.

''අරවින්ද පිරිමින් නැති ගෑනුන්ය කීවේ ගණිකාවන්ට.''

මාලින්ගේ මව කර බාගනු දුටු අරවින්ද, යටි සිතින්, සන්තෝෂ වී ය.

''ගණිකාවන් හතළිස් දහක් ඉන්නවා!''යි චමරී විස්මයෙන් තෙපලා ය.

''හතළිස් දහම ගණිකාවන් නෙවී. හුඟක් දෙනෙකුට රස්සාවක් නැහැ. ඔවුන්ගෙන් වැඩි දෙනා යුද්ධ කාලේ පිටරටින් එංගලන්තෙට ආපු ගෑනු. සමහරු හෝටල්වල රක්සාව කරනව.''

''ගෑනුන්ගේ වගතුග කවි බසින් කියා සන්තෝෂ උණු කාලේ පහු ගියා'' යි මාලින් කී ය.

''ඒ එංගලන්තෙ—මෙහේ නෙවී''යි කියමින් නීලා සිනාසුණාය.

''මෙහේ නම් ගෑනුන්ගේ වගතුග තාම කියන්නේ කවියෙන්මයි. කසාද බඳින කොට සුබ සෙත් පතන්නෙ කවියෙන්. තරුණියකට ලියුමක් යවන්නෙත් කවියෙන්''යි චමරී කීවා ය.

නාලිකා නැඟී අලුත් අමුත්තන් කිහිප දෙනකු පිළිගැනීමට ආලින්දය දෙස බැලුවා ය.

''අපි පැටියට යන්නත් එක්ක කලින් එන්නයි හිටියේ'' කියමින් මදිරා දෙමාලසිංහ නෝනා සාලයට ඇතුළුවූවා ය.

''මාලින් ලංකාවෙන් යද්දිට වඩා ටිකක් උස ගිහිල්ලා තියෙනව''යි කියමින් ඈ මාලින් දික් කළ අත තර කොට අල්ලා ගත්තා ය. රත් අඳුන් ගාන ලද ඇගේ දෙතොල් විවරය අතරින් මුතුවන් දත් පෙනිණ. කන්පෙති අලංකාර කරන දියමන්ති අරුංගල් දෙක දිලිණ.

''මේ අරවින්ද විහාරහේන''යි කියමින් ඔහු තම යහළුවා මදිරාට හඳුන්වා දුන්නේ ය.

මාලින්, මල්ලිකා දෙමාලසිංහට ආචාර කෙළේ ඇගේ අත මිරිකමිනි. එංගලන්තයට යද්දී කුඩා දැරියක සේ උන් මල්ලිකා දූන් පුන් පියයුරු සහිත ළය ද සිනා රැඳි පැසුණු දෙතොල ද බැබළෙන කොපුල් ද ඇති සුන්දර තරුණියකි.

''ගෑනුන්ගේ වගතුග කවි බසින් කිව කාලේ පහු ගියා'' යයි මාලින් අයියා කියනවා. අපි කිව්වා එංගලන්තෙ මිසක් මෙහේ

නෙවිය කියා. මලී කියන්න, මගේ කීම හරිද වැරදි ද?''යි චමරි ඇසුවා ය.

''හරි!''

''කොහොම ද හරි වෙන්නේ? මල්ලිකාටත් එහෙනම් කවි-යෙන් ලියූ ආදර හසුන් ලැබෙන්ට ඇති!''

''ජැටියට එන්ට බැරි උණේ මන්ද''යි නාලිකා කබලාන මදිරා දෙමාලසිංහ නෝනාගෙන් ඇසුවා ය.

''මහත්තය ගෙදර ආවේ ප්‍රමාද වෙලා; නැති නම් මටත් මල්ලිකාටත් කල් ඇතිව එන්න තිවුණා.''

''මට හොඳ කතාවක් මතක් උණා''යි අරවින්ද කී ය. ''ඒක ඇන්ටන් චැකෝෆ් නමැති රුසියන් ලේඛකයාගේ නාටකයක එන පුවතක්. අපි ඒ නාටකය එංගලන්තෙදී දැක්කා; මාලින්ට මතක ද?

''චැකෝෆ්ගේ ඒකාංක නාටකය ද?''

''ඔව්.''

''කියන්න—කියන්න; ඒක මේ නෝනාමහත්තැනුත් අහන්න ඕනෑ කතාවක්.''

''මැද පන්තියේ තරමක් පොහොසත් මිනිහෙක් උන්නා''යි අරවින්ද කථාව කියන්ට පටන් ගත්තේ ය. ''එයාගේ නෝනා එයාට බොහොම ආදරෙයි. හදිසියේ මහත්තයා මැරුණා. නෝනා කොපමණ කණගාටු උණාද කිවුවොත් කාමරෙන් එළියට බහින්නෙ නැතිව කළු ඇඳගෙන උන්නා. මැරුණ මහත්තයට ණය දුන් මිනිහෙක් මරණෙ ගැන දැනගෙන ආවා ණය අයකර ගන්න. වාඩකාරයා කිවුවා ''මහත්තය මැරුණට කණගාටුවෙන් නෝනා කළු ඇඳගෙන කාමරෙන් එළියට බහින්නේ නැහැ. කවුරුවත් එක්ක කතා කරන්නෙත් නැහැ කියා.''

''ආ එහෙම ද?'' යි අසමින් ණයහිමියා හිස සලා සරදම් කරා. ''කමක් නැහැ. නෝනාට ගිහින් කියාපන් මැරුණු මහත්තයාට ණය දුන් මහත්තයෙක් ඇවිල්ලා ඉන්නවාය කියා.''

''අපොයි! මට බැහැ'' යි වැඩකාරයා කිවුවා.

''බොට බැහැ, නෙවා? බොට මම බැරි කරනවා''යි කියමින් ණය හිමියා තර්ජන කරා.

වැඩකාරයා කාමරේට ගොහින් බියෙන් ගැහෙමින් ආ පසු ඇවිත් මෙහෙම කිවුව; 'මහත්තයා මැරිලා සුමාන දෙකක් ගියේ නැහැ; තාම කාමරෙන් එළියට බැස්සේ නැහැ; කවුරුවත් එක්ක කතා කරන්නෙත් නැහැ; ගොහිල්ලා වෙනින් දවසක එන්න ය.''

Scanned by CamScanner

"මහත්තයා මැරුණාට තාම කණගාටු වෙනවා! ත්ම— හරිය අපි දන්නවා. ගොහින් කියාපන් ණය මුදල් ගෙවන ක මෙතනින් මම යන්නෙම නැත කියා."

ණයහිමියා හරිබරි ගැහී වාඩිවෙලා කකුල් දෙකක් දිග ඇ ගන්නවා.

වැඩකාරයා යළිත් කාමරේට ගොහින් ඇවිත් කියනවා "නෝනා කියනවා කරුණාකරලා වෙනින් දවසක එන්න කවුරුවත් එක්ක දැන් කතා කරන්නේ නැත කියා."

"කොහෙත්ම යන්නේ නැහැ; ගිහින් කියාපන් අද මම මෙත නවතිනවා මිසක් යන්නේම නැත කියා!"

කළු ඇඳගත් නෝනා, බැරි තැන කාමරෙන් එළියට එනවා ණයහිමියා ඉතා ඕනෑකමින් නෝනා දිහාව බලනවා. නෝනා ලස්සණයි.

'මහත්තයා මැරුණාට කළු ඇඳගෙන ගෙයින් එළියට බහින්නේ නැතිව කණගාටු වෙනවා. ඒකට මොකද මූණෙ පූයර දමන්න නම් මතක නැති කරලා නැහැ!''යි කියමින් ඔහු මුහුණට ඇඟිල්ල දික් කරනවා.

නෝනා තරහවෙලා 'නෝබිනා කතා කියන්න එපා' කියනවා

"නෝබිනා කතා නෙවි; ඇත්තෙ කතා!''යි ණය හිමියා උත්තර දෙනවා.

"අපට සරදම් කරන අදහසින් මේ කියන්නේ සිතින් ගොතා ගත් බොරු කතාවක්''යි කියමින් චමරී සිනාසුණා ය.

"මම කියන්නේ මම දැක්ක නාටකයක විත්තියක්. මම ඒක ඉක්මනට ඉවර කරන්නම්. නෝනයි මහත්තයයි දිගින් දිගට බහින් බස් වෙනවා. ණයකාරයා මහා අමාරු කාරයෙක්. නෝනා ගේ තරහත් ටිකින් ටික අඩු වෙනවා; කට කොනට සිනාත් නඟි නවා. ණයකාරයාත් කතා කර කර ටිකින් ටික නෝනාට ළං වෙනවා; ඇහෙත් හැපෙනවා. ණයකාරයා මෙහෙම කියනවා 'මුකුළු සිනා, නිල්වන් ඇස්, රතු තොල්, නැලැවිල්ලේ කරන කතා කෙදිරිය, හෙළන සුසුම්, හඳපාන, පට දුහුල් ආදියට රැවටෙන මිනිහෙක් නෙවි මම. මම ගෑනු දහතුන් දෙනෙක් විවාහ කරගත් මිනිහෙක්! ඒගොල්ලන්ගෙන් හත් දෙනෙක් මම හැර දමා වෙන මිනිස්සුන් එක්ක ගියා. අනිත් හදෙනාම මට එපාවෙලා මම හැර දැම්මා."

අරවින්ද, සිනා හඬ නිසා තමා කී කතාවත්, ඒ අනුව පෑ අභ දහරත් නැවැත්වී ය.

"නාටකය අවසාන උණේ කොහොම ද?''යි නීලා ඇසුවා

Scanned by CamScanner

"මේ ළමයින්ට නෙව මේවා හාරා පාරා බලන්න හිතෙන්නේ" යි වැලිවල නෝනා කීවා ය.

"නාටකය අවසාන වන්නේ නෝනාත් ණය හිමියාත් කසාද බැඳීමෙන්!"

"ඔය නාටකය අවුරුදු ගණනකට ඉස්සර වයි.එම්.සී. එකේ නාටක මණ්ඩපයෙහි පෙන්නුවා වගේ මට මතකයි. මමත් බලන්න ගියා. ඊ. සී. බී. විජේසිංහ තමා ඒකේ ණය හිමියාට ආවේ" යි සරලා කීවා ය.

"ගැනුන්ගේ වගතුග දූන් කවියෙන් කියන්නේ නැහැ යි යන කීමට ඔය නාටකය නිදර්ශනයක් වෙන්නේ කොහොම ද?" යි චමරි ඇසුවා ය.

මාලින් තම යාළුවා වෙනුවෙන් පිළිතුරු දුන්නේ ය.

"නිදර්ශනයක් නොවෙන්නම්. කවියෙන් කියන ඒවාට රැවටෙන්නෙක් නෙවි යයි ණයහිමියා කිවුවා. ඉතින් අර නෝනා කැමති උණෙත් ඒ මහත්තයාටයි!"

සුවඳ විහිදෙන කානේෂන් මල් බඳුන් සහිත ලැකර් සායමින් ඔප නගන ලද මේසය වටා රැ කෑමට දෙළොස් දෙනෙක් වාඩි වූ හ. සුප් පිඟන් සිස් කළ වහාම මාලින් හා අරවින්ද බත් හා එලවුළු ද මාළු ද ගෙන්වාගෙන කන්ට වූ හ. ඔවුන් අන්‍යයන් අනුගමනය කරමින් මස් පිඟන් හා මාළු පිඟන් නොකෑම, නාලිකාගේත් සවිමත් කබලාන ගේත් සන්තෝෂයට හේතු නොවී ය.

"එංගලන්තෙදි බත් කෑවේ ඉතාම කලාතුරකින්" යි මාලින් කීවේ ය. "අපි දෙන්නා අද බත් කන්නේ වැද්දන් කන්නා වාගේ."

මාලින් හා අරවින්ද, වැඩකාරයන් අතින් ආ ව්‍යංජන දීසි හා මාළු දීසි ද හිස් කළෝ ය.

"නොකිවුවත් මේ දෙන්නා වැද්දන් වගේ තමයි අද කන්නේ" කියමින් වැලිවල නෝනා හොඳටම සිනාසුණා ය.

"අපි මහන්සි ගන්නේ වැද්දන් වගේම කන්නයි" අරවින්ද කී ය.

ඔවුන් දෙන්නා වැද්දන් වන්ට තැතනීම සෙල්ලමක් කොට සැලකූ කාන්තාවෝ සිනාසුණෝ ය. ඔවුන් වැදි වෙස් ගනු බලා සිටි කබලානගේ සිතට නැගුණේ බියකි. මොවුන් ටික කලකින් විප්ලව වාදීන්ව පෙරළි නොකරති යි කිව හැකි ද? හැම දෙනා ම කරන දේ කිරීමෙන් ඔවුන්ට සන්තෝෂ විය නො හැකි ය. නීතියට රීතියට හා සමාජ සිරිතට ගරුකරන්නෝ නම් ඔවුහු හාමත් වූවන් ලෙස මෙසේ බත් ගිල දැමීමට බිය වෙති; ලජ්ජා වෙති.

Scanned by CamScanner

මොවුන් විප්ලවවාදීන් වන්නේ එංගලන්තයෙහිදී ලැබූ උගැන් මත් ඇසූ දුටු දේත් නිසා නොවේ ය යි සිතීමට තරම් සාධාරණ බුද්ධියක් කබලානට නැති ය. එංගලන්තයෙහි දී ඔවුන් ලැබුවේ අදීනව සිතන්ට අනුබල දෙන උගැන්මකි. අදීනව සිතා නිර්භය ඒ සිතුම් කීමට එංගලන්තයේ වටාපිටාව ඔවුන්ට අනුබල දුන්නේ ය. වෙනස් නොවන අතීතයක් එංගලන්තයේ ජනයාට නැති ය. එහි විද්‍යා කලා ශිල්ප හා සිරිත් විරිත් සතියෙන් මසින් දෙමසින් තුන් හාර මසින් වෙනස් වෙයි.

''මේ ළමයින්ට බත් කන්න ආසා ඇති නෙවැ. තව බෙදා ගන්න'' යි වැලිවල නෝනා කීවා ය.

''බත් කන්ට අපි මේ පටන් ගත්තා විතරයි!''

''එහෙනම් තව හුඟාක් කන්ටයි හිතාගෙන ඉන්නේ!'' යි දෙමාලසිංහ නෝනා කීවාය.

''නැතුව-''

''අපිට නම් දැන් බත් ඕනෑ නෑ''යි කියමින් නාලිකා කබලාන පිහියත් උඩු අතට හැරවූ ගෑරුප්පුවත් පිඟානෙහි තැබුවා ය.

''අම්මා රට බත් නොකන එක හොඳයි නෙවැ!''යි මාලින් තමා ළඟ පුටුවෙහි උන් මල්ලිකාට පමණක් ඇසෙන සේ කීවේ ය. ''බත් කකා නිකම් ඉන්න කොට හුඟක් මහත් වෙනවා!''

මල්ලිකා සිනාසුණා ය.

''ගෑනු මහත් වෙනවට මාලින් කැමති නැති හැඩයි!''

''කැමති නැහැ''යි කියමින් මාලින්, මල්ලිකාගේ මුහුණත් උඩුකයත් දෙස බැලී ය. ''මල්ලිකා මහත නැහැ. මහත ගෑනුන්ට මම ටිකක් බයයි!''

''අම්මා කියන්නේ මම කෙට්ටු වැඩියි කියා.''

''නැහැ''

''බත් කෑවාම මහත් වෙනවා නම් සිංහල මිනිසුන් තරබාරු මිනිසුන් වෙන්න එපා ය.''

''අපි දෙන්නා අද කන්නා වාගේ කෑවොත් ඔක්කොම තරබාරු වේවි. සිංහල මිනිස්සුන්ගෙන් සියේට පනහකට බඩ පිරෙන්න බත් වත් ලැබෙන්නේ නැහැ.''

මාලින් සහ අරවින්ද බත් කෑම නැවැත්වූයේ පුඩිම අතින් ගත් වැඩකාරයා මදිරා දෙමාලයිංහ නෝනාට ළංවූ පසු ය.

# 5

"අපේ පරණ පෝඩ් කාර් එක විකුණා අලුත් කාර් එකක් අද ගන්න පුළුවන් ද?"

නැල්සන් හෝටලයේ රැය ගතකළ විහාරහේන, උදේ තේ බීමට වාඩි වූ වහාම ඇසුවේ මේ ප්‍රශ්නය ය.

මිනිසුන් පමණක් නොව නගරය ද නින්දෙන් අවදි වූවකු මෙන් රැයෙහි පැවති නිසන්සලය දුරු කෙළේ ය. දුම්රිය ඝෝෂා-වත් මොටෝ රථවල ඝෝෂාවත් ඇසෙයි. කන්තෝරු බලා යන ලිපිකාරයන් පා නඟා තබන හඬ ඇසෙන්නේ ගමන් ගත් සේනාවක් එක වර පා තබන විට නඟන හඬක් ලෙසිනි. බිත්තර බේකන් බැදෙන හඬට කන් දුන් වික්‍රමනායක තලු මරමින් එහි සුවඳ ඇසුවේ ය.

"අලුත් කාර් එකක් ගන්න එක හොඳයි. අලුත් කාර් එකකට අද මුදල් ගෙවන්න පුළුවනි. නමුත් ඒකෙන් අද අපට යන්ට ලැබන්නේ නැහැ" යි වික්‍රමනායක කීවේ ය.

"අදම ගමට යන්ට බැරි නම් මොකට ද කාර් එකකට සල්ලි ගෙවන්නේ?"

"අපට මෙහෙම කරන්න පුළුවනි. සල්ලි ගෙවා උන්ට අපි කියනව දෙණියායට කාර් එක එවන්නය කියා. ටිකක් පාවිච්චි කරපු අලුත් කාර් එකක් ඉල්ලා ගෙන අපි ගමට යමු. අලුත් කාර් එක එවුවාම පරණ කාර් එක ආපසු අරින්න පුළුවනි."

"ඒකට උන් කැමතිවේවි ය?"

"උන් කැමති වේවි. මොකක් ද ගන්න කාර් එක?"

"මිල වැඩි උණත් හොඳ වාං කාර් එකක් ගන්න ඕනෑ."

මුදලාලි හිතා හිටියේ ගෙයක් තරම් ලොකු සැලූන් රථයක් ගන්ටයි. මානයෙන් පිම්බුණු බඳ ඇති ඒ ලොකු කාර්වලට පුතා කැමැති නොවී ය. ඔහු යෝජනා කෙළේ හොඳ වාං ඉංග්‍රීසි කාර් එකකි.

"ලොකු සැලූන් කාර් එකක් ගන්න දෙස්තර මහත්තයා එපයි කිව්ව ද" යි වික්‍රමනායක ප්‍රශ්න කෙළේ ය.

"ඔව්" යි කියමින් මුදලාලි තේ කෝප්පය අතට ගත්තේ ය.

"මුදලාලි බිත්තරේත් බේකන් කෑල්ලත් කන්නේ නැද්ද?"



Scanned by CamScanner

''නැහැ''.

''එවටත් මුන්ට සල්ලි ගෙවන්න ඕනෑ''යි කියමින් වික්‍රමනායක බිත්තරයත් බෙකන් කෑල්ලත් තමාගේ පතෙහි දමාගත්තේ ය.

''මම ඊයේ පිටත් වෙන්න ඉස්සර දෙස්තර මහත්තයාගෙන් ඇහුව. එයා කැමති හොඳ ඉංග්‍රීසි කාර් එකකට. ඇමරිකන් සැලූන් කාර්වලට එයා කැමති නැහැ.''

අරවින්ද උදේ දහයට පමණ නැල්සන් හෝටලයට ආවේ ය. 'සන්බීම්' රථයක් ගැනීමට වික්‍රමනායකත් පියාත් කරගත් තීරණය ඔහු අනුමත කෙළේ ය. රථයට මුදල් ගෙවූ ඔවුන්ට ඒ වර්ගයේම අනික් රථයක් ගමට යනු පිණිස ලැබුණේ ය.

''අලුත් කාර් එක සතියකින් දෙණියායට එවනව'' යි සුද්ද පොරොන්දු වී ය.

''කබලාන මහත්තයලයි ගෙදරට ගොහින් කියලා යමු ද?''යි රථයට නැගුණු මුදලාලි ඇසුවේ ය.

පියා ඒ යෝජනාව කෙළේ කුමක් නිසා දැයි අරවින්දට නොවැටහිණ. චමරිගේ සිත තමා කෙරෙහි ඇද්දීමේ අදහසින් පියා ඒ යෝජනාව කෙළේදැයි ඔහු සැක කෙළේ ය. ධනවතකු ද ලොක්කකු ද වන කබලානගේ දුව හා තමා ද විවාහ වනු දැකීමට පියා ආසා කරතොත් එය පුදුමයට කාරණයක් ද? මේ වර අනෝමා මැදුරට නොයා යුතුයයි අරවින්ද තීරණය කෙළේ ය. අලුත් රියෙන් මේ අවස්ථාවෙහි එහි ගිය හොත් නාලිකා කබලාන මෙසේ සිතන්නේ නැතැයි කිව හැකි ද? 'මුදලාලි පුතාත් එක්ක ආයින් ආවේ අලුත් 'සන්බීම්' කාර් එක අපට පෙන්නලා යන්න!' ළමා කාලයේ නගරයේ නැවතී උගත් අවධියෙහි අරවින්ද තමාගේ ගැමිකම සිහි කොට සිතින් වේදනා වින්දෙකි.

''නැහැ! අපි කෙළින්ම දෙණියාය බලා පිටත් වෙමු''යි අරවින්ද කී ය.

කබල් ෆෝඩ් රථයෙහි ඇන්ජිම තනන ගෝසාවත් බදින් නැගෙන කබල් බෙලෙක් හඬත් අසමින්, මුළු කයම සොලවන ගැස්සීම ඉවසමින් මෙතෙක් කල් ගමන් බිමන් ගිය විහාරහේන මුදලාලි මේ වර අලුත් රථයෙන් ගමන් කෙළේ අපමණ සන්තෝෂයෙනි. අලුත් රථයේ මුදු සුමුදු ගමන නිසා මුදලාලිගේ සිත ද කය ද නැළ වෙයි. හොඳ අලුත් රථයකින් ගමන් කිරීමෙන් මෙතරම් සැනසිල්ලක් හා සුව පහසුවක් ලැබෙතියි විහාරහේන මීට පෙර නොසිතු වේ ය. කබල් රථයෙන් දුර ගමනක් ගිය විට ඔහු රථයෙන් බැස්සේ අවුල් වුණු හිස ද ඇවිසුණු කෝපය ද ඇතිව ය. එ

ඇන්ජිම නැඟූ ගෝසාවත් රිය බඳින් නැගුණු දත් හිරිවටවන කබල් බෙලෙක් හඬත් ඉවසීමේ ප්‍රතිඵලයකියි මුදලාලි කිසි විටක නොසිතුවේ ය.

"දෙස්තර මහත්තයා දැන් ඉතින් කොළඹ පදිංචි වෙන්ට ඕනෑ නෙව ද?"යි වික්‍රමනායක ඇසුවේ ය.

"ඔව්."

"එහෙනම් කොළඹින් ගෙයක් ගන්ට ඕනෑ නෙව?"

"ටික කලක් මට ගෝල්ෆේස් හෝටලේ නවතින්න පුළුවනි."

"මොකට ද හෝටලවල නවතින්නේ"යි මුදලාලි කී ය. "අපි කොළඹින් ගෙයක් ගන්නවා; වික්‍රමනායක උන්නැහේ සොයන්න හොඳ ගෙයක්. ටිකක් වැඩි උණත් කමක් නැහැ."

"වැඩිය නොදී මේ දවස්වල ගෙවල් ගන්න බැහැ."

"කීයක් උණත් කමක් නැහැ."

ගෝල්ෆේස් හෝටලයේ ටික දවසක් නැවතීමට අරවින්ද කළ යෝජනාව ගැන පියා සිතුවේ සංවේගයෙනි.

වැළ නොකඩා කොළඹ බලා දිවෙන රථ පසු කරමින් වේගයෙන් පැදෙන රථය මොරටුව පසු කෙළේ ය. පඳුරුවලින් සෙවණ වුණු ඉවුරු ඇති, වක් වූ තැන් බහුල නදියෙහි පාලම අසල වන මාළු කොටු, දිය කඳ රඳවනු පිණිස නදිය හරහා, තනන ලද පවුරක් වැන්න. අව්වෙන් කැකෑරෙන ජලය, කළු පාට මඩ වගුරක් මෙන් උකු ය. ඉවුරු දෙපැත්තේ ගොඩගසන ලද දුවඩුවලින් නගින පල් ගඳ ඇද ගෙන සුළඟ හැමී ය.

මොරටුව දුටු අරවින්දට තමා කොළඹ නැවතී උගත් අවධිය සිහි වී ය. ඔහු ඒ කාලය තුළ යහළුවන් සමඟ මොරටුවට කිහිප වතාවක් පැමිණියේ ය. දවසක ඔහු හවස්වරුවේ යහළුවකු සමග ඇඳිත් මොරටුවේ දුම්රිය පළෙන් බැස්සේ ය. දුම්රිය පළෙන් එළියට ගොස් අතුරු පාරෙහි ගමන් කළ අරවින්ද මහත් කොට හඬ නඟා උගුර පැදුවේ ය. ඔවුන් ඉදිරියෙහි ගමන් කළ තරුණ කාන්තාවක්, වේදනාවෙන් තවනු ලැබූ මුහුණක් දක්වමින් අරවින්ද දෙස පිළිකුල් බැල්මක් හෙළුවා ය.

අරවින්දගේ මුහුණ විළියෙන් හැකිළිණ. යුරෝපියන් අනුකරණය කිරීම එකල මහත් කොට සැලකූ අරවින්ද තමා උගුර පැදීමෙන් කෙළේ වල්කමක් ය යි සිතුවේ ය. විනීත කාන්තාවක වූ ඇගෙන් පාඩමක් උගත යුතු ය යි සිතූ ඔහු කර බාගෙන ගමන් කෙළේ, මින් මතු ඒ පුරුද්ද මැඩීමට කරගත් අධිෂ්ඨානයෙනි.

පාලමින් එගොඩ වුණු රිය වංගුවට ළඟාවත්ම පාර අයි උන් එළදෙනක් පාර මැදට පැන්නා ය. රියකරු වහාම රිය හ බරේක් තද කෙළේ ය. රියෙහි උන් තිදෙනාම ගැස්සී උඩ ගෙ යළිත් අසුන්වල වැටීමෙන් තුවාල නොවී බෙරුණේ අත්ව හසුවුණු දේ තරකොට අල්ලා ගැනීමෙනි.

"යන්තම් බේරුණා!"යි වික්‍රමනායක කී ය.

"හයියෙන් එලවන්න එපා"යි විහාරහේන කී ය. "හයියෙ ගියත් අපට රැවෙන්න ඉස්සෙල්ලා දෙණියායට යන්න බැහැ."

එගොඩඋයනේ සිට පානදුරය වන තෙක් පාර දෙපැත්තෙහි පොල්, දෙල්, කොස්, සූරිය, වල්බෙලි, දෙඹ, කදුරු ආදි ගස් ද ගස් යට වැවුණු වල් පඳුරු ද ඇති හිස් බිම් දුටු අරවින්දට සිහිවූ මූකළානක් මැදින් වැටුණු පාරකි. දකුණු පැත්තෙහි අහස ක්ෂිතිජය ද පොල් රුප්පා අතරින් පෙනෙන්නේ මුහුදෙහි දිය ලෙසිනි. පාර දෙපැත්තෙහි ගෙවුයන් වටා බැඳි ඇතැම් පැළඉ වැටවල ඉතිහාසය කීමට මෙන් නැඟී සිටි ලොකු ගස්, පාර දෙපැත් සෙවණ කරයි. පානදුරයට පිවිසි අරවින්ද දුටුවේ පෙර නුදුටු වි ලොකු ගෙවල් ඇති දියුණු වූ නගරයකි.

පානදුරය අරවින්ද එතරම් දැක පුරුදු නගරයක් නොවී ය විහාරහේන මුදලාලිට නම් එය දෙණියාය මෙන් පුරුදු රටකි.

පාලම් හතරත් ගඟත් මුව දොර වූ සුදුවැලි තලාත් කලපුව නිසා කළුතර ඉතා දැකුම්කළු නගරයක් වෙයි. පාලම කෙළව පාර අයිනේ පිහිටි බෝ ගසත් බෝ මළුවත්, විහාරස්ථානය වැන්න. විහාරහේනගේ රියැදුරා ද රථය නවත්වා සත දහය පින් කැටයට දමා බෝ ගසට වැන්දේ ය.

ඔර්ලෝසු කණුව ද ඕලන්දයන්ගේ කාලයෙහි තනන ගෙවල් ද කඩ වීදියෙහි අසුන්දරත්වය මඩිමින් බැබළෙන ස්මාරක යක් වැන්නායි අරවින්ද සිතුවේ ය. බේරුවල පහන් කණුව මුහුදු වතුර බීමට දික් කළ, වක් වූ හොටක් වැනි බිම කඩක් සුළඟ ලෙලෙන මුදුන් ඇති පොල්ගසුත් ආදි යුගයෙහි පොළොවේ උදරය තුළ වූ මහා කම්පනයන් සිහි කරවනු ගල්කුළුත් මු තීරයෙහි තමා දුටු සුන්දර දැකුම්වලින් එකක් ය යි අරවින්ද කල්ප කෙළේ ය.

පොල්ගසින් සෙවණ වුණු ඉවුරු ඇති බෙම්තොට ගඟ ගෝ වක් නොනඟා සෙමින් පාලම යටින් ඇදෙයි. ඒ දිය කඳ අයිනෙහි වූ පොල් රුප්පා සහිත බිම්තීරයටත් මුවදොර හ ද්වීපතක් සේ නැංගාවූ පඳුරු සහිත වැලි කන්දටත් අතරින් ගෙ මුහුදට වැටී කරදිය රළ මඩිමින් වටාපතක් සේ විසිරෙයි.

Scanned by CamScanner

"අලුත්ගම වැඩිය අලුත් වෙලා නැ"යි වටපිට බලන්ට වූ අරවින්ද කී ය.

"යුද්දෙ හින්ද කොළඹ ටිකක් වෙනස් උණා. නගරවලට වඩා වෙනස් උණේ සමහර ගම"යි වික්‍රමනායක කී ය. "කටුකුරුන්ද පැත්ත හුඟාක් වෙනස් උණා. ඔක්කොටම වඩා වෙනස් උණේ කොග්ගල තමා."

"දැන් අපි යන්නේ කොග්ගල පහුකරගෙන ද?"

"ඔව්. තාත්තට මාතරට යන්න ඕනැ නිසා අද අපි දෙණියායට යන්නේ මාතරින් හැරිලා. අපට කොග්ගල බලන්ටැකි."

"දෙණියායත් වෙනස් වෙලා ද?"

"ඔව්, ටිකක් වෙනස් වෙලා. දැන් පැල්මඩුල්ලේ ඉඳලා කාර් වලින් කෙළින්ම දෙණියායට එන්න පාරක් තියෙනවා."

"අපේ ගේත් වෙනස් වෙලා"යි කියමින් මුදලාලි සිනාසුණේ ය.

"ගේ කඩාලා හැදෙවුවා ද?"යි අරවින්ද ඇසුවේ ය.

"ඔව්—සම්පූර්ණයෙන් කැඩුවේ නැහැ. බාගයක් විතර කඩාලා හැදෙවුවා."

ගංඉවුර දෙපැත්තෙහි වූ කඩොල් කිරල ගස්, පොල්ලෙලි කොටු හා ගහ පළින් පළ වූ ඔරු ද අරවින්ද එතරම් දැක පුරුදු දේ නොවී ය.

මොරටුව පසු කළ තැන් සිට විහාරහේනගේ මොටෝරථය පසු කොට කොළඹට හෝ මාතරට හෝ ගමන් කරන මොටෝ රියවල ගණන ඩෙහෙවින් අඩු වී ය. එහෙත් ඔවුන්ට හමුවන බක්කි කරත්ත, බරකරත්ත ආදිය ගණනින් වැඩි වෙයි.

කොස්ගොඩ සිට අම්බලන්ගොඩ තෙක් වන මහා පාර දෙපැත්තෙහි ලොකු කුඩා ගල් කුළු සහිත කඳු ගැට බහුල වූයේ කෙසේ ද යන පැනය අරවින්දගේ සිතට නැංගේ ය. බලපිටියේ උසාවිය අසලදී මහා පාරට නුදුරින් නැඟුණු පවුරක් සේ පිහිටි ගල්කුළු වනාහි අවුරුදු කෝටි ගණනකට පෙර මුහුදු පතුල ඉස්සී පිපිරීමෙන් සිදුවුණු මහා විපර්යාසයක ප්‍රතිඵලයක් ද? අව් වැසි සුළං මහා විනාශ කර්තෘකයන් බව ඒ ගල් වැටිය නිසැකව පළකරයි. අවුරුදු දස දහස් ගණනක සිට වැසි දිය වැටී බැසීමෙන් ඒ ගල් වැටියෙහි ගෙවී ගිය තැන් රැළි පාලම් සේ පෙනෙයි. වැසි දියෙන් තෙම්මෙන් වන පිම්බීමත් අව්වට කර වීමෙන් වන හැකිළීමත් කියන ලොකු කුඩා පිපුරුම් විවර ඒ ගල් වැටිය පළින් පළ දැක්ක හැකි ය.

ගල් වැටි, පොල් රුප්පා, දෙල් ගස්, දෙඹ ගස්, එරමුදු ගස් හා සූරිය ගස් හා ලොකු කුඩා ගෙවල් ද දෙපැත්තෙහි ඇති පාරින් සෙමින්

Scanned by CamScanner

දිවෙන රථය, එක් පැත්තකින් මුහුද ද අනික් පැත්තෙන් දිය පිරු
අගල් ද අගල් අතර වූ බිමින් නැඟුණු ගෙඩි නැති පොල් ග
ඇති පාරකට පිවිසියේ ය. රියකරු හදිසියේ බරේක් දමා නැවැ
රියෙහි උන් තිදෙනාම ගැස්සී අසුන්වලින් විසි වූහ.

පාරත් අහසත් වසා පැතිරි දැඩි දුම් පටලයක්, රථයේ ගම
නවත්වනු පිණිස හදිසියේ නැඟුණු පවුරක් සේ පාර හරහ සිටියේ
නැහැය කාගෙන ගිය ගඳක් දැනුණු අරවින්ද 'මේ මීදුමක් කොයින්ද
යි විස්මයෙන් ඇසුවේ ය.

''හුණු කොටුවලින් එන දුම''යි රියකරු කී ය.

''හෝ! මේ හික්කඩුව''යි අරවින්ද කී ය. ''මට දැනුයි මත
උණේ.''

''තව හැතැප්මක් විතර ගියාම එන්නේ හික්කඩුව.''

හවස තුනට පමණ ඔවුහු ගාල්ලට ළඟා වූහ. එක් පැත්තකි
ඕලන්ද පවුරෙනුත් අනික් පැත්තෙන් රුමස්සල කඳු ගැටයෙනු
සෙවණ වුණු ගාලු වරාය ඉතා දැකුම්කලු කරදිය කඩකි. මේ කරදි
කඩෙහි සුන්දරත්වය වැඩි වන්නේ කොළඹ වරායෙහි මෙන් නැව්
යාත්‍රා, සුලභ නොවන බැවිනියි අරවින්ද සිතුවේ ය.

''කොටුව ඇතුළත් බලා යමු'' යි අරවින්ද සිතුවේ ය.

රියකරු අලුත් කොටු දොරටුවෙන් ඇතුළුව රිය පදවා ගො
ගොස් පරණ කොටු දොරටුවෙන් පිට වී ය. ගාලු වරායේ සුන්දරත්
වය කෙලෙසීමට නැඟුණු මඩුවක් වැනි මාළු කඩය අසලින් ගි
මොටෝරියේ උන් අරවින්දගේ පමණක් නොව අන්‍යයන්ගේ
නාස් පුඩු හැකිළිණ. මෙතරම් සුන්දර වරායක් සහිත ගාල
නගරයේ කැතකම වඩාත් පෙනෙන්නේ ද වරායට පිටු පා පිහි
ගරා වැටුණු ගෙවල පැළ දොරවල් බලා මේ පාරෙන් ගමන් කරන්
නන්ට ය.

සුන්දර දෙයින් ආස්වාදයක් නොලැබිය හැකි නිසා පුවු පා ලැ
කසල විදින කකුල් හතරේ දැවැන්තයන් මෙන් කඩවීදියෙහි පට
කඩවත තෙක් පිහිටි ලොකු කුඩා ගෙවල් ද වැසිකිළි ද කසළ ගොඩ
වල් ද වෙයි. රුමස්සල කන්ද වසාගත් වනෝද්‍යානයක් වැ
මූකලානෙහි වන මල් කොළ පිසගෙන වාතයත් ජලයත් පිරිසි
කරන ඔසෝනයෙන් බරව හමන මුහුදු සුළඟ නොඉවසන්නා
මෙන් වරායට පිටුපා පිහිටි මේ ගෙවල වෙසෙන්නෝ, මහා පාරි
නඟින දූවිලි ඇදගෙන එන වාතය ආශ්වාස කරති.

ගාලු වරාය ඉතාම සුන්දර දිය කඩක් බව අරවින්දට වැටහුණේ
කඩවත අසලදී ය. රියකරු සෙමින් රිය පැදවූයේ ය.

Scanned by CamScanner

කරදිය කඩ වටා නැඟුණු පවුරක් සේ එක පැත්තකින් රුමස්සල කන්ද පෙනෙයි. කන්ද වසාගත් මූකළාන. නිල්වන් ගුවන් තලය යට තද කොළ පැහැයෙන් බබළන වනෝද්‍යානයක් වැන්න. අනික් පැත්ත වටා ඇඳුණු බිම කඩ කෙළවරින් නැඟුණු පහන් කණුව, එක් ටැම ගෙයක් සේ බබළයි. දෙපැත්තෙන් ඇදී වක්ව ගිය මේ දෙබිම කඩ එක්වනු වළකන දිය කඩ, වරායට ඇතුළුවන දොරටුවක් වැන්න. ඒ දොරටුවෙන් ඔබට යොමු කරන දෙනෙතට හසුවන්නේ ක්ෂිතිජය තෙක් පැතිර විසිරී අහසටත් වඩා දැඩි ගැඹුරු නිල් පැහැයෙන් බැබළෙමින් අතුරුදහන් වන මහා කරදිය කඳ ය.

අලුත් කොග්ගල අරවින්ද පෙර නුදුටු විරූ දැක්මකි. එකිනෙකට ළංව පිහිටි ගෙවල් සුන්බුන් කොට, ගස් කොළන් කපා, සම තලයක් කරන ලද බිම කඩ කෙළවර වූ තැන පිහිටි කොග්ගල ඔය සුන්දර දැක්මකි. මුහුදු අහස් නැව්, නදිය අලංකාර කරන දැවැත්ත හංසයන් වැන්න. හිරිගල් දේවාලයෙන් ඉතිරි වුණු ගල් කඩ අවුරුදු කිහිපයක් යකුළෙන් ද පුපුරණ වෙඩිවලින් ද, ලැබූ මහා පීඩාව කියන ලකුණු ඇතත් දැනුදු නොසැලී සිටියි. එතැන් සිට කොග්ගල ඔය පාලම තෙක් පාර දෙපැත්තේ දක්නා ලද්දේ කවුළු දොරවල් හා වහල් තලයන් ඉගිලී ගිය ගෙවල් දෙපේළියකි.

කොග්ගල පසු කළ මොටෝර්රථය වැලිගම නගරය පසු කෙළේ දෙබිත්තියක් අතරින් අමාරුවෙන් ඇදෙන ඇතකු ලෙසිනි. මොටෝරිය මාතරින් හැරී දෙණියාය බලා වඩාත් වේගයෙන් ගමන් කෙළේ ය.

Scanned by CamScanner

# 6

මව දෝතින්ම අරවින්දගේ හිස අල්ලා ළංකරගෙන ඔහුගේ මුහුණ සිපගත්තා ය.

"ඔය මැදැ"යි කියමින් විහාරහේන මුදලාලි, ගේ ඇතුළට ගියේ ය.

ඔවුන් ගෙදරට ළඟා වූයේ රෑ හතට පමණ ය.

තේ වත්තක එක් කෙළවරක වූ කඳු ගැටයක් කපා සමතලා කොට එහි සාදන ලද ඒ ගෙය පෙරට වඩා විශාල ලෙස අරවින්දට පෙනිණ. අලුත් කාමර තුනක් හා පෝටිකෝවක් ද සෑදීමෙන් ගෙය විශාල කරන ලද්දේ මීට මාසයකට පෙර ය. අරවින්දගේ වැඩි සන්තෝෂයට හේතු වූයේ විදුලි පහනින් ගෙය එළිය කරනු ලැබීමයි.

මිදුලෙහි රැස්ව සිටි ගැමියනුත් විස්මයෙන් විදහාගත් දෙනෙත් ඇතිව ගේ තුළ සිටි ගැමි ගැහැනුන් හා දරුවනුත් දුටු විහාරහේන මුදලාලි දෙරටුවට ගොස් වට පිට බැලී ය.

"වැලිගම හාමිනේ; මොකොට ද මේ තරම් මිනිස්සු ගොඩක් ගෙන්නුවේ"යි අසමින් ඔහු ආපසු සාලයට ගියේ ය.

"මම ගෙන්නුවේ නැ; පුතා එක අරංචියට ඒ ගොල්ලන් ඇවිල්ලා තියෙනවා" වැලිගම හාමිනේ කීවා ය.

ඇ කීවේ සම්පූර්ණ ඇත්ත නොවන බව විහාරහේන දනී. ගේ ගැමි ගැහැනුන්ගෙනුත් ගැමියන්ගෙනුත් දෙකෙන් කොටසක් පමණ ගෙන්වන්ට ඇත්තේ ඇ විසිනි යි ඔහු කල්පනා කෙළේ ය. ඔවුන් ගෙන්වා ඔවුන්ට සංග්‍රහ කිරීමෙනි තම බිරින්ද සන්තෝෂ වන්නේ. විහාරහේන, වෙළඳාම සඳහාත් වතු පාලනයටත් වෙහෙසෙයි. නිතර කොළඹ යෙයි. එහිදී මිතුරන් සමඟ කා බී සන්තෝෂ වෙයි. වැලිගම හාමිනේ මුදල් සැපයීමට නොවෙහෙසෙයි. පුතා ගෙදර සිටියදී ඇ පුතාට සාත්තු කළා ය. ඔහු බලා සන්තෝෂ වූවා ය. ඔහු එංගලන්තයට ගිය පසු ඇ සන්තෝෂ වන්ට පුරුදු වූයේ ගැමියන් ද ගැමි ගැහැනුන් ද ගෙන්වාගෙන ඔවුන්ට සංග්‍රහ කරමින් ඔවුන් හා කතාබහ කිරීමෙනි. ඔවුන් සියල්ලන්ගේම ආදරය දිනාගත් ඇ ඔවුන් හා සන්තෝෂ වන්ට පමණක් නොව ඔවුන් හා ... වන්ට ද පුරුදු වූවා ය. ඇතැම් ගැමියන් හා ගැමි ගැහැනුන් ද ඉඩංගු ලැබුණු විටක පුළු සොරකම කරන බව ඇ දනියි. එවැන්නන්



Scanned by CamScanner

හසුවූ විට මුදලාලි නිර්දය ලෙස ඔවුන්ට දඬුවම් කළ නමුත් ඇ කිසි කලක දඬුවම් නොකළා ය.

"අරවින්ද මහත්තයා රට ගියාට මොකද සනීප වෙලා නැහැ"යි එක් ගැමියෙක් බයාදු කමින් කීවේ ය. ඔහු එසේ කීවේ තමාගේ සන්තෝෂය ප්‍රකාශ නොකොට ඔහු දෙස බල බලා සිටීම හොඳ නැතැයි සිතූ බැවිනි.

විහාරහේන ගැමියා දෙස රවා බැලුවේ ය. බියගත් ඔහු බිම බලාගත්තේ ය.

"'දෙස්තර හාමුදුරුවෝ'යි කියාපන්. දැන් ඉස්සර කතා කර විදියට කතා කරන්න එපා. ඒ මහත්තයා රට ගොහින් බොහොම ලොකු විභාග පාස් කරලා ඇවිත් තියෙන්නේ."

"ඔව් මුදලාලි මහත්තයා. එයා ඉස්සර වගේ එහෙම කතා කරන එක වැරදියි" මහලු ගැමියෙක් අර ගැමියාට දෙස් කී ය.

අරවින්ද බිම බලාගත් වනම සිනාසෙමින් කාමරයට ගියේ ය.

"බොලා අහලා තියෙනවා නොවද කොක්වත්තෙ නඩුකාර උන්නාන්සේ ගැන. එයා අපටත් නෑයෝ වෙනවා."

"ඔව්; අපි දන්නවා"යි ගැමියන් තුන් දෙනෙක් ම එක විට කීහ.

"එයා උණත් දැන් දෙස්තර හාමුදුරුවන්ගේ කකුල් දෙක ළඟට එන්න ඕනෑ."

විහාරහේන තම බිරිඳ සොයා කුස්සිය පැත්තට ගියේ ය. කාමරයට වී ඇඳුම් උනා තබා සරමකුත් කමිසයකුත් හැඳගත් අරවින්ද ඇලින්දයට ගියේ ය.

"තාත්තා එහෙම කියන්නේ කවට කමට; මට දෙස්තර මහත්තයා ය කියන්න"යි අරවින්ද ගැමියන්ට කීවේ ය.

ඔහු ගැමියකුගේ මුහුණ පහන් එළියට හරවා බැලී ය. ඔහුගේ පිපිහළු වුණු මුහුණත් සුදුවුණු ඇසුත් ඉදිමෙන්ට ළංවූ අත්පාත් දුටු අරවින්ද තව ටික කලකින් ඔහුගේ පාංඩුව සුව නොකළ හැකි ලෙඩක් වන්නේ ය යි තීරණය කෙළේ ය. අමාරු වන්ට පෙර පහසුවෙන් සුව කළ හැකි පාංඩුවෙන් ඔහු මැරෙතොත් මැරෙන්නේ නොදන්නාකම නිසා ය.

"හෙට උදේට එන්න; මම පාංඩුවට බෙහෙතක් දෙන්නම්."

ගැමියා අරවින්දට වැඳ ඉවත්වූයේ මලක් වී ඉස්මුදුනෙන් පිට කරවන තරම් සන්තෝෂයකිනි.

"මොකොට ද වඳින්නේයි?" අරවින්ද තරහයෙන් ඇසුවේ ය.

Scanned by CamScanner

ගැමි ගැහැනු ද පිරිමිහු ද හත් අට දෙනෙක් විකින් ව
අරවින්දට ළං වූහ. දෙදෙනෙක් ගිරෙහිනි ළමයින් දෙදෙනෙ
ඇදගෙන ආහ.

"දැන් මේ ඔක්කොම බලන්න මට බැහැ. හොඳයි.
බලමු" යි අරවින්ද කී ය. ඔහු ගැමියන් කිහිප දෙනකුගේ
මුහුණුත් ඇඟවලුත් පිළිවෙළින් බැලූහ. සියලු දෙනාම පෙළෙ
තේ ආහාරයෙහි අඩු පාඩු නිසා හෝ එකම වර්ගයේ දේ කෑ
නිසා හෝ වැළඳෙන ලෙඩවලින් විය යුතු ය.

කුස්සිය පැත්තේ සිට පැමිණි විහාරහේන, අරවින්ද වට කරගෙ
ගැමියනුත් ගැමි ගැහැනුනුත් දෙස බැලුවේ කෝපයෙනි.

"මොකොද! මේ"

අරවින්ද තම මව සොයා ගියේ ය. මුදලාලි ගැමියන් අමතා
මෙසේ කී ය.

"අපි දැන් කැවිලි කන්නේ නැහැ. අපි එද්දි හවස තේ වතුර
බීලා ආවේ. අපිට හදපු කැවිලි බොලාට කන්න දෙන්නය කියා
මම වැලිගම හාමිනේට කිවුවා. ඒවා කාලා තේ වතුර කෝප්පය
බැගින් බීලා පලයල්ලා."

විහාරහේන සාලයට ගොස් වික්‍රමනායකගේ කනට කට ළං
කොට මෙසේ කී ය.

"බරන්ඩි වීදුරුවක් ගන්නවා නම් අන්න පිට කාමරේ
අල්මාරියේ ඇති."

"මම ටිකක් අරගෙන ගෙදර යන්නම්, මෙට උදේට එන්න
බැරිය."

"රෑට කෑම?"

"ගෙදර ගොහින් කනවා."

වික්‍රමනායක කාමරයට ගොස් වීදුරුවේ මුව විට දක්වා බරන්ඩි
වක්කරගෙන දෙහුස්මට බීවේය. කාරා කෙළ ගසා ඔහු කාමරය
යෙන් පිට වනු දුටු ගැමියන්ගෙන් ඇතැමෙක් තවත් එකකුගේ
මුහුණ බලා සිනාසී යටැසින් නැවතත් වික්‍රමනායක දෙස බැලුවේ ය.
වික්‍රමනායක මොටෝරියෙහි නගින්ට යනු දුටු ගැමියෝ වි
වටකොට ගත්හ. රියකරු ඇන්ජිම නැවැත්මට ඇණය ඇද්දේ
වික්‍රමනායක ගැමියන්ට සැරකරන්නාක් මෙන් මෙසේ කී ය.

"අහකට වෙයල්ලා! කාරේ එකට යටවෙලා මැරෙන්න හද
ව ද?"

ගැමියෝ බරාඳයට වැදී කැවුම්, කෙසෙල්, කොකිස්, අතිරස
ආදිය කන්ට වූහ. අතික් කැවිලිවලට පෙර අවසන් වූයේ වැ

තලප පිඟාන ය. වැලිගම හාමිනේ තවත් වැලිතලප පිඟානක් ගෙනැවිත් තැබුවා ය.

''මෙච්චර කැවිලි ගොඩක් හැදුවෙ අපිට කන්න ද?''යි මුදලාලි තම බිරිඳගෙන් ඇසුවේ ය.

මෙයින් ඇතැම් කැවිලි සැමියා ද පුතා ද නොකන බව ඈ දනියි. එහෙයින් ඒ කැවිලි හැදුවේ ගැමියන් උදෙසා ය; ගැමියන් පැමිණියේ ද ඇගේ ආරාධනයෙනි. පුතා පැමිණීම නිමිත්තයෙන් ඇට පස් වනක් ප්‍රීතියෙන් ප්‍රීති විය හැක්කේ ඇගේ සුහද ගැමියන් ගෙන්වාගෙන ඔවුන්ට ද සංග්‍රහ කිරීමෙනි.

''අපි විතරක් කෑවාම ඇතැ''යි කියමින් වැලිගම හාමිනේ අලුත් කෙහෙල් ඇවිරි දෙකක් ගෙනැවිත් මේසය උඩ තැබුවා ය.

''ඔන්න කාපල්ලා බඩ පිරෙන කල්.''

''ඔව්; කාපල්ලා! ඕවාට ගෙවන්න සල්លි ලැබෙන්නේ කොහෙන් දැ කියා බොලාගේ මේ හාමිනේ දන්නේ නැහැ''යි කියමින් මුදලාලි හඩ නඟා සිනාසුණේ ය.

''අපි හෙම්බත් වෙලා ඉන්නේ ඕවාට වියදම් කරන්න සල්ලි හම්බ කරලා තමයි.''

''හම්බ කරන්නේ වියදම් කරන්න නෙව. මෙහෙමත් දවසක වියදම් කරන්නේ නැත්නම් මොකොට ද හම්බ කරන්නේ''යි කියමින් වැලිගම හාමිනේ තම පුත්‍රයා දෙස බැලුවා ය.

''මුදලාලි මහත්තයාට සාගරේ වගෙ තියෙනව නෙව'' යි මහලු ගැමියෙක් කී ය.

''මොන සාගරයක් ද බාප් අර්නෝලිස්'' යි මුදලාලි කී ය. ''ලැබෙන ඒවා වියදමටත් මදි.''

''අපි එහෙම කිව්වට—තුනුරුවන්නේ සරණින්–කටවහක් වදින්න එපා. අපි පතන්නේ මුදලාලිට තව තවත් ලැබෙන්නය කියා. අපේ මේ හාමිනේ ඉන්න කල් මේ ගෙදරට කිරි උතුරන්නා වාගේ හැම දේම ලැබෙන්න ඕන'' යි කියමින් අර්නෝලිස් වැලිගම හාමිනේ දෙස බලා අනතුරුව දෙවියන් යදින්නාක් මෙන් උඩ බැලුවේ ය.

''අර්නෝලිස් ඔය හැම දම කියන කතාවක් තමයි'' කියමින් වැලිගම හාමිනේ සිනාසුණා ය.

''පුතාත් කන්න මෙයින් වැලිතලප කෑල්ලක්'' යි කියමින් වැලිගම හාමිනේ වැලිතලප තයිමක් පුතා අතට දුන්නා ය.

''ඔව්-ඔව්—දෙස්තර හාමුදුරුවොත් අද සන්තෝසෙට කන්න ඕනෑ වැලිතලප කෑල්ලක්''යි අර්නෝලිස් කී ය.

Scanned by CamScanner

''දෙස්තර හාමුදුරුවො කොළඹ නවතින්න යාවි නෙව හාමි...'' යි ගැමි ගැහැනියක් ඇසුවා ය.

''ඔව්!එයා කොළඹ මහ ඉස්පිරිතාලේ වැඩ කරන්න එපයි...''

''එහෙනම් හාමිනේටත් කොළඹ නවතින්න යන්න වෙවි...'' ඈ කීවේ ශෝකයෙනි.

''මම කොහේ ද ඔය ලොකු සිදදිවල නවතින්න යන්නේ!...''

''හාමිනේ ගියොත් බොලාට රවටාගන්න කෙනෙක් මෙ... නැති වෙනවා!'' යි මුදලාලි සිනාසෙමින් කීවේ ය.

''අනේ අපි එහෙම කරන්නේ නැහැ. හාමිනේට එහෙ... කරොත් ඒ කර මිනිහාට හෙන ගහවි.''

ගැමියෝ, තේ වතුර බී සුරුට්ටුව බැගින් ගෙන නික්ම ගියෝ... ගැහැනුන් සියලු දෙනාම ඔවුන් අනුව ගියේ විට සපමිනි. ඇතැ... ගැමියන් කටවල ඔබාගත් සුරුට්ටු පත්තු කෙළේ මුදලාලිගෙ... නිවෙ... ...යාර දෙතුන් සීයක් ඇත් වූ පසු ය.

''...දලාලි හැබෑ අමාරුකාරයා''යි අර්නෝලිස් කී ය. ''හා...නේ නම් පොඩි දරුවෙක් වගෙයි. මුදලාලි බණිනවට බ... මිසක් නොවේ නම් හාමිනේ අපට කවදාවත් නැත කියන්... නැහැ.''

''අමාරුකාරයා නිසා නොවෙන්නම් ලක්ෂ ගණනක පොහො... සතා උණේ. මුදලාලි ඉස්සෙල්ලාම අකුරැස්සෙදි පාන් පෙට්ටි... ඔළුව උඩ තියාගෙන පාන් වික්කා''යි සයිමන්, අර්නෝලිස්ට ළ... රහසක් කියන්නාක් මෙන් කීය.

අකුරැස්සේ තැනින් තැන ඇවිද පාන් විකුණූ වත්තුහාමි දෙ...යායට ඇවිත් පාන් පෝරණුවක් පටන්ගත්තේ ය. කලකට ප... සිල්ලර කඩයක් ද අනතුරු ව සාප්පුවක් ද පටන් ගත් ඔහු අවුරු... හත අටකට පසු තේ වත්තක් ගත්තේ ය. තවත් අවුරුදු හ... අටකදී ඔහු අක්කර දහසක පමණ වතු හිමියෙක් වී ය. මුදලා... දෙණියායට ආ තැන් පටන් වෙළඳාම් කොට ක්‍රමයෙන් ධනවත්... සැටි අර්නෝලිස් සිහි කෙළේ ය. මුදලාලි මුලදී මුදල් සප... ගත්තේ මිනිසුන් තළා පෙළා ඔවුන්ගෙන් නිර්දය ලෙස ව... ගැනීමෙනි; රුපියල් පහකිනුදු අනුන්ට උපකාර නොකිරීමෙ... කොතරම් දිළින්දෙකුගෙන් වුව ද සතයකුදු අඩු නොකොට පො... අය කළ ඔහුට ගැමියන් නොකිපුණේ වැලිගම හාමිනේ නිසා ... මහලු ගැමියෙක් වූ අර්නෝලිස් දනියි. විශාල ධනවතකු වූ ... විහාරහේන මුදලාලිගේ හැඩි-දැඩිකම හා මසුරුකම ද ටිකක්... වී ය. ලොක්කන් ආශ්‍රයෙන් දැන් ලොක්කකු වන්ට සිතා ... ඉන්න මුදලාලි, ගැමියන්ට පිළිකුල් නොකරන්නේ ද වැලි... හාමිනේ නිසා ය.

''මුදලාලිට හරිගියේ හාමිනේ හිත්ද''යි අර්නෝලිස් පිළිතුරු දුන්නේ ය. 'කුම්මැහි ගැනියෙක් අහු උණා' නම් මුදලාලි කාලකණ්ණි මිනිහෙක් වෙනවා; නැති නම් අන්තිම නරක මිනිහෙක් වෙනවා. එයාගේ වාසනාවට තමයි වැලිගම හාමිනේ හම්බ උණේ.''

''අර්නෝලිස් අයියා කියන එක ඇත්ත'' යි එක් ගැහැනියක් කීවා ය. ''මුදලාලි එක්ක පරණ කේන්ති හිතේ තියාගෙන ඉන්න මිනිස්සු තාම ඉන්නවා. සිමියොන් ඒ ගොල්ලන් ගෙන් එක් කෙනෙක්. ඒ මිනිහා හැම දම කියන්නේ හාමිනේගේ මූණ බලන්න බැරි නිසා මුදලාලිගෙන් පළිගන්නේ නැතුව ඉන්නවා ය කියා.''

''සිමියොන් එච්චර තරහ මොකො ද?''

''එයැයිගේ ඉඩම් ගහගත්තේ මුදලාලි නෙව.''

''මුදලාලි ගත්තේ සල්ලි ගෙවලා නෙව.''

''සල්ලි ගෙවුවට මොකොද එයින් දෙකෙන් පංගුවක් පොලියට හිලවු උණා!''

''ඉතින් මුදලාලිය වැරදිකාරයා?''

''සිමියොන් කියන්නේ එයා එක්ක මුදලාලි බොහොම යාළු වෙලා නිකම් සල්ලි දෙන්නා වගේ එයාගෙ උවමනාවලට සල්ලි දුන්නය කියා. ඒ මිනිහත් යාළුකමට දෙනවයි කියා හිතාගෙන වියදම් කරා. අන්තිමේදී ඒ මිනිහාට අමාරු වෙලා රුපියල් දහක් ඉල්ලුවාම මුදලාලි කිව්වා 'උකසට ඉඩම ලියන්න'ය කියා ඉස්සර දීපු සල්ලිත් ඒවාට පොලියත් එකතු කරලා උකස ලිවුවා.''

''එහෙනම් මුදලාලි හරිම අමාරුකාරයෙක් තමා!''

''තමාට ඕනෑ නැති නම් මුදලාලි සල්ලි දුන්නම එයා ගත්තේ මොකට ද? සිමියොන් නෙවි ද වැරදිකාරයා?'' යි ගැමියෙක් ඇසී ය.

''උඹට මුදලාලිගේ කට්ටකම තේරෙන්නේ නැහැ.''

''හාමිනේ අපිට සලකන්නේ මුදලාලිගේ ඔය වැරදි දන්න නිසා වෙන්න ඕනෑ''යි ගැහැනියක් කීවා ය.

''උඹේ කටට හෙන ගහන්න ඕනෑ, ඔහොම ඒවා කියනවාට''යි තවත් ගැහැනියක් කීවා ය. ''වැලිගම හාමිනේ ඔය මොකුත් දන්නේ නැහැ. ඔවා දැනගත්තත් අපට සලකන්නේ මුදලාලිගේ වැරදි වහගන්න නෙවි.''

තේ සුවඳ හා පොළොවෙන් නැගෙන සුවඳ ද ඇදගෙන හමන මඳ නල ගස් කොළන් හෙළන හුස්මක් වැන්න. පරණලයෙන් වැසුණු රූප්සා තෙතමනයෙන් තොර නොවූව ද රැයෙහි හමන

සුළඟ පවා වියලි ගතියෙන් තොර නොවී ය. පඳුරු සහිත කුඹ
කඳුවල පිහිටි ගෙවල පහන්, ගස්වල එල්ලන ලද ලන්තෑරුම් මෙ
පෙනෙයි වරින් වර වළාකුළින් වැසෙන තරු ඇති අහස් අ
දැඩිවෙමින් තුනීවෙයි. ගැමියෝත් ගැමි ගැහැනුත් දෙතුන් දෙ
බැගින් සඳ එළියෙන් එළිය වුණු අතුරු පාලවලට බැස ගම
කොළෙෝය. ඇතැම් ගැහැනුන් අතුරු පාරට බැස්සේ 'අර්නෝලි
මාමේ අපි යනවා!' කියමිනි.

මහා පාරෙහි දූන් ගමන් කරන්නේ අර්නෝලිස් පමණි. තම
ගේ හිසට ළංවම පියෑඹූ මාවවුලකු 'සර බර' හඬ නඟමින් අසළ
ගසක එල්ලෙනු අරනෝලිස්ට දැනිණ. ගස් මුදුන් එක්වීමෙ
සෙවණ වීම නිසා දැඩි අඳුරෙන් වැසුණු ඇතැම් තැනක පාර මැ
අර්නෝලිස් ගමන් කෙළේ ඇසින් බලා සැක හැර ගත්තකු ලෙ
නොව ඉව අල්ලනනකු ලෙසිනි. ඇතැම් එළිමහන් තැනක තර
රැසින් එළිය වුණු පාර අයිනෙහි පිහිටි ගල් කුළුවල සෙවණැලි
අර්නෝලිස්ට තමාගේ තරුණ කාලය සිහි කෙළේ ය. ඔහු
තරුණ කාලයෙහි හඳපානේ හාවන් වෙඩි තැබුවේ ය. තරුණියන්
සොයා ගියේය. තරුණයන් හා තරුණියන් රැස්වන පින්ක
පළවලට පසළොස්වක දවස්වල ගියේ ය.

ගල් කුළුවලට මඳක් ඈතින් වූ කුඩා පාලමකින් එගොඩ
අර්නෝලිස් තේ කම්මලට නුදුරින් පිහිටි මුර ගෙයක් වැනි කුඩා
ගෙයකට ඇතුළු වී ය. ඔහු දල්වූ බෝතල ලාම්පුව ගල් ලෙනෙ
තුළක වූ කණා මැදිරි එළියක් සේ පාරට පෙනෙයි.

# 7

ගැමියන් හා එක්ව නික්ම නොගිය තරුණයෝ දෙදෙනෙක්, ගේ ඇතුළට ගිය විහාරහේන මුදලාලි එන තෙක් ඉස්තෝප්පුවේ කණුවක් ළඟට වී සිටියෝ ය. පට සරමක් හැඳ ඇඟ බද අල්ලාගත් මෙස් බැනියමකින් උඩු කය වසාගත් එකකුගේ ඉණ වටා දවටී, මලක් වැනි ලොකු ගැටයකින් කෙළවර වුණු, කළු ලේන්සුවෙනි අරවින්ද ඔහු හඳුනාගත්තේ.

''මම හිතුවේ අනික් කාංඩෙත් එක්ක හරුමනුත් ගියාය කියා''යි කියමින් සාලයේ උන් අරවින්ද ඉස්තෝප්පුවට ගියේ ය.

''අපි මුදලාලි හම්බවෙලා කියාලා යන්න ඉන්නවා'' යි කියමින් හරුමන් වක් කරගත් ඇඟිලි සහිත දකුණු අත්ලෙන් තමාගේ නැහැයත් උඩු රැවුලත් කටත් පිස දැමී ය. හරුමන් තම කටත් නැහැයත් එසේ පිස දමමින් ඇසින් සිනාසෙන්නේ කුමක් නිසාදැයි අරවින්ද වටහා ගත්තේ ය. තමා එංගලන්තයට යන්ට පෙර ගෙදර පවත්වන ලද උත්සවයක් දෙකක් උදෙසා හරුමන් බොහෝ වෙහෙස වූයේ ය. 'මොකොද හරුමන් ඇස් දෙකෙන් සිනාසෙන්නේ' යනු එක් දවසක පැවැත්වුණු උත්සවය අවසානයෙහි තම පියා හරුමන්ගෙන් ඇසූ ප්‍රශ්නයකි. හරුමන් ඇසින් පමණක් නොව කටින් ද සිනාසෙමින් ඇඹරෙන්ට වී ය.

''වරෙන්''යි කියමින් තම පියා ඔහු අතින් අල්ලා කාමරයට ඇදගෙන ගොස් ලොකු වීදුරුවක් පුරවා බීම වක්කොට එය ඔහුගේ අතට දුන්නේ ය. වතුර වත් නොකොටම බ්‍රැන්ඩි වීදුරුව එක හුස්මට බී තොල කට පිස දමාගෙන හරුමන් ගිය සැටි අද ඊයේ දුටුවක විච්ඡත්වය ඇතිව අරවින්දගේ සිතම නැගිණ.

සාප්පුව ඉදිරියට ගොස් තම පියාට බැණ අපහාස කළ මැරයකුට වරක් හොඳටම තළන ලද්දේ හරුමන් විසිනි. තම පියා රකින හිතවත් යෝධයකු වැනි ඔහු යකඩෙන් තැනුණාක් වැනි දැඩි අත් පා ඇත්තෙකි.

''තාත්තාට එන්න කියන්න ද'' යි අරවින්ද ඇසුවේ ය.

''නෑ—එපා. මුදලාලි මහත්තයා එන කල් අපි ඔහේ තව ටිකක් වෙලා ඉන්නවා.''

මඳ වේලාවකින් පැමිණි විහාරහේන මුදලාලි, හරුමන් හා ඔහුගේ යහළුවා ද සමඟ කාමරයට ගියේ ය. ලොකු වීදුරු දෙකක



Scanned by CamScanner

මුව විට දක්වා බ්රැන්ඩි පුරවාගත් තරුණයෝ දෙදෙනා බිම බලා
වනම වීදුරු දෙක සිස්කෙට කාමරයෙන් පිටවූහ.

ඔවුන් දෙදෙනා ගොස් ටික වේලාවකින් රෑ කෑම කන්ට වා
අරවින්ද 'එන්න; අම්මත් වාඩිවෙන්න, බත් කන්න' යි කී ය.

''ඔව්! එන්න වැලිගම හාමිනේ''යි විහාරහේන කී ය.

''මට පස්සේ කන්න බැරිය''යි කියමින් වැලිගම හාමිනේ
පුතාට බත් හැඳි කීපයක්ම බෙදුවා ය.

පුතාට බෙදීමෙන් ද සිස්වන ව්‍යංජන පිඟන් තමාගේ අතින්
ගෙන ගොස් එහි ව්‍යංජන පුරවාගෙන ඒමෙන් ද තරම් සන්තෝෂය
මේසයට වැඩිවීමෙන් වැලිගම හාමිනේට නොලැබෙයි.

''අපි දැන් කාලා ඉවර කරන්නත් ළඟයි. එන්න අම්මැ
ඇවිත් වාඩිවෙන්න.''

''මේ එනවා''යි කියමින් වැලිගම හාමිනේ තසිමක් ගෙ
කුස්සියට ගියා ය.

''පිඟන්වල ව්‍යංජන ඉවර උණාම ඔය පියදාස කොලුවා
කියන්න. ඌ ගෙනැවිත් තියාවි''යි විහාරහේන කී ය.

''කිරි තියෙනවා—මස් කෑ නිසා කන්න හොඳ නැහැ නේද?''
යි කියමින් වැලිගම හාමිනේ අලුත් එලවළු තසිමක් මේසය උ
තැබුවා ය. බරාඳයේ උන් කළුවා කන්පට ගසනු ඇසූ ඈ මෙ
කීවා ය. ''කිරි මතක් කරන කොට බල්ලත් කන්පට ගැහුවා.''

''බල්ලගෙ ඔළුවෙ හෝහපුටුවො වහන්න ඇති. ඌ හාමි
නේගේ කතාව අහගෙන ඉඳල නෙවි කංපට ගැහුවෙ''යි මුදලා
කී ය. ''කිරි කන්න හොඳද නැද්ද කියා දොස්තර මහත්තයා
වැඩිය දන්නේ කොහොමද හාමිනේ!''

''අපේ අම්මල තාත්තල නම් අපට මස් කාලා කිරි කන්
දුන්නේ නැහැ.''

''කිරි කෑවාට කමක් නැහැ අම්මා''යි අරවින්ද කීවේ ය.
''හුහක් මස් කෑවා නම් කිරි කන එක ටිකක් අගුණ වෙන්
පුළුවනි. මස්වල වැඩියෙන් තියෙන්නෙත් දිරවන්න අමාරු ආහා
ද්‍රව්‍යයක්. කිරිවල තියෙන්නෙත් ඒ වර්ගයේම දිරවන්න අමාරු
ආහාර ද්‍රව්‍යයක්. මස් කාලා කිරි කන්න නරකය කියන කතා
ඇතිවෙන්න ඇත්තේ ඒක නිසා වෙන්න ඇති. බතුයි එලවළු
නැතිව මස් හුහක් කාලා කිරි කෑවාම නම් අජීර්ණ වෙන්ට පුළුවන්.''

රට ගොස් දොස්තර කම උගත් තම පුත්‍රයාගේ ශාස්ත්‍ර ඥානය
වැලිගම හාමිනේ ගරු කළ නමුත් ඒ නිසා ඈ තම මතය බැහැ
නොකළා ය.

Scanned by CamScanner

"හොඳ නම් ටික ටික කන්න''යි කියමින් වැලිගම හාමිනේ කිරි හට්ටියක් හා පැණි කෝප්පයක් ද මේසය උඩ තැබුවා ය.

ඈ බත් කෑමට වාඩි වූයේ අනතුරුව ය.

පසු ද උදය නවයටත් පෙර ගැමියෝ තිදෙනෙක් ද ගැමි ගැහැනු හතර දෙනෙක් ද විහාරහේනගේ ගෙදර මිදුලෙහි රැස් වූහ. අරවින්ද ඔවුන්ගේ මුහුණ බලා නාඩි ද අල්ලා බැලූහ. අනතුරුව පෙර දින රෑ පරීක්ෂා කළ ගැමියාගේ ඇස්පිලි උස්සා බැලුවේ ය.

"මේ බේත ඩිස්පැන්සරියෙන් ගන්න.'' යි කියමින් ඔහු, චට්ටෝරුවක් ලියා ගැමියාට දුන්නේ ය. "මම කොළඹ ගියාම ගුළි බෙහෙත් බෝතලයක් ගෙනැත් දෙන්නම්. එතකල් ඔය බෙහෙත් වතුර බොන්න.''

අරවින්ද, හති දමමින් උන් ගැහැනියක් සාලයේ පුටුවක වාඩි කරවා පරීක්ෂා කෙළේ ය. අනතුරුව නළාව ද තබා ඇය පරීක්ෂා කරනු ගැමියන් බලා සිටියේ විස්මයෙන් විදහාගත් දෙනෙත් ඇතිව ය. ඇගේ ඇහේ ඇති හැම ලෙඩක් ම ඒ නළාවට හසුවෙතියි සිතූ ගැමියෝ තමන්ගේ පපුවලට ද ඒ නළාව තබනු දැකීමට ආශා කළෝ ය.

"බර වැඩ කරන්නෙත් නැතිව, ඇවිදින්නෙත් නැතිව ඉන්න''යි ඔහු ඒ ගැහැනියට කීවේ ය. ඕනෑම ලෙඩක් සැණකින් සුව කළ හැකි බෙහෙතක් ඇතැයි යන දැඩි විශ්වාසයෙහි පිහිටි ඈ, 'අනේ දොස්තර හාමුදුරුවනේ බෙහෙතක් දෙන්න' යයි කීවා ය.

"හොඳයි; මම බෙහෙතක් දෙන්නම්''යි අරවින්ද කී ය. ඔහු එසේ කීවේ පාට කරන ලද වතුර බෝතලයක් වත් දීමෙන් ඇගේ සිත හැදිය යුතුයයි සිතූ බැවිනි.

බෙහෙතෙහි බලය ගැන ගැමියන් අතර මුල් බැසගත් අදහස් වඩාත් දැඩි කරන ලද්දේ වෙදුන් විසින් බව අරවින්ද දනියි. එක්තරා සින්දූරම් ඇබිත්තක් දුන් කෙණෙහි සුවාසය අදින මිනිහා වුව ද අඩු ගණනේ මාස කීපයක්වත් ජීවත් වෙයි. ඉතාම අමාරු ලෙඩකුගේ පයේ මාපටඟිලි දෙකෙහිත් නාසා පුටවලත් 'ප්‍රාණ ජීවය' නමැති තෙල් බින්දු හතරක් ගැවොත් ඔහු අලුත් පණක් ලබයි.

වරක් නිව්මෝනියාවෙන් පෙළුණු තම පියාගේ උණ එකසිය හතරට නැංගේ ය. දොස්තරගේ නියමය පරිදි අයිස් බෑගය හිසෙහි තැබීමට පළමුව බියගත් මව, ප්‍රාණ ජීවය බින්දු හතරක් මාපටඟිලිවලත් යටි පතුල්වලත් ගා සැටි අරවින්ද මතක් කෙළේ ය. වරක් දෙණියායේ ඉස්පිරිතාලයට ගෙන ගිය ගැමියකු පැ විසිහතරක් ජීවත් නොවෙතියි එහි දොස්තර විනිශ්චය කෙළේ ය. නෑයෝ

ආපසු ලෙඩා ගෙන ගොස් වෙදකු කැඳවූහ. ඔහු ලෙඩා පරීක්ෂා කොට බලා, 'බෙහෙත් ගුළියක් තියෙනවා. ඒක ඉහුරු ඉස්ම කොහොම හරි පෙවුවොත් මම ලෙඩේ හොඳ කරනවා'යි කී ය.

පොවන ලද පළමු වන බෙහෙත් හැඳි භාගය උගුරෙන් පහළට නොගියේ ය. එය උගුරෙහි රැඳීමෙන් 'ග්ර්——ග්ර් ග්ර්——' හඬක් නික්මෙන්ට වී ය.

''සෙම පොඩ්ඩක් උගුරේ හිරවෙලා තියෙනවා. ඒක අහක් කළොත් බෙහෙත් ටික පෙවේවි''යි ගැමි තරුණයෙක් කී ය.

''ඔව්——ඔව්—— සෙම ටික අහක් කර ගත්තොත්''යි වෙද කී ය.

තරුණයා ලෙඩාගේ උගුරට සුළැඟිල්ල දමා කරකවා එළියට ගත්තේ ය. 'ටිකක් ආවා තව ටිකක් තියනවා'යි ඔහු කී ය.

අවසාන හුස්ම හෙළන තෙක් ලෙඩකුට වෙදකම් කරවිය යුතු ය. දෙස්තරකු සුවකළ නොහැකියයි කී පමණින් සුන් බලාපොරොත්තුවෙන් ළතවන්නේ නැති ගැමියා හොඳ වෙදකු කැඳවයි. ඔහුත් වෙදකම් නොකළ හැකියයි කිවහොත් චට්ටෝරු වෙදකු හෝ යකැදුරකු හෝ ගෙන්වයි. ඔහු මෙසේ කරන්නේ බෙහෙත හා මන්ත්‍රයත් නිසා උපන් දැඩි විශ්වාසයෙන්ම ගතාවේ. දෙස්තරකු සුව නොකළ හැකියයි කී ලෙඩෙක් ඇතැම් විට චට්ටෝරු වෙදකු විසින් සුව කරනු ලැබී ය. ඔහුගේ විශ්වාසය බෙහෙතේ පමණක් නොව වෙද කෙරෙහි ද පිහිටියකි. සමහර පැරණි වෙදුන් හා යද්දෙස්සන් මළ මිනිසුන්ට පණ දුන් බව ගැමියා දනියි.

ගැමියන්ගේ මේ සිතුම් පැතුම් දනිතත් අරවින්ද ගැමි තරුණයා සමඟ තර්ක කෙළේ කෝපයෙනි. අරවින්දගේ තර්කය ඔහුට නොවැටහිණ.

''ඒක එහෙමද ?'' යි ගැමි තරුණයා වෙද මහත්තයාගෙන් ඇසී ය.

''ඉංගිරිසි වෙදකමේ හැටියට ඒක එහෙම වෙන්න ඇති. නමුත් ආයුර්වේදයේ හැටියට ඒ ඉංගිරිසි මතය වැරදියි'' කියමින් වෙද ශ්ලෝකයක් කීවේ ය.

කායික විද්‍යාව ගැන එකල ද මද දැනුමක් ලත් ශිෂ්‍යයකු වූ අරවින්ද ද, වෙද සමඟ වාද කිරීමට තමා තුළ හටගත් ආශාව මැඩගත්තේ අමාරුවෙනි. 'බෙහෙත් නොපෙවෙන ලෙඩුන්ට බෙහෙත් පොවනු පිණිස ගැමියන්ට අනුබල දෙන්නේ කුමක් නිසාද'යි ඇසීමෙන් වෙද කුප්පන්ට බිය ගත් ඔහු ගැමි තරුණයා ගෙන් මෙසේ විචාළේ ය. 'ලෙඩාගේ බෙල්ල මිරිකන්ට හදන්නේ ?'

කළු බෙහෙත් ගාගත් විසප්පුවක් අතේ ඇති ගැමි තරුණයෙක් කෙඳිරිගාමින් අරවින්දට ළංවූයේ ය. ඔහු සැත් කටුවක් ගෙන තම්බා අනතුරුව ගෙඩිය පළා ගැමියා හඬවමින් එය මිරිකුවේ ය. වේදනාව නැවතුණු පසු ගැමියා ගියේ සන්තෝෂයෙනි.

''මොකද මේක ඉස්පිරිතාලයක්ය කියා හිතා' ගත්තා ද''යි විහාරහේන මුදලාලි මුර ගෑවේ ය. උදේ සාප්පුවට ගිය ඔහු ආපසු ගෙදර පැමිණියේ දැන් ය. අරවින්ද වටලාගෙන සිටි ගැමියෝ ඉවත් වූහ.

''දෙස්තර මහත්තයා ගමේ මිනිස්සුන් ආස්සරයට යනවා වැඩියි. ටිකක් ආඩම්බරකමට නොහිටියොත් ඕකුන් සලකන්නේ නැහැ''යි විහාරහේන තම බිරිඳට කී ය.

''අනේ උන් දුප්පත් ඇයෝ. උන් ආස්සරේ කරාට වරදක් වෙන්නේ නැහැ.''

''උන්ගේ ලෙඩ බලන්නම දෙස්තර මහත්තයා එංගලන්තයට ගොහින් රුපියල් විසිදහක් විතර වියදම් කරල ඉගෙනගෙන ආවේ.''

''දුප්පත් ඇයන්ට වෙදකම් කරාම පින්සිද්ද වෙනවා.''

තමා ඉපිද වැඩුණු ගෙයත්, කුඩා වියෙහිදී නිතර දැකීම නිසා තමාගේ සිතෙහි නොමැකෙන සේ ඇඳුණු කඳුකර පරිසරයත් ගෙයින් එළියට බැස්ස අරවින්දට-තමාගේ ළමා කාලය සිහි කෙළේ ය. ගෙය පිහිටි කඳු ගැටය ඉදිරියෙහි වූ පල්ලම, විවිධ වර්ණයෙන් බැබළෙන කොළ—වනමල්—පඳුරුවලින් ද කබර පැල්ලම් සහිත ගල් කුළුවලින් හා රුක්ස ගසින් ද වැසුණකී. පල්ලම කෙළවර වන තැනින් නඟින දූඩි කොළ පැහැති තේ පඳුරුවලින් වැසුණු කන්ද ද කන්දට පිටු පසින් එකිනෙකට උස්ව නැඟුණු කඳුවැටි ද අරවින්ද දැක පුරුදු විසිතුරු දැක්මකි. වඩාත් උස්ව ඇතින් නැඟී සිටි කඳු මුදුන් වසාගත් අඳුර නිල් කොළ පැහැති වන හිස්වල හැපි හැපී බිඳී බිඳී විසිර නැගෙනහිර බලා යාත්‍රා කරන වලාකුළු ළැව්-ගින්නෙන් නඟින දුම් කඳක් මෙන් ළහිරු රැසින් බැබළෙන නිල් අහස් වියනෙහි කාන්තිය වසයි. තේ පඳුරින් වැසුණු කඳුවලට තුදුරින් වූ කඳු ගැටයෙහි පළින් පළ පිහිටි ගෙවල් කිහිපය කුඩා නගරයක් නොව ඉස්පිරිතාලය බව අරවින්ද දනියි.

තමා බැලූ බැලූ දෙසින් පෙනුණ අහසත් කඳුත් වනයත් ගස් කොළතුත් තේ වතුත් ගැමියනුත් තමාගේ ළමා කාලය සිහි කරන්නේ කුමක් නිසාදැයි අරවින්ද තමාගෙන්ද ප්‍රශ්න කෙළේ ය.

''පින් සිද්ද වෙන එක හැබැව හාමිනේ''යි මුදලාලි කී ය. ''නමුත් ගමේ මිනිස්සුන් අතරට යන්න ඕනෑ තමන්ගේ ලොකු

Scanned by CamScanner

කමත් පරෙස්සම් කරගෙන. උන්ට ටිකක් ආඩම්බර පෙන්න ඕනෑ. නැත් නම් උන්ගේ බයත් සැලකිල්ලත් නැතිවෙනවා.

"උන් ඒ ළමයට හොඳට ආදරෙයි."

ලොක්කකු මෙන් බැබළීමේ ආසාවෙන් මඩනා ලද තම අදහස් වැලිගම හ [illegible]නේට නොවැටහෙන බව විහාරහේන දැ එහෙයින් ඔහු තම බිරිඳ හා තර්ක නොකෙළේ ය. ගැමියන් ලෝකය ඇගේ ද ලෝකය වී ය. ඒ ලෝකය හැර දවස නගරයට පිවිසීමට ඇ කැමැති නොවේ. පරණල පත් යට ත ගත් තමාගේ සුපුරුදු වාසය හැර ඇවිදින ගොළුබෙල්ලා කෙ හරි නැවතත් යන්නේ ඒ සුපුරුදු ස්ථානයටම ය. වැලි හාමිනේ තම නෑයකුගේ මඟුලක් තුලාවක් සඳහා ගාලු නගර හෝ මාතර නගරයට හෝ ගියහොත් සිතන්නේ දෙණියායේ ඇ සුපුරුදු ඇගේ වාසස්ථානය ගැන ය. ආපසු එහි ළඟා වන තෙ ඇ නගරයෙහි කාලය ගෙවන්නේ මවගේ තුරුල්ලෙන් ඉව් කරනු ලැබූ කුඩා දැරියක ලෙස ශෝකයෙනි; තාන්තුවෑවෙනි.

ආණ්ඩුවෙන් නම්බු නාමයක් ලබනු සඳහා වැරවෑයම් ක විහාරහේන, ලොක්කන් හමුවීමට යන්නේ වික්‍රමනායක සමඟ නම්බු නාමය උදෙසා තමන්ගේ මුදල් කඩා ගැනීමට නැත් ක කිසිවකුට විහාරහේන හයු නොවී ය. "මම සල්ලි හම්බ ක ඉතා අමාරුවෙන්. නම්බු නාමයක් උදෙසා උණත් අමාරුවෙ හම්බ කර සල්ලි විසි කරන්න මගේ අදහසක් නැතැ'යි විහාරහේ මුදලාලි දවසක වික්‍රමනායකට කී ය.

"බොහොම හරි මුදලාලි. පොදු කටයුතුවලට මුදල සල්ලි ටිකක් වියදම් කරලා තියෙනවා නෙව. යුධ අරමුදල මුදලාලි පන්දහක් දුන්නා. කච්චේරිවල ලියන්නන්ටත් ලො කත්ටත් පඩුරු ඔප්පු කරන්න ඕනෑ නැහැ. අපි ඔන්න ඔ නිකම් බලා ගෙන ඉදිමු."

ලොකු දොස්තරකු වී කොළඹ පදිංචි වන තම පුතා ආණ්ඩු ලොකු ලොක්කන් හිතැතිත්ම හඳුනා ගනියි. එංගලන්තයේ ග කාලය තුළ අරවින්ද වෙනස් වූ බව මුදලාලි දනියි. එහෙත් ගැමි සමාජයට නොගැළපෙන සේ බෙහෙවින් වෙනස් වූවෙ මුදලාලි නොසිතුවේ ය. තමාගේ ආධිපත්‍යයට හසුවන නැ වාසය කරන කල අරවින්දගේ සිතුම් පැතුම් වෙනස් කිරීම අම කාරියක් නොවේ යයි විහාරහේන සිතුවේ ය. ඔහු යම් කාරියක් හෝ අදහසක් හෝ බද අල්ලාගන්නේ කිඹුලකු ර කටින් යම් කිසිවක් දැඩිව අල්ලාගන්නාක් මෙනි.

තමා තරයේ අල්ලාගත් කාරියට හෝ මතයට හෝ අ සියලු දෙනාම දෙස් කීවත් සිනාසුණත් සරදම් කළත් ඒ ස

හෝ මතය හෝ නොහැරීම මුදලාලිගේ උපන්ගෙයි ගතියක් වැන්න. විළිබිය අඩුකමත් දැඩි ආත්ම විශ්වාසයත් නූගත් කමත් සමඟ අත්වැල් බැඳ ගත් ඒ ගතිය අන්‍යයකුගේ වැටීමට හේතු විය හැකි වුව ද මුදලාලිගේ නැඟීමට හේතු වී ය.

මීට කලකට පෙර තමා ගේ තේ වත්තකට යාව පිහිටි කැලෑ ඉඩම කැබැල්ලක් වෙන්දේසියේ විකුණන ලදී. ධනවත් වතු හිමියෝ කිහිප දෙනෙක් ඒ ඉඩම් කැබැල්ල ගැනීමට සිතාගෙන වෙන්දේසි පළට පැමිණියෝ ය.

"වික්‍රමනායක උන්නැහේ, මම හිතාගෙන ඉන්නේ ඒජන්ත උන්නාන්සේ ආවාම ගණනක් නොදමා චෙක් එකක් අත්සන් කරලා දෙන්ටයි. මම කියනවා තමුන්නාන්සේට ඕනෑ ගණනක් දමා ගෙන මට මේ ඉඩම් කෑල්ල තීන්දු කරන්න කියා.''

සමහර ධනවත්තු සිනාසුණෝ ය. ඇතැමෙක් ඔහු විළිබිය නැති අහංකාර මෝඩයෙකියි සිතූහ. වික්‍රමනායකගේ අවවාදයට ද කන් නුදුන් මුදලාලි චෙක් පතක් අත්සන් කොට ඒජන්ත මහතා අතට දුන්නේ ය.

"තමුන්නාන්සේට ඕනෑ ගණනක් දමා ගන්නැ''යි මුදලාලි කී ය.

ඔහු ඒ වදන් කියේ ද සෙනෙවියකු අතවැසි නිලධාරියකුට අණ කරන්නාක් මෙනි. එකටෙක ඇනී යතුරු වැටෙන්නාක් මෙන් තද වන හනු දෙකකුත් කිඹුල් කටෙහි දැඩි ග්‍රහණය සිහිකරවන, පළල් වූ කට වැසුණු තොල් සඟලකුත්, පටු නළල් තලයකුත්, හතරැස් නිකටකුත් ඇති මුදලාලිගේ මුහුණ බැලූ ඒජන්ත මහතාගේ කට කොනට නැංගේ සිනාවකි. එය සරදම් සිනාවක් නොව මුදලාලිගේ ළදැඩිකම වටහාගැනීම නිසා නැඟුණු පැසසුම් සිනාවකි. ඒජන්ත මහතා චෙක්පත ආපසු මුදලාලිට දුන්නේ ය.

ඉඩම් කැබෙල්ල වෙන්දේසියට ගත් අවස්ථාවෙහි කිහිප දෙනෙක් මිල කීහ. එකකු අක්කරයක මිල රුපියල් පනහයි කියනු ඇසූ තව එකෙක් හැත්තෑපහයි කී ය. අනිකා සීයයි කී ය. රුපියල් විසිපහත් දහයත් බැගින් වැඩි කරන ලද මිල රුපියල් දෙසීය දක්වා නැංගේ ය. ඒජන්ත මහතා විහාරහේන දෙස බලා සිනාසුණේ ය.

"මමත් ඉල්ලන්න ඕනෑ ද?''

ඒජන්ත මහතා හිස වැනී ය.

"රුපියල් තුන්සීයයි — හාරසීයයි — පන්සීයයි — හයසීයයි — හත් !—''

"ඉල්ලුම් කාරයන් තවත් ඉන්නවා ද?'' යි අසන්නාක් මෙන් මුදලාලි වට පිට බැලී ය.

වැක්පත ගත් මුදලාලි, වික්‍රමනායක මහතා ලවා එහි ග
ලියවූයේ ය. ඒජන්ත මහතා රුපියල් තිස්දහේ වැක්පත අ
ගෙන ඉවත තබා සිනාසෙමින් තම අත දික්කෙළේ ය. මුද
දැකීන්ම ඒ අත අල්ලාගෙන සෙලෙව්වේ ය.

"බැල්ලිගෙ පුතාල !—අරුන් දන්නවයි මේ ඉඩමේ වටි
කම" යි කියමින් මුදලාලි පැරද පසු බසින අනික් ඉල්ලුම් කාරය
දෙස බැලුවේ ය. "වික්‍රමනායක මහත්තයා මේ ඉඩමේ අක්
යක් අඩු ගණනෙ රුපියල් දහක් වටිනවා. මගේ ඉඩමට අල්
කැලයක් නිසා මට මේක දෙදහක් වටිනවා. එච්චරට සාර
පොළොව. අර්නෝල්ඩ් පසෙහි හොඳ නරකත් ඉඩම්වල හො
නරකත් හොඳට අඳුනනවා. ඒක ඒ මිනිහා පූරුවේ වාසනාව
ලබාපු දැනුමක් වෙන්න ඕනෑ. මම එයාත් එක්ක ගිහිල්ලා කැල
රිංගලා බැලුවා. 'මුදලාලි මේ ඉඩම අරින්න එපා. කීයට උණ
ගන්න' යයි ඒ මිනිහා කිවුවා."

දේණියාය පාළු රටක් ලෙස අරවින්දට දැනෙන්ට වූයේ තු
හතර දවසක් ගෙවුණු පසු ය. විහාරහේන මුදලාලිගේ රැවුම් බල
ගෙරවුම් අසා බියගත් ගැමියන් අරවින්ද දැකීමට යන්නේ හොරෙ
තම මවගේ ආදර සංග්‍රහයන් විඳිමින් හුදකලාව වෙසෙන අරවින්ද
ගේ හිත නොයෙක් අරමුණුවල එල්බ ගන්ට වී ය. කබලානෙ
නිවෙසත් වමරි හා මාලින් ද ඔවුන් ගේ නෑයන් වූ නිලා හා සරලා
සමඟ ගත කළ පැ කිහිපයක් සිහි කිරීමෙන් ඔහු ලබන්නේ සන්
තෝෂයකි. වමරි බටහිර සභ්‍යත්වයෙන් උකහාගත හැකි හැම
අංගයක්ම පුරන් කැටියක් දිය උරා යන්නාක් මෙන් උකහාග
තරුණියකි. බටහිර සභ්‍යත්වය ඇගේ හාවභාව ලීලා ද කායි
ලක්ෂණ ද සකස් කොට සිය ගුණයෙන් තියුණු කරන්නකි. ඇගේ
අභරදහර හා රූප සෞන්දර්යය ද විනීත පටලය අතරින් අරවින්දට
පෙනෙන්නේ විශුඩ වේෂයකිනි.

ගැමියන් පිට ඔපය නමින් හඳුන්වන ඒ විනීත පටලය තොර
අඳුන්, සුවඳ කල්ක, වත්සුණු, දෙබැමට තුඩුදෙන අඳුන්, නි
රංගය, විසිතුරු සුනිදු දුහුල්, ආචාර විධි, උගැන්ම යන ආදියෙ
සංයෝගයෙන් සැදුණකි. තොලබ බෝතලය තුළ මුදු මොළො
නිල් එළියෙන් බැබළෙන කණමැදිරියකු සේ විනීත පටලය තු
බැබලෙන ඇගේ සෞන්දර්යය, කාමාශාව නඟන සුවඳ කරඬුව
වැන්න. ඉතාම හොඳ සුවඳ පැන් බෝතලය නැවත නැවත
නැහැයට ළං කොට සන්තෝෂ වන්නකු මෙන් ඔහු නැවත නැවත
වමරි සිහි කෙළේ ය. පිටු පා ගමන් කරන කල නැටෙන නිලාගේ
උකුළ පෙදෙස වැන්නක් ඔහු එංගලන්තයෙහි දී තුහුවුවේ
ලංකාවේ ගැහැනුන්ට තරම පුළුලුකුළ එංගලන්තයේ ගැහැනුන්
නැති නිසා ද? තුනී සාරි පට දෙකකුල් හිරවන සේ ඇඳ පාහින්

කිරීම නිසා ද ඇතැම් සිංහල ගැහැනුන්ගේ උකුළ පෙදෙස් පිපිරෙන තරම් පිම්බෙන්නේ? ඇද තද කොට අඳින ලද දුහුල් පට තුළ හැටුණු නිලාගේ උකුළ පෙදෙස සිහි කළ අරවින්දට ලුනු සිවියක් වැනි පටලයක් ඇති බිත්තරය තුළ වැඩෙන ඉස්ගෙඩියා නිතැතින්ම සිහි වී ය. රට කන පටින් බැඳුණු ඇගේ දෙපියයුරු පට හැට්ටය උස්සාගෙන මතු වී සිටි සැටි මතක් කළ අරවින්දගේ දෙනෙත් සෙමින් පියවිණ. ඔහු වහා දෙනෙත් විදහා ගත්තේ ලජ්ජාවෙනි. ලජ්ජාවට හේතු වූයේ මවගේ කට හඬ ය.

"මොනව ද පුතා කල්පනා කරන්නේ"

උතුරා යන තරම් කරුණා රස පිරි බඳුනක් වැනි මවගේ මුහුණ දුටු අරවින්දගේ කාමුක සිතිවිලි, ඊයම් බරු මෙන් සිත් සයුරෙහි බසින්ට වී ය. අතිකකු ගේ තරුණ බිරිඳ සමඟ එක ඇඳෙහි නිදගන්ට ගොස් හසුවුණු එකකු ලෙස මහත් ලජ්ජාවෙනි අරවින්ද අසුනෙන් නැඟී සිටියේ.

"එක තැන ඉන්ට කම්මැලි නම් ටිකක් ඇවිදින්ට යන්න පුතා."

"ඔව් අම්මා, මමත් දූන් පොඩ්ඩකට කලින් සිතුවා ! ගමේ මිනිසුන් බලා කතා කරලා එන්න."

අරවින්ද කබායක් හැඳගෙන දෙස්තර නළාව ද සාක්කුවේ දමා ගෙන ගෙයින් එළියට බැස්සේ ය. ඔහු තේ වතු උඩින් වැටුණු අඩිපාරට බැස කෙළින් ගියේ ඔහු ලවා ලෙඩ සුව කරගැනීමට පැමිණි ගැමියන් ද ගැහැනුන් ද වෙසෙන පෙදෙසට ය.

ගැමියෝ උදළු ගා තේ පඳුරු යට වැවුණු වල් පැළ උදුරති. තළල් තලයත් හිසත් වටා බැඳි පටියෙහි එල්ලී පිට උඩ රැඳුණු කූඩා ඇති දෙමළ ගැහැනු තේ දළු කඩ කඩා ඒ කූඩ තුළට විසි කරති. අරවින්ද ගමන් ගත් අඩි පාර එල්ලේ දිවෙන ගිරි කඳුර ඔස්සේ, සින් ගිගිරි හඬින් කුඩා ගඟුලැල්ල ගලා යයි. මහා දිය ඇල්ලකින් නැඟී විසිරෙන වාෂ්පයක් සේ පොළොවෙන් නඟින වාෂ්පය, හිරු රැසෙහි උෂ්ණය උරාගැනීමට අඳින ලද තෙත පට හුල් පටක් වැන්න. වාෂ්පයෙන් තැවෙන මුහුණත් හිසත් ඇති අරවින්දට දිය නා ඇඟ පිසදැමූ විට දැනෙන උණුසුමින් යුතු සිහිලත් සොම්නස් හැඟීමත් දැනෙන්නට වී ය. කඳුගැටයක් උඩ පිහිටි තානායම් පළ බලා නඟින මොටෝරිය අරවින්දට පෙනුණේ ඉක්මන් ගමනින් යන දැවැන්ත ඉඳිබුවකු ලෙසිනි.

ගැමියන්ගෙන් වැඩි දෙනා ජීවත් වන්නේ මැටි ගසා අතු සෙවෙණි කරන ලද කුඩා පැල්පත්වල ය. බදමෙන් බැඳ උළු සෙවෙණි කරන ලද ගෙවල් කීපය, කලකින් හුණු නොගෑමත්, පුස් බැඳීමෙන් සැදුණු විශාල කළු පැල්ලමුත් නිසා පැල්පත්වලට

Scanned by CamScanner

වඩා කිලුටු ය; කැත ය. ඒ ගෙවලට සම කරන විට අතු සෙ කරන ලද පැල්පත් පිරිසිදු ය; වාසයට සුදුසු තැන් ය. බද බඳින ලද ගෙවලින් නික්මෙන කිලුටු ගඳට එක්වුණු පුස් ගඳ ගඳක් පැල්පත්වලින් නොනික්මෙයි. පැල්පත්වල ඇතුළ වැඩි එළියක් ලබයි. ඇඟිලි පහරවල් සහිත වියලුණු මැටි තෙතමනය උරා ගනියි. මැටි ගාන ලද ගෙබිම ද වතුර තො බදම හෝ ගඩොළු හෝ ඉගිලීමෙන් සෑදුණු වළ ගැසුණු තැ විවර එහි නැති ය. දුවිලි නැති ය. මැටි ගසා අතු සෙවෙණි ලද ගෙවල වෙසෙන දිළින්දෝ, වැඩි වාසනාව ඇත්තෝ අරවින්ද සිතුවේ ය. පැල්පත්වල වෙසෙන ගැමියන් කිලිටි බදම ගෙවල වාසය කරන ගැමියන්ට වඩා නිරෝගිව ජී වතොත් එය පුදුමයක් විය නොහැකි ය.

ඇතැම් පැල්පතක වෙසෙන්නෝ තිදෙනෙකි. නැති සිව් දෙනෙකි. තවත් පැල්පතක හත්දෙනෙකි. නොඑසේ අට දෙනෙකි. රස්සාවක යෙදුණ දෙතුන් දෙනකු ඇති පවු හිඟ ය. පියා උදේ සිට සවස් වන තෙක් කය වෙහෙසා වැඩ කර ඇතැම් පවුලක පියා ද අලසයෙකි! එහෙයින් බිරින්ද මුදල් සපය මොවුන් ඉතා සුළු ආදායමකින් සන්තුෂ්ටියෙන් ජීවත් වන් කෙසේ ද?

හති දමමින් තමාගෙන් බෙහෙත් ගැනීමට ආ ගැහැනිය පැල්පතෙහි බරාඳයෙහි සිටි තරුණිය දෙස අරවින්ද බැලු විස්මයෙනි. මනාව වැඩුණු නිරෝගී දේහයක් ඇති ඇ දුටු වි අරවින්දට සිහිවූයේ එංගලන්තයෙහි වික්ටෝරිය-ඇල්බට්ර් කෞ ගෙහිදී තමා දුටු ග්‍රීක දෙවඟනකගේ පිළිරුවකි. ඇගේ දෙකොපුල් බඳ ද පළ කරන්නේ පිපිරී පිට වන තරම් වන තරුණ මදය ඇගේ තොසිහින් දෙතොල, අඳුන් ගාන ලද කලක මෙන් ර පැහැයෙන් තෙත් ය. නැහැය උස් ය, තියුණු ය. දෙඇසෙහි නි ගැඹුරු ය; ඉහටිය සිහින් ය.

අරවින්ද ඇ දෙස දෙතුන් වරක්ම බැලුවේ මහත් ආසාව මෙන් කුහුලකිනි. ඔහු, තමා දෙස ආසාවෙන් බලනු දුටු තරු යගේ දෙනෙත් බිමට හැරිණ; යුගත නිතැතින්ම හැට්ට කර දෙස ගියේ ය. ඇ තමාගේ ළය වඩාත් වැසෙන සේ හැට්ට කර උ පස්සා පැත්තේ කොනින් අල්ලා පහළට ඇද්ද ය.

"දූන් හතිය අඩුද" යි අරවින්ද ඇගේ මවගෙන් ඇසුවා ය

"දෙස්තර මහත්තයාට පින්සිද්ද වෙන්න දූන් ටිකක් අඩුයි" ඇ කිවා ය.

අරවින්ද පුදුම නොවී ය. ඔහු ඇට දුන්නේ බෙහෙතක් නො රසවත් පැණියකි. අද වුව ද ඇ හිටිහැටියේම මිය ගියායයි අසන්

Scanned by CamScanner

ලැබුණොත් අරවින්ද නොවෙයි පුදුම වන්නේ. ඇගේ රෝගය එවැන්නක් බව අරවින්ද දන්නා හෙයිනි. තමා දුන් බෙහෙත් වතුර බීමෙන් ඈ ගුණ ලැබුවේ, එංගලන්තයට ගොස් උසස් උපාධි ලබා පැමිණි තමා කෙරෙහි තැබූ දැඩි අන්ධ විශ්වාසය නිසා ය.

තරුණියගේ ඇඟ අල්ලා බැලීමට සිතූ අරවින්ද නළාව ගෙන පළමුව හති දමන ස්ත්‍රියගේ පිටට ද පපුවට ද තබා බැලී ය. අනතුරුව ඔහු ඇගේ මුහුණ බැලුවේ විස්මයෙනි. දැන් ඇගේ හදවත ගැහෙන්නේ මඳක් වෙනස් හඬකිනි. නාඩි වැටෙන්නේ ද මඳක් අඩු වේගයෙකිනි. "හෙට උදේ අපේ ගෙදරට එන්න. මම අලුත් බෙහෙතක් විදින්නම්" යි අරවින්ද කී ය.

"මම අද ගෙදරට නොගියේ මුදලාලි මහත්තයා හිටියොත් බණිය කියා බයේ."

"නවයටත් දෙළහටත් අතර කාලයේ තාත්තා ගෙදර ඉන්නේ කලාතුරකින්"යි කියූ අරවින්ද තරුණිය දෙස බලා සිනාසුණේ ය.

"නළාව තියා දූගේ ඇඟත් බලන්න ද?"

"එමලින්, මේ අපේ දෙස්තර හාමුදුරුවන්ට කියා ඇඟ බලවාගනින්."

එමලින් සිනාසෙමින් අත දික් කළා ය. රතු දෙතොල් විවරයෙන් පෙනුණු ඇගේ දත් දුටු අරවින්දගේ කුහුල තවත් වැඩි වී ය.

ඇගේ අත අල්ලා බැලූ අරවින්ද අනතුරුව ඇගේ වම් උරයට යටින් නළාව තැබී ය. වැරෙන් හුස්ම ගන්ට වූ ඇගේ ළය හැට්ටය පුපුරවන තරම් වේගයෙකින් පිම්බෙමින් හැකිළෙයි. අරවින්ද නළාව තද කෙළේ ඈ 'ඌයි කියද්දැ'යි දැනගනු පිණිස ය. ඇගේ බඳ මෙළෙක් වුව ද දැඩිය; මඳක් නළාව තද කිරීමෙන් රිද්දිය හැකි බඳක් ද නොවේ. ඔහු අනතුරුව ඇගේ ළයට නළාව තැබුවේ දැඩි ආසාවෙනි. පිම්බුණු ලොකු රබර් බෝලයක් උඩ තැබූ කලක මෙන් නළාව ඇගේ ළැම එක වර අල්ලා නොගත්තේ ය.

"දූගේ ඇඟ බොහොම හොඳයි!" අරවින්ද කී ය.

අරවින්ද වටලාගත් ගැමි ගැහැනුන්ගෙන් ඇතැම් එකියක් යටැසින් තවත් එකියක දෙස බැලුවා ය. තවත් එකියක එමලින් දෙස බැලුවේ ඊර්ෂ්‍යාවෙනි. 'මුදලාලි මහත්තයට ආරන්චි උණොත් අපටත් හොඳටම බණීවි'යි මහලු ගැමියෙක් කී ය.

පිරිපුන් නිරෝගි දේහයක් ද ඇද පලුදුවලින් තොර අවයව හා ඉන්ද්‍රියන් ද ඇති මෙවැනි තරුණියක මේ ගැමි ගැහැනියට ලැබුණේ කෙසේ ද? ඇගේ සැමියා දිරාගිය කයක් ද ඇද පලුදුවලින් තොර නොවූ ඉන්ද්‍රියන් ද ඇති ගැමියකු බව අරවින්ද දනියි. ඇගේ මවු ලෙඩ වන්ට පෙර හොඳ දේහයක් ද රූ සපුවක් ද ඇති ස්ත්‍රියක වූ බව කියන සලකුණු ඈ කෙරෙන් තවම අතුරුදහන් නොවී ය. එහෙත් පියාගේ එකම කායික ලකුණකුදු ඈ නොලැබුවේ කෙසේ ද?

අරවින්ද ආපසු බලා ගමන් කෙළේ ය.

''ඇත් අම්ම වගේම විලිලැජ්ජා නැති එකියක්''යි ගැමි ගැහැ යක තවත් එකියකට කියනු අරවින්දට ඇසිණ. අරවින්ද තරු යගේ තොරතුරු දැනගත්තේ ඒ ගැහැනියගෙනි. ඇගේ වතුකාරයකුගේ අනියම් බිරිඳ ලෙස කලක් ජීවත් වූයේ ඇ සැමියාට හොරෙන් නොවේ. එමලින් වතුකාරයා නිසා ඇ දුව ය. ගමෙහි ධනවත් ගැමියකුගේ දූරියක නොබිව තරම බොමින් ද වෙනත් රස ආහාර හා පලතුරු කමින් ද ඇ වැඩුණ ජීවත්ව සිටි තාක් වතුකාරයා ඇට වුවමනා දේ සැපයීම සඳහා ම නොමසුරුව මුදල් දුන්නේ ය.

හාමත් වෙමින් වුව ද සැමියන්ට බියෙන් හා ලජ්ජාවෙන් පති රකින ගැමි ගැහැනුන්, එමලින්ගේ මව සිහිකරන්නේ පිළිකු වැඩි ඊර්ෂ්‍යාවකිනි. එහෙත් එමලින්ගේ මව තමා වතුකාරයා අනියම් බිරිඳ වූ බව සිහිකරන්නේ ගර්වයෙනි. ඇ ඇගේ රකින්නේත් ඇට වුවමනා දේ සපයා දෙන්නේත් අනිත් ගැ ගැහැනියක තම දුව නිසා ආරූඪ කර නොගන්නා තරම් අහංකා කමිනි.

''දෙස්තර මහත්තයට නවතින්න කොළඹ 'ගිරිගෝරි' පා ලොකු ගෙයක් මේ වික්‍රමනායක මහත්තයා ඊයේ අරගෙ තියෙනවා'' යි මුදලාලි කී ය. මුදලාලිත් වික්‍රමනායකත් ප්‍රවෘත්තිය කීමට අරවින්ද එන තෙක් බලා සිටියෝ ය.

''හොඳ අලුත් ලොකු ගෙයක්'' යි වික්‍රමනායක කී ය.

''එතරම් ලොකු ගෙයක් ගත්තේ මොකටද''යි අරවින් ඇසුවේ ය.

''ගේ ලැබෙන තුරු දෙස්තර මහත්තයට පුළුවන් නොව වෙ කොහේවත් ටික දවසකට නවතින්න'' මුදලාලි කී ය.

''ටික දවසක් හෝටලේ නවතින්න පුළුවනි. සමහර විට සුමානේම වැඩ බාරගන්න වෙවී.''

''දෙස්තර මහත්තයා අනිද්දට කොළඹ යනු කොට ඕනෑ න වික්‍රමනායක මහත්තයත් එක්ක යන්න. වික්‍රමනායක මහත්තය කිවුවාම ඕනෑ දෙයක් කරදේවි. මෙයා නාඳුනන කෙනෙ කොළඹ නැහැ''යි කියමින් මුදලාලි වික්‍රමනායක දෙස බල සිනාසුණේ ය.

''හෝටලේ නවතින නිසා වික්‍රමනායක මහත්තයා අනිද් නාවාට කමක් නැහැ.''

''මම එහෙනම් සුමානෙකට පස්සේ එන්නම්; ගෙට කරන දෙයක් ඒ ආවාම අරගන්නවා.''

# 8

අරවින්ද කොළඹ ගොස් මහා හෝටලයෙහි කාමරයක් කුලියට ගෙන එහි නැවතුණේ ය. ඔහු පත් කරනු ලැබුවේ මහා ඉස්පිරිතාලයෙහි වෛද්‍ය විශාරදයන් දෙතුන් දෙනකුට පණික් පහළ පදවියකට ය. උදේ නවයට පමණ ඉස්පිරිතාලයට යන ඔහු දවල් දොළහ හෝ එක හෝ වන තෙක් ලෙඩුන් බලයි. නැවත දෙකට පමණ ගොස් ඇතැම් දවසක හවස පහ හය වන තෙක් ලෙඩුන් බලයි. එක දොස්තරකු විසින් දවස් පතා බලා සොයා වෙදකම් කළ යුතු ලෙඩුන්ගේ ගණන මෙතරම් විශාල වේතියි අරවින්ද සිතෙනුදු නොසිතුවේ ය.

"ලංකාවේ ඉන්න ඔක්කොම මිනිසුන් ලෙඩුන් දැ"යි ඔහු මාලින්ගෙන් ඇසුවේ ය.

"ලංකාවේ ඔක්කොම මිනිසුන් ලෙඩුන් වෙන එක අහන්න ඕනැද"යි මාලින් කී ය. "ලංකාවේ ලොකුම ආදායම ලැබෙන වතු රාශියක් සුද්දන්ගේ. අනික් ටික මේ රටේ පොහොසත් මිනිසුන් ටික දෙනකුගේ අතේ. දොස්තරලාත් සිවිල් නිලධාරිනුත් ආණ්ඩුවේ මුදලින් කොටසක් පඩි වශයෙන් ගන්නවා. වෙළඳාම මිනී මෝරුන් වැනි පිටරට ධනවතුන් අතේ."

"සිංහල මිනිසුන් වැළඳ නොකඩා ඉස්පිරිතාලෙට එන්නේ දුප්පත්කම නිසාම වෙන්න බැහැ."

"උඹ මොකද මහා හෝටලේ නවතින්න ආවේ? උඹ ලංකාවේ පස් පැගු හැටියේ වෙනස් වේගනයි එන්නේ!"

අරවින්ද සිනාසුණේ ය. ලංකාවෙහි පය ගැසූ ද පටන් තමා වඩාත් කළකිරුණු බව මාලින් කීවේ ය. තමාගේ මව ඉහළ පන්තියේ නෑ මිතුරන් උදෙසා සතියක් පාසාම වාගේ රෑ කෑමක්, හවස තේපැන් සංග්‍රහයක් පවත්වයි. දෙතුන් දවසක් මාලින් ඒ උත්සවයන්ට එක් වී ය. අනතුරුව ඔහු බොරු කියා ගෙදරින් පිට වෙයි.

"එතකොට අම්මලා තාත්තලාගේ හිත් රිදෙනවා නෙවැ"යි අරවින්ද කී ය.

"ඒගොල්ලන් හොඳටම නරක් වෙලා ඉන්නේ, ඒ ගොල්ලන්ගේ හිත් රිද්දන්ට පුළුවන් මිනිස්සු නැති නිසා!"



Scanned by CamScanner

බලවතුන් ඉදිරියෙහි කොන්ද නමාගැනීම කලාවක් මෙන් පුරුදු පුහුණු කරගත් මිනිස්සු නගරයෙහි හිඟ නොවෙත්. කෙවිටි පහර ලැබ දෙකකුල් අස්සේ නකුට සඟවා ගන්නා බල්ලන් මෙන් සමහරු, නිර්දය මිනිසුන් ඉදිරියෙහි බඩගාන්ට වුව ද කැමැති වෙති. 'තමන්ගේ රටෙහි තමන්ගේ ජාතියෙහි, ඇතැම් විට තමන්ගේ නෑයන් වන, මේ මිනිසුන්ගේ හීන දීන කම් බලා ටික දෙනකුන් සන්තෝෂ වන්නේ කෙසේද'යි සිතූ මාලින් කෝප වී ය.

තම පියාගේ කන්තෝරුවෙහි වැඩ උගැන්මට මාලින් යන්නේ කැමැත්තෙන් නොවේ. එහි ඉන්නා ලිපිකරුවන්ගෙන් ද කම්කරුවන්ගෙන් ද වැඩි දෙනකුන් යටි හිතින් තමාගේ පියාට වෛර කරන බව මාලින්ට වැටහිණ. එහෙත් ඔවුන්ගෙන් සමහරු කේලාම් කීමෙන් ද පහත් සේවකයන්ට පීඩා කිරීමෙන් ද පියාගේ සිත් දිනා ගැනීමට වෑයම් කරති. අන්‍යයෝ, පියා ඉදිරියට ගිය විට, පමණ ඉක්මවා ඔහුට ගරු බුහුමන් දක්වති.

මේ මිනිසුන් මෙතරම් දීනයන් වූයේ කෙසේ ද? පිටු පා යන තම මිතුරාට පිහියෙන් ඇනීමට පිහියා අතින් ගත්තන් මෙන් මොවුන් කන්තෝරුවලත් කම්මල්වලත් වැඩ කරන්ට පුරුදු වූයේ කෙසේ ද? මොවුන් දූෂණය වූයේ කර්මාන්ත හිමියන්ගේ වස්තු ලොභය, බොරු මානය, අහංකාරකම, කෝපය, පලිගැනීමේ චෙතනාව යන ආදි කෙලෙසුන් නිසා නොවේදැයි මාලින් ප්‍රශ්න කෙළේ ය.

"අම්මාත් තාත්තාත් ගොළු කරන තරම් පෙරළියක් උණත් මම කරනවා"යි කියමින් මාලින් තමා අත තිබුණු පොත බිත්තිය අද්දර වූ අසුනක් උඩට වීසි කෙළේ ය.

නිර්දය මිනිසුන්ට තමාගේ පියා කැමැත්තේ ය. මිනිසුන් තළා පෙළා මුදල් සැපයීම සඳහා වහල් කොට ගැනීමට ඔවුන් තරම් ශූරයන් ඔහුට ලැබිය නොහැකි ය. 'දයාව හා අනුකම්පාව මිරිකා හළ ඇයන්ට කැමැති තම පියා තුළ, තමා නිසා හටගන්නේ කෝපයකි'යි මාලින් කල්පනා කෙළේ ය.

"මාලින් ඉක්මන් වෙනවා වැඩිය"යි අරවින්ද කී ය.

"උඹ දැන් බණ දෙසන්න ඉගෙන ගන්නවා වගෙයි"යි කියමින් මාලින් තම යහළුවා දෙස කෝපයෙන් බැලුවේ ය. ඔහු හුනස්නෙන් නැඟී කවුළුව ළඟට ගියේ ය. ඔහුගේ දෙනෙතට හමුවූයේ ඈත මුහුදෙහි බැබළෙන පහන් එළියකි. එය, වරාය බලා යාත්‍රා කරන නැවක කුඹගසෙහි දල්වෙන පහනකින් නික්මෙන එළියක් බව ඔහු වහා හැඳින ගත්තේ ය. දියකඩනය කෙළවර වූ පහන් කණුවෙන් නික්මෙන, එළිය වල්ගා තරුවක වල්ගය අහස පිස දමමින් පැතිරෙන්නාක් මෙන් මුහුද පිස දමමින් පැතිරෙයි. මුහුදින්

Scanned by CamScanner

නගින ගෝෂාව, ගල් කුළුවල හැපි හැපී බිඳ වැටෙන රළ පෙළ නිසා වඩාත් දැඩි වෙයි. හෝටලයෙහි මිදුලෙහි එක් පසක නවත්වන ලද මොටෝ රථ පෙළ හෝටලයෙහි විදුලි පහන්වලින් නික්මෙන එළිය නිසා කාන්තියෙන් බැබලෙයි. පෝටිකෝව යටට ගමන් කරන මොටෝ රථයක දොර, දොරටු පාලයා විසින් හරින කල, නගින 'ටකස්' හඬ ද එහි උන් ගෑනුන් හා පිරිමින් බැස්ස පසු දොර වසන කල නගින 'ක්රාස්' හඬ ද මාලින්ට ඇසෙයි.

''අද කාර් හුඟාක් එන්නේ හෝටලේ බාලක් තියෙන නිසා ද?''යි මාලින් ඇසුවේ ය.

''මම හිතන්නේ නැහැ''යි කියමින් අරවින්ද වමතින් ටයි ගැටය අල්ලාගෙන අනික් අතින් පටක් ඇද ගැටය තද කෙළේ ය.

''මම මේ ඇඳගත්තේ මාලින්ලයි ගෙදරට යන්ටයි. රෑ කෑමට එන්නයයි මට මාලින්ලයි අම්මා ආරාධනා කරල තියෙනවා.''

''ඉතින්?''

''මම හිතුවේ මාලින්ගේ කීම නිසා මට ආරාධනා කළාය කියා.''

''මගේ කීමට?''

''ඔව්.''

''භෝජන සංග්‍රහ පවත්වන දවසට මම ගෙදරින් පිටවෙලා යන බව උඹට කිවුවා මතක නැද්ද?''

''මම යන නිසා උඹත් එව්විය කියා මම හිතුවා.''

''මම උඹ බලන්න ආවේ ඒ කන්දෙස්කිරියාව ඉවර උණාම ගෙදර යන කල්පනාවෙන්.''

''උඹ නොගියත් මට නොගිහින් බැහැ.''

''බැරි නම් පලයන්''යි කියමින් මාලින් සිගරැට් කොටය කවුළුවෙන් ඉවතට වීසි කෙළේ ය.

''මාලින් තම මවුපියන්ගේ සිත් රිද්දන්ට වෑයම් කරන්නේ කුමක් නිසා ද'' යනු අරවින්දට විසඳිය නොහැකි ප්‍රශ්නයකි. දෙමවුපියන් ගේ සිත රිද්දීම අරවින්දට නුහුරු කාරියකි. ඔහු වැඩුණේ දෙමවුපියන්ගේත් වැඩිහිටියන්ගේත් අණ නොඉක්මවීමට අනුබල දෙන ගැමියන් අතර ය.

ගැමි ගැහැනුන් ඇසුරු කරන මව වැඩිම සන්තෝෂය ලබන්නේ අරවින්ද ගැන සිතීමෙනි; ඔහුගේ දියුණුව පැතීමෙනි. මුදල් සපයනු සඳහා වෙහෙසෙන නමුත් පියා ගෙදර පැමිණි විට සිතන්නේ පුතාගේ අනාගතය ගැන ය. පාසැලෙහි උගන්නා කාලයෙහි මාලින් වෙහෙස වී පාඩම් කෙළේ ය, තම යහළු ළමයින් ආශ්‍රය

කෙළේ ය. උදේ සිට සවස් වන තුරු තම ව්‍යාපාරය පිළිබ
කටයුතු කරන කබලාන ගෙදර පැමිණි විට සිතන්නේ ඒ කටයුතු
ගැන ය. කතාබහ කරන්නේත් මුදල් සැපයීමට වෙහෙසෙන
වෙළඳුන් සමඟ ය. නාලිකා ලොක්කන්ට සංග්‍රහ කිරීමෙන්
මහත්ම සන්තෝෂයක් ලබයි. ගැමි ගැහැනියක මෙන් දරුවන්
ගැන සිතන්ටත් ඔවුන් හා සුරතල් කරන්ටත් ඇට ඉඩකඩ ලැබුණේ
කලාතුරකිනි.

ඇඳුමෙන් පැළඳුමෙන් හා බසින් ද තමන් අනුකරණය කරන
කළු මිනිසුන් දකින එංගලන්තයේ ඉංගිරිසින් තුළ බොහෝ විට
හටගන්නේ උදාසීන හැඟීමකි. නොඑසේ නම් අවඥා සහගත
හැඟීමකි. ඇතැමකු කෙරෙන් ඒ හැඟීම අතුරුදහන් වන්නේ කළු
මිනිසකු දැන හැඳිනගෙන ඔහු ඇසුරු කරන්ට වූ පසු ය. මාලින්
ඉංග්‍රීසින්ට කිපෙන්නේ මේ කරුණු සිහි කරන නිසා ද? ලංකාවේ
යුරෝපියන් අනුකරණය කරන තම මවත් පියාත් අනික් නෑයනුත්
ඔහු සිහි කරන්නේ ක්‍රමයෙන් වැඩෙන අප්‍රසාදයකිනි. තම පියාගේ
ලොකුම වත්තෙහි ලොක්කා ඉංගිරිසියෙකි. එහෙත් මවුපියන්
සුද්දන්ගේ සිරිත් විරිත් ඇඳුම් පැළඳුම් අනුකරණය කරන්නේ
ඔවුන්ගේ ශ්‍රාවකයන් ලෙසිනියි මාලින් සිතුවේ ය. ඇතැම් විට
දාසයන් ලෙසිනි. ඔවුන්ගේ බස කතා කරන්නේ ගර්වයෙනි.

උක්දඬු මිරිකන්නාක් මෙන් මිනිසුන්ගේ ශ්‍රම ශක්තිය මිරිකා
ගැනීමෙන් ධන සපයන තම පියාගේ පරමාර්ථය කුමක් ද? කර
බාගෙන ඔහුට අනුබල දෙන තම මවගේ පරමාර්ථය කුමක් ද?
ලොක්කන් ලෙස ජීවත් වීම ද? ඔවුහු සුදු මිනිසුන් අනුකරණය
සඳහා අතමිට දිගහැර මුදල් වියදම් කරති.

එංගලන්තයේ සුදු මිනිසුන් තමන්ගේ අතීතය සිහි කරන්නේ
ගර්වයෙනි. අධිරාජ්‍යය, සිහි කරන්නේ අහංකාර කමිනි. පෙරදිග
අනික් සියලුම ජාතීන්ට වඩා තුමූ උසස්ය යන මානය ඔවුන් තුළ
ඇතිවන්නේ නිතැතිනි. අධිරාජ්‍යය සිහිකොට සමහර සුදු මිනිසුන්
වඩන ගර්වය තම මවත් පියාත් වඩද්දැයි මාලින් තමාගෙන් ම
ඇසුවේ ය.

"මාලින් මාත් එක්ක යන්න එන්නේ නැද්ද?"යි අරවින්ද
නැවතත් ඇසී ය.

"නැහැ."

"එහෙනම් තුඹ මම එන කල් මගේ කාමරේ ඉන්නවා ද?"

"තුඹට රෑ දෙළහටවත් එන්න ලැබෙන එකක් නැහැ" යි
කියමින් මාලින් කාමරයෙන් පිට වී ය.

ටික වේලාවක් අලස කමින් කාලය ගෙවීමට සිතූ මාලින් හෝටලයේ දකුණු පැත්තේ බරාඳයට ගියේ ය. ඔහු වාඩි වූ පුටුවට ඈතින් වූ කනප්පුව අසල වූ පුටුවෙහි උන් මැදිවියෙහි වූවෙක් නැඟී ඇවිත් තමා ඉදිරියෙහි වූ අනික් පුටුවෙහි වාඩි ගත්තේ ය.

දක පුරුදු මුහුණක් හැඳින ගැනීමට වැර කරන්නකු මෙන් මාලින් අනිකාගේ මුහුණ බැලුවේ ය.

''වික්‍රමනායක ?''

''ඔව්; මම හිතුවා අඳුනාගන්න බැරිවේය කියා. දෙස්තර මහත්තයා කාමරේ ද?''

''නැහැ. ටිකකට ඉස්සර වෙලා ගියා අපේ ගෙදරට; රෑ කෑමට''

''ෂාහ්!—මම ඇවිල්ලා ටිකක් වෙලයි. වැඩකාරයෙක් උඩට ගොහින් බලා ඇවිත් කිවුවා දෙස්තර මහත්තයා කවුදෝ අමුත්තෙක් එක්ක කතා කරනවාය කියා. මම පස්සේ යන්න බැරිදූයි කියා හිතාගෙන විස්කි වීදුරුවක් ගෙන්නාගෙන බිවුවා. කාමරේ උන්නේ මහත්තයා බව දන්නවා නම් මම කෙළින්ම යනවා.''

වික්‍රමනායක විස්කි වීදුරුවක් නොව කිහිපයක් බීවකු විය යුතුය යි මාලින් සිතුවේ ය.

හිස් වීදුරු හතරක් සහිත බන්දේසියක් අතින් ගෙන ගමන් කළ සේවකයෙක් මාලින්ට ළංවූයේ ය.

''බීර බෝතලයකුත් විස්කි වීදුරුවකුත් අපට ඕනෑ.''

බරාඳයේ අනික් පැත්තේ කොනේ වාඩිවී සිගරැට්ටුවක් උරන රුවැති කාන්තාවක් ද මනාව වැඩුණු දේහයක් ඇති කළු මිනිසෙක් ද දෙස වික්‍රමනායක වරින් වර බලයි. ඔවුන් දෙදෙනා ඉදිරියෙහි වූ වීදුරු දෙකෙහි ඉතිරිව තිබෙන්නේ විස්කි විය යුතුය යි මාලින් සිතුවේ ය.

''යාළුවෝ ද?''

''මහත්තයා සිරිපාල සැවුළගල–මගේ යාළුවෙක්. නෝනා අඳුනනවා''යි වික්‍රමනායක කීවේ කට කොනකට නඟාගත් සිනාවක් ඇති ව ය.

''මාලින් මහත්තයා බොන්නේ බීර විතරක් ද?''යි අසමින් ඔහු විස්කි වීදුරුව අතට ගත්තේ ය.

''ඔව්——''

''එංගලන්තෙදීත් ?''

''එංගලන්තෙදි මම වයින් බීලා තියෙනවා. කලාතුරකින් කොක්ටේල් බීලා තියෙනවා.''

"සැර බීම නොබොන එක හොඳයි. පුරුදු උණාම නොබී ඉන්න බැරිවෙනවා."

"මම නොබොන්නේ සැර නිසාවත් පුරුදු වන නිසාවත් නොවෙයි" කියමින් මාලින් සිගරැට්ටුවක් පත්තු කෙළේ ය.

බරාඳයේ අනික් කොනින් සිනාහඬ නික්මෙයි. මත් පැන් පිම්බුණු හිස ඇතියෙක්, සිහිවිලි දමෙහි පැටලී තමා පිට කරන දුම් වලා සීලිම දෙසට නඟිනු බලා සිටියි. ඇතැම්හු තර්ක කරති. කළු කලිසමින් හා කබායෙන් වැසුණු කයත් සුදු කමිසයේ කර පටිය යටින් බැඳුණු කළු බෝ එකත් ඇති කළු මිනිහෙක් උදාර ලීලාවෙන් බරාඳයෙන් ගොස් ඇතුළු ගැබට වැදුණේ ය. සිගරැට් දුම් වලා සමඟ නඟින විස්කි සුවඳත් ජින් සුවඳත් වෙන් කොට ගැනීමට පුරුදුවූවකි වික්‍රමනායකගේ නැහැය.

විස්කි වීදුරුවෙන් තුන්කාලක් සිස් කළ වික්‍රමනායකගේ හිස පෙරට වඩා බැමෙයි.

"අරයා—හරි අමාරු—කාරියෙක්" යි කියමින් වික්‍රමනායක බරාඳයේ අනික් කොනේ උන් සැවුළුගල නෝනා දෙස බැලුවේ ය.

පළමු සැමියා සිටියදී ලංකාවේ සිටි යුද්ධ නිලධාරියකු හා හාද වූ ඈ ඔහු සමඟ බුරුමයට ගියා ය. ඈ යළිත් ලංකාවට පැමිණ නොබෝ කලකින් සැවුළුගල සමඟ හාද වූයේ ය. ඔහු වරක් ධනවතකුව සිට මත්පැන් පානයත් ගැනුන්ගේ සමාගම සෙවීමත් නිසා ක්‍රමයෙන් පිරිහුණෙකි. දැන් ඒ ස්ත්‍රිය සමඟ ඉන්නේ ඔහු ය. වික්‍රමනායක කී මේ ඕපාදූප ඇසූ මාලින් මෙසේ ඇසුවේ ය.

"ඒ නෝනා තාම දික්කසාද උණේ නැද්ද?"

"ඇයි නැත්තේ. සුදු මිනිහා සමඟ ගියේ දික්කසාද වෙලා නෙවි. දික්කසාද උණේ මෙයා සමග කසාද බඳින්න තමා."

"එහෙනම් එයා දැන් සැවුළුගලගේ බිරින්ද?"

"ඔව්."

වික්‍රමනායක සංවේගයෙන් කී ඕපාදූප මාලින් ඇසුවේ කිසිම සංවේගයකින් නොවේ. ධනයෙන් පිරිහුණකු තම බිරිඳ අනික් ධනවතුන් ආශ්‍රයෙන් සන්තෝෂ වනු ඉවසීම බටහිර සිරිත්වලට වහල් වීමේ විපාකයක්ය යන වික්‍රමනායකගේ මතය මාලින් බැහැර කෙළේය. ඇතැම් විට ධනවතුන්ට තම දූන් විකුණන දිළින්දෝ ගම්වලත් නගරවලත් දක්නා ලැබෙත්. ඇතැම් දිළිඳු මවපියන් එතරම් දීනකම් කරන්නේ බටහිර සිරිත් නිසා ද? ඔවුන් ලවා එවැනි දීන කම් කරවන්නෝ අර්ථ ක්‍රමයත් සමාජයත් විසිනි.

වික්‍රමනායක මාලින්ගේ මේ අදහස් නොපිළිගත්තේ ය. ඔහු අතීතයට වදිමින් වර්තමානය හෙළාදකින්නෙකි.

Scanned by CamScanner

''ඉස්සර කාලේ මිනිසුන් අතර දුසිරිත් නොපැවැත්තේය යන කිම මහ ගොන් කථාවක්''යි මාලින් කී ය. ''සුසිරිත් ඇති වන්නේ දුසිරිත් සමඟමයි. ඒ කාලේ සමාජයටත් අර්ථ ක්‍රමයටත් සරිලන දුසිරිත් ඕනැවටත් වඩා තිබුණා. දුසිරිත් නැතිව සුසිරිතට ජීවත් වන්න බැහැ. අඳුරක් නැතිව එළිය පමණක් තියෙන්නේ බඹලොව විතරයි. දුසිරිත් සුසිරිත් යනු වචන දෙකකි. දුසිරිත් යන වචනය අර්ථය ඇති එකක් වන්නේ සුසිරිත් යන වචනය නිසා ය. සුසිරිත් යන වචනය අර්ථ ශූන්‍ය එකක් නොවන්නේ දුසිරිත් යන වචනය නිසා ය. දුසිරිත යන වචනය නැති නම් සුසිරිත යන වචනය බල්ලෙකුගේ බිරුම හඬ වැනි නිකම් සද්දයක් වෙනවා ඇති!

''වචන කොහොම උණත් ක්‍රියාවට—කර්මයට—අනුව විපාක ලැබෙනවා''යි කියමින් වික්‍රමනායක තර්ක කෙළේ ය.

''වික්‍රමනායක මහත්තයාට අභිධර්මය මතක් වෙන්නේ දන්'' යි කියමින් මාලින් සිනාසුණේ ය.

''සොරකම් කරාම ඒකට විපාක ලැබෙනවා.''

''ඔව්; මෙලොවදීම හිරගෙට යනවා: පරලොවදී අපායට යනවා.''

''එහෙනම් පරලොව හිරගෙදර තමා අපාය! එතකොට පර-ලොවත් වළංගු වන්නේ ලංකාවේ දණ්ඩ නීතියම ද?''

''නැහැ; දණ්ඩ නීතිය ඇති උණේ පරලොව නීතිය අනුව. කර්මය අනුව.''

පොදුවේ කාටත් අයිති කැලේක වැවුණු දෙල් ගහක් තියෙනවා. ඒකෙන් ගැමියෙක් දෙල් ගෙඩි දෙකක් කඩා ගන්නවා. ඒක හොර-කමක් ද?''

''ආණ්ඩුවට අයිති ඉඩමක් නම් ඒ දෙල් ගහෙන් දෙල් කැඩීම හොරකමක් තමා.''

''ඉඩම ආණ්ඩුව විසින් ගැමියන් උදෙසා පොදුවේ වෙන් කරන ලද ඉඩමක් නම්.''

''දෙල් ගහ අයිති වන්නේ වැවූ මිනිහාටයි.''

''වැවූ මිනිහෙක් නැතිනම්.''

''හොරකමක් නෙවී.''

''එහෙනම් ඒකේ විපාකය මොකක් ද හිරේට යාම නෙවී නරකාදියට යාම නෙවී.''

''ඒක හොරකමක් නොවන නිසා.''

''නමුත් ඒක ක්‍රියාවක් නෙවිද? මම කවුවැට බැඳගෙන රකින දෙල් ගහෙන් ගෙඩියක් කැඩුවත් ඒක ක්‍රියාවක්. ඒකට විතරක් ද විපාකය තියෙන්නේ.''

''ඒක හොරකමක් නිසා; කඩන මිනිහා එය අනිකෙක් ගහක් බව දන්නා නිසා.''

''විපාක ලබන්නේ ක්‍රියාව නිසාම නොවේ. දුසිරිත් සුසි... යන වචන අනුව බව එතකොට ඔප්පු වෙන්නේ නැද්ද? නරක... දක්නා ලැබෙන්නේ මෙලොව නීතියෙහි දෙවැනි සංස්කරණය...''

''මහත්තයා කතා කරන්නේ හිතට හොරා.''

''ඇත්ත තමයි. වික්‍රමනායක මහත්තයා කතා කරන්නේ... හිතට හොරා. අපි කවුරුත් කතා කරන්නෙ හිතට හොරා. ... විඳින්නේ අපි හදගත් වචනවල විපාක මිසක් අපි කරන ක්‍රියාව... විපාක නොවේ.''

මාලින් හෝටලයෙන් එළියට බැස කොම්පඤ්ඤ වීදියට බැ... ගමන් කෙළේ සන්තෝෂයෙන් නොව කෝපයෙනි. ඔහු අත... මතන් දෙඩුවේ වික්‍රමනායක විසින් කුප්පන ලද බැවිනි. ... මුවදෙර අසල සක්මන් මළුව අයිනේ පළින් පළ පිහිටි විදුලි පහ... මාලින්ට පෙනුණේ පහන් වැටක් ලෙසිනි. එකිනෙක ගෑවෙමි... අඳුරෙහි නැඟී සිටි කොටුවේ දෙමහල් තෙමහල් සිව්මහල් ගෙවලි... ඇතැම් එකක කවුළුවකින් නික්මෙන විදුලි එළිය අඳුර බිඳගෙ... පැතිරෙයි. රැයෙහි නගරය මුර කරන යොධයකු සේ නැඟී සි... ඔර්ලෝසු කණුවෙන් විහිදෙන ආලෝක ධාරාව අහස පිසදමමි... කැරකෙයි. පහන් කණුවලින් නික්මෙන එළියෙන් නැවෙ... ගෙවල් හා කඩසාප්පු ඇති කොටුව සඳරැසින් බැබළෙන කුඩා... නගරයක් වැන්න. කොළඹ අයිස් කොම්පැනියේ ගොඩනැගිල්ලෙ... පාත මාලයේ කවුළු, රැරා බසින දියෙන් නිතර සේදෙන දවැන්... විදුරුවලින් වසන ලද දෙරටු ලෙසිනි මාලින්ට පෙනුණේ. පර... කබල් කඩපලක් වැනි කොම්පඤ්ඤ වීදියෙ දුම්රිය පළෙහි දුල්වෙන... පහන් කිහිපයෙන් නික්මෙන එළිය එහි අඳුර දුරු කිරීමටවත් තර... නොවූවකි. දුම්රිය දෙරටුවෙන් එතෙර වූ මාලින්ගේ දෙකන්... අඟුල් වැටුණේ හෝටල්වලින් හා තේකඩවලින් එක වර නික්මෙ... ගුවන් විදුලිය සින්දු ඇසීමෙනි. වසන ලද සාප්පුවල අඟුවල වැ... නිදන්නන්ගේ ගෙරවුම් හඬ මාලින්ට ඇසෙන්ට වූයේ තේ ක... පසුකොට ගොස් අහසට එල්ල කරන ලද කොතක් වැනි දෙවමැ... ඉදිරියෙන් වමට හැරුණු විට ය. පාර දෙපැත්තේ නවත්වන... දවැන්ත මොටෝරිය දෙපේළියක් අතරින් ගමන් කිරීමෙන් ... රිගල් සිනමා මැඳුර පසු කෙළේ ය.

යෝර්ක් වීදියට හැරෙන තැන නවත්වන ලද රික්සෝ ගෙ... නැඟී වෙරිමතින් දොඩවන නාවියන් හතර දෙනා දෙසවත් නොබ... ජැටිය දෙසට හැරුණු මාලින් නැවතුණේ ය. ඔහු නැවතුණේ... රික්සෝ කාරයකු 'සර්' යි කියමින් හඬ ගෑ බැවිනි.

Scanned by CamScanner

"මුන්ට කියන්න සර්, මේ පාරෙන් ගොහිල්ලා නමාය පංචිකාවත්තට යන්න ඕනෑ කියා."

"පංචිකාවත්තට යන්න මොකට ද මිනිහෝ මේ වටවංගුවේ යන්නේ?"

"එහෙම නොකර මුන්ගෙන් සල්ලි ගන්න බැහැ සර්."

"අර හන්දියෙන් වමට හැරිලා කෙළින්ම පලයන් පංචිකාවත්ත දිහාවට. මම උන්ට කියන්නම් බොලාට ටිකක් වැඩිපුර සල්ලි දෙන්නය කියා. තක්කඩියෝ!"

නැවියෝ මාලින්ට ස්තුති කළෝ ය.

"මොකටද මිනිහෝ පංචිකාවත්ත පැත්තට යන්නේ?"යි මාලින් රික්සෝ කාරයාගෙන් ඇසී ය. "එහේ මොනවා පෙන්නන්නද?"

රික්සෝකාරයා සිනාසුණේ ය.

"ඒ පැත්තට යන්න ඕනෑය කියා වද දෙනවා සර්."

"එයි; බොලා ඔය මිනිසුන්ගේ ඉණ–ඉහ අතගාගන්න එපා."

"අපි එහෙම කරන්නේ නැහැ සර්. එතන ඉන්නවා මහ නරක මිනිස්සු වගයක්, පාර පෙන්නන්න. මූන් හතර දෙනා පුරුදු කාරයෝ වගෙයි"කී රික්සෝකාරයා, අනික් තුන් දෙනා මදක් දුර ගිය පසු පිටත්වූයේ ය.

මාලින් මහා හෝටලය අසළින් වමට හැරී ගෝඩන් උයන දෙසට ගමන් කෙළේ ය. මහා හෝටලයේ හැම කවුළුවකින්ම විදුලි එළිය නික්මෙයි. පාර දෙපැත්තේ නවත්වන ලද දවැන්ත මෝටෝරිය දෙපේළිය කෙළවර වූයේ ඇසින් දක්ක නොහැකි තරම ඈතට දික්වූ දෙකෙළවරකිනි. හෝටලය තුළින් පියානෝ නද ඇසෙයි.

විදුලි පහනින් වැගිරෙන එළියෙන් හෝටලයේ පාත මාලයේ ඇතුළු කාල එළිය වි ය. දුඹුරු වූ අඹ ගෙඩියේ පාටින් බැබළෙන බිත්ති හා කඩු අසල වූ වේවැල් පුටු ද බිත්තිවල පාටින් බැබළෙයි.

# 9

අනෝමා මැඳුරේ සාලයෙහි පළින් පළ වූ අසුන්වල හිඳගෙ ගැනුන් ගෙන් වැඩි දෙනකුන් කතාබහ කරන්නේ සමාජයෙ ඕපාදූප ගැන ය. ගෙවුයනෙහි තබන ලද අසුන්වල හිඳගෙ කබලාන, චන්ද්‍ර සෝම වැලිවල හා දෙමාලසිංහ ද වෙළඳ ව්‍යාපාර යන්ගෙන් වඩ වඩාත් ලාබ ලැබිය හැකි අලුත් උපාය ගැන කම්කරු සමිති නිසා කම්කරුවන් පාලනය දුෂ්කර වීම ගැන කතාබහ කරති.

අනෝමා මැඳුරෙහි භෝජන සංග්‍රහයට අරවින්ද ඇතුළු කිහි දෙනෙක් වාඩිවූහ. භෝජන සංග්‍රහයෙන් පසු පිරිමින්ගෙන් වැ දෙනා මිදුලට බැස්සෝ ය. කාන්තාවෝ සාලයෙහි අසුන්වල වාඩිගත්හ.

''කම්කරු සමිතියකට බැඳෙන එකෙකු වත් මම වැඩට ගන්නේ නෑ''යි කබලාන කී ය. ''මම ගිය සුමානේ දෙන්නෙක් අස්කළා. අස්කළේ උන් කම්කරු සමිතියකට බැඳුණු නිසා.''

''කම්කරුවන් නරක් කරන්නේ ඔය සමිති තමයි. ඔක් කොටම ඉස්සෙල්ලා ඔය සමිති සුන්බුන් කරන්න ඕනෑ.''

''උන්ට ඕනෑ තරමක් කෑගාන්න අරිනවා. සමිති කාරයන්ට කිසිම සැලකිල්ලක් දක්වන්න හොඳ නැහැ. උන් එකෙකුටවත් මම මගේ කන්තෝරුව අහලටවත් එන්න දෙන්නේ නැහැ. යමක් කියන්න තියෙනවා නම් කම්කරුවන් විසින් ඒක මට කියන්න ඕනෑ. මම එහෙමයි මගේ වැඩ පළේ වැඩ කාරයන්ට කියා තිබෙන්නේ''යි කියමින් කබලාන හිස් කෝපි කෝප්පය බන්දේසිය උඩ තැබී ය.

''එංගලන්තෙට ගොස් විබාග පාස්කරලා එන කඩකාරයන්ගේ පුත්තුත් නීතිඥයන්ගේ පුත්තුත් පියුන්ලාගේ පුත්තුත් කොන්දොස් තරලාගේ පුත්තුත් බාස්ලාගේ පුත්තුත් ඩිස්පැන්සරලාගේ පුත්තුත් ලොක්කන් වෙන්න හදන්නේ කම්කරුවන් අල්ලාගෙන.''

''බොල් මිනිස්සු. උන්ගෙන් බොහෝ දෙනෙකුට මන්ත්‍රී මණ්ඩලය හැර ගොස් වෙන තැනකින් රුපියල් තුන්සීයක පඩි පිට රස්සාවක් ලබාගන්න බැහැ.''

''රමසැමිට හොඳ අලුත්ම බැනාරිස් සාරි වගයක් ඇවිත් තිඋණා'' යි සාලයෙහි උන් මදිරා දෙමාලසිංහ නෝනා කීවා ය.



Scanned by CamScanner

''උන්ට අලුත් සාරි එන බව දන්නවා නම් මම ටජ්මහල් එකෙන් ගිය සුමානේ සාරි ගන්නේ නෑ''යි සිරිමා රුක්අත්තන කීවා ය.

''යසෝමා හිදහල බඳින්නේ ලබන මාසේ'' යි සුරංගිනී රුක්-අත්තන කීවා ය. ''විශාඛා එකේදී එයාත් මාත් හිටියේ එක කැලැසියේ.''

''යසෝමා බඳින්න යන මහත්තයාගේ තාත්තා පිටිසර මුදලාලි කෙනෙක්ය කියනවා නෙවැ.''

''ඔව් — අපේ — කසින් කෙනෙක් එයාලයි අමමා හොඳට අඳුන-නවා; මහ ගොඩේ අම්මංඩි කෙනෙක් වගෙයි කිවුවා.''

''ටජ්මහල් එකේ වොයිල් සාරි මෝස්තර හුඟක් තිවුණා—'' යි සිරිමා රුක්අත්තන කීවා ය.

''අපෝයි! මට නම් වොයිල් සාරි අඳින්නම බැහැ''යි කියමින් මදිරා දෙමාලසිංහ දෙවුරය මදක් සෙළවුවා ය.

''දැන් වොයිල් සාරි ටිකක් ගොරෝසුයි—නෙවද?''යි නාලිකා කබලාන කීවා ය.

සාලයේ ඈතම කෙළවරට වී අරවින්ද සමඟ කතාබහ කරමින් උන් තරුණියන් දෙදෙනාගෙන් එකියක් වන චමරී, නීලා දෙස බැලුවා ය.

''වොයිල් සාරි ගොරෝසු ද?''

''අක්කා ඔය ඇඳගෙන ඉන්නේ වොයිල් සාරියක් නෙවැ!''යි කියමින් නීලා සිනාසුණා ය.

''දෙමාලසිංහ නෝනා කීවේ චමරීට ඇනුම්පදයක්?'' යි අර-වින්ද කීවේ ය.

''එයා මට ඇනුම්පද කියන්නේ නැහැ.''

''අරවින්ද කතරගම ගියා ද?''

''මම කවදාවත් ගියේ නැහැ.''

''මොනවා! දෙණියායේ ඉපදිලත්?''

''කතරගම යෑම ගමවල මිනිසුන්ගේ සිරිතක් නෙවි.. ඔවුන් කතරගම දෙවියන් අඳුනන්නෙත් නැහැ; ඔහුට බයත් නැහැ!''

''කොළඹින් නම් හුඟක් කතරගම යනවා''යි චමරී කීවා ය.

''කතරගම දෙවියෝ නගරවල ධනවත් මිනිසුන්ගේ දෙවියෙක් මිස ගමවල මිනිසුන්ගේ දෙවියෙක් නෙවි. කතරගම යන්නේ නගරවල පොහොසත් සිංහල මිනිස්සු. ඔවුන් නිසා දැන් ගමවලත් ඒ සිරිත පැතිරෙනවා.''

''ගම්වල මිනිස්සු ඉහත කාලේ කතරගම යන්න ඇති.''

''නැහැ. නගරවල ධනවත් සිංහල මිනිසුන් කතරගම දෙවි යන් අදහන්ට උගත්තේ ධනවත් හින්දුකාරයන්ගෙන් වෙන්න ඕනෑ.''

''අපි කතරගම ගියේ සෙල්ලමට.''

''ඒ චමරී! දෙමාලසිංහ නෝනා ගියේ දෙවියන්ට පඬුරු ඔප්පු කරන්න''යි නීලා කීවා ය.

''මොකොට ද?''

''මහත්තයාට නම්බු නමක් ලබා දෙන්ටත් රට ගිය සර් නිව වන්ගේ නෝනා රජබිසොව ඉදිරියට යවන්ටත් කියා රත්රන් මොණර රූපයක් දෙවියන්ට ඔප්පු කරා!''

ඇත උන් සිරිමා රුක්අත්තන නීලා දෙස බලා සිනාසුණා ය. දෙමාලසිංහ නෝනා, තම සහෝදරයාත් නැනාත් එන්ගලන්තයෙහිදී කළ කී ඇසූ දුටු දේ නාලිකාට කියයි. නිවටන් ආයනිව රජ බිසොව විසින් පිළිගනු ලැබුවා ය. සාරිය මස්වන ලද්දේ පැරිසියෙහිදී ය. ඇ අජන්තා වියනෙහි ලියකම් පෙන්නූ විට පැරිසියේ කාන්තාවක් එය වෙනස් කොට සාරියට උචිත අලංකරණයක් කළා ය.

''හරි ගැස් මල්ලක්!''යි නීලා කීවා ය.

''චමරිගේ අම්මත් ගැස් මල්ලක් ද?'' යන ප්‍රශ්නය අරවින්දගේ සිතට නැඟුණු නමුත් කටින් පිට නොවී ය.

''අම්මා දෙමාලසිංහ නෝනාට හොඳට කැමතියි'' චමරී කීවා ය.

''ගැස් මල්ලක් නිසා ද?''

''වෙන්න ඇති.''

''කවුරු උණත් ඒ නෝනාට කැමති වෙනවා''යි අරවින්ද කී ය.

''පිරිමි''.

''ගෑනු අකමැති වන්නේ ඊර්ෂ්‍යාවට.''

''මාලින් සමාජයටත් සමාජ සිරිත් විරිත්වලටත් වදින පුද්ගල ස්ත්‍රීන්ගේත් පිරිමින්ගේත් සිත් රිදවීමෙන් සන්තෝෂ වන්නේ. සමාජයටත් සමාජ සිරිත්වලටත් අවඥා කරන්ට චමරී උගත්තේ ඇගේ සහෝදරයාගෙන් දැයි'' අරවින්ද තමාගෙන්ම ප්‍රශ්න කෙළේ ය. මොවුන් දෙදෙනාටම සමාජය තිත්ත වූයේ එක කරුණක් නිසා විය යුතු ය. නීලා නිසැකවම චමරී අනුකරණය කරන තරුණියකි. මැද විශෙහි වූ කාන්තාවන් විළියෙන් කර ගන්වන කියුම කීමට චමරී නොපැකිළෙයි. නීලා ඇට අනුව

දෙයි. කාමාශාවෙන් මඩනා ලද ස්ත්‍රීන්ගේත් පුරුෂයන්ගේත් සිත් සතන් විභාග කෙරෙන වර්තමාන නවකතා ඇතැම් පිරිමින් පවා කුප්පයි. චමරීත් නීලාත් එවැනි නවකථා කියවූවන් විය යුතුයයි අරවින්ද කල්පනා කෙළේ ය.

"නීලා වාත්ස්‍යායනගේ කාම සූත්‍රය කියවා තිබෙනවා ද?"යි අරවින්ද ඇසුවේ ය.

"සිංහල නවකථාවක් ද?"

"නැහැ, සංස්කෘත පොතක්."

"අපි සංස්කෘත දන්නේ කොහොමද සිංහලවත් හොඳට දන්නේ නැති කොට?"

"කාමසූත්‍රයේ ඉංගිරිසි පරිවර්තන තියෙනවා."

"අරවින්ද ළඟ තියෙනවා ද?"

"ඔව්—"

"දුන්නොත් කියවන්නම්."

"ගෑනු ළමයි නරක් කරනවායි චෝදනා කොට මවුපියන් මට විරුද්ධව නඩු දමාවි!"යි කියමින් අරවින්ද සිනාසුණේ ය.

"එහෙනම් එච්චරට නරක පොතක් ද?"

"ලොකු ගෑනුන්ට නම් නරක පොතක් නෙවි."

"දෙමාලසිංහ නෝනා වගේ ගෑස් මලුවලට ද?"යි අසමින් චමරි සිනාසුණා ය.

"නැහැ; වයසින් පැසුණු ගෑනුන්ට."

"අපි ඒගොල්ලන්ට වැඩිය පැහිලා!"

"මම 'ආර්ච් ඔෆ් ද ට්‍රයම්ප්" කියවා ඉවර කෙළේ පෙරේද"යි චමරි කීවා ය.

"මරියා රිමාක්ගේ අලුත් නවකතාව."

"ඔව".

"ඒක කාම සූත්‍රයට වඩා බොහොම පහළයි!"

"ඒ සැත්කම ප්‍රන්සයේ මිසක් මෙහෙ කරන්න බැහැ. හුඟක් ඉස්සර එහෙම සැත්කමක් කළ දෙස්තර කෙනෙක් හිරේට ගියා!"යි කියමින් චමරි සිනාසුණා ය.

"ඉස්සර නම් රස්සාව නැති මිනිස්සුන් වැඩි වන තරමට පඩිත් අඩුවෙනවා. දැන් රස්සාව නැති මිනිස්සුන් වැඩිවන තරමට පඩි වැඩිවෙනවා"යි මිදුලේ කතා කරමින් උන් තිදෙනාගෙන් එකෙක් වන දෙමාලසිංහ කී ය.

''අවුරුදු දෙළහකට විතර උඩදී මම මැට්‍රික් පාස් කළ තරුණයෙක් රක්සාවට ගත්තේ රුපියල් හැත්තෑපහේ පඩියට. ඒ කාලේ මැට්‍රික් පාස් කළ තරුණයෝ හිඟයි'' කබලානා කී ය. ''අවුරුදු හයකට පමණ උඩදී රක්සාව නැති මැට්‍රික් පාස් කළ තරුණයෝ හුඟක් වැඩි උණා. පඩි නැතුව තුන් හාර මසක් වැඩ කරන්ටත් ඊට පස්සේ වැඩ හොඳ නම් පඩියක් නියම කරන්ටත් කියමින් උන් ඉල්ලුම් පත්‍ර එවන්න පටන් ගත්තා. මම එකෙක්වත් පඩි නොගෙවා වැඩට ගත්තේ නැහැ. හැබැයි, ඉස්සර පටන්ගැන්මෙදී ගෙවූ පඩිය වන රුපියල් හැත්තෑපහ මම රුපියල් තිහ කළා. උන් ඒ පඩියට උණත් පොර කකා රස්සාව ඉල්ලන්න පටන් ගත්තා.''

''දැන් කවුරු ගත්තත් වැඩි පඩියක් ගෙවන්න ඕනෑ. අලි අපරාදයක්! රුපියල් හතළිහකට උණත් එන්න කැමැති රස්සාව නැති මිනිස්සු ඉන්නවා. අපට ඕනෑ කෙනෙක් අපට කැමැති පඩියක් ගෙවා ගන්න දැන් ඉඩක් නැහැ. නමුත් අපි බඩු විකුණන්න ඕනෑ ගන්නා මිනිස්සුන් නියම කරන ගණනටමයි!''

''රස්සාවක් කරන්න බැරිව නිකම් කෑ කෝ ගාන මිනිස්සුන් තමා මන්ත්‍රණ සභාවලට පත් වෙන්නේ. වෙළඳාම ගැනත් කර්මාන්ත ගැනත් ඒ මිනිසුන් දන්නා උලව්වක් නැහැ. උන් කෑමුර ගාන්නේ නූගත් මිනිස්සුන් සන්තෝෂ කරන අදහසින්. උන් එකා රුපියල් හත් අට සීය බැගින් පඩි ගන්නවා. අප ළඟ වැඩ නොකරන මිනිස්සුන්ටත් උන් වැඩි පඩි අරගෙන දෙනව. තව අවුරුදු පහකින් රට බංකොලොත් වේවි.''

කර්මාන්ත හිමියෝත් වෙළෙන්දෝත් උදේ සිට හවස් වන තුරු වෙහෙසී වැඩ කරති. රැයෙහි ද ඔවුන් නොනිදා සිතන්නේ තම තමන්ගේ කර්මාන්ත හා වෙළඳාම් ගැන ය. ඔවුන් තමන්ගේ මුළු කාලය යොදන්නේ කර්මාන්තය හෝ වෙළඳාම හෝ ගැන ය. තමන් සතු වස්තුව පමණක් නොව ඇතැම් විට ණයට ගත් වස්තුව ද යොදන්නේ ඒ ව්‍යාපාරයන් උදෙසා ය. ඔවුන් එසේ නොකරතොත් ඒ ව්‍යාපාරයන් සාර්ථක වන්නේ කෙසේ ද? කර්මාන්තශාලාවල හෝ වෙළඳ සැල්වල හෝ සේවකයෝ නියමිත පැගණනක් වැඩ කරති. කර්මාන්ත හිමියන් හෝ වෙළඳුන් හෝ ඉතා සෙවිල්ලෙන් උනන්දුව නොසිටියොත් සේවකයෝ අලසකමින් කාලය ගතකරති. ඔවුන් ගෙදරවලට ගිය පසු තමන්ගේ කාර්‍යයන් අමතක කොට විනෝදය සොයති. කර්මාන්ත හිමියන්ගේත් වෙළඳුන්ගේත් අපූර්ව උද්‍යොගය නිසා නොවේ නම් එකම කර්මාන්තයකින්වත් වෙළඳාමකින්වත් ලාබ ලැබිය නොහැකි ය. ලාබ ලැබීමයයි කියන්නේ වැඩි පුර නිපදවීමට ය. කර්මාන්ත හිමියන් හා වෙළඳුන් පන්නා සියලු ව්‍යාපාරයන් සේවකයන් අතට

දීම, රන් බිජුවට දමූ පාත්තයා මැරීම වැන්නයි සිතූ කබලාන වඩාත් කිපුණේ ය.

"දැන් මහන්සි වෙලා වෙළඳාම කරන්න හිතෙන්නේ නැහැ" චන්ද්‍රසෝම වැලිවල කී ය. "මහන්සි වෙලා හම්බකරන මුදල්-වලින් වැඩි හරියක් පඩියට යනවා. ඉතුරු ආදායමෙන් ලොකු කොටසක් ආදායම් බදුවලට යනවා."

"කිසිම රක්සාවක් කරන්න බැරි, කටින් බතලකොළ හිටවන මිනිසුන් මන්ත්‍රීන් වීමේ විපාක තමා" යි සවිමන් කබලාන කී ය. "මාලින්ගේත් කල්පනාව තියෙනවා මන්ත්‍රී කමක් සඳහා වැඩ කරන්න! මෝඩයා——"

"ඇත්ත ද?" යි දෙමාලසිංහ ඇසුවේ ය.

"මම එයාට බැන්නා හොඳටම. මම කිව්වා ඔය මන්ත්‍රියෙකුට වෙළඳ සැලකින් රුපියල් දෙසීයක පඩියක් ලබාගන්නට බැරිය කියා. මන්ත්‍රීන්ගෙන් ලියුම් අරගෙන එන ඇයන්ගේ ඉල්ලුම් පත්‍ර ඔක්කොම වීසි කරනවා!"

සවිමන් කබලාන සතියකට උඩදී මහා ගරාජයක් සහිත සීමා-සහිත දුන්හිඳ සමාගම මිලට ගත්තේ එහි වටනාකමට වඩා විශාල මුදලක් ගෙවීමෙනි. කොතරම් ගුරයකු වුව ද කබලාන ඒ ගනුදෙනු-වෙහිදී රැවටිණැ යි දෙමාලසිංහ සිතුවේ ය.

"දුන්හිඳ ගරාජයට ගෙවූ ගණන බොහොම වැඩි නෙවද?" යි දෙමාලසිංහ ඇසුවේ ය.

"ඔව්! වැඩි බව දැනගෙනයි මම ඒක ගත්තේ."

"ඒකෙන් ලාබයක් උපද්දන්න පුළුවන්ද?"

"මම ඒක කඩා විනාශ කරනවා! වැඩට ගන්ට පුළුවන් මැෂින් හා වෙනත් දේ උගුල්ලා අපේ ගරාජයට ගෙනියනවා. අනිත්වා කඩා යකඩවලට විකුණනවා."

"එතකොට හැබැම අලාබයක් වෙනවා නෙව."

"ඔව්; නමුත් ඒ වගේ දෙගුණයක් මම අවුරුදු දෙකකින් හම්බ කරනවා!"

"ගරාජය ඒ විදියටම පැවැත්වීමෙන් එපාය හම්බ කරන්න."

සවිමන් කබලානගේ කට කොන සිනාවක් නැංගේ ය.

"ගරාජය ඒ විදියට පැවැත්වීමෙන් අවුරුද්දකට රුපියල් හත් අට දහසකට වැඩිය අලාබ වෙනවා. ගරාජය තිබෙන තැන හොඳ නැහැ. උන් වික්කේ අලාබ වන එක කොහොමවත් නවත්තන්න බැරි නිසා. වෙන කවුරුවත් ගරාජය ගත්තොත් එහි තියෙන දේ ඔක්කොම උගුල්ලාගෙන ගොස් අනිත් තැනක සවිකොට විසාල

ගරාජයක් පටන් ගනීවි. එහෙම උණොත් අපේ කර්මාන්තය
දූන් ලැබෙන ලාබ හුඟක් අඩු වෙනවා.''

කබලානගේ වෙළඳ බුද්ධිය කෙතරම් සියුම්දැයි සාහසික
දෙමාලසිංහට වැටහෙන්නේ දූන් ය. සත විසිපහ පවා අත නැ
අයකරන කබලාන, ඉඟුරන් ඇමට ගෙන බලයන් බාන අන්දම
වෙළෙන්දකු නොවන බව දෙමාලසිංහ මීට පෙර නොදත්තේ ය
ඔහු තල්මසුන් ඇමට ගෙන තිමිංගලයන් බාන්නෙකි! එහෙත් හාල්
මැස්සා ද අතනාරින්නෙකි.

''ඕහෝ! තල්මසකු ඇමක් කොට ගෙන තිමිංගලයන් බාන්ට
අදහස. මට තේරෙන්නේ දූන්''යි දෙමාලසිංහ කීවේ ය.

සචිමන් කබලාන සිනාසුණේ ය.

''මගේ කර්මාන්ත ශාලාවට හානි කරන්ට සිටි කොම්පැනි
තමා දුන්හිඳ ගරාජය. සුද්දන්ගේ සමාගම්වලින් මගේ වෙළඳාම
පහර වදින්නේ නැහැ.''

කබලාන ධනය සැපයීමෙනුත් රැස්කිරීමෙනුත් මහත්ම සන
තෝෂය ලබන්නකු බව දෙමාලසිංහ දනියි. මසුරකු නොවූව ද ඔ
තමාගේ ධනකඳ ඉහළ නගිනු දැකීමට අතෘප්තිකර ආශාව ඇත
තෙකි.

''දූන් ඔය මුදල් සම්බ කළා මදි ද?''යි දවසක දෙමාලසිං
කබලානගෙන් ඇසුවේ ය.

කබලාන සිනාසුණේ ය.

''මම හම්බකර තිබෙන ධනය මොකක් ද? අමෙරිකාවෙ තිය
ඉන්දියාවේ මහා ධනවතකුගේ ධනයට සම කරන විට මගේ ධන
මහමෙර ඉදිරියෙහි වූ ගල් කැටක් තරම්වත් නැහැ.''

කබලාන ධනය සපයන්නේ කොතරම් අතෘප්තිකර ආශාවකින්
දැයි දෙමාලසිංහ වටහාගත්තේ මේ පිළිතුරු ඇසූ ද ය. කබලා
බොරු මානයෙන් හා නම්බු නාම වලින් සන්තෝෂ වන්නෙ
නොවේ. ඔහු සන්තෝෂ වන්නේ ධනය ගොඩ ගැසෙනු දැකීමෙ
ඔහු ගර්වයෙන් සලකන්නේ ඔහුගේ ගුරකම පමණි. ඔහුගේ දය
වත් කරුණාවත් ධනය රැස් කීරීමේ ආශාව නමැති යකඩ සපත්තුව
හසුවීමෙන් මිරිකෙයි. ඔහු තමාගේ සේවකයන්ට නිර්දය ලෙ
සලකන්නේ වැටුප් ප්‍රශ්නයෙහිදී පමණි. සෘජුව ළැදිව වැඩ කර
සේවකයන් පමණක් නොව අනික් සේවකයන් ද තළා පෙළා වුව
නිර්දය ලෙස ඔවුන්ගෙන් වැඩ ගන්නා කළමනාකාරයෝ ඔහුගේ
සිත් ගනිති. අනික් සේවකයන්ගේ ශ්‍රම ශක්තිය මිරිකා ගතනු
තැනදී සැලෙමින් පසුබාන්නා කොතරම් දක්ෂයෙක් වුව ද ඔහුගේ
සිත් නොගනියි.

තමාගේ ශ්‍රම ශක්තියෙහි අවසාන බින්දුව දක්වා වුව ද මිරිකා-ගැනීම සඳහා සිත කය දෙකම වෙහෙසන කබලාන අනික් මිනිසුන්-ගේද ශ්‍රම ශක්තිය මිරිකාගැනීම වරදක්යයි කිසි විටක නොසිතයි. එහෙයින් ඔහු කළමනාකාර කම්වලට සුදුස්සන් ලෙස සලකන්නේ තමා මෙන් වෙහෙස නොතකා වැඩ කරමින් සේවකයන්ගෙන් ද වැඩ ගැනීමට හුරුකම ඇති නිර්දය මිනිසුන් පමණි. ඔහු හැම මිනිසාම විනිශ්චය කරන්නේ ඒ වෙළඳ මිනුමෙනි. ඔහු සන්තෝෂ වන්නේ සිත කය දෙක වෙහෙසා වැඩ කිරීමෙනි. හිස උස්සාගෙන තමාගේ කාර්යයන් කරන්ට හැකි තාක් ඔහු නිසොල්මන් නොවෙයි. ඇඟේ රුදවක්, හිසරදයක් වැනි සුළු අසනීපයක් නිසා ඇඳෙහි වැති-රෙන මිනිසුන් ගැන අසන ඔහු කෝප වෙයි.

අරවින්ද ආපසු හෝටලයට ගියේ රෑ දෙළහට පමණ ය. තව-මත් මඳක් බැමෙන හිසක් ඇති වික්‍රමනායක සිනාසෙමින් අරවින්-දගේ කාමරයට ඇතුළු වූයේ ය.

මාලින් ගොස් නොබෝ වේලාවකින් මහා හෝටලයේ බරාඳ-යෙන් නික්මුණු වික්‍රමනායක ගියේ පිටකොටුවේ වික්ටෝරියා හෝටලයට ය. එහි දී ඔහු ආහාර අනුභව කොට නැවතත් මහා හෝටලයට ගොස් එහි බරාඳයේ පුටුවක හිඳගත්තේ ය.

"මම එනකල් වික්‍රමනායක හුඟක් වෙලා බලන් ඉන්න ඇති."

"ඒක මට—හොඳට—පු—පුරුදු—කාරියක්— හ්හ—හා—හා."

වික්‍රමනායක වචනයක් දෙකක් හෝ තුනක් හෝ කියා මඳක් නවතියි; නොඑසේනම් සිනාසෙයි.

"මම අද කැමකට ගියා."

"මම දන්නවා—මාලින් මහත්තයා කිවුවා."

"ඕහෝ! මාලින් හම්බ වුණා ද?"

"ඔව්; ඇවිත් ටිකක් වෙලා මා එක්ක කතා කරමින් උන්නා. මාලින් මහත්තයා යන්නේ නෑ කිවුවා. කැමට හුඟ දෙනෙක් ඉන්න ඇති."

"පිරිමි හතර පස් දෙනකුට වැඩිය උන්නේ නැහැ. අනික් ඔක්කොම ගෑනු—වැලිවල නෝනා, නීලා, සිරිමා රැක්අත්තන, මදිරා දෙමාලසිංහ—"

"දෙමාලසිංහ නෝනාත්—උන්නා!"යි කියමින් වික්‍රමනායක සිනාසුණේ ය.

"වික්‍රමනායක අඳුනනවා ද?"

"ඔව්—එයාගේ මහත්තයා මගේ යාළුවෙක්;— නෝනා හරි-යට ආඩම්බරයි."

Scanned by CamScanner

"ඒක තමයි එහෙනම් චමරිත්, නීලාත්, ඇනුම්පද කිවුවෙ"

"ඒ නෝනා ගැන— මම හොඳ විත්තියක් කියන් —නම් —ග්හ—තා—හා."

වික්‍රමනායක දවසක සවස් වරුවේ දෙමාලසිංහ මහත්මයා හමු වීමට ඔහුගේ නිවසට ගියේ ය. මදිරා දෙමාලසිංහ ආලින්දයේ සිටියා ය.

"දෙමාලසිංහ මහත්තයා ඉන්නවා ද?" යි වික්‍රමනායක ඇසුවේ ය. ඔහු මදිරා දෙමාලසිංහ නෝනා හා මීට පෙර කතාබහ කළ එකෙක් නොවී ය.

"මොන මහත්තයා ද?" මදිරා දෙමාලසිංහ නෝනා ඇසුවේ කෙළින් කර ගත් හිසත් තරහයෙන් හැකිළුණ දෙබැමත් ඇතිව ය. දෙමාලසිංහ නෝනාගේ මුහුණ වෙනස් වනු වික්‍රමනායක දුටුවේ ය.

"දෙමාලසිංහ මහත්තයා—"

"බව්ද?"

මදිලා දෙමාලසිංහ මේ වර වික්‍රමනායකගේ දෙපා තෙක් බැලුවේ වැයමින් ආරූඪ කර ගත් ගර්වයකිනි. වික්‍රමනායක ඇගේ යටි අදහස් වටහාගත්තේ ය.

"මේ—මෙහේ ඉන්න දෙ—මා—ල—සිං—හ— මහත්තයා—"

වික්‍රමනායක කට කොනට නැගූ සිනාව දුටු මදිරා දෙමාලසිංහ තවත් කෝප වූවා ය.

"මෙහේ ඉන්න බව්ද?—"

"උඹේ වාහෙ!'

මදිරා දෙමාලසිංහ නෝනාගේ මුහුණ, අබ පිපිරවිය හැකි තරම් රත් වී ය. ඇ අනික් අතට හැරී 'ජේම්ස්' යි ගිගුරුවා ය.

"වැඩකාරයා දිව ආවොත් මම උාට පාඩමක් උගන්වන්නම්'යි සිතින් කියූ වික්‍රමනායක මඳ වේලාවක් බලා සිටියේ ය. මදිරා දෙමාලසිංහ 'ජේම්ස්' යයි වඩාත් කෝපයෙන් කියමින් ගේ ඇතුළට ගියා ය. වික්‍රමනායක වටපිට බැලුවේ ය.

"හාමුදුරුවෝ!"

යට දක්වූයේ වික්‍රමනායක කී කථා වස්තුව ය.

"ම—මම—බරාදයෙන් හෙමින්—ගමන් කොට උයනේ වම—පැත්තේ—දොරටුවෙන් පිටවී පාරට බැස්සා"යි කියමින් වික්‍රමනායක කතාව අවසාන කෙළේ ය.

අරවින්ද හොඳටම සිනාසුණේ ය.

''දෙමාලසිංහ නෝනා එහෙම කතා කෙළේ වික්‍රමනායක එහි යනවාට අසතුටු නිසා ද?''

''නෑ—දෙස්තර—මහත්තයා''යි වික්‍රමනායක කී ය. ''මේ—මම එහි යන්ට මාසෙකට උඩදී දෙමාලසිංහට—නම්බු නමක් ලැබුණා. ඒක එයා ලබා ගත්තේ—සල්ලි වියදම් කරලා. මම 'දෙමාලසිංහ මැතිතුමා' නැත්නම් 'දෙමාලසිංහ හාමුදුරුවෝ'යි නොකිව්වට—ඒ නෝනා තරහ වෙන්න ඇති.........තරහ වෙන බව කලින් දන්නවා නම්—මම ''හාමුදුරුවෝ'' යයි කියනවා. 'හාමුදුරුවෝ' කියන එක— 'මහත්තයා' කියන එකට— වඩා කටට—පහසුයි.''

''ඉතින් එහෙම නොකියා ඒ නෝනා කෝප කළේ මොකට ද?'' යි අරවින්ද ඇසුවේ ය.

''මටත් තරහ ගිය නිසා, හ්හ—හා—හා''

''තාත්තා ගියා ද?''

''ඔව්; කඩේත් වතුවලත් වැඩ තියනවාය. කියා ඊයේම ගියා. අනිද්ද ගෙට ගොස් පදිංචි වෙන්න පුළුවනි. තාත්තාත් එක්ක ගොහින් ගෙට ඕනෑ ලී බඩුත් අනිත් දේත් ගත්තා.''

''ලී බඩු ගන්න ඉස්සර මමත් බැලුවා නම් හොඳයි නෙවද?''

''හෙට බලන්න පුළුවනි. දෙස්තර මහත්තයට ඕනෑ සැට් එකක් තෝරාගන්න පුළුවනි. තාත්තා සල්ලි ගෙවුවේ එහෙම කියලා—''

''එහෙනම් මම අනිද්ද උදේම හෝටලේ තිබෙන මගේ බඩුත් ඒ ගෙට යවනවා. වික්‍රමනායක එහේ අනිද්ද උදේට ඉන්න.''

''වැඩ කාරයෝ දෙන්නෙක් ඊයේ හිටන් ඒ ගෙයි ඉන්නවා.''

Scanned by CamScanner

# 10

ඇවිදීමෙන් කය වෙහෙසීමත්, කිසිවකු විසින් කෝප නොකර රතු ලැබීමත් ජැටියේ වැටට හාන්සිවී මුහුදු සුළං ආශ්වාස කිරීම නිසා මාලින්ගේ සිත සන්සුන් වී ය.

උසස් නිලධාරියකු ලෙස වුව ද ආණ්ඩුවට බැඳෙන්ට මාලින් කැමැති නොවී ය. ආණ්ඩුවේ ලොකු නිලධාරියකු වීමේ අනුසස් මව කියනු අසන හැම විට මාලින් කිපෙන්නේ ය. ඔහු පියාගේ කන්තෝරුවට ගොස් එහි වැඩ උගන්නේ සන්තෝෂයෙන් නොවේ. ඉංගිරිසින් මෙන් කන බොන, යන එන, අඳින පළඳින සංග්‍රහ පවත්වන තම මවුපියන්ගේ ගතානුගතික ජීවිතය මාලින්ට අප්‍රිය වූයේ පාසැලෙහි ඉහළ පන්තියෙහි උගන්නා කාලයෙහිම ය. ඉංගිරිසින් අනුකරණයට වෙහෙසෙන තම මව එයින්ම සන්තෝෂ වී ජීවත් වන්නේ කෙසේ ද? ප්‍රවෘත්ති පත්‍රය හැර අනික් පොතක් පත ඈ නොකියවයි; ප්‍රවෘත්ති පත්‍රය ගත් විට ද ඈ පළමුව කියවන්නේ විවාහ ගිවිසුම්, මරණ පුවත් පිළිබඳ දැන්වීම් තීරයයි. පත්‍රයේ 'පම්පෝරි' තීරයත් 'විලාප' තීරයත් ලෙස හැඳින්විය යුතු ඒ පිටුව මාලින් නොකියවයි. මව ඒ තීරු කියවූ අනතුරුව බලන්නේ 'මඟුල් ගෙදර වරුණ' හා 'මරණ ගෙදර වරුණ' නමින් හැඳින්විය යුතු ප්‍රවෘත්ති ය. අනතුරුව ඈ ආණ්ඩුකාරයාගේ ගමන් බිමන් හා රාජවාසල සංග්‍රහයන් පිළිබඳ පුවත් ආසාවෙන් කියවයි.

පියාගේ කන්තෝරු කාමරයට යාව පිහිටි විශාල කාමරය ඉංගිරිසි පොත්වලින් පිරුණු පොත්ගුලකි. වෙළඳාම හා කර්මාන්ත පිළිබඳ පොත් පමණක් නොව, අනික් සාහිත්‍ය කලා විෂයන් පිළිබඳ පොත් හා හොඳ නවකතා ද එහි සුලභ ය. මව ඒ පොත්ගුල දෙස බල බලා දිනපතා ඉංග්‍රීසි පත්‍රයත් ඉරිද පත්‍රයත් කියවීමෙන් සන්තෝෂ වෙයි. කලාතුරකින් සිනිමා සාලාවට යන ඈ එහිදී, සිපින, හඬන, දෙඩන, කඳුළු හෙළන ගැහැනුන්ගේත් පිරිමින්ගේත් විගඩම බල සන්තෝෂ වෙයි.

සමාජයෙහි අනික් බොහෝ තරුණියන් මෙන් එමරි ඇඳුම් පැළඳුම්වලින් ගත සැරසීමෙන් ද වත්සුණු සුවඳ විලවුන්වලින් වත බැබළවීමෙන් ද මුදල් සපයනු පිණිස බටහිර සමහර මිනිසුන් ලිය පළකරන පහළ පන්තියේ සහරා, නවකථා කියවීමෙන් ද සිනිමා මඩුවට ගොස්, වාඩ ගැමියන් පවා සිනාස්සන බොළඳ කතා බොළඳ චරිත බලා සන්තෝෂ වීමෙන් ද පමණක් තෘප්ත වන



Scanned by CamScanner

තරුණියක නොවූයේ තමා නිසා බව මාලින් දනියි. අනික් ඇතැම් තරුණියන් මෙන් වමරී ද මුලදී කොටුවේ පොත් සාප්පුවලට ගොස් සිතියම් සහිත සඟරා හා බොළඳ නවකථා පොත් ගෙනැවිත් දෙසතියක් තිස්සේ කියවමින් විනෝදස්වාදයක් ලැබුවා ය. වමරී ක්‍රමයෙන් මේ ඇබ්බැහිකමින් මිදුණේ මාලින් විසිනි. ගැහුන්ගේ මුහුණු, ඇස්, තොල්, තන, (...)ළු, කකුල් හා ඔවුන්ගේ බැලුම්, කෙඳිරීම්, හැඬීම්, සිපුම් ද පොතටත්, සඟරාවටත්, සිත්තමටත් ආරුඪ කොට මුදල් සැපයීම, බටහිර මිනිසුන් අතර මෙකල සියුම් කලාවකි. හැට්ට කරට උඩින් මදක් ඉස්සුණු හෝ සැට්ටය මතු කරගෙන පිම්බුණු හෝ පියයුරු ඇති හැඟැනියක, සිප වැළඳ ගන්නා ගැහැනියක හා මිනිසකු, යන ආදී සිත්තමින් තොර වූ සිනිමා දැන්-වීමක් ප්‍රවෘත්ති පත්‍රයක මෙකල දක්ක හැකිදැයි මාලින් තමාගෙන්ම ප්‍රශ්න කෙළේ ය.

තරුණියන් පස්සේ දිවීමෙනුත් හෝටල්වල පැවැත්වෙන බාල්-නැටුම් ආදියට එක්වීමෙනුත් මාලින්ට සන්තෝෂයක් නොලැබිය හැකි ය. ඔහු කාමාශාව මිරිකා හළ එකකු වැන්න. උගන්නා කාලයෙහි බෙහෙවින් පොත් පත් කියවූ ඔහු දැන් එයින් එතරම් ආස්වාදයක් නොලබයි. තමාට අප්‍රිය ගතානුගතික සමාජය මැනවයි සම්මත කරන දේ නොකිරීමෙහි දැන් ඔහු වඩාත් සන්තෝෂ වන්නේ. ඔහු මවුපියන්ගේ සිත් රිද්දන්නේ එය සමාජයේ ද සිත් රිද්දීමක් වන බැවිනි.

ජැට්ටියෙන් නික්ම ගමන් කළ මාලින් මහාවීදියට බැස්සේ ය. නවත්වන ලද විදුලිරිය ගමන ඇති මහාවීදිය රථ වාහනවලින් තොර වී ය. ඔර්ලෝසු කණුව අසල වූ රික්සෝ හතරක ලාම්පු වනාහි දික් කරගත් ඉස්සරහ කකුල් හා උස්සා ගත් හිස් ද ඇති සතුන් හතර දෙනකුගේ ඇස් මෙන් බබළයි. අඳුරෙන් වැසුණු වරායෙහි නැවක කුඹගසෙහි පහන, තරුවක් සේ දිලෙයි. පෙරහැරක් මෙන් ගමන් ගත් රථ වාහනත් සාප්පු තුළට ඇතුළු වන ජනයාත් නිසා දහවල් කාලයෙහි හටගන්නා කලහයෙන් තොර මහා වීදිය, මාලින් ලවා සිහිකරවූයේ තුදුරුව එන සතුරු සේනාවට බියෙන් පලා ගිය මිනිසුන් ඇති කුඩා නගරයකි. ඔහු ගැස් පහ හන්දියෙහි නැවතී වටපිට බැලී ය.

මහත්මයා මරදානට යන්න ද? මේ පාර කිව්වුයි'' කෝලිය් කාරයා කී ය.

''මම දන්නවා—මම කල්පනා කෙළේ කොහාට යනවා ද කියා නිශ්චය කරගන්න බැරිව!''යි කියමින් මාලින් සිනාසුණේ ය. ඔහු කෙළින්ම ගොස් උසාවිය අසළින් දකුණට හැරුණේ ය; මද වේලාවකින් යළිත් වමට හැරී පාරට බැස්සේ ය. සුවඳ හමන ඇඳුම් ඇඳ

මුහුණෙහි පුයර තවරාගත් ගැනියක්, මාලින් පසු කොට යන්නට පෙර, දෙතුන් වරක් ඔහු දෙස බැලුවා ය.

පංචිකාවත්ත පාරට පිවිස දුම්රිය පළ ඉදිරියට ළඟා වූ මාලින්ට වෙහෙස දැනිණ. ඔහු හෝටලයකට වැදී උඩුමහලට නැඟී කාමරයකට ඇතුළු වූ කෙණෙහි එහි විදුලි පහන ද දැල්විණ. ඒ කාමරයට යාව පිහිටි කාමරයෙහි ද විදුලි පහන දැල්වෙයි. ගැහැනියකගේත් පිරිමියකුගේත් කට හඬත් සිනා හඬත් ඇසෙයි. 'සිනමා බලන්ට ආ දෙදෙනකු විය යුතු ය' යි මාලින් සිතුවේ ය.

''ටක් ටක්!''

මාලින් දොර හැරියේ ය. කුකුළු මාළුත් පානුත් ගත් සේවකයකු දකින අදහසින් දොර හළ ඔහු දුටුවේ කෝපයෙන් විදහාගත් රතු දෙනෙත් ඇති තරුණයෙකි.

''අර පැත්තේ මෙපමණ කාමර තියෙද්දී මේ කාමරේටම ආවේ මොකොට ද?'' යි ඔහු තරහයෙන් ඇසී ය.

''මට ඕනෑවට,''යි කියමින් මාලින් දොර වසා ගොස් පුටුවෙහි වාඩි වූයේ ය.

තරුණයා යළිත් වේගයෙන් දොරට ගැසුයෙන් මාලින් මේ වර දොර හැරියේ කෝපයෙනි. ඔහු, මත්පැනින් හා කෝපයෙන්, ලොවි ගෙඩි දෙකක් සේ රතු වුණු ඇස් විදහාගෙන දොරටුවෙහි උන් තරුණයා බෙල්ලෙන් අල්ලා තල්ලු කෙළේ ය. කාමරයෙහි උන් ගැහැනිය, ඔහු බිම වැටෙනු අසා එළියට ආවා ය. කෝපයෙන් නැඟී මාලින් ගහන්ට ගිය තරුණයා, හෝටලයේ සේවකයන් විසින් අල්ලාගෙන ගොස් අනික් කාමරයකට ඇතුළු කරන ලදී.

මාලින් කෑම කා හෝටලයෙන් බැස රික්සෝවක නැංගේ ය. 12.30 ට පමණ අනෝමා මැඳුරට ළඟා වූ ඔහු රික්සෝකාරයාට රුපියලක් දුන්නේ ය.

''අපෝයි! මදි මහත්තයා.''

ඔහු තව සත පනහක් දුන්නේ ය.

''මදි මහත්තයා''යි රික්සෝකාරයා කී ය.

''තවත් කීයක් ද ඉල්ලන්නේ.''

''තව පනහක්වත් දෙන්න.''

මාලින් තව සත පනහක් දුන්නේ ය. ඒ සත පනහ ඔඩොක්කුවෙ දමාගත් රික්සෝකාරයා 'මට තව රුපියලක්ම ඉල්ලන්න බැරි උණා!' යි කියමින් ගමන් කෙළේ ය. ගලින් පතුරක් ගසාගන්නාක් මෙනි ඇතැම් ධනවතකුගෙන් නියම කුලිය ලබාගත හැක්කේ. එවැන්නන්ගෙන් ලැබෙන අඩු කුලියටත් පිරිමැසෙන සේ මාලින්

වැන්නන්ගෙන් වැඩි කුලිය අය කළ යුතුයයි රික්සෝකාරයා සිතුවේ ය. ඔහු දෙරටුවෙන් පිටවී තාප්පයේ කුළුණු කණුවෙහි සවි කරන ලද පිත්තල පුවරුවේ අකුරු කියවන්ට තැත් කෙළේ ය. ඔහු ගිනිකූරක් ගසා 'ANOMA' යන අකුරු පහ අමාරුවෙන් කිය වූයේ ය.

"මේ මහත්තයා සොයාගෙන දවසක එන්න ඕන. අගහිඟ කියා රුපියල් පහක් ණයට ඉල්ලාගන්න පුළුවන් වෙයි" රික්සෝකාරයා සිතී ය.

මාලින් ලෝබයෙක් නොවේ; ළදරුවෙක් ද නොවේ; රික්සෝකාරයා වැන්නන්ට පිළිකුල් කරන්නෙක් ද නොවේ. එහෙයින් එවැන්නන්ගේ සාක්කුවලට අත දැමීම පහසු ය. මුදල් සැපයීමෙහි ශූර ධනවතුන් තමාට නිර්දය ලෙස සලකන සැටි රික්සෝකාරයා සිහි කෙළේ ය. ඔවුන් නිසා ඔහු තුළ හටගන්නේ බියකි; ද්වේෂයකි. එහෙත් මාලින් නිසා ඔහු තුළ හටගන්නේ බියක් නොවේ. කරුණාවක් ද නොවේ. ඔහු සිතුවේ මාලින්ගෙන් මුදල් කඩාගත හැකි උපාය ගැන ය. ඔහු අවේලාවේ පංචිකාවත්ත පැත්තේ ඇවිදින්ට ගියේ කුමට ද? ගණිකාවන් පෙන්නා ඔහුගෙන් මුදල් කඩාගත නොහැකි ද?

රික්සෝකාරයා, මාලින්ගේ මුහුණත් දික් සිහින් නැහැයත් කුඩා කටත් පිස්සකුගේ ඇස් දෙක වැනි ඇස් දෙකත් හැඩහුරුකමත් හොඳින් සිහි කෙළේ ය. ඔහුගේ ටසෝර් කලිසමත් දික් අත් ඇති ඉරි සහිත පට කමිසයත් රික්සෝකාරයාගේ සිත්සතන්හි ඇඳුණු සිත්තම් දෙකක් වැන්න.

මාලින් එන තෙක් අවදියෙන් සිටි සේවකයා, කොරිඩෝරයේ දොර හැර විදුලි පහන දැල්වූයේ ය. මාලින් දොර වසා යතුරු දමා පහන ද නිවා තම කාමරයට ගොස් එහි විදුලි පහන දැල්වූයේ ය. අනික් පැත්තේ කාමරයට වී නොනිදා පොතක් කියවමින් උන් චමරී දොර හැරගෙන මාලින්ගේ කාමරය දෙසට ගියා ය.

"මාලින් අයියා දැන් ද ආවේ?"

"ඔව්—ඇයි?"

"අම්මා නිදාගන්න ගියේ තරහයෙන්."

"මෙතන සංග්‍රහයෙන් හා කතාබහ අවසාන වන වේලාව දන්නවා නම් මට හරියට ඒ වෙලාවට එන්න පුළුවනි"යි මාලින් කීවේ ය.

"මමත් අද තරහයෙන් උන්නේ. අර ගෑනිගේ පුරසාරම් අහන්න බැරිව."

"කාගේද? දෙමාලසිංහ නෝනාගේ?"

"වෙන කාගෙද? අයිස් කෝපි ඇති එවන්න ද?"

"එපා".

චමරී උගන්නා කාලයේ ද අනුකරණය කෙළේ තම මව තො
මාලින් ය. කාගේ වුව ද සිත රිද්දීමටත් සිත රිද්දන බස් තෙප
මටත් ඈ උගත්තේ තම සහෝදරයාගෙනි; ඇතැම් විට පියාගෙ

# 11

සර්මන් කබලාන තමා ඉදිරියේ උන් සේවකයන් හතර දෙනා දෙස බැලුවේ ය.

''මේ ලියුම එවුවේ තුඹලා හතර දෙනා–''

''එහෙයි'' යි නායකයා කී ය.

ගිනි උදුනක් වැනි කම්මලෙන් පැමිණි කම්කරුවෝ, විදුලි පවන්පතින් සිහිල්වුණු කාමරය අයිස් කාමරයක් තරම් සිසිල් කරනු ලැබූවක්යයි සිතුවෝ ය. කබලාන ඉදිරියෙහි වූ විශාල මේසයත්, පුටු තුන හතරකුත් කොනක වූ අල්මාරියත් හැර අන් කිසිවක් කාමරයෙහි නොවී ය.

''තුඹලාට ගෙවන පඩිය මදි—''යි කියමින් කබලාන, නායකයා දෙස රවා බැලුවේ ය.

''මම ළමයි හතර දෙනෙක් ඉන්න පවුල්කාරයෙක්.—සර්.''

''ළමයි හතර දෙනාටත් පවුලටත් පඩි ගෙවන්න කියනවා ද?''

''නැහැ සර්—අපට වියදමට මදි.''

''වියදමට මදි නම් ගෙදර නිකම් ඉන්න ළමයින්ටත් හම්බ කරන්න කියාපන්''යි කියමින් කබලාන ෆයිල් එකක් පෙරළා බැලී ය.

''ජයනායක.''

''එහෙයි,''

''එක පාරටම තුඹට රුපියල් දහයක් වැඩි කරලා තියෙනවා.''

''ඒ අවුරුදු තුනකට ඉස්සර.''

''අවුරුද්දකට ඉස්සර—''

කබලාන ෆයිල් එකේ පිටුවක් පෙරළා කියවූයේ ය.

ජයනායක අත්දමන්දව වට පිට බලන්ට වූයෙන් කබලාන ෆයිල් එක හකුළා ඉවත තැබී ය.

''තුඹ හොඳින් වැඩ කළ නිසා තමයි රුපියල් දහයක් මම එක වරටම වැඩි කෙළේ. අනික් තුන් දෙනාගේ වැඩ කොහෙත්ම හොඳ නැහැ. ෆෝර්මන් ගිය අවුරුද්දේ ලියාපු වාර්තාව මා ළඟ



Scanned by CamScanner

තියෙනවා''යි කියූ කබලාන තවත් පොතක් ගෙන දිග හැර බලා එහි සඳහන් වගන්තියක් කියවූයේ ය.

''මෙතැන් සිට හොඳින් වැඩ නොකළොත් නුඹලා දෙන්නම අස් කරනවා.''

සේවකයන් නික්ම ගිය පසු කබලාන, තමාගේ ලියන්නාට හඬගා මෙසේ කී ය.

''ජයනායක හොඳ වැඩකාරයා. එයාගේ පඩි වැඩි කරන්න බැහැ. එයාට වඩා පරණ හොඳ වැඩකාරයෝ කීප දෙනෙක් ඉන්නවා. එයා අස්වෙන්ට නෝටිස් දුන්න දවසක පමණක් එයා ගැන මට දන්වන්ට ඕනෑ.''

ලියන්නා ෆයිල් දෙක අතට ගත්තේ ය. පියුන්කාරයා කාඩ් පතක් ගෙනැවිත් කබලානට දුන්නේ ය.

''එන්න කියාපන්.''

සැම්පල මිටියක් අතින් ගත් තැරැව්කාරයෙක්, කන්තෝරු කාමරයට ඇතුළුව කබලානගේ දකුණු පැත්තෙහි වූ පුටුවෙහි හිඳ-ගත්තේ ය.

''මොකද සුරසෝම හදිසියේ?''

''මැනේජර් මහත්තයා කිවුව මේ රෙදි සැම්පල මහත්තයාට පෙන්නන්න කියා.''

කබලාන රෙදි සැම්පල මිටිය ගෙන බලා මේසය උඩ තැබුවේ ය.

''අපි රෙදි ගෙන්වන්නේ නැහැ නෙව. ඊයේ මැනේජර් උන්නැහේ මේ ගැන මට කිවුවා.''

''රුපියල් ලක්ෂයක් ලාබ ගන්ට පුළුවනි. රෙදි යාර තුන් ලක්ෂයක් තියෙනවා. ඕඩරය දුන්නොත් තව මාස තුනකින් නොවරදවාම රෙදි ලැබෙයි.''

''ඔක්කොම එක වර විකුණාගන්න බැරි උණොත්.''

''යාර තුන් ලක්ෂයම ගන්ට හදෙනෙක් ඉන්නවා. යාර තුන් ලක්ෂය ගොඩ බැවුණ හැටියේම මම විකුණා දෙන්නම්.''

''හොඳයි; මැනේජර් මහත්තයා කිවූ ගණනට කැමැති උණාද?''

කබලාන ටැලිපෝනය අතට ගත්තේ ය.

''හලෝ සීමන් ද කතා කරන්නේ—මේ කබලාන. යාර තුන් ලක්ෂයකට ලැයිසන් එක දෙන්න පුළුවන් ද? හා—පුළුවනි—හොඳයි. ස්තුතියි.''

කබලාන කඩදාසියක් ගෙන ලියා අත්සන් කොට එය සුරසෝමට දුන්නේ ය.

"මැනේජර් මහත්තයාට දෙන්න."

අසතුරුව කබලාන තම ලියන්නා දෙසට හැරුණේ ය.

'කවුද පෙත්සම එවාලා තියෙන්නේ."

" තුන් මාසෙකට උඩදී අස්වී ගිය සුමනදාස ආයිත් රස්සාව ඉල්ලනවා. ගැනිත් ළමයිනුත් හාමත් වෙනවාය කියා."

"හොඳ වැඩකාරයා—"

"ඔව්."

"අස්වෙද්දී ගෙවුවේ කීය ද?"

"රුපියල් අසූ පහයි."

"රුපියල් අසූපහේ පඩියට ඒ මිනිහා වැඩට ගන්නය යි මැනේජර්ට කියන්න."

"ඒ ගණනට නාවොත්."?

"රුපියලක්වත් වැඩි කරන්න එපා. දුන්හිඳ ගරාජයෙන් අපට ඕනැකරන උපකරණ ගේන්න ඕනෑ—අනික්වා කඩා යකඩවලට විකුණනවා. ඉතුරු වන උපකරණ එකක්වත් නොකඩා තිබෙන්න-අරින්න එපා. කොර්නේලිස් ඉස්පිරිතාලෙන් ගියා නම් මේ මාසේ පඩිය ගෙවන්න එපා. එයාට හය මාසයක් පඩි ගෙවුවා. ගැනි ආවොත් රුපියල් සීයක් දීලා පිටත් කරනවා."

"නුවරඑළියේ බංගලාව රුපියල් හැත්තෑ දහකට ඉල්ලනවායයි ඇස්වත්තේ අද ඇවිත් කියා ගියා."

"අපි ඒක ගත්තේ ගිය මාසේ හතර වන ද ද?" ලියන්නා ෆයිල් එක පෙරළා බැලී ය.

"ඔව්".

"රුපියල් හතළිස් දහට?"

"ඔව්."

කබලාන කල්පනා කෙළේ ය. වැලිපෝනය අතට ගෙන ගෙවල් තනන සමාගම් දෙකක අධ්‍යක්ෂකයන් සමඟ සාකච්ඡා කොට ලියන්නාට මෙසේ කී ය.

"හෙටම තීන්දු කරන්න කියන්න."

කබලාන වැලිපෝනය, ආධාරය උඩ තැබී ය.

ලියන්නා බිල්පත් කිහිපයක් හා ලේඛනයක් ද කබලාන අතට දුන්නේ ය.

"කම්බි ඇන රුත්තල රුපියලයි සත විසිපහයි! වැඩියි. ගිය මාසෙ කම්බි ඇන රාත්තලක මිල රුපියලයි. රාත්තලට සත විසිපහක් වැඩිය ගෙවුවේ කවුද? එයා මා ළඟට එවන්න ඕනෑ.

ඔහෝ!'' යි කියමින් කබලාන නිල් පැන්සලය ගෙන ඉලක්කම් පෙළක් යට ඉරක් ඇන්දේ ය.

''මේ ගමනට පැට්රෝල් ගැලුන් දෙකහමාරයි වියදම් වන්නේ. ඒ වැඩිම ගණන තමා. ගැලුන් හතරහමාරක් ගන්න බැහැ. කවුද ලොරිය එලෙව්වේ ?''

''ඩැනියෙල්''.

''හෙට ඩැනියෙල් මා ළඟට එවන්න ඕනෑ. කියන්න තියෙන දෙයක් ලියමනකින් කියන්නයයි මේක පාස්කළ ලියන්නාට දන්වන්න ඕනෑ.''

''සිරිල් කවඩිහේන තාම අසනීපෙන්. දැන් අට මාසයක් වෙනවා.''

''අට මාසෙට ම පඩි යැවුවා ?''

''ඔව්''.

''එයාට මාසයක් කල් දෙන්න හොඳයි. මිනිහ මේ කන්තෝරුවේ වැඩ කරන්න වෙලා අවුරුදු දහයකට වැඩි නෑ නෙව ?''

''දහයයි මාස හතරයි.''

''එහෙනම් එයාගේ පැන්ෂන් මුදල එයාට දෙන්න හොඳයි.''

''එයා රුපියල් දෙසීයක් ණයට අරගෙන තියෙනවා.''

''ඒ මුදලත් පොලියත් අඩුකරගෙන ඉතුරු ගණන මිනිහාට යවන්න ඕනෑ. අසනීපෙන් ඉන්න නිසා මිනිහාට සල්ලි ඕනෑ වේවි. ඒ මුදල යැවීම පහු කළොත් එයාගේ නෝනා පෙත්සන් ලියාගෙන මෙහාට ඒවි.''

ලියන්නා ගිය වහාම කබලාන, වෙළඳුන් තිදෙනකුන් කාමරයට කැඳවූයේ ය. ඔවුන් තිදෙනාම මෙතෙක් වේලා උන්නේ අමුත්තන්ගේ කාමරයෙහි ය. කබලාන රුපියල් හැට හැත්තෑ දහක ගනුදෙනු ගැන ඔවුන් තිදෙනා හා කතාකොට තීරණයකට බැස්සේ මිනිත්තු පහළොවකිනි. නුවුවමනා වචනයකුදු නොකියන කබලාන අනිකකුට එවැනි වචන දෙකක් කීමට ද ඉඩ නොදෙයි. ඔහු යමක් ගැනීමට සිතන්නේ එහි මිල නියම කරගෙන ය.

ඔහු කවර කාරියක් වුව ද කරන්නේ, කිසි කලක තමාට වරදින්නේ නැතැයි සිතන්නකු ලෙස ය. එහෙත් තමා නොවරදින සුළු මිනිසෙකියි කබලාන නොසිතයි.

රාජකීය ආසියාතික සමිතියේ සාමාජිකයකු වන ඔහු ඇතැ[illegible] [illegible] එහි කෙරෙන සාකච්ඡාවලට ද හවුල් වෙයි. කලා හව[illegible]

නොවේ. ඔහු කිසි කලක රහල් හිමියන්ගේ කවි පොත් සැලකිල්ලෙන් නොකියවූ නමුත් රාහුල සමාජයේ අනුශාසක පදවිය උසුලයි. ඇතැම් විට එහි ලේකම් ද සභාපතියා ද සමඟ කතා බහ කිරීමෙන් ඔහු රහල් හිමියන් හා ඔවුන්ගේ කාව්‍යයන් ද ගැන තොරතුරු දැනගනියි. ඒ තොරතුරු වලින් හා තමා දන්නා තොරතුරුවලින් ඔහු ඇතැම් විට ප්‍රයෝජන ගන්නේ ලේකම්ටත් සභාපතියාටත් වඩා ශූර ලෙසිනි.

තම පියා වැනි කාර්‍යශූර මිනිසකු දස දහසකිනිදු තෝරා ගත නොහැකි බව මාලින් දනියි. එහෙත් ඔහුගේ චරිතය මාලින්ගේ සිත් නොගත්තේ ය. ඔහු වස්තුව රැස් කරන්නේ දැඩි ලෝභියකු ලෙසිනි. අවංකකම හා දයානුකම්පාව, හොඳ මිනිසකු හැඳින්වෙන ගුණාංග දෙකක්ය යනු මාලින්ගේ හැඟීම වෙයි. දයාවත් අනුකම්පාවත් දුර්වල සිත් ඇතියන් හැඳින්වෙන ලකුණු ලෙස සලකන සව්මන් කබලාන අනුකම්පාවත් නිර්ව්‍යාජත්වයත් යන දෙකම බැහැරකොට ජීවත් වන්නෙකි. ඔහු කන්තෝරුවෙහිදී පමණක් නොව ගෙදරදී ද ජීවත් වන්නේ තමාගේ නිසග මිනිස් ගති හා දයාවත් කරුණාවත් සඟවනු පිණිස බැඳගත් වෙස් මුහුණක් ද ඒ වෙස් මුහුණට ගැළපෙන සේ ඇඳගත් ඇඳුම් ද ඇත්තකු ලෙස ය. ඒ වෙස් මුහුණ ඉවත් කළහොත් දකින්ට ලැබෙන්නේ දයා-කරුණාවෙන් නොඅඩු මුහුණකි.

ලිපිකරුවකු තමාගේ දැනුම හෝ සමර්ථකම හෝ සිහිකොට වැඩි වැටුප් ඉල්ලා ලියුමක් ලියුවොත් කබලාන අවස්ථාවට සුදුසු පරිදි වෙනස් වෙයි. 'උඹ වගෙ මිනිසුන් සීයක් සොයාගත හැකියි' කියන්නාක් වැනි බැලුමකිනි ඔහු අර ලියන්නා දෙස බලන්නේ. අනතුරුව ඔහු ඒ ලියන්නාගේ දුර්වලකම් හා වැරදි කිහිප ගුණයෙන් වැඩි කොට කියයි. ලියන්නා අවංකයකු නම් ආපසු යන්නේ තමාගේ ශූරකම් ගැන සිතීම වැරදිය යන හැඟීම ඇතිව ය. කපටියකු නම් යන්නේ කබලානට සිතින් බණිමිනි.

මාලින් තම පියාගේ කන්තෝරුවේ වැඩ කරන්නේ ක්‍රමයෙන් වැඩෙන අසන්තෝෂයකිනි. තව අවුරුදු තිහක් නිරෝගිව ජීවත්විය නොහැකි තම පියා මිනිසුන් පෙළන්නේ කුමක් නිසා ද? තමාගේ ම ශ්‍රම ශක්තිය මිරිකා ගැනීමේ අදහසින් මෙන් වෙහෙස නොබලා වැඩ කරන ඔහු කම්කරුවන්ගේ ශ්‍රම ශක්තිය මිරිකා ගන්නේ නොදැන ද? මේ ප්‍රශ්න මාලින්ට නම් ප්‍රහේලිකා වැන්න. මාලින් දිළින්දන්ට අනුකම්පා කරන්නේ එයින් තමා සන්තෝෂයක් ලබන බැවිනි. තම පියා මිනිසුන්ගේ ශ්‍රම ශක්තිය මිරිකා ගන්නේ එසේ කිරීමෙන් මුදල් රැස් කළ හැකි බව මාලින් දනියි. මුදල් සැපයීමෙහි ඔහු වැඩිම සන්තෝෂය ලබන්නේ.

Scanned by CamScanner

# 12

අරවින්ද චමරිත් නීලාත් සමඟ 'අජන්තා නිශාන්තයට' ඇතුළු වූයේ ය. ඔවුන් එන තෙක් එහි බලා උන් මංගලිකා සැවුළුගල්ද ඔවුන්ට එක් වූවා ය.

"සිරිපාල මහත්තයා ආවෙ නැද්ද?"යි චමරී ඇසුවා ය.

"නෑ; සිරිපාල වත්තට ගියා; ආවෙ නැහැ"යි කියූ මංගලිකා අරවින්ද දෙස බලා මුකුළු සිනාවක් පෑවා ය.

"අරවින්ද දැන් ග්‍රෑගරි පාරේ මාළිගාවක් වගෙ ලොකු ගේක නෙවද ඉන්නේ. හෝටලේ ඉන්දෙද්දී නම් අපට නිතර දකින්ට ලැබුණා! අරවින්ද බලන්න මම දෙදවසක් ගියා ඒ මාළිගාවට!"

චමරී නීලාගේ අත මිරිකුවා ය.

"ඉස්පිරිතාලේ දැන් බොහොම වැඩ කරන්ට ඕනෑ"යි අරවින්ද කී ය.

"ආවාට පස්සේ කී දෙනෙක් කැපුවා ද?"

"මම ගණන් කෙළේ නැහැ."

"කී දෙනෙක් මැරුවා ද? හුහක් මරාල නෙවද කපන්න ඉගෙනගන්න ඕනෑ"යි කියමින් මංගලිකා සිනාසුණා ය.

"මැරුවෙ එක්කෙනයි. එංගලන්තේදීත් ටිකක් පුරුදු උණා"

"මිසිස් සැවුළුගල දන්නේ නැද්ද අරවින්ද එංගලන්තේදී බොහොම ඉහළින් පාස්කරලා එහේ ඉස්පිරිතාලේත් කලක් සැත්කම් කළ වග?"

"මම අහලා නැහැ."

කලින් මුදල් ගෙවා වෙන් කරන ලද මේසය කරා ඔවුහු ගමන් කළෝ ය. හිස්ව තිබුණේ ඔවුන්ගේ මේසය සහ ඈත කෙළවරෙහි වූ තවත් මේසයක් ද පමණි. ගැරුප්පු හා පිහියා එකට වදින හඬත් කතාබහ හා සිනා හඬත් ඇතැම් මේසවලින් නැඟියි. නුදුරින් වූ මේසයකින් නැඟින්නේ කතාබහ හඬ පමණි. අරවින්ද හා කතුන් තිදෙනා ද වාඩිගත් තැනට නුදුරින් මේසය ඉදිරියෙහි වාඩිගෙන කතාබහ කරන දෙදෙනාගෙන් එකෙක් මංගලිකා දෙස දෙතුන් වරක් බැලී ය.

සේවකයෙක් අරවින්දට ළංවී හිස මඳක් පාත් කොට කන හැරවූයේ ය.



Scanned by CamScanner

‘‘මෙරී’’යි අරවින්ද කී ය. ‘‘මිසිස් සැවුළුගල?’’

‘‘රම.’’

ඈත කොනේ මේසය ළඟ වාඩිවී උන් කාන්තාවක් හා මැද වියෙහි වූ පිරිමියෙක් ද අසුන්වලින් නැංගෝ ය. තවත් ගැනු පිරිමි යුවල කීපයක් ඔවුන් අනුකරණය කළෝ ය. වාදකයෝ වොල්ට්ස් නැටුමට උචිත තාලය වයන්ට පටන් ගත්හ. යුවළ කීපයක් නැටුම් බිමට පිවිස සෙමින් නැමෙන බසින යුගත් ද ඉස්සෙන පැදෙන පාද ද ඇතිව එහි යාත්‍රා කරන්ට වූහ.

රම වීදුරුවෙන් බාගයක් සිස්කළ මංගලිකා සැවුළුගල, දකුණු පයේ සපත්තු අඩිය ඉතා සෙමින් උස් පාත් කරමින් තාලය අල්ලයි.

ඔවුන් සුප් පිඟන් සිස් කෙළෙන් වෙයිටර් යළිත් ළංව හිස පාත් කෙළේ ය.

‘‘ෂැම්පේන්.’’

‘‘ඩරයි මොනපෝල් නැහැ සර්.’’

‘‘මොන වර්ගද තියෙන්නේ?’’

‘‘මොන්ටා ක්‍රස්ටො?’’

‘‘එපා.’’

‘‘සින්සානො—ඉටැලියන්?’’

‘‘එපා’’.

‘‘..............අයිරොයි?’’

‘‘හොඳයි.’’

මාළු පිඟන් හතරක් හා ෂැම්පේන් ද වෙයිටර් අතින් මේසයට පැමිණියේ ය.

‘‘අතික් කොනේ අන්තිම මේසය ළඟ අර ඉන්නේ මදිර දෙමාලසිංහ’’යි කියමින් මංගලිකා ෂැම්පේන් උගුරක් බීවා ය.

‘‘ඒ මහත්තයා කවුද? මම මීට ඉස්සර දැකලා නැහැ.’’

මංගලිකා කට කොනට සිනාවක් නැඟුවා ය. එමරී, නීලාගේ ඇඟ කොනිස්සුවා ය.

වොල්ට්ස් නැටුමට තවත් යුවළ කිහිපයක් එක් වූ හ.

හිසකෙස්, මල්පොකුරු, සැට්ට කොට්, වත්සුණු තැවරුණු [illegible]ණු ආදියෙන් සුවඳ හමයි. විදුලි පවන් පත් නිසා ප්‍රශ්වාසය [illegible]ල් වෙයි; සුවඳ පැතිරෙයි; ගීත නාදය කන් පිනාවයි: සිත් [illegible]ළවයි. පිබිදුණු ඉන්ද්‍රියන් ඇති විනෝදකාමීන් මේ සියල්ල [illegible] මලා ලබන ආස්වාදය කාමය නඟන බෙහෙතක් වැන්න.

සුදු සිනිඳු දික් පට ගවුමෙන් වැසුණු කය ඇති ලන්සි තරුණියක තම හවුල් කාරයාගේ දකුණු අත්තලය ඔච්ච්ලක් කරගත්තාක් මෙන් පැද්දි පැද්දී නැටුම් බිම වටා යන්නේ පිරිමින්ගේ නෙත් සිත් අදිමිනි. මැදවියෙහි වූ සාරිකාරියක්, මනාව වැඩුණු දේහයක් ඇති තරුණයකුගේ අතට බර නොදී පා තබමින් එයි. මදිරා දෙමාලසිංහ නෝනා ද, මුහුණටත් වඩා සුන්දර බැල්මත් ගමනත් ආචාර විධිත් ඇති තරුණ විය නොඉක්මවූවකු අතින් නැටුම් බිමට පිවිසියා ය.

''ගෙයි ඉන්නේ අරවින්ද විතරක් ද?'' මංගලිකා ඇසුවා ය.

''අම්මාත් ඉන්නවා.''

''අරවින්ද අම්මා ගමින් එක්ක ආවෙ බොහොම අමාරුවෙන් නෙවද''යි කියමින් චමරී සිනාසුණා ය.

''අම්මා එන්න කැමති උණේ නැහැ. මට තනියම ඉන්න අරින්න හොඳ නැතැයි තාත්තා කියන්ට පටන් ගත්තා. අම්මා අවසානයේ කොළඹ නැවතීමට කැමැති උණේ තනියම ඉන්ට ඇරියොත් මම නරක් වේය කියා හිතූ නිසා.''

''පුතා බාල් නටන්ට යනවාට අම්මා අසතුටු නැද්ද?''

''මම හොඳයි කියන දේකට අම්මා විරුද්ධ වෙන්නේ නෑ.''

''පිටිසර වාසය කළ නමුත් අරවින්දගේ අම්මා බොහොම හොඳයි. පුතාට ආදරෙයි; පුතා එක්ක යන ගැනුන්ටත් ආදරෙයි!'' කියමින් චමරි සරදම් කළා ය.

''එහෙනම් අපි ගියොත් අපිටත් ආදරේ වේවි''යි මංගලිකා තෙපළා ය.

''නෑ'' යි කියමින් නිලා සිනාසුණා ය. ''කසාද බැඳපු නෝනලා අරවින්ද එක්ක තනියම යනවාට අරවින්දගේ අම්මා කැමැති නැහැ. කසාද බැඳපු නෝනලා යන්න ඕන මහත්තැන් එක්ක. චමරී මොකොද සිනාසෙන්නේ!''

''අරවින්දගේ අම්මා බැඳපු නෝනලාට ආදරේ නොකරන්නේ ඒ නෝනලා පුතා නොදන්නා ඒවා උගන්නාවිය කියා!''

''දෙයියනේ ඔක්කොම දන්නවා!''යි අරවින්ද කීවේ ය.

''ගැනුන්ට සැක්කම් කරන්ට ඕනෑ ගැනු''යි නිලා යෝජනා කළා ය.

''එහෙනම් ගැනු හුඟක් මරාවි!''

මංගලිකා 'හොක්' වීදුරුවක් ටී කුකුළු මේ පිහාන සිස් කළා ය.

''නිලා නටන්නෙ නැද්ද?''

''අනේ—මම දන්නේ නෑ.''

Scanned by CamScanner

චමරී නැටුම් බිමට බැස්සේ අරවින්ද සමඟ ය. අරවින්දගේ දකුණු අත චමරීගේ බඳ වටා ගොස් උර හිසට පාතින් සිටියේ ය. ඔහුගේ වමතට හසුවුණු ඇගේ දකුණු අතේ ඇඟිලි තුඩු උරහිසට එල්ල වන තෙක් ඉස්සිණි. චමරීගේ වම් අතේ ඇඟිලි හතර අරවින්දගේ දකුණු අත් ගොබය උඩ රැඳිණි; පා දෙකක විලුම් ඉස්සිණි; අනික් දෙපා සෙමින් පැදෙන්ට වී ය.

අත්තලයෙන් තොව සුළඟින් ගත් පුළුන් පොදක් සේ චමරී නැටුම් බිමෙහි යාත්‍රා කළා ය. මුහුණ පුරා පැතුරුණු සිනාවක් ඇතිව පා තබන ඇ 'මෙතරම් හොඳින් නටන්ට පුරුදු වූයේ කෙසේ ද?' යන ප්‍රශ්නය අරවින්දගේ සිතට නැංගේය. මංගලිකා සැවුළුගල තරුණයකු විසින් නැටුම් බිමට බස්සනු ලැබුවා ය. ඔහු අනිකකු නොව කලින් ඇ දෙස බැලුම් හෙළුවන්ගෙන් එකෙකි.

"චමරී මෙපමණ හොඳට නටන්ට පුරුදු උණේ කොහොමද?"

තමාගේ රූ සපුව පිළිබඳ වර්ණනාව අසා සන්තෝෂ වන ස්ත්‍රියක මෙන් චමරී සන්තෝෂ වූවා ය. වඩාත් හොඳින් පා තබන ඇ බඳ කිරුම් බරට තබනු සඳහා වැයම් කළාය. එය වෙහෙසන වැයමක් කොට අනතුරුව දිය නා අලුත් ඇඳුම් ඇඳගත්කල දැනෙන සුව පහසුවත් සන්තෝෂයත් වැනි සුවපහසුවක් හා සන්තෝෂයක් ද ඇට දැනෙන්ට වී ය. චමරී හිස මඳක් පස්සට යවා අරවින්දගේ මුහුණ බැලුවා ය.

"මාලින් අයියාත් මමත් නටන්ට ඉගෙන ගත්තා."

අරවින්දගේ බැල්මට ඇගේ දෙඇස හසු වි ය. ඇ සිනාසී වහා ඉවත බලා ගත්තා ය.

"මාලින් දැන් නැටුම්වලට යන්නේ නැහැ නේවද? එයා මටත් බණිනවා!"

"එයා මට මොකුත් කියන්නේ නැහැ."

"මදිරා දෙමාලසිංහ නෝනා මාලින් එක්ක තරහ ද?"

"මාලින් අයියා එයා එක්ක වැඩිය කතාවට යන්නේ නැහැ. ගියොත් එයා විරුද්ධව තර්ක කරනවා. අයියා එක්කට වඩා එයා මම එක්ක තරහයි."

"ඇයි?"

"එයා මම ඉන්න තැනකදී පුරසාරම් දෙඩුවොත් මම ඇනුම්පද කියන නිසා. එයාගේ මුහුණට ඇනුම්පද කියන්න අයියාට බැහැ. ඒ නිසා අයියා මට අනුබල දෙනවා!"

"එයාගේ ඕජය අද අඩුවා වගෙයි."

"ඔය යාළුවා ඉදිරියේ එයා එහෙම තමා. ගෙදරින් සල්ලිත් අරගෙන ගොස් දෙනවා එයාට!"

"එච්චරටම එයාට ආදරෙයි!"

"මම දන්නේ නැහැ"යි කියමින් චමරි සිනාසුණා ය.

"නැටුමකට එයාට මම අඬගාන්නද?"

"මේ යාළුවා ඉන්දෙද්දී එයා එන්නේ නෑ. නමුත් එයාට තව දෙන්නෙක් ඉන්නවා!"

"චමරි ඕවා දන්නේ කොහොම ද?"

"එයාගේ ඕපාදූප නීලාටත් මටත් අහන්න ලැබෙනවා. මට අහන්න නොලැබෙන ඕපාදූප නීලා මට රහසේ කියනවා."

චමරි නීලා සොයා ගොස් ඈ ළඟින්ම වාඩි වූවා ය. අරවින්ද මඳ වේලාවක් විඩා හැරියේ ය.

අරවින්ද හිම කිරම පතක් කා නැඟී, විඩා හරිමින් උන් මංගලිකා වෙතට ගොස් ඇට ආචාර කෙළේ ය.

ඈ සන්තෝෂයෙන් නැඟී අරවින්ද හා නැටුම් බිමට බැස්සා ය.

ඇගේ බඳ වටා අත යැවූ විගස අරවින්දගේ සිතත් කයත් පුරා අමුතු හැඟීමක් පැතිරිණ. විදුලිය කවන ලද යපටක් ඇල්ලුවකුගේ කය පුරා පැතිරෙන විදුලිය ධාරාවක් ලෙසිනි ඒ හැඟීම ඔහු තුළට වැදුණේ. මංගලිකාගේ භාවභාව ලීලා, විදුලිය ධාරාවක් සේ ඔහුගේ අතට දැනෙයි. එහෙත් ඈ ඔහු හා පා නගන්නේ අනික් ගැහැනියක මෙනි. ඇගේ අහර දහර හසුවන්නේ ඇසට නොව අතට ය. ඈ යටැසින් හෙළන්නේ සිත පමණක් නොව කයද අද්දන බැල්මකි. ඇගේ කය මහත් නොවූව ද ළය ටිකක් මහත් ය. එවැනි සිහින් කයක් මෙවැනි සපිරුණු දෑඩි ළයක් ලැබුවේ කෙසේ ද? "ළය පුම්බන බෙහෙත් ගා පිරිමැදීමෙන් ද' යන ප්‍රශ්නය අරවින්දගේ සිතට නැඟිණ.

"අරවින්ද දැන් හෝටලේට එන්නේ ම නෑ නේවද?" යි මංගලිකා ඇසුවා ය.

"නිවාඩු නැහැ."

"හෙට එන්න."

"හෙට නම් බෑ."

"අනිද්දට."

"එන්නම්."

"එහෙනම් මම බලා ඉන්නවා."

"හයටත් හතටත් අතර වෙලාවක එනවා."

නැටුම අවසාන වුණු වහාම අරවින්ද, චමරිත් නීලාත් සොයා ගියේ ය.

"දෙන්නාම ජනේලෙ ළඟට වෙලා ඔපාදූප විවේචනය කරනවාද?"

"ඔපාදූප මතක නැති කරනවා"යි කියමින් නීලා සිනාසුණා ය.

චමරි කවුළුවෙන් ඇතුළු වන සිහිල් සුළං ආශ්වාස කෙළේ ආසාවෙනි. නික්ම යන මොටෝරියවල සෝෂාව ඇසෙයි; අඩක් නිවෙමින් යළිත් රැස් විහිදෙමින් දල්වෙන ලාම්පුවල එළිය නිසා චමරි තම මුහුණ අනික් පැත්තට හරවා ගත්තා ය. ඇතැම් ස්ත්‍රියක හා පුරුෂයකු කාමාවේශ වූවන් මෙන් ඔවුනොවුන්ගේ ඇඟේ හැපෙමින් ගොස් විශාල සැලූන් රියකට නඟිනු චමරී දුටුවා ය. එය මදිරා දෙමාලසිංහ නෝනාගේ රථය ය. චමරි නීලාගේ අත කොනිස්සුවා ය.

"මම දැක්කා"යි නීලා කීවා ය.

"මොනවද?"යි අරවින්ද ඇසුවේ ය.

"අඳුනන ගැනියෙක්!"

"මංගලිකා එක්ක ගොස් හෝටලයේ බස්සා මම ඉක්මනට එන්නම්" යි අරවින්ද කී ය.

"ඉක්මනට එන්න—අපි එළියේ ඉන්නවා. ටිකක් ඇවිදින්න තියයි."

"ඇයි එළියට යන්නේ? සංගීතය අහගෙන ඉන්න බැරිය."

"දැන් වයන්නේ ජෑස් තාල—මම කැමැතියි එළියට ගොහිල්ලා හුළං ටිකක් බොන්න!"

මංගලිකා මොටෝරියෙහි නංවාගත් අරවින්ද හෝටලය බලා ගියේ ය. පෝටිකෝව යට සිටි මුරකාරයා දොර හැරියේ ය. අරවින්ද ඇ සමඟ පඩි පෙළ නැඟ දෙවන මාලයට පිවිසියේ ය. කොරිඩරයෙ කෙළවරක පමණක් විදුලි පහනක් දල්වෙයි. වසන ලද දොරවල් ඇති එකම කාමරයකිනිදු එළියක් නොනික්මෙයි. මංගලිකා දොර හැර දොරට මුවහ වී අරවින්ද දෙස බැලුවා ය. අරවින්ද ඇගේ බඳ වටා අත යවා දෙතොල තරකොට සිම්බේ ය. ඔහු දෙතුන් වරක් ඇගේ දෙතොල සිප කාමරයෙන් පිට වී යළිත් ඇ දෙස බැලුවේ ය.

"අනිද්ද හයටත් හතටත් අතරේ."

"ආවොත්!"යි කියමින් මංගලිකා ඇඟිල්ල උරුක්කොට වනමින් සිනාසුණා ය.

අරවින්ද කොරිඩෝරයෙන් නික්ම ගොස් පඩි පෙළින් බැස්සේ ය.

චමරිත් නීලාත් අජන්තා නිශාන්තය දකුණු පැත්තෙහි වූ උයනට ගොස් සක්මන් කළෝ ය. අහසෙහි බැබළෙන ඉමක්

කොනක් නැති තරු වැළ ගස් මුදුන් අතරින් පෙනෙයි. තරු එළියෙන් යන්තම් එළිය වුණු මුදුන් ඇති නගර මන්දිරයෙහි පාත්‍රයක් වැනි ශෘංගය දුටු චමරීට මතක් වුණේ මහා සොහොන් ගැබකි.

ග්‍රීසියේ ආර්ටිමීෂ්යා බිසොව විසින් තම ස්වාමියා වූ මොසෝලස් රජු උදෙසා තනවන ලද මහා සොහොන් ගෙයි චිත්‍රය චමරී පොතින් පතින් දැක තිබේ. ඉන්දියාවට ගිය ඈ ටජ්මහල් මැදුර දෙතුන් වරක් දුටුවා ය. පහන් එළියෙන් හා තරු එළියෙන් මඳක් තුනී වුණු අඳුරට පිවිසි චමරීට සිහිවන්නේ කනත්තය; සොහොන් ගැප් ය; මළ මිනී ය. නගර මන්දිරයේ පාත්‍රයක් වැනි මුදුන දුටු ඇට සිහි වූයේ මහා සොහොන් ගැප් ය. අනතුරුව කනත්ත ය.

උයනෙහි සක්මන් කළ චමරීත් නීලාත් එක් දෙරටුකවට ළඟා වූහ.

"කනත්ත දුර ද?" යි චමරී ඇසුවා ය.

"නැහැ—වැඩි දුරක් නැහැ."

"යමුද බලන්න?"

"කනත්තට මේ රෑ!"

"රෑට කනත්ත මොන වගේදැයි බලන්න ආසයි!"

"දූන් අරවින්ද ඒවි."

නගර මන්දිරයට ආසන්න පිටියෙන් අනික් පැත්තෙහි පිහිටි කලාභවන චමරීටත් නීලාටත් හුරු පුරුදු තැනකි. එක් විචාරකයකු විසින් 'නාන ගෙයක් වැන්න' යි පරිභව කරන ලද කලා භවන, අඳුර නිසා ඔවුන් දෙදෙනාට නොපෙනෙයි. නගර මන්දිරය ඉක්මවා ගිය ඔවුන්ට සේනානායක ප්‍රතිමාව පෙනෙන්නේ අඳුරු කඳකින් නෙළන ලද ප්‍රතිමාවක් ලෙසිනි. ඒ ප්‍රතිමාව ඉදිරියෙහි වූ පිටියෙන් ඔබ්බෙහි පිහිටි පැට්‍රල් මඩුවෙහි විදුලි පහන තවමත් බැබළෙයි. ආපසු ගොස් මාවතට බැස්ස ඔවුහු කෝවිලක් වැනි ඇස් ඉස්පිරිතාලයත් හන්දියෙහි පිහිටි ශෝකාකුල මුහුණක් ඇති සොවිසා ප්‍රතිමාවත් මනැසට නඟාගත්හ.

විදුලි එළියෙන් එළිය වුණු අජන්තා නිශාන්තය තුළදී ඔවුන් ගස් මුදුන් දුටුවේ එකම අඳුරු කඳක් ලෙසිනි. එළියට බැස අඳුර සහිත උයනට පිවිසි ඔවුන්ට ගස් මුදුන් කළු සෙවණැලි ලෙස පැහැදිලිව පෙනෙයි. අහස වඩාත් නිල් පැහැයෙන් බබළයි. කොටුවේ ඔර්ලෝසු කණුව මුදුනෙන් පැතිරෙන විදුලි එළිය දුරාව අහස වරින් වර එළිය කරයි.

# 13

''ලංකාවට ආ හැටියේ උඹ වෙනස් උණා.''

''ලංකාවට ආවාම සුදු මිනිස්සුත් වෙනස් වෙනවා''යි කියමින් අරවින්ද සිනාසුණේ ය.

''උඹ කළු සුද්දෙක් වෙන්න හදනවා.''

මාලින් මේ වචන කටින් පිට කෙළේ මදක් හැකුළුණු යටි තොල ද නින්දවත් කෝපයත් ප්‍රකට කරන බැල්මක් ආරූඪ වුණු දෙනෙත් ද ඇතිව ය.

අරවින්ද, මගදී හමුවූ මාලින් තම මොටෝරියෙහි නංවාගෙන ගියේ පැගොඩා තේ පැන් සැලට ය. ඔහු පැගොඩාවට ගියේ මාලින් මහා හෝටලයට නොයන බැවිනි.

''ලංකාවට ආවාට පස්සේ මාලින් පීස්සෙක් වෙන්න හදනවා.'

''ඒක ලොකු මිනිසුන්ගෙන් ඉගෙනගත් කීමක්. ලංකාවේදී උඹ මෙතරම් වෙනස් වේය කියා මම හිතුවේ නැහැ.''

''සමාජයට ගැලපෙන පරිදී වෙනස් නොවී ජීවත් වෙන්නේ කොහොම ද? 'පරිසරයට අනුකූල වෙයන් නැත්නම් මැරියන්' යයි ප්‍රකෘතිය කියනවා.''

''පරිසරය කඩා සුන්බුන් කරලා අපට ඕනෑ හැටියට සකස් කර ගන්නවා.''

''කළුගලේ ඔළුව හපාගන්නේ මොකොටද?''

''කළුගල සුන්බුන් කරන්න.''

''ඔළුවයි සුන්බුන් වන්නේ.''

''උඹත් හදන්නේ සමාජයෙහි ඉහළ නඟින්ටයි. ලොක්කෙක් වෙන්න වෑයම් කරන්නේ නැති කෙනෙක් සමාජයට විරුද්ධ වීම කළුගලේ ඔළුව හැපීමක් ලෙස සිතන්නේ නෑ.''

''ලොකු මිනිස්සුන් අතරට පිටතින් පැමිණි තැනැත්තා ලොකු මිනිහෙකු වෙන්ට වෑයම් කිරීමේ වරද කුමක්ද''යි අරවින්ද ප්‍රශ්න කෙළේ ය. පෙර නම් ලොකු මිනිස්සු අරවින්ද දෙස නොබැලූහ. ඔහු එකල ඔවුන්ගෙන් ලැබුවේ උපහාස සිනා පමණි. ඒ ඉහළ සමාජයෙන් පලිගත හැක්කේ ඒ සමාජයේ අවයවයක් වීමෙනි. අරවින්දට ඉහළ සමාජයෙන් ඈත්විය නොහැකි ය. 'මා ඔවුන්

ආශ්‍රයෙන් ලොක්කකු වීමට වෑයම් කරන්නේ ඔවුන්ගෙන් ප
ගැනීම පිණිසද ?'යි අරවින්ද තමාගෙන්ම ප්‍රශ්න කෙළේ ය.

මාලින් ඉහළ සමාජයේ පවුලක ඉපිද එහිම වැඩුණෙකි. සමාජ ජීවිතය ඔහුට තිත්ත වූයේ ඒ නිසා ද? ඔහුට සිත සන ගත හැක්කේ ඒ සමාජයෙන් ඈත්ව ඒ සමාජය හා හටන් කිරීමෙනි සිදුහත් කුමරු දිළිඳු ගෙයක උපන්නේ නම් ඔහු ගිහිගෙය අත්හැ වලට යන්නේ ද? අතීතයෙහි නම් මාලින් වැන්නන් ද ගත්මෙ වලට වැද කෙලෙසුන් නැසීමට අනුබල දෙන මඟ ය. දැ ලෝකය වෙනස් ය; සිතුම් පැතුම් වෙනස් ය; සමාජය වෙනස් ය අපේක්ෂා වෙනස් ය. ගිහි ගෙය හැර කෙලෙස් තවනු සඳහා ගි සිදුහත් කුමාරයා ද මවුපියන්ගේ සිත් රිද්ද සමාජයට නිග්‍රහ කෙළේය. අතීතයෙහි ගිහිගෙය හැර වල් වැදුණු මිනිසාත් මෙකල සමාජයට පටහැණිව සමාජය සුන්බුන් කරන්ට වැර වෑයම් කරන්නාත් යන දෙදෙනාම එකෙකි. එකකු දමන ලද ඉඳුරන් ඇත්තකු වූයේත් අනිකා කුප්පන ලද ඉඳුරන් ඇත්තකු වන්නේත් කාලය දේශය අනුව ය.

අරවින්ද මෙසේ තර්ක කරනු ඇසූ මාලින් තවත් කිපුණේය.

"ලොකු මිනිසුන් වී කලක් ජීවත්ව සිට මියගිය අනික් ඇතැම් මිනිසුන්ට වඩා උඹ වෙනස් බවක් මට පෙනෙන්නේ නැහැ"යි මාලින් කී ය. "අනික් ඇයන්ගෙන් සමහරු සාහිත්‍ය කලා හා විද්‍යාව අතින් හිස් පුද්ගලයෝ. උඹ ඔවුන්ට වෙනස් වන්නේ සමාජයෙහි බැබළෙන්ට උපකාර වන උගත්කමින් පමණයි. ඒ උගත්කම එළුවාගේ බෙල්ලෙහි එල්ලෙන තන පුඩු වගෙයි."

"මාලින් උඹේ බණ එතරම් තර්කයට ගැළපෙන්නේ නැහැ. සමාජය උසස් කොට සලකන උගැන්ම ලොට තනයක් නොවේ. සමාජයෙහිදී කිරි උතුරුවන තනයක්!"

"සමාජය වෙනස් කළාම ඒවා ඉබේම වෙනස් වෙනවා; ලොට තන ඉබේම හැළෙනවා."

"අනිත් මිනිස්සුන් ඉහළ යන්ට හදන්නේ ලොක්කන් අනුකරණයෙන්. උඹ ලොක්කෙක් වෙන්ට හදන්නේ ඔවුන්ට පටහැණි වීමෙන්. වෙනස එපමණයි."

උඹ හිතට හොරා බොරු කියනවා. වෙනස එච්චර උනත් මනුෂ්‍ය කරුණාව, පරාර්ථසේවය උසස් නොවේ ද?"

"මනුෂ්‍ය කරුණාව උඹට විතරක් සින්නක්කරයේ අයිති දෙයක් නෙවි. තාත්තා එක්ක උඹ ගැටෙන්ට යන්නේ මොකොට ද? තාත්තාට තාත්තාගේ වෙළඳාම කරන්ට ඇරලා උඹේ වැඩේ උඹ හොඳින් කළාම ඔයිට වැඩිය තරක ද?"

Scanned by CamScanner

"උඹ ඔය බණ දෙසන්න ඉගෙන ගත්තේ ලංකාවට ආවාට පස්සේ. උඹ හරි තක්කඩියා!"යි කියමින් මාලින් රවා බැළුවේ ය.

මාලින් හා ඔහුගේ පියා ද අතර හටගත් භේදය දවසින් දවස දියුණු වී ය. ඔහු දූන් පියාගේ කන්තෝරුවේ වැඩට නොයයි. කළමනාකාරයන් කම්කරුවන්ට පීඩා කරනු දුටු හැමවිටම මාලින් විරුද්ධ වූයේ ය. ඔහු කම්කරුවන් උදෙසා හටන් කෙළේ ය. කළමනාකාරයන් කළ පැමිණිලි අසා කබලාන, මාලින්ට තරවටු කෙළෙන් ඔහු අස් වූයේ ය. ඔහු තම පියාට විරුද්ධකම් නොකරන්ත කම්කරුවන්ගේ පක්ෂය ගෙන ඔවුන් උදෙසා වැඩ කරන්නෙකි. වැඩි වැටුප් ඉල්ලා වරක් ලියුමක් දුන් කම්කරුවන් හතර දෙනාගෙන් නායකයා හැර අනික් තිදෙනාම අවස්ථාවක් බලා අස්කරනු ලැබූහ. ඔවුන් අස්කරන ලද්දේ කබලානගේ අනුශාසනය අනුව ය. ශූර කම්කරුවකු වන නායකයා අස් නොකිරීම තමාගේ ලාභයට හේතු වන බව කබලාන දනියි.

කම්කරුවන් තිදෙනා අස්කිරීම අනික් කම්කරුවන්ගේ කෝපයටත් කලකිරීමටත් හේතු වී ය. කම්කරු හවුල විසින් අනුබල දෙන ලදුව කබලානගේ කර්මාන්ත ශාලාවෙහි කම්කරුවෝ වැඩ නැවැත්වූහ. ඒ හටනෙහිදී කබලාන කම්කරු හවුල ද කම්කරුවන් ද පරාජය කොට ජයගත්තේ ය. වැඩ නැවැත්වූ කම්කරුවන්ගෙන් පහළොස් දෙනකු හැර අනික් සියල්ලෝම දෙදවසකට පසු යළිත් පැමිණියෝ ය. කබලාන ඔවුන් ගෙන්වා ගත්තේ අතමිට දිගහැර මුදල් වියදම් කිරීමෙනි.

කම්කරුවන් වැඩ නැවැත්වූ දවසෙහි කබලාන රුපියල් දෙතුන් දහසක් වියදම් කෙළේ ය. අවුරුදු කිහිපයකට පෙර අස්කරන ලද කම්කරුවන් කිහිප දෙනකුන් ද වැඩි වැටුප් ගෙවන්ට පොරොන්දුවී වැඩට ගෙන්වාගත්තේ ය.

"ඉතින් ඔය අවුල උඹේ තාත්තාටත් කම්කරුවන්ටත් බේරාගන්න ඇරපන්. උඹ මොකට ද ඒකට අත දමන්න යන්නේ"යි අරවින්ද කී ය.

"මම ඒකට අත දමන්න යන්නේ නැහැ. මම කම්කරු හවුලේ නායකයෙක් නෙවී. නමුත් මම කම්කරුවන්ට අනුකම්පා කරනවා. ඔවුන්ට කළමනාකාරයන් හා බාස්ලා පීඩා කරන හැටි මම දන්නවා. තාත්තා ගන්නේ උන්නේ පැත්ත නොව උන් පෙළන ඉහළ ඇයන්ගේ පැත්තයි. මේක තාත්තාත් කම්කරුවන් එක දෙනකුත් අතර ඇතිවී තිබෙන වියවුලක් නොවන බව උඹ හොඳටම දන්නවා."

"කළමනාකාරයන්ගේ පැත්ත නොගෙන තාත්තා වෙළදාම් කරන්නේ කොහොම ද?"

''මේක තාත්තාගේ වෙළඳාම පිළිබඳ ප්‍රශ්නයක් නොවේ ධනවතුන් හා දුප්පතුන් පිළිබඳ ප්‍රශ්නයක්; සමාජ ක්‍රමය පිළිබඳ ප්‍රශ්නයක්; කම්කරු හවුල දූන් වැඩ කරන්නේ තාත්තාගේ වැඩ පළේ සියලුම කම්කරුවන් ලවා වැඩ නැවැත්වීමටයි. ඔවුන් වැඩ නැවැත්තුවොත් අනික් කර්මාන්ත ශාලා කිහිපයකත් කම්කරුවන් වැඩ නවත්වනවා ඇති.''

''එතකොට හටගන්නේ මහා අවුලක්.''

''කම්කරුවන්ට සහනය දුන්නොත් අවුලක් වෙන්නේ නැහැ.''

තලතුනා වියෙහි වූවෙක් ඔවුන් දෙදෙනාට පිටු පා ගමන් කෙළේය. ''තිස්ස''යි මාලින් ඔහුට හඬ ගෑවේ ය. ඔහු ආපසු ඇවිත් මාලින් ඉදිරියෙහි වූ පුටුවෙහි වාඩි වූයේ ය.

''තිස්ස කයිසාරුවත්තේ——අරවින්ද අඳුනන්නේ නැහැ නේවද දෙස්තර——''

''නැහැ අහලා තියෙනවා'' යි තිස්ස කීවේ ය. ඔහුගේ අවුල් වුණු කෙස් වැටියට යටින් වූයේ ලොකු හිසකි. දික්වූ නැහැය පුළුල් නළල් තලයෙන් ඇදුණු හොටක් වැන්න. නිතර අඩක් වැසී සිටින ඇස් දෙකෙහි උමතු ශොකාකූල බැල්ම ප්‍රකට වූයේ ඔහු ඉඳ හිට ඇස් විදහාගත් විට පමණී.

''තිස්ස අපේ ළඟ නෑයෙක්. අපේ අම්මා තිස්සගේ අක්කාගේ දූ——ලේලි. තිස්ස මට අඳුනාගන්න ලැබුණෙත් මෑතදී.''

තිස්ස සැට වයස ද ඉක්මවූවකු නමුත් පෙනුමෙන් පනස් වියෙහි වූවෙකි. ඔහුගේ කමිසය අලුත්ය. කලිසම නොකිළිටි වුව ද කබලකි.

තිස්ස කවර ජාතියකගේ වුවද අතීතය නොසලකන්නෙකි. වර්තමානයට පරිභව කරන්නෙකි. ඔහු කිසිවක් නොඅදහයි. විද්‍යාවට සරදම් කරයි; සමාජයට සිනාසෙයි. ඉතිහාසය නවකථාවක් යයි කියයි. 'තිස්ස පිස්සන් කොටුවට යැවිය යුත්තෙකි'යි ඇතැමුන් කියන බව මාලින් දනිතත් අරවින්ද නොදනියි. සමාජයෙහිම වාසය කරන කෙලෙස් තැවූ මිනිහා භයානකයෙකි. ඔහු හොඳ මිනිසකු ලෙස සැලකෙන්නේ සමාජයෙන් ඈත්වූ විට ය. අනිකාගේ දුකෙහිදී දුක් නොවන, අපරාධය දුටු තැන සංවේග නොවන, මරණයෙහිදී නොහඬන, තමාට බැණ වැදුණු කල නොකිපෙන එකා සමාජය විසින් නිෂ්ඵල මිනිසකු ලෙස සැලකීම වැරදි ද? වැරදි නොවේ ය යනු මාලින්ගේ හැඟීම විය. එහෙත් තිස්ස, මාලින් ගැන සිතන්නේ මාලින් තමා ගැන සිතන්නාක් මෙනි. මාලින් සමාජය නොඉවසන්නෙකි. එහෙයින් ඔහු සමාජයෙන් ඈත්ව තවුස් දම් පුරන්ට වෑයම නොකොට සමාජයෙහි හිඳගෙන දස් සපන්නේ, ඉහළ සමාජයට ශාප කරන්නේ කුමක් නිසා ද?

Scanned by CamScanner

'මෙකල ලෝකයෙහි සියලුම අවුල්වලට හේතුව සමාජය කෙරෙහි කළකිරී කිපෙන මිනිසුන් ගාල් කරනු පිණිස තවුස් අරම නැතිවීම ය'යි තිස්ස කල්පනා කරයි. තිස්සත් මාලිනුත් හමු වූ ඇතැම් විට තර්ක කරන්නේ එකකු අනිකා තවුස්දම් රැකීමට වල් වැදිය යුත්තෙකැයි යන හැඟීමෙහි එල්බ ගෙන ය. අතීතයෙහි පෙරදිග නම් මාලින් වැන්නෝ වල් වැදී තවුස්දම් පුරන්නෝ වූහයි තිස්ස හැම විටම කී ය.

" 'පුරාණ සිංහල වීරයෝ' බලන්ට තිස්ස ගියේ නැද්ද''යි මාලින් ඇසුවේ ය. ඔහු මේ ප්‍රශ්නය ඇසුවේ තිස්ස කුප්පා අතීතයටත් වර්තමාන සමාජයටත් බන්නනු පිණිස ය.

" 'පුරාණ සිංහල වීරයෝ?' ඒ මොකක් ද?''

''ජාතිය නොහඳුනන අපේ ජාති හිතෛෂීන්ගේ ජාතික නාටකය——''

''පොදු මිනිසුන් පාලනය කරමින් තමන්ගේ විශේෂ අයිතිකම් රැකගෙන සිටීම අමාරු වේගන එන කොට ලොකු මිනිස්සුන් කරන්නේ තුමක් ද? ආගම ඇදහීමටත් අතීත මුතුන්මිත්තන්ගේ ලොකුකම් කීමටත් පටන් ගැනීම යි'' තිස්ස කී ය. ඔහුගේ කට කොනත් ඇස්කොනත් වෙනස් වූයේ සාවඥ සිනාවක් නිතැතින්ම නැඟුණු බැවිනි.

''අතීතයේ සිටි සිංහල මිනිසුන් වීරකම් කළා නම් ඒ බව කීම හා සිහිකිරීම වැරදි ද?''යි අරවින්ද ඇසී ය.

තිස්ස තමාගේ තේ කෝප්පය තුළ හැන්ද දමාගෙන කුරුගායි. ඔහුගේ කට කොනට නැඟුණු සිනාව පිට නොකරන ලද නින්දාලාපයකගේ විලාසය ගත්තේ ය.

''කවුද වීරකම් කෙළේ?'' යි අසමින් තිස්ස තම කට කොන්, දෙකන් දක්වා පළල් කෙළේ ය. වැටුණු දතක් නිසා පැදුණු විවරයකුදු නැති ඔහුගේ දත් දැන්ද පොල් ඉරි දෙකක් සේ මතු වී ය.

''දුටුගැමුණු රජ්ජුරුවෝ.''

''දුටුගැමුණු රජ සිංහල මිනිස්සුන් මරානොදමා දෙමළ මිනිස්සුන් මරාදැමූ එක ද?''යි අසමින් තිස්ස තේ උගුරක් බීවේ ය.

''මොනව! දෙමළ මිනිස්සුන් මරා සිංහල රට නිදහස් කළ එක''යි අරවින්ද කීවේ ය.

''දුටුගැමුණු රජ්ජුරුවන්ට දුර දක්නා නුවණත් නිර්භීත කමත් තිබුණා නම් මරාදමන්නේ දෙමළ මිනිස්සුන් නෙවි''යි තිස්ස කී ය.

''එහෙනම් පොදු සිංහල ජනයා මැඩගෙන සැප වින්ද අතලොස්ස ද'' යි අසමින් මාලින් සිනාසුණේ ය.

Scanned by CamScanner

''දැන් ඉන්න ඉහළ මිනිස්සුත් ඉහළ නගින්ට වෑයම කරන මිනිස්සුත් කියන්නේ තමන් පුරාණ සිංහල වීරයන්ගෙන් පැවත එන බවයි. මාලින් කියන්නේ ඔවුන්ගෙන් බොහෝ දෙනා බොල් මිනිස්සුන් අභිනක්ය කියා!''යි තිස්ස තෙපළේ ය.

''ඒගොල්ලන්ගෙන් සමහරුන්ට ඕනෑ උගුර ළඟට එන තෙක් හොඳ රසවත් කෑම කන්ට. ඉංග්‍රීසින් අනුකරණය කරන්ට. රන්සිවි ගෙවල් වගේ මහා මොටෝරියවලින් යන්ට. අහංකාර ගැනුන්ගේ මූණු ඉඹීමෙන් සන්තෝෂ වන්ට! මේ සියල්ලෙන් සිතත් කයත් නළවාගෙන ඉන්න වෙලාවට ඔවුන්ට ඕනෑ කරන්නේ ඔවුන් සන්තෝෂ කරන විගඩම්.................''

''මාලින් කියන්නේ මුඩුක්කුවල ගුඩු වන දිළින්දන්ට වස්තුව බෙදා දී ධනවතුන්ටත් මුඩුක්කුවලට ගොස් තපස් රකින්ට ද?''යි තිස්ස ප්‍රශ්න කෙළේ ය.

''ඔක්කොම එක සමාන පොහොසතුන් වෙන්ටයි මම කියන්නේ.''

''එතකොට පොහොසත් වන්නේ ඔක්කොම නෙවි; මැරයෝ; තක්කඩියෝ, නගරයේ සිංහල වැද්දන්ට වඩා මම ගම්වල ඉන්න සිංහල වැද්දන්ට කැමතියි'' කියමින් තිස්ස දත් දැන්දම පෙනෙන සේ යළිත් දෙතොල් විදහාගත්තේ ය. එය සිනාවක් ද නොඑසේ නම් දත නියවීමක් ද යනු අරවින්දට තේරුම් ගත නොහැකි වී ය. එය සිනාවත් සරදමත් යන දෙකම එකට ඇනීමේ ප්‍රතිඵලයක් බව මාලින් දනියි.

''උගත් වැද්දන් කමිස කලිසන් කෝට් සපත්තු තොප්පි ආදියෙන් තමන්ගේ ඇඟෙත් සිතෙත් කැළැල් හා වණ වහගන්නවා. ගම් වැද්දන් රෙදි කඩින් වහ ගන්නේ රහස් තැන් විතරයි!'' තිස්ස යළිත් කී ය.

''ගැමියන් රහස් තැනුත් වසා නොගෙන ඉන්නවා නම් තිස්ස වඩාත් කැමති වේවි!''

''රහස් තැන් වසා නොගෙන ඉන්ට ධෛර්‍ය්‍ය ඇත්තේ අහිංසකයන්ටත් කුඩා දරුවන්ටත් පමණයි.''

''එහෙනම් ගැමියන් අහිංසකයන්ට වඩාත් ළංවන්නේ අඩක් නිරුවතින් ජීවත් වන නිසා!''යි කියමින් අරවින්ද සිනාසුණේ ය.

''උගතුන්ට අහිංසකයන් වෙතට ළංවිය නොහැක්කේ ඔවුන්ට අඩක් සෙළුවෙන්වත් ජීවත් වන්ට බැරි නිසා!''

''සෙළුවෙන් ජීවත් වන උගතුන්ගේ නිකායක් බටහිර පහළවී තියෙනවා.''

''බටහිර අනුකරණය කරන්ට දඟලන අපේ උගතුන්ට සෙළ-වෙන් ජීවත් වන්ට තරම් වත් ධෛර්යයක් නැහැ! අදීනව සිතන්ට පුළුවන් කමක් නැහැ?''

''තිස්ස මහා නරුමයෙක්!''

''ඉතාම හොඳ අවංක හදවත් ඇත්තේ නරුමයන්ට පමණයි'' කියූ තිස්ස යාපනේ සුරුට්ටුවක් පත්තු කරගෙන මාලින්ගේ මුහුණට එල්ල කොට දුම් පිට කෙළේ ය. ''වහා උණුවන අවංක හදවත් ඇති මිනිසුන්ට පමණයි නරුමයන් විය හැක්කේ.''

''ඇත්ත, නරුමයන් උණාට පස්සේ උන්ගේ හදවත් සිත් පිත් දෙකින් ම තොර වෙනවා! එතැන් සිට ඔවුන් සිනාසෙන්නේ සිතින් නොව කයින්. ඔවුන් දුක් වන්නේත් සිතින් නොව කයින්; අනුකම්පා කරන්නේත් සිතින් නොව කයින්.''

''මෙලොව ඉන්නා මිනිස්සුන්ට උවමනා කරන්නේ සිතින් සිනාසීම නොව කයින් සිනාසීමයි. සිතින් දක්වන අනුකම්පාව නොව කයින් දක්වන අනුකම්පාවයි. දෙවියන්ටත් පෙරේතයන්-ටත් පින් දෙන්නා වගේ සිතින් දක්වන අනුකම්පාව ඕනෑ කරන්නේ එලොව මිනිස්සුන්ටයි!''

''තිස්ස නගරයේ උගතුන්ට වඩා ගම්වැද්දන්ට කැමැති නම් ඇයි ගමට නොයන්නේ''යි කියමින් මාලින් සරදම් කෙළේ ය.

''මම උගත් වැද්දකු වුණු ගම් වැද්දකු නිසා!''

''ගම් වැද්දකුව ඉන්ට බැරි උණ නිසා තිස්ස දැන් එහෙනම් කණගාටු වෙනවා!''

''නැහැ—ගම් වැද්දන්ගේ අගය දැනෙන්නේ උගත් වැද්දෙක් උණාට පස්සේ. ඒ නිසා මම උගත් වැද්දෙක් වීම ගැන සන්තෝෂ වෙනවා!''

''එහෙනම් අසභ්‍ය දෙයින් ශිෂ්ට දේ හැඳිනගත හැකි වන්නේ උගත් වැද්දකු උණාට පස්සේ!''

''නෑ. අර බිත්තියේ ඇඳි සිත්තම් උගතුන්ට එල්ල කරන ලද සරදමක් බව ම ලින් කල්පනා කළා ද?''යි අසමින් තිස්ස දකුණු පැත්තේ බිත්තිය පෙන්නුවේ ය. ''උඩම පේළියේ පරවී මල නටන්නේ රුසියන් පොල්කා නැටුම, යටින් තළා පිඹින බෙර වයන, වීණා ගාන දළඹුවන්, ගොළුබෙල්ලන්, පළහැටියන් තමා කුලීනයන් හා උගතුන්! මේ යුද්ධයෙන් සමාජ වාදය නමැති රුසියන් පොල්කා නැටුම් ඉහළ නැංගා. පොදු ජනයා මැඩගෙන ඉහළින් සිටි කුලීන පන්තියේ උගත් මිනිසුන් පහළ වැටිලා තළා කාරයන් බෙරකාරයන් හා වීණා ගායකයන් උණා!''

Scanned by CamScanner

''තිස්ස කිසි දෙයක හොඳක් දකින්නේ නැහැ. තිස්ස තද
කොළ බිස්සෙහි අඩිය තියන්නෙත් තණ කොළ යට සරුපයෙක්
ඇත්දැයි යන සැකයෙන්'' කියමින් අරවින්ද හොඳටම සිනාසුණේ ය.

තිස්ස, නගරයේ උගතුන්ටත් ධනවතුන්ටත් කම්කරුවන්ටත්
බණින්ට පටන්ගත්තේ ය. 'නගර වැසියෙක්, උගැන්මෙන්ම ශිෂ්ට-
යෙක් නොවන්නේය'යි කියමින් ඔහු තර්ක කෙළේ ය. නගර-
යෙහිදී ලැබිය හැක්කේ පොතින් පතින් හා උගතුන් අනුකරණයෙන්
ලබන උගැන්ම මිස ශිෂ්ටත්වය නොවේ. අසංකීර්ණ මනුෂ්‍යයා
උගැන්මෙන් සංකීර්ණ මනුෂ්‍යයෙක් වෙයි. එයින්ම ඔහු ශිෂ්ට-
යෙක් නොවේ. ඔහු අභිරුචියෙන් ද සංකීර්ණ මනුෂ්‍යයකු වනු
මිස ශිෂ්ටයෙක් නොවේ. උගතුන්ගෙන් වැඩි දෙනා ග්‍රාම්‍ය අසභ්‍ය
දෙයින් ආස්වාදය ලබන්නේ එහෙයිනි. සිනමාව ග්‍රාම්‍ය අශිෂ්ට
කලාවකි. බඳ පුම්බා ගත් දුවැන්ත මොටෝරිය ග්‍රාම්‍ය වාහනයකි.
සංකීර්ණ දෙයක් අශිෂ්ටත්වයෙන් හා ග්‍රාම්‍යත්වයෙන් නිදහස් කොට
නිපදවීම අමාරු කාරියකි. උගතුන් අගය කරන දේ අතර ග්‍රාම්‍යත්-
වයෙන් දූෂණය නොවූ දේ එතරම් සුලභ නොවේ. අශ්ලීලත්ව-
යෙන් ශිෂ්ටත්වය වෙන් කළ හැකි මිනිසුන් නගරයේ උගතුන් අතර
සුලභ නොවන්නේ ඔවුන් ගතානුගතිකව සංකීර්ණ දේ ශිෂ්ට දේ
ලෙස සලකන බැවිනි.

තිස්ස වෙළඳ බුද්ධිය හා උපාය ඥානය, නාගරික සභ්‍යත්වය හා
අත්වැල් බැඳගෙන යාමෙන් වන හානියක් අතිශයෝක්තියෙන්
කියන්ට තැත් කරන බව අරවින්දට වැටහිණ.

''ගැමියන්ගේ අභිරුචිය එයිටත් වඩා ග්‍රාම්‍යත්වයෙන් දූෂණය
වූවක් නොවේ ද?''

''නැහැ'' යි තිස්ස පිළිතුරු දුන්නේ ය. ''වාම් අසංකීර්ණ හැම
දේම ග්‍රාම්‍යත්වයෙන් මෙන් අසභ්‍යත්වයෙන් ද තොර ය. තද
කොට බැඳි තන පට නිසා ඉස්සුණු පියයුරු යුවළ වැයමින් ආරූඪ
කරන ලද අශ්ලීල ලක්ෂණ ඇත්තකි. මෙකල වෘද්ධ ගැමියා
ජීවිතයෙහි අත්දැකීම් ඇති ආදි කාලීන වෘද්ධ ගැමියන් නිපදවූ ජන
කථා ඇසීමෙන් ද ලත් උගැන්ම ඇත්තෙකි. ඔහු වන රොදවල්,
ගංගා, ඇළ දෙළ, කඳු මූකළාන් හා සතුන් දැකීමෙන් නොදුන වුවද
ආස්වාදයක් ලබන්නෙකි. ස්වභාව ධර්මය නොහොත් ප්‍රකෘතිය
ආශ්‍රයෙන් සකස් වුණු ඔහුගේ රුචිය අසංකීර්ණ වෙයි. සියලු
අසංකීර්ණ දේ අශ්ලීලත්වයෙන් තොර වෙයි. එහෙයින් ඔහුගේ
රුචිය ද ග්‍රාම්‍යත්වයෙන් දූෂණය නොවූවකි.

''බලි ඇදුරාගේ සිත්තම! ගමේ සිත්තරාගේ සිත්කම ග්‍රාම්‍යත්ව
දෝෂයෙන් තොර ද?''යි මාලින් ප්‍රශ්න කෙළේ ය.

Scanned by CamScanner

"නගරයේම ඉපිද නගරයේ ම වැඩුණු මාලින් දන්නේ කොහො-මද බලියෙහි ග්‍රාම්‍යත්වය? බලි ඇදුරාගේ සිත්තම ග්‍රාම්‍ය නොවේ. කුඩා දරුවන් අඳින සිත්තම්වල මෙන් එහි අපරිණත ලක්ෂණ ඇති බව හැබැ ය. බලි ඇදුරාගේ සිත්තම අසංස්කෘතයයි කිය හැකි නමුත් ග්‍රාම්‍යයයි කිව නො හැකි ය. 'ග්‍රාම්‍යත්වය' යනු නාගරික-යන් ගැමියන් හෙළාදැකීමට නිපදවූ වචනයකි. ඒ වචනය ඔවුන් ප්‍රථම පැටවිය යුතු ය. අසංස්කෘත හැම දේම ග්‍රාම්‍ය නොවේ. එසේ නම් ප්‍රකෘතිය ද ග්‍රාම්‍යයයි කිය යුතු ය. කුඩා දරුවන් අඳින කිසිම සිත්තමක් ග්‍රාම්‍යත්වයෙන් දූෂණය නොවේ. ඔවුන් කුණු-සරුපයක් කියනු පිණිස සිත්තමක් ඇන්දත් එය අශ්ලීලත්වයෙන් තොර වෙයි. ගැමියන්ගේ කලාව දරුවන්ගේ කලාවට හිමි අසංකීර්ණත්වයෙන් තොර නොවූවකි. ආදි කාලීන වැද්දන් පුම්බන ලද ළය ද කකුල් ද ඇති ගෑනු රූප ඇඳුවා. ඇන්ද උන් ගෑනු රූපයෙහි ඒ ලකුණු අතිශයෝක්තියට නැඟුවේ එයින් ආස්වාදයක් ලබනු පිණිස නොවේ; ගොවිතැනින් වැඩි අස්වැන්න ලැබීම පිණිස ය. පුම්බන ලද ළයත් කකුලුත් ඇති ගෑනු රූප ඔවුන් ඇඳුවේ දැඩි ආත්මික ඇදහිල්ලක් නිසාය. වර්තමාන කලාකරුවා තන මහත් කොට ගෑනු සිත්තම් අඳින්නේ ඔහු එයින් පහත් ආස්වාදයක් ලබන නිසා, අන්‍යයන් ද එයින් ආස්වාදයක් ලබන බැවින්. ග්‍රාම්‍යත්වය ආරූඪ වන්නේ ඒ නිසා ය."

"එතකොට සීගිරි සිත්තම්, අජන්තා සිත්තම?" යි අරවින්ද ප්‍රශ්න කෙළේ ය.

"අජන්තා සිත්තම් හා සීගිරි සිත්තම් අශ්ලීලත්වයෙන් තොර නොවේ. එහෙත් ඒ අශ්ලීලත්වය නොසලකන්නේ ශ්‍රේෂ්ඨ කලා කාරයන් තමන්ගේ උසස් භාවනාව සාර්ථක ලෙස ඒ සිත්තම්වලට ආරූඪ කරන ලද බැවිනි. ඔවුන් ඒ සිත්තම් ඇන්දේ ආගමික පර-මාර්ථයක් මුල්කොට ගෙන ය. පුම්බන ලද ළය ඇතිව අජන්තා ස්ත්‍රීන් ඇඳීම සිත්තරුන්ගේ දෘෂ්ටියෙහි වරදින් ආරූඪ වූ ග්‍රාම්‍යත්ව-යක් නොවේ. ඒ කාලයෙහි කාමුක රජුන් ඇමතියන් හා උගතුන් පිම්බුණු ළය මහත් කොට සැලකූ නිසා සිදුවූවකි. ඒ හැර ඒ ගෑනු රූපයන්ගේ අනිත් ශිෂ්ට ලක්ෂණ, පුම්බන ලද ළය නිසා ආරූඪ විය යුතු අශ්ලීලත්වය බෙහෙවින් දුරුකරයි."

"අපි ඔක්කොම යළිත් ගම් වැද්දන් වෙමු ද?" යි අසමින් මාලින් තිස්සගේ පිටට තට්ටු කෙළේ ය. "අපි බලි අන්දවමු; තොවිල් නට-වමු; පිදේනි දෙමු; ළය සමතලා කරන ඇඳුම් ගෑනුන්ට අන්දවමු.

"නගරයේ බොහෝ උගතුන් හා ලොකු මිනිස්සුන් සෑත්තර අහනවා; කේන්දර බලනවා; කතරගමට ගොහින් පඬුරු ඔප්පු කර නවා. බලි අන්දවන්නෙත් නැතත් මතුරවනවා. තොවිල් නොනට-වන නමුත් දෙහි කප්පනවා" යි කියමින් තිස්ස මාලින්ට සරදම්

කෙළේය. "නගරයේ බොහෝ මිනිසුන් අපරදිග සභ්‍යත්වයෙහි හරය නොව පොත්ත බදාගන්නවා. ඒ වගෙම ඔවුන් සිංහල සභ්‍යත්වයෙහි හරය ඉවත දමා පොත්ත බදාගන්නවා. මන්තරයත් ග්‍රහයන් පිදීමත් දෙහි කැපීමත් ආදි කාලීන වැද්දන්ගේ මිථ්‍යා ශාස්ත්‍ර! තිරශ්චීන විද්‍යා. ඒ මිථ්‍යා ශාස්ත්‍ර නිසා උපන් කලා තමා තොවිල් නැටීම හා බලි ඇදීම. බලි ඇදීමත් තොවිල් නැටීමත් තමා,ඒ මිථ්‍යා ශාස්ත්‍රයන්ගේ හරය නොහොත් වටනා අංගය. නගරයේ මිනිස්සුන් මැණික් ඉවත දමා බෙලිකටු හා කවඩි බදාගන්නා වැද්දන් වාගේ කලාව ඉවත දමා තිරශ්චීන විද්‍යා බදාගන්නවා!"

"ඒක නොවෙන්නම් තිස්ස මම බලි අන්දවමු, තොවිල් නටවමු, පිදේනි දෙමුයි කිවුවෙ!"

තිස්ස පුටුවෙන් නැංගේ ය.

"තිස්ස යන්න ද?"

"ඔවු—මට යාළුවෙක් හම්බවෙන්න තියෙනවා."

"තිස්ස, හෙට අපි එක්ක රෑ කෑමට ගෝල්පේස් හෝටලේට එනව ද?"

"ගෝල්පේස් හෝටලේට?"

"ඔව්."

"බෑ. හැඳි ගෑරුප්පු වලින් කෑම මට එපා වෙලා."

"එහෙනම් අතින් කනවා නෙව."

"එතකොට හෝටලේට එන අනිත් මිනිස්සු මා දිහාව බලන්න පටන් ගනීවි!"

"ඉතින් බැලුවට මොකද?"

"මොකුත් නැහැ; ඒ උගත් මෝඩයන් මා දිහාව බලා සන්තෝෂ වෙනවා. ඔවුන් මා දිහා බලා සන්තෝෂ වෙන එකටයි මම විරුද්ධ වන්නේ. නෘත්‍ය ශාලාවට හෝ සිනමාවට හෝ ගොහින් ඔවුන් විගඩම් බලා සන්තෝෂ වන්නේ මුදල් ගෙවා. මම මොකොටද උන්ට නොමිලේ සන්තෝෂය ලැබීම සඳහා විගඩම් පාන්නේ!"

"අතින් කෑම විගඩමක් ද?"

"අතින් නොකන ගතානුගතික මිනිස්සුන් අතරට ගොස් අතින් කෑම විගඩමක් වෙනවා. අතින් කන්ට විතරක් නෙවි; එක පතේ කන්ටත් මම කැමතියි. මුස්ලිම්කාරයන් විතරයි එක පතේ කෑමෙන් සන්තෝෂ වන්නේ; බත් මාළුපිනි ගෙනැවිත් තැබුවාම මුස්ලිම් කාරයන් ඉඳුල් අත්වලින්ම බත් මාළුපිනි බෙදා ගන්නවා!"

"ඒක අශිෂ්ට චාරිත්‍රයක්"යි කියමින් අරවින්ද සිනාසුණේය.

"නෑ—ඒක අශිෂ්ට චාරිත්‍රයක් නෙවි. බල්ලන්ට එක පතේ කන්න බැහැ—උන් පොරකනවා. මිනිස්සුන් බල්ලන්ට වඩා ශිෂ්ටයි. ඒ නිසා මිනිස්සු එක පතේ කන්න ඕනෑ!"

"බල්ලන්ට වල්ග තියෙනව—මිනිස්සුන්ට වල්ග නැහැ!"

"දෙපයින් යන්ට පටන් ගෙන මිනිස්සුන් වල්ග හළා ගත් එක තමයි ලොකුම වැරැද්ද! වල්ගය තමා අපේ අතීතය. ඒ අතීතය නිතර සිහිකරන වල්ග කොටයක් අපට තියෙන බව මට වඩා හොඳින් අරවින්ද දන්නවා."

"එක පතේ කන්ට ගොස් සය රෝගය බෝකරගන්ට කැමති වන්නේ කවුද?"යි මාලින් ඇසුවේ ය.

"එක පතේ නොකන මිනිස්සුන් අතරයි සය රෝගය වැඩියෙන් බෝවෙන්නේ."

"එක පතේ කන්ට නම් බැහැ! නමුත් තිස්ස කැමති නම් යමු අපි පැරිස් හෝටලේට"යි අරවින්ද යෝජනා කෙළේ ය.

"හොඳයි. නමුත් මම හැඳි පාවිච්චි කරන්නේ නැහැ. මම ඉඳුල් අතින් උණුත් කුකුළු මස් බෙදාගන්නවා!"

"තිස්සට වෙනම කුකුළු මස් පිඟානක් ගෙන්නනවා!"

"කමක් නැහැ."

තිස්ස නික්ම ගිය පසු අරවින්ද මෙසේ කී ය.

"තිස්ස උගත් වැද්දෙක්ම තමා!"

"පොත් කියවීම තිස්සට අබින් කෑම වගේ දුසිරිතක්"යි මාලින් කීවේ ය. "අබින් කන්නාගේ ස්නායු අඩ පණ වෙනවා. පොත් කියවීමෙන් තිස්සගේ ස්නායුත් අඩ පණ වෙලා තියෙනවා. අබින් කන්නා අබින් හෙළා දකින්නා වාගේ තිස්ස හැම පොතම හෙළා දකිනවා!"

"එහෙනම් එයා පොත් කියවන්නේ මොකට ද?"

"අබින් කන්නා වාගේ තිස්සට වෙන කිසිවකින් විනෝදයක් ලබන්ට බෑ. අබින් කෑමත් මත්පැන් බීමත් පොත් කියවීමත් යන තුනම එක සමානයයි තිස්ස කියනවා."

අරවින්ද හා මාලින් පැගොඩාවෙන් නික්ම රීගල් සිනමා සාලාව බලා ගියෝ ය. ඔවුන් දෙදෙනාම සිනිමා සිත්තම් බැලීමෙන් එතරම විනෝදයක් ලබන්නෝ නොවෙති. විනෝද කලා අතරින් සිනමාව මාලින් ඉතා පහත් එකක් ලෙස සලකන්නෙකි. ආණ්ඩු-වත් සමාජයත් ගතානුගතික අනික් හැම දේත් වෙනස් වනු දකින ආසාවෙන් මඩනා ලද මාලින්ට උචිත විනෝදය සපයන තැන් දුර්ලභ ය. ඔහු ඇතැම් දවසක සිංහල නාටකය බලන්ට යන්නේ

Scanned by CamScanner

එය ධනවතුන්ටත් ඉංග්‍රීසි උගතුන්ටත් ඉහළ සමාජයටත් එල්ල කරන ලද ග්‍රාම්‍ය නින්දලාපයෙන් ගහන වූවක් බැවිනි. සමාජයට කිපුණු ඔහු නාටකයෙහි ග්‍රාම්‍ය ස්වරූපය නොතකා එයින් ආස්වාදයක් ද ලබයි.

රීගල් සිනිමා සාලාව අසල පාර දෙපැත්තේ නවත්වන ලද මොටෝරිය දෙපේළිය කෙළවර වූ තැන වම් පැත්තේ අරවින්ද තම මොටෝරිය නවත්වා එහි දෙරවල් වසා යතුරු දැම්මේ ය. ඔවුන් දෙදෙනා ආපසු සිනිමා සාලාව බලා පයින් ගමන් කෙළේ තමන්ටම බණිමිනි. සිනිමා සාලාවේ බැල්කනියේ අසුන් හැර අනික් අසුන් අතර හිස් අසුන් දෙකක් ඔවුන් සොයාගත්තේ ඉතා අමාරුවෙනි.

Scanned by CamScanner

# 14

අරවින්ද සිනිමා සාලාවෙන් නික්ම අනෝමාවට ගොස් මාලින් එහි බස්වා තම නිවෙසට පැමිණියේ රෑ දහයට පමණය. අරවින්දගේ පියාත් සමඟ පැමිණි අමාරු ලෙඩෙක් හා ඒ ලෙඩාගේ පියාද ඔහු එන තෙක් එහි බලා සිටියෝ ය. මාතර සිට මෝටෝරියෙන් ගෙන එන ලද ලෙඩා තම පියාගේ යහළුවකුගේ පුතෙකි.

''තමුන්නාන්සේ එන කල් අපි බලා උන්නා''යි ජයනෝරිස් මුදලාලි කී ය. ඔහු බඳින ලද කොංඩයක් ද කදිම උඩු රැවුලක් ද ඇති මැද වියෙහි වූවෙකි.

විසිතුරු බංගලාව, මල් වවන ලද උයන, රතු ඉටියෙන් ඔප් නඟන ලද ආලින්දය ද පලසක් අතුරන ලද සාලය ද වටනා පුටු සැටි ආදිය ද උළුවහු දෙරටු වසා අදින ලද පට රෙදි ද ජයනෝරිස් මුදලාලි නැවත නැවත බැලී ය. බලත්ම අරවින්දට ඔහුගේ සැලකිල්ල වැඩි වී ය.

''මේ ජයනෝරිස් මුදලාලි—මගේ ඉතාම හොඳ පරණ යාළුවෙක්'' කියමින් වත්තුහාමි මුදලාලි තම යහළුවා පුතාට අඳුන්වා දුන්නේ ය.

අරවින්ද අතට අත දීමෙන් ජයනෝරිස් මුදලාලිට ආචාර කෙළේ ය.

''අපට අද විතරයි ටිකක් නිවාඩු ලැබෙන්නේ. යාළුවෙක් එක්ක අද සිනිමා බලන්න ගියා. කෝ ලෙඩා!''

''කාමරේ අපි එයා හාන්සි කෙරෙවුවා. එයාට ටිකක් අමාරුයි—''

ජයනෝරිස් මුදලාලි තම පුතාගේ රෝගය විස්තර කරන්ට පටන් ගත්තේ ය; බඩේ කැක්කුම හැදුණු දට පසු සිංහල වෙද කැඳවනු ලැබීය; ඔහු කෂායක් නියම කෙළේ ය; ගුලි බෙහෙතක් දුන්නේය. බඩ තවන්ට නියම කෙළේ ය. තවන විට පමණක් කැක්කුම ටිකක් අඩුවී ටික වේලාවකට පසු යළිත් වැඩි වී ය.......

ගැමියන් හඳුනන අරවින්ද, ජයනෝරිස් මුදලාලිගේ දෙඩවිල්ල එක වරම නොනැවැත්වූයේ ය. සමත් වෙදකු විසින් වෙදකම් කරනු ලැබූ ලෙඩකු කොළඹට ගෙනෙන්නේ පන අදින්ට ළංවූ පසුයයි සිතූ අරවින්ද අනතුරුව ජයනෝරිස්ගේ කථාවට බාධා කෙළේ ය.



Scanned by CamScanner

"ලෙඩා දෙස්තර මහත්මයකුටත් පෙන්නුවා ද?"

"පෙන්නුවා. අදම කොළඹ ගෙනියන්න කිවුවා——"

"ඇයි කලින් මට ඒක නොකිවුවේ?" යි කියූ අරවින්ද වහා ගෙට ගොස් කබාය ගළවා තබා දෙස්තර කබාය හැඳගෙන ලෙඩුන් බලන කාමරයට ඇතුළු වූයේ ය. ඔහු සුවිච් ඇනය පාත් කරත්ම 'ටික්' හඬක් නැංගේ ය. ඇඳ අසළ වූ විදුලි පහනින් නිකුත් වූ දිමුත් සුදු එළියෙන් කාමරය එළිය වී ය. අරවින්ද ලෙඩා ඇඳෙහි බාවා පරීක්ෂා කෙළේ ය. යටි බඩ දකුණු පැත්තේ ඉදිමුම ඔහුගේ ඇඟිලි තුඩුවලට දැනුණේ දැඩි දෙයක් ලෙසිනි. ඔහු ලෙඩාගේ නාඩි ද බලා කලින් කටෙහි තබන ලද උෂ්ණ කටුව අතට ගත්තේ ය.

"බඩේ රිදුම හැදිලා කී දවසක් වෙනවා ද?"

"අට දවසක් විතර වෙනවා"යි ලෙඩා උත්තර දුන්නේ ය.

"වෙද මහත්මයා බඩ යන්න බෙහෙත් දුන්නා ද?"

ලෙඩාට පෙර 'ඔව්' යයි පිළිතුරු දුන් ජයනෝරිස් මුදලාලි, වෙද මහතා කළ වෙදකම් යළිත් විස්තර කෙළේ ය. කෂාය, බෙහෙත් ගුළි, කැඳ වතුර, තෙල් ගෑම, තැවීම කියූ ඔහු අනතුරුව ලෙඩා උදෙසා කරවන ලද යකැදුරුකම් විස්තර කෙළේ ය. දෙහි කැපීම, පිදේනි දීම, හූනියම, මහදෙයියම.................

අරවින්ද මේසය කරා ගොස් පුටුවෙහි වාඩිවී කඩදසි පතක් ගෙන ජයනෝරිස් මුදලාලිට හඬගෑවේ ය.

"දැන් වහාම ලෙඩා ඉස්පිරිතාලෙට ඇතුල් කරන්ට ඕනෑ. මේ ලියුමත් අරගෙන යන්න. මම එකොළහට ඉස්පිරිතාලෙට එනවා."

අරවින්ද ටැලිපෝනය ගෙන ඉස්පිරිතාලයේ දෙස්තරකුට ලෙඩාගේ තොරතුරු දන්වා ජයනෝරිස් මුදලාලිට ලියුම දුන්නේ ය.

"මුදලාලි මාත් එක්ක ටිකකට සාලෙට එන්න."

ජයනෝරිස් මුදලාලි අරවින්ද පස්සේ ගියේ තම පුතාට මරණ දඬුවම නියම කිරීම හෝ නිදහස දීම හෝ අරබයා කෙරෙන විනිශ්චය ඇසීමට යන්නකු ලෙසිනි. අතරින් පතර අමාරු සිංහල වචන ද බහාලමින් අරවින්ද රෝගය අරබයා කළ විස්තරය හොඳින් තේරුම් ගත නොහැකි වූ ජයනෝරිස් මුදලාලි මෙසේ කීය.

"මාතර දෙස්තර මහත්මයා කිව්වා 'ඇපැන්දිසයිසිස්' වෙන්න ඇත, කපන්න වේ ය කියා——"

"ඊටත් වඩා බර ලෙඩක් වෙලා තියෙනවා. ඇපැන්ඩික්ස් කියන බඩවැල් තුඩ ගෙඩියක් වෙලා. වෙද මහත්මයා බඩ යන්න බෙහෙත් දීපු නිසා ලෙඩේ තවත් නරක් වෙලා තියෙනවා. ගෙඩිය පිපුරුවොත් හොඳ නැහැ. දැන් ලෙඩා ඉස්පිරිතාලෙට ඇතුල් කරලා අදම ඔපරේෂන් එකක් කරන්න ඕනෑ."

Scanned by CamScanner

අරවින්ද එකොළහට ඉස්පිරිතාලයට ගොස් ලෙඩාගේ මුත්‍ර හා රුධිර පරීක්ෂණය පිළිබඳ වාර්තාව බලා යළිත් වරක් ලෙඩා සෝදිසි කෙළේ ය. අනතුරුව රෝද සහිත ඇඳෙහි බාවා ලොම් පලසකින් වැසූ ලෙඩා සැත්කම් මඩුවට ගෙනයනු ලැබී ය.

බියෙන්ද සැකයෙන් ද සෝකයෙන් ද කම්පා වන ජයනෝරිස් මුදලාලි සැත්කම් සැලෙහි ආලින්දයෙහි කණුවකට අත ගසාගෙන බලා උන්නේය. සැත්කම් මඩුව දුටු ඔහු, උමං ගෙවල් සහ සොහොන් ගෙවල් සිහි කෙළේ ය. ලේ ගඳත් බෙහෙත් ගඳත් ඔහුගේ නාසය කාගෙන යයි. ගන්ධි තොප්පි වැනි සුදු හිස් වැසුම් හා නාසා පටන් කටවල් ද වැසෙන සේ බැඳුණු මුව වඩම් ද ඇතිව ඇස්වටයේ වැදෙන තරම් දික් වූ සුදු වසනයන් හැඳගත් දෙස්තරුත් සේවකයෝත් සැත්කම් මඩුවෙන් එළියට එති; එහි ඇතුළුවෙති. ඔවුන් දුටු විගස මස් කොලොම්බුකාරයන් සිහි කළ ජයනෝරිස් මුදලාලිගේ බිය වැඩි වී ය. තමා ගේ හිස් මොළය දියව වැගිරෙන්නාක් මෙන් ඔහුට දැනිණ. ඔහුගේ නළල් තලයට ඩාදිය නැංගේය. ඉස්පිරිතාලය කැරකෙන්ට වී ය. තමා පා ගසාගත් පිල්කඩ හකුරු මුලක් සේ සුන්බුන්ව ගිලී බසින්ට වී ය. ඉතා වෑයමෙන් සිහි එළවා කණුව අල්ලාගෙන සෙමින් පාත් වී පිල්කඩ උඩ වාඩි වූ ඔහුගේ කටින් පිට වූයේ සුසුමකි.

සැත්කම් මඩුවට ඇතුළු කරනු ලැබූ ලෙඩා, ලේ හාරය සහිත පුළුන් කැටි ගන්නා ඇනමල් බාල්දි, රිදී පාටින් දිලෙන සැත්කටු සහිත වීදුරු අල්මාරි හා හුමාලයෙන් තැම්බෙන සැත්කටු සහිත රිදී පාට බඳුන් ද දුටුවේ ය. කවර අතකට වුව ද සෑණකින් හැරවිය හැකිසේ නැඹී සිටි විදුලි පහන් යට වූ සැත්කම් මේසයට මාරු කරනු ලැබූ ලෙඩාගේ ඇස් වසා සේවකයෙක් රෙදි කඩක් බැන්දේය. සැත්කටු සහිත වීදුරු මුදුන් ඇති කුඩා මේස සැත්කම් මේසය අසල වී ය.

ලෙඩා සැත්කම් මේසයට මාරු කරනු ලැබූ වහාම නැහැයත් කටත් වසාගත් දෙස්තරෙක්, මුස වායු උපකරණයෙහි වැල්පට හැරවූයේ ය. එයින් නිකුත් වන සුවඳැති වායුව දෙනාසාපුටයෙන් ඇතුළුවත්ම, තම දෙකන් සිදුරු අගුල් වටවන ගෝසාවක් ලෙඩාට ඇසෙන්ට වී ය. අමාරුවෙන් හුස්ම ගන්ට වූ ඔහු හිස හරවමින් දැත ඒ අතටත් මේ අතටත් ගසන්ට වී ය. ඔහු තමා වටා සිටි දෙස්තරුන් හා සාත්තු කාරයන් ක්‍රමයෙන් වලාකුළුවලට හැරී අතුරුදහන් වනු, ඇස් වසා බැඳි රෙදිකඩ යටින් යන්තම් දුටුවේ ය. කන්හි වැකුණු ගෝසාව දැන් බොහෝ ඈතින් නික්මෙන හඬක් සේ ඔහුට ඇසෙයි. ඇසුවන්ගේ හද කකියවන කෙඳිරියක් නහමින් ක්‍රමයෙන් සිහින ලෝකයට බසින ඔහු, විසංඥව සුෂුප්තියෙන් නින්දට වෙයි.

අරවින්ද සැත්කටුවකින් ලෙඩාගේ යටි බඩෙහි තැනක් සලකුණු කළ වහාම ඒ ලකුණ ඇති තැන හැර අනික් හැම තැනම, වද කරන ලද විෂ බීජ ඇති කඩින් වසනු ලැබීය. සැණෙකින් සාත්තුකාරිය දුන් අනිස් සැතකින් ඔහු ලෙඩාගේ යටි බඩෙහි අර සලකුණ එල්ලේ පිට සම පැළුවේ ය. 'මැක්බර්නිගේ කැපුම' නමින් හැඳින්වෙන ඒ විවරයෙන් බඩවැල් තුඩ පාද මතු කොට ගැනීම අරවින්දගේ අදහස වී ය. පිට සම කේඳි දැමීමෙන් පසු මතු වුණු මස් පටවල් එහි කෙඳි දිවෙන සැටි බලා වෙන් කළ අරවින්ද, කලම්ප අඬුවලින් විවරය පාද තබා අනතුරුව දෙවන මස් පටෙහි ද කේඳි වෙන් කරන ලදින් උදර කුහරය වසා සිටි පැරිටෝනියම් පටලය මතු වීය. පැරිටෝනියම් පටලය සිදුරු කළ පසු උදර කුහරය තුළවූ අතුනුබහන් හා එහි එක් මුල්ලකින් ලියලූ සුළැඟිලි තුඩ වැනි තුඩ ද මතු වී ය. තුඩ පිපිරුණොත් එයින් පිටවන සැරව, පැරිටෝනියම පටලය තුළ වැගිරෙනු වළකනු සඳහා ඔහු වහාම ගොස් රෙදි කැටි තැබුවේ ය.

අනතුරුව ඔහු බඩවැල් තුඩ හා ඊට ඇඳී සිටි මැසන්ටරිය නමැති සිවිකාව ද විවරයෙන් උඩට මතු කෙළේ ය. සිවිකාව අඬු දෙකකට හසකොට තබා එය සැතින් වෙන් කොට, බඩවැල් තුඩෙහි මුල තවත් අඬුවකට හසුකොට ඒ තුඩ වහා කපා ඉවත් කෙළේ ය. බඩවැල් තුඩ කැපූ පසු ඉතුරු වුණු ඇබිත්ත සිවිකා පට බැඳ ඇතුළට ඔබා මසා අනතුරුව මැසන්ටරි සිවිකාව ද මසා බැඳ අඬු ඉවත් කෙළේ ය. සැත්කම අවසාන කළ අරවින්ද පැරිටෝනියම් පටලයත් මස්පටවලුත් මැසුවේ ය.

දළ රෙදි කඩින් වසන ලද මළ කඳක් වැනි තම පුතා බැවුණු ඇඳ රෝද පිටින් සැත්කම් මඩුවෙන් එළියට එනු දුටු ජයනෝරිස් මුදලාලි හඬන්ට වී ය.

''ඇයි මුදලාලි අඬන්නේ''! යි අරවින්ද ඇසුවේ ය. ''මම පුතා බේරුවා. දැන් බයවෙන්න කාරණයක් නැහැ. මම ටිකක් බයේ උන්නේ කපන්ඩ ඉස්සර ගෙඩිය පුපුරාවිය කියා. තවත් දවසක් පහුළණා නම් අඩන්නත් වෙනවා!''

ජයනෝරිස් මුදලාලිගේ සිත ටිකක් සැහැල්ලු වී ය. 'තව දවස් තුනක් ඉවසුවොත් ලෙඩේ හොඳ කරනවා'යි කියමින් ලෙඩා කොළඹට ගෙනයනු වළකන්ට වැයම් කළ ගමේ වෙද සිහි කළ ජයනෝරිස් මුදලාලි කෝප වී ය.

පසුද උදේ බංගලාවට ගිය ජයනෝරිස් මුදලාලි නෝට්ටු කොළ මිටියක් අරවින්දගේ අතෙහි තැබුවේ ය.

''පුතාගේ ලෙඩේට ඔතැම හොඳ බෙහෙතකට වියදම් කරන්න. තව ඔනෑ වියදමක් කරන්න මම කැමතියි.''

Scanned by CamScanner

අරවින්ද නෝට්ටු කොළ මිටිය ජයනෝරිස් මුදලාලිට ආපසු දුන්නේ ය.

"දැන් බය වෙන්න කාරණයක් නැහැ. තුවාලෙ හෙමින් හොඳ වෙන්න අරින්න ඕනෑ. වෙන බෙහෙතක් ඕනෑ නැහැ. අමුතු වියදමක් කරන්න උණොත් මම ඒ වියදම කරලා බිලක් දෙනවා."

පසු ද අරවින්ද තවත් ලෙඩුන් තිදෙනෙකුට සැත්කම් කෙළේ ය. එයින් එකක් ලිවරයේ ගෙඩියක් විද නළයක් ගසා සාරය ඉවත් කිරීම වී ය. ඒ සැත්කම හොඳින් කරන්ට ලැබීම ගැන අරවින්ද සන්තෝෂ වී ය. එහෙත් අනික් සැත්කමක් ඔහුගේ කෝපයටත් ශෝකයටත් හේතු වී ය. එය තමා වරද්ද විනිශ්චය කළ රෝගයක් බව ඔහුට වැටහුණේ සැත්කම් මඩුවෙහි දී ය. ඔහු සැත්කම් කරන්ට පටන් ගත්තේ එය ලිවරයේ ගෙඩියක්ය යන විනිශ්චයෙහි පිහිටා ය. එය පිළිකාවක් බව දැනගත්තේ ලෙඩාගේ කය සිදුරු කොට පරීක්ෂා කිරීමෙන් පසුව ය. අරවින්ද පිළිකාව එහෙමම තිබියදී කැපුම මසා රෝගියා වාට්ටුවට යැවුවේ ය. සැත්කමට පෙර ලෙඩා නැවතත් වරක් හොඳින් පරීක්ෂා නොකිරීම ගැන අරවින්ද තමාටම දෙස් නැඟීය. ලිවරයේ පිළිකාව හැඳිනීම ඉතාම දුෂ්කර වුව ද ඍජු අවංක ශල්‍ය වෛද්‍යයකු ව අරවින්ද දවස් ගණනක් ඒ සැත්කම් සිහි කෙළේ ය.

ජයනෝරිස් මුදලාලිගේ පුතාට කළ සැත්කම පැටලිලි සහිත අමාරු එකක් නොවී ය. අරවින්ද වහාම රෝගය හැඳින එවේලේම ක්‍රියා කෙළේ ය. ඉහළ නැඟීමේ ආශාව ඇති ශල්‍ය වෛද්‍යයකු වශයෙන් ඔහු කවර ලෙඩකු සඳහා වුව ද ක්‍රියා කරන්නේ එලෙසිනි. එහෙත් අවේලාවේ ලෙඩුන් බැලීමට දොස්තරවරුන්ගේ මැළිකමත් ඔවුන්ගේ උදාසීනත්වයත් දන්නා ජයනෝරිස් මුදලාලි අරවින්ද කෙරෙහි බෙහෙවින් පැහැදුණේ ය. අරවින්ද එවේලේම ලෙඩා ඉස්පිරිතාලයට යවා රෑ එහොළහට පමණ සැත්කම කරන ලද්දේ තමාට දැක්වූ විශේෂ සැලකිල්ල නිසායයි ජයනෝරිස් මුදලාලි සිතුවේ ය. 'අරවින්ද ඉතාම හොඳ දොස්තරමහත්මයෙක්' යි ඔහු තම නෑ මිතුරන්ට කීවේ ය. ඔහු රෝගය විනිශ්චය කරන්නේ දිවැස් ඇත්තකු ලෙසිනි. ඔහු සැත්කමට බුද්ධදාස රජු මෙන් සමර්ථයෙකි.

"ජයනෝරිස් මුදලාලි පුතා ගැන හුඟක්ම පැහැදී වර්ණනා කරනවා"යි වත්තුහාමි මුදලාලි කීවේ ය.

"මම කෙළේ කොයි ලෙඩකුට උණත් එවේලාවේ දොස්තරෙක් කරන වෙද කමක්. දොස්තර කෙනෙක් දැනගෙන නම් ඒ ලෙඩා කැපීම කල් තියන්නේ නැහැ තාත්තා."

Scanned by CamScanner

"එහෙම කියන්න එපා!" යි කියමින් වත්තුහාමි මුදලාලි සිනා සුණේය. කුට වෙළඳ බුද්ධිය ඇති ඔහු තම පුතා තවම ප්‍රස්තාවෝචිත නුවණ නොලැබූවෙකියි සිතුවේ ය. කපටින් හා කුහකයන් ද ඇසුරු කරමින් වෙළඳාමෙන් මුදල් සපයන ඔහු අරවින්ද ලැබූ උගැන්මත් පුහුණුවත් නොදන්නෙකි.

"පුතා විශේෂ සැලකිල්ලකින් වෙදකම් කරනවා යයි මම ජයනෝරිස් මුදලාලිට කිවුවා. මිනිහ ගමට ගියාම හැමෝටම කියාවි පුතා ගැන. ඉක්මනට හොඳකරවා ගෙන පුතා ගමට එක්ක යන්නයි දූන් මිනිහගේ ආසාව."

"අදට සුමාන දෙකක් වෙනවා. තව තුන් හතර දවසකින් ලෙඩා ගෙදර එක්ක ගියාට කමක් නැහැ. මම අද සවස වාට්ටුවට ගියාම ලෙඩා බලා ජයනෝරිස් මුදලාලිට කියන්නම්."

පියා කාමරයෙන් පිට වී ගිය පසු අරවින්ද පොතක් අතට ගත්තේ ය. එය මීට සති තුනකට පමණ පෙර අරවින්ද පිටු හැටක් පමණ කියවා ඉවත තැබූ පොතකි. සිත් වෙහෙසන නවකතාවක් බැවින් එය කියවිය යුත්තේ අමාරුවෙනි. මාලින් හා තවත් උගත් තරුණයන් ද වර්ණනා කරන්නක් නිසා, අරවින්ද ඒ පොත අමාරුවෙන් වුව ද කියවීමට සිතුවේ ය. ඔවුන්ගේ මතයට එකඟවීමට හෝ පටහැණිවීමට හෝ එය තමා විසින් ද කියවිය යුතුයයි අරවින්ද කල්පනා කළ බැවිනි.

තාප්පයේ දකුණු පැත්තේ දොරටුවෙන් ඇතුළු වුණු දුවැන්ත මොටෝරියක් මිදුලෙහි නැවතිණ. එහි උන් ස්ත්‍රියක් රිය කවුළුවේ දොරටුවට මුහුණ දික්කොට උදර ලීලාවෙන් වටපිට බැලූවා ය. අරවින්ද ඈ හඳුනා ගත්තේ ය. එහෙත් ඈ නුදුටුවකු මෙන් ඔහු තම මුහුණ වැසෙන සේ පොත මඳක් උස්කොට අල්ලාගෙන නොනුවත්වා කියවූයේ ය. අරවින්දගේ මව ආලින්දයට පැමිණියා ය. රිය කරු ගොස් 'වලවුවේ හාමුදුරුවො ටිකකට කතා කරනවා'යි ඇට කී ය.

"මොන වලවුවේ හාමුදුරුවො ද?"

"දෙමාලසිංහ හාමුදුරුවන්ගේ නෝනා මහත්තයා."

වැලිගම හාමිනේ ආලින්දයෙන් බැස මොටෝරිය කරා ගමන් කළා ය. පොත මඳක් ඈත් කොට එක ඇසකින් මොටෝරිය දෙස බැලූ අරවින්දට දත් සැපිණ.

"අනේ කරුණා කරල——කියංඩ ඩොක්ටර්ට——සර් දමෝරාසිංහ මැතිතුමා ගොඩබහින්නේ අද සවස 6.30ට කියලා."

"තරහ නොවී කඩදසි කැල්ලක් ලියා දෙන්නැ"යි වැලිගම හාමිනේ ඉතා කරුණාවෙන් කීවා ය.

Scanned by CamScanner

මදිරා දෙමාලසිංහ නෝනා අත් බෑගයෙන් කඩදාසියක් ගෙන පවුන්ටන් පෑනින් එහි යම් කිසිවක් ලීවා ය.

''කරුණාකරලා——මේක දෙංඩ——ඩොක්ටර්ට——බෝම ඉස්තූතියි. ගිහිල්ලා——එන්නම්——''

මදිරා දෙමාලසිංහ නෝනා අසුනෙහි හාන්සි වී කකුල පිට කකුල දමාගත්තා ය. ගෝසාවක් නොනඟා රිය සෙමින් ගමන් කොට වම් පැත්තේ උයන් දොරටුවෙන් පිට වී ය. ගලක් උඩින් ගිය නිසාදෝ රථය පන්දුවක් මෙන් උඩ පැන්නේ ය. රථය පිටිපස්-සෙහි වැටුණු හිරු රැස්, කණ්ණාඩියක වැටුණු හිරු රැස් මෙන් ආපසු හැරී වැලිගම හාමිනේ දෙසට දිවී ය. ඈ වහා අතික් අතට හැරුණා ය.

අරවින්ද පොත වසා ඉවත දමා කාමරයෙන් එළියට ආවේ කෝපයෙනි. මව දුන් කඩදාසි කෑබැල්ල ඔහු නොබලාම ඉරා විසි කෙළේ ය.

''මොකට ද අම්මා ඒකී .ළඟට ගියේ!'' යි ඔහු කෝපයෙන් ඇසුවේ ය.

''අනේ පුතා ඒ, නෝනාට එහෙම කතාකරන්න එපා.''

අරවින්ද මෙතරම් කිපුණේ කුමක් නිසාදැයි වැලිගම හාමිනේට නොවැටහෙයි. මදිරා දෙමාලසිංහ නෝනා තමා සමඟ කතා කෙළේ සෙමින් නැළවිල්ලෙන් ය. ඈ කඩදාසි කෑබැල්ල තමා අතට දුන්නේ ද මහත් සැලකිල්ලක් දක්වමිනි. 'ගිහිල්ලා එන්නම්'යි කීවේ ද තමාට හිස නමා ආචාර කිරීමෙනි. ඈ කොතරම් හොඳ ශිෂ්ට සම්පන්න නෝනා කෙනෙක්දැයි වැලිගම හාමිනේ සිතුවා ය.

''අම්මා දන්නේ නැහැ ඒ ගෑනිගෙ අහංකාරකම්. එයා ආවේ අහංකාරකම් පෙන්නලා යන්නමයි.''

''මම හිතන්නේ නැහැ පුතා එහෙම''

''ඒ ගෑනිගෙ විදිය අම්මා දන්නෙ කොහොම ද? ඒ ගෑනි ආඩම්බරකම පෙන්නාලා යන්ට මෙහාට ආ එකයි මට ඉවසන්ට බැරි. අහංකාරකම් පෙන්නන්න ඒ ගෑනි අපේ ගෙදරට එන්නේ මොකට ද? ඒ ගෑනි ඕනෑ තැනකදී මට අහංකාරකම් පෙන්නුවට කමක් නැහැ.''

''ඒ නෝනා ආඩම්බර උණාම අපට මොකද?''

වත්තුහාමි මුදලාලි ද කාමරය තුළින් එළියට පැමිණියේ ය.

''දොස්තර මහත්තය කියන එක හරි''යි මුදලාලි කීවේ ය. ''ඒ නෝනට කාර් එකෙන් බහින්න බැරි නම් යන එකයි ඇත්තෙ. හාමිනේ මොකොටද ඒ නෝනගෙ කකුල් දෙක ළඟට ගියේ? ඒකෙන් දොස්තර මහත්තයට නෙව ද අවනම්බුව.''

වැලිගම හාමිනේ සිනාසුණා ය. තමා කෙළේ වරදකැයි ඈ දැනුණු නොපිළිගනියි.

"හාමිනේ දෙණියායෙදී වගේ මෙහේදී වැඩ කරන්න එපා. ටිකක් ආඩම්බරේට ඉන්න ඕනෑ. නැත්නම් දෙස්තර මහත්තයත් පහළ යනවා."

අරවින්දට ලජ්ජා හිතිණ. ඔහු මවට සැර කෙළේත් දෙස් කීවේත් ඉක්මන් කමිනි. "ඒ නෝනා අහංකාර උණාම අපට මොකද?" යනු විසින් මව කී අවංක කියුම වැරදිදැයි අරවින්ද තමාගෙන්ම ප්‍රශ්න කළේ ය.

"අම්මා ආඩම්බර වෙන්න එපා. අනුන්ට දෙස් කියමින් අපි අහංකාරකම් පෙන්වන්නෙ මොකොට ද? ඒ ගෑනි අදහස් කරලා ඇවිත් අහංකාරකම් පෙන්නු නිසායි මට තරහ ආවේ."

Scanned by CamScanner

# 15

අරවින්ද පසු ද ඉස්පිරිතාලයේ වාට්ටුවල ලෙඩුන් බැලීමට ගියේ ය. තමා විසින් සැත්කම් කරනු ලැබූ ලෙඩුන්ගෙන් එකකු හැර අනික් කවුරුනුත් සන්තෝෂයෙන් සිටිනු දුටු ඔහු ද සන්තෝෂ වී ය. ඔහු හැම ලෙඩා සමගම වචන තුන හතරක් කතාබහ කෙළේ ය. ඇතැමකුට සරදම් කොට සිනාසුණේ ය. අරවින්ද ලෙඩුන්ට පමණක් නොව සාත්තුකාර කාන්තාවන්ට ද ඉතා ප්‍රිය වූවෙකි. සාත්තුකාර කාන්තාවන්ට ද සරදම් බස් පවසා සිනාසෙන අරවින්දගේ ලෙඩ්ඩු සාත්තුකාර කාන්තාවන්ගෙන් ද හොඳින් සැලකිලි ලබති. වේදනාව නිසා වහා කිපෙන ලෙඩුන් පවා ඔවුන්ට විරුද්ධව චෝදනා නඟන්නේ ඉතා කලාතුරකිනි.

අරවින්ද ජයනෝරිස් මුදලාලිගේ පුතාගේ පිටට තට්ටු කෙළේය.

"ඉලන්දරියාට දැන් සනීප නෙව ද?"

"ඔව්."

අරවින්ද ඔහුගේ තුවාලය පරීක්ෂා කොට නායක සාත්තුකාර කාන්තාවගෙන් ද ප්‍රශ්න කොට අනතුරුව මෙසේ කී ය.

"හෙට යන්ට පුළුවනි. ගෙඩිය හොඳටම පැසවන්ට ඉස්සර ආ නිසා බේරුණා!"

"මීට කලින් එන්ට නුදුන්නේ තාත්තා" ලෙඩා කී ය. "වෙද මහත්තයාත් අනිත් මිනිස්සුත් තාත්තා බය කරා. කපන්නේ නැතිව හොඳ කරන්න පුළුවනියි වෙද මහත්තයා පොරොන්දු උණා."

"කපනවාට තාත්තා දැන් ඉස්සර වගේ බය නැහැ" යි කියමින් අරවින්ද අනික් වාට්ටුවක් බලා ගියේ ය.

අරවින්ද සොයා එන ලෙඩුන්ගේ ගණන දැන් ක්‍රමයෙන් වැඩි වන බැවින් ඔහු විසින් ඉස්පිරිතාලයෙහිදී කළයුතු සැත්කම් හා අනික් කාර්‍ය්‍යයෝ ද වැඩිවෙති. විනෝදාස්වාදය සඳහා දැන් ඔහුට ලැබෙන්නේ මඳ කාලයකි. සතියකට හතර පස් වරක් ඔහු අජන්තා නිශාන්තයට යතත් රෑබෝවන තෙක් එහි කාලය ගත කරන්නේ ඉතා කලාතුරකින් දවසක පමණි.

ඔහු අවසරයක් ලැබුණු කල සවස් වරුවේ එහි යන්නේ චමරිත් නීලාත් හමුවන පිණිස ය. එහෙත් ඔවුන් එහි දී අරවින්දට හමු වන්නේ සතියකට වරකි; ඇතැම් විට දෙවරකි.



Scanned by CamScanner

උදේ සිට හවස් වන තෙක් ඉස්පිරිතාලයෙහි වැඩ කොට ගෙදරට ආ ලෙඩුන් බලා, අනතුරුව තුති පැසසුම් පුදන ජයනේරිස් මුදලාලිගේ කන්දෙස්කිරියාවෙන් බේරී අජන්තා නිශාන්තයට ගිය අරවින්ද වෙනදට වඩා සන්තෝෂ වී ය.

''අරවින්දට දූන් වැඩ වැඩිද''යි චමරී ඇසුවා ය.

''ටිකක් වැඩියි.''

''සල්ලි හම්බ කරන්න ආසා උණාම වැඩ වැඩී වෙනවා''යි කියමින් නිලා සිනාසුණා ය.

''සල්ලි හම්බ කරන්න මහන්සි වෙන්න ඕනෑ නැහැ. තාත්තා හුඟක් සල්ලි හම්බ කරලා තියෙනවා. තාත්තාට ඉන්න එකම පුතා මමයි!''

මේ වචන කියූ අරවින්ද බැලුවේ චමරීගේ මුහුණ ය.

''ඒකට මොකද අරවින්ද සොයන්නේ සල්ලිමයි!''

නිලා කීවේ ඇනුම්පදයක් බව චමරීට වහා වැටහිණ.

''අරවින්ද එයාගේ තාත්තාගේ පොහොසත්කම කියමින් මා දිහා බැලුවේ අපේ තාත්තාගේ පොහොසත් කම නිසා නෙව්!''

''මම දෙන්නාම කසාද බැඳගන්නවා!''යි කියමින් අරවින්ද සිනාසුණේ ය.

''ඒ කොහොම ද?''

''මරක්කලයෙක් වෙලා!''

''ආච්චිලා වෙන්න අපි කැමති නැහැ!'' යි චමරිත් නිලාත් එක වර කීහ.

සේවකයෙක් අරවින්දට ළංව හිසත් බඳත් නැමී ය.

''මට අද මහන්සියි! ආච්චිලා දෙන්නා මොනවද බොන්නේ!''යි අරවින්ද ඇසී ය.

''අපට අයිස් ක්‍රීම්.''

''කන්න?''

''මොකුත් එපා''.

''සර් නිවටන් දමෝරාසිංහ ගොඩ බසිනවා බලන්න අරවින්ද ගියේ නැද්ද?'' යි නිලා ඇසුවා ය.

''නැහැ. නීලා ගියා ද?''

''නැහැ.''

''චමරී?''

''අපේ අම්මාත් නීලාගේ අම්මාත් එයාගේ තාත්තාත් ගියා.''

Scanned by CamScanner

"ජැටියට ලොකු මිනිස්සුන් කැඳවනු සඳහා මහන්සි ගත්තේ මදිරා දෙමෑලසිංහ නෝනා"යි වමරි කීවා ය.

"සර් නිව්ටන් එන්ට දෙලොස් දවසකට පමණ උඩදී මදිරා දෙමෑලසිංහ උණ ගැනී අමාරුවෙලා උන්නා"යි නීලා කීවා ය. "දවසක් අම්මා ලෙඩ බලන්න යද්දී මමත් ගියා. එද එකසිය තුනට උණ නැඟලා තිඋණා. ඒකට මොකද අපි ගිය හැටියේ එයා අයියාගේ ලොකුකම් කියන්න පටන් ගත්තා. එංගලන්තෙන් ලැබී තිබුණු පින්තූර වගයක් පෙන්නුවා. ඒ ඔක්කොම සර් නිව්ටන්ගේත් නෝනාගේත් දුවගේත් පුත්තුන්ගේත් පින්තූර. පුතා ඊටන් කොලීජියට ඇතුල් උණායයි මදිරා කිවුවා. දූ සහ ලොකු පුතා තාත්තාත් අම්මාත් සමග ආවා."

"නීලා දන්නවාද ඊටන් කොලීජියට නිවුටන්ගේ පුතා ඇතුල් කළායයි කීවේ කුමක් නිසාද කියා."

"ලෝඩ් වරුන්ගේ ළමයි යන කොලීජියක් නිසා."

"ඔක්ස්පර්ඩ් යුනිවසිටියේ අංශයක් වෙන ඊටන් කොලීජියට බාර ගන්නේ එංගලන්තේ ලෝඩ් ගොල්ලන් ඇතුළු මහා ලොක්කන්ගේ ළමයි. ළමයි උපන් හැටියේ ඒ ගොල්ලයි නම් ලියා පදිංචි කරනවා ලොකු උණාම ඊටන් කොලීජියට ඇතුල් කරන අදහසින්. අනිත් ඇයන්ගේ ළමයෙක් ඊටන් කොලීජියට බාර ගන්නේ බොහොම කලාතුරකින්."

"ඊටන් කොලීජියට ළමයි ඇතුල් කිරීම අමාරු බව මදිරා දෙමෑලසිංහ නෝනා දන්නේ කොහොම ද?"

"එයා සොය සොයා ඉගෙනගන්නේ ඕවා තමයි" කියමින් වමරි හිමකිරම ඇබිත්තක් තේහැඳි තුඩට ගත්තා ය.

නීලා තම හිමකිරම බඳුනෙන් බාගයක් පමණ කෑවා ය. අජන්තා නිශාන්තයේ වාදකයෝ, ස්ට්‍රවුස්ගේ Blue Danube නමැති ගීතය වාදනයට පටන් ගත්හ. වායුවට හරවන ලද නිදි මබෙහෙතක් වැනි ඒ මියුරු ගීතය පැතිර කනින් ඇතුළුව අධ්‍යාත්මය නළවයි. අනික් මේස ළඟ වාඩිවී කන බොන ගැනුත් පිරිමිත් කසුකුසු හඬින් කතාබහ කරති. සිගරැට් දුම් වළා එක්ව නැඟී සීලිම අසලදී විසිර තිල් සිහිඳු පට වියන් පටක්ව අනතුරුව අතුරුදහන් වෙයි. ප්‍රමාදව පැමිණෙන ගැනුත් පිරිමිත් අනික් විනෝද කාමීන් විසින් අරක් නොගන්නා ලද මේස සොයනු පිණිස වටපිට බලමින් යෙති. ඇතැමුන්ගේ බැල්මට ගොදුරු වෙමින් සිගරැට්ටුවක් උරන සාරිකාරියක් එක් කෙළවරක වූ මේසය ළඟ වාඩි වී තවත් ස්ත්‍රියක හා කතාබහ කරයි. ඇගේ දෙතොලත් නියත් තද රතුපාටින් බැබළෙයි. අඳුන් ගෑමෙන් දික් කොට වක්කරන ලද ඇගේ දෙබැම

Scanned by CamScanner

කළු ආරුක්කු දෙකක් වැන්න; නැහැයත් දෙ ඇසත් වඩාත් තියුණු වෙශයක් ගත්තේ ඒ දෙබැම නිසා ය.

වැහිවලාවෙන් අහස අඳුරු වුව ද උෂ්ණය දැඩි ය. පිටත වූ දැඩි අඳුර තුනී වූයේ පාර දෙපැත්තේ පිහිටි පහන් කණුවල විදුලි පහන්වලින් නික්මෙන එළියෙනි. අජන්තා නිශාන්තය එළිය කරන ලද්දේ නිලට හුරු මුදු මොළොක් විදුලි එළියකිනි. එමගින් රෑ බෝ වූ බවක් ඇතුළත සිටියවුන්ට නොදැනෙයි.

හිම කිරම බඳුන් සිස් කළ චමරීත් නීලාත් අසුන්වලින් නැංගෝය.

''යන්න ද?'' යි අරවින්ද ඇසීය.

''අද කලින් එන්නයයි අම්මා කිවුවා.''

චමරීත් නීලාත් නික්ම ගියේ වැඩි සන්තෝෂයකින් නොවේ. චමරී ග්‍රීන්ලන්ඩ් පාරට ගොස් නීලා බස්සා ආපසු අනෝමාවට ගියා ය.

''චමරී මීට කලින් නාවේ මන්දැ''යි මව ඇසුවා ය.

''නීලාත් එක්ක ටිකක් ඇවිදින්න ගියා.''

''මදිරාත් සමඟ වජ්රින් මෙහි ඇවිත් මෙපමණ වේලා ඉඳලා ගියා. වජ්රින් උඹ දකින්න ආසාවෙන් උන්නා.''

''අද උදේ වරුවේ එයා හම්බ උණා. මා එක්ක කතා කළා. වජ්රින් හුඟක් වෙනස් වෙලා. එයා දැන් කතාකරන ඉංග්‍රීසි තේරුම් ගන්නත් අමාරුයි.''

''වජ්රින් උඹ ගැන බලාපොරොත්තුව ඉන්නවා. මදිරා අද ඒ ගැන කතා කරලා උඹේ කැමැත්ත දැනගෙන තීන්දුවක් කරන්න කිවුවා.''

''වජ්රින්ට මම කැමති නැහැ අම්මා. ඒගොල්ල මට ලොකු වැඩියි!''

''මොනවා! උඹත් අයියා සිතන විදියට හිතන්නත් එයා කතාකරන විදියට කතා කරන්නත් ඉගෙනගෙන තියෙනවා වගෙයි මට පෙනෙන්නේ.''

මව මෙසේ කීවේ ඒ වේලාවේ හිතට නැඟුණු හැඟීමෙන් මිස සිතා-මතා බැසගත් තීරණයකින් නොවේ. එහෙත් මවගේ කියුම ඇත්තක් බව චමරී දනියි. චමරී, මාලින්ට ඇල්ම ඇත්තියකි. ඔහු හා නිතර වාද විවාද කරන ඇ ඔහු ගෙනෙන පොත් ද කියවයි. එංගලන්තයට යන තෙක් මාලින් හැම කාරියකටම ගියේ චමරී සමඟ ය. සැණකින් එකවෙක කියන්ට නොදන්නා මාලින් ඇනුම් පද කියන්නේ කලාතුරකිනි. ඇතැම් ස්ත්‍රියක හෝ පිරිමියකු හෝ

Scanned by CamScanner

තමාට නින්ද කරන අදහසින් ඇනුම්පදයක් කී විට පවා මාලින් කර බාගනියි; චමරී එසේ නොවේ. සමාජයේ ඉහළ ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ සමඟ වුව ද ඇ එකට එක කියමින් හටන් කරයි. මාලින්ට ඇනුම් පද කී එකාට හෝ එකියට දරුණු ඇනුම්පදයකින් දඬුවම් කිරීමට ඇ නො පැකුළුණා ය.

"වජ්‍රින්ට උඹ අකැමති මන්ද?" යි නාලිකා කබලාන යළිත් තව දුවගෙන් ඇසුවා ය.

"මම කැමති නැහැ."

"අකැමති වෙන්න වැරැද්දකුත් තියෙන්න එපාය."

"වැරැද්දක් ඇති නිසා නෙවි. මම කැමැති නැති නිසා කැමති නැහැයි කිවුවෙ."

"සර් නිව්ටන්ගේ පුතාට උඹ අකැමති උණාට——"

"වෙන කවුරුවත් අකැමති නොවන බව මම දන්නවා අම්මා; මගේ හිතේ කැමැත්තක් නැති කොට මම කරන්නේ මොකද?"

ශූර ස්ත්‍රියක වන නාලිකා කබලාන චමරී කී සියලු වදන් විශ්වාස නොකළා ය. චමරී වජ්‍රින්ට අකැමැති වන්නේ අනික් කිසිවකු පතන නිසා ද? නොඑසේ නම් අනිකකුට බස් දෙන ලද හෙයින් ද? තමන්ගෙන් නොවිචාරා චමරී එවැනි හිතුවක්කාර කමක් කරතියි නාලිකා කබලාන නොසිතයි. එහෙයින් ඇ මේ වචන කටින් පිට කෙළේ අකැමැත්තෙනි.

"උඹ වෙන කාටවත් පොරොන්දුවක් එහෙම උණා ද?"

"නැහැ අම්මා" යි ඇ අසන්තෝෂයෙන් පිළිතුරු දුන්නා ය. "අම්මාගෙන් අහන්නේ නැතිව එහෙම පොරොන්දුවක් වෙන්න මම කවදාවත් හිතුවේ නැහැ."

"හොඳයි උඹ බලාපොරොත්තු වන කවුරුවත් ඉන්නවා ද?"

චමරී වහා පිළිතුරු නුදුන්නේ ඒ ප්‍රශ්නය නිසා ඇගේ සිත අවුල් වූ බැවිනි. ඇගේ යටි සිතෙහි සැඟවී සිටි සිතුමක් හෝ පැතුමක් හෝ ජාගර සිතට නැඟුණේ ය. මවගේ ප්‍රශ්නය නිසා මතු වුණු ඒ සිතුම මැඩගත යුත්තක් ද? නොඑසේ නම් මවට ද කිව යුත්තක් ද? සර් නිව්ටන්ගේ පුතා වන වජ්‍රින් පිළිබඳ යෝජනාව නොකියා මව එවැනි ප්‍රශ්නයක් ඇසුවා නම් ඇ පිළිතුරු දෙන්නේ ඇගේ යටි සිතින් මතුවුණු සිතුම මැඩ ඉවත දැමීමෙනි. වජ්‍රින් පිළිබඳ යෝජනාව ඇසූ නිසා ඒ සිතුම මැඩීමෙන් මව සන්තෝෂ කිරීමට නොව ප්‍රකට කිරීමෙන් අසන්තෝෂ කිරීමට චමරී එඩිතර වූවා ය.

"ඔව් අම්මා".

"කවුද?——" නාලිකා කබලාන ඇසුවේ අසන්තෝෂයෙනි.

''අරවින්ද''.

''අරවින්ද දෙස්තර!'' කියමින් නාලිකා කබලානා තම දුවගේ හිසේ සිට දෙපා තෙක් බැලුවා ය.

''අර ගොඩේ මුදලාලිගේ පුතා?''

මේ වචන ඈ කටින් පිට කෙළේ තමාගෙන්ම ප්‍රශ්නයක් අසන්නාක් මෙනි.

''පාන් පෙට්ටිය ඔළුව උඩ තියාගෙන ඇවිදලා විකුණා පොහොසත් උණු මිනිහෙක් එයාගේ තාත්තා. එයාගේ අම්මා මහා පිටිසර ගෑනියෙක්; ඉංග්‍රීසි වචනයක්වත් දන්නේ නැහැ. ඒ ගොල්ලන් එක්ක ඉන්න පුළුවන් ද? මුදලාලි මහ අහංකාර වනචර මිනිහෙක්. කන්න දන්නෙත් නැහැ; අඳින්න දන්නෙත් නැහැ; කතා කරන්න දන්නෙත් නැහැ''.

අරවින්ද නිසා චමරිගේ සිතෙහි බොළඳ ආලයක් හට නොගත්තේ ය. ඔහු නිසා ඈ තුළ හටගත්තේ කුහුලකි. ඒ කුහුල පැතුමක් වුණේ මව නැඟූ ප්‍රශ්නය නිසා ය.

''මම බඳිනවා නම් බඳින්නේ අරවින්ද මිසක් එයාගේ තාත්තා නෙවි'' යි කියමින් චමරී සිනාසුණා ය.

''ඒක මම දන්නවා''යි මව කෝපයෙන් කීවා ය.

''උඹට එයාගේ තාත්තාත් අම්මාත් අහක දමන්න බැහැ.''

චමරි එකටෙක නොකීවා ය.

වජිරින් පිළිබඳ යෝජනාව ඇසූ මාලින් ඊට විරුද්ධවීමට චමරිට අනුබල දුන්නේ ය.

''ඒ ගොල්ලන් ඔක්කොම කළු සුද්දන් වෙන්ට දඟලනවා. සර් නිව්ටන් සුදුමිනිහෙකුටත් වැඩි අධිරාජ්‍ය වාදියෙක්. වජිරින් එංගලන්තේදී ඉගෙනගෙන තියෙන්නේ ඉහළ පන්තියේ ඉංග්‍රීසි කාරයෙක් වගේ ඉංග්‍රීසියෙන් කතාකරන්නත් ආචාර සමාචාර පවත්වන්නත් තමා. එයා මහා බූරුවෙක්——''

''මාලින් අයියා ඒගොල්ලයි වැරදි වැඩි කරලා කියනවා''යි කියමින් චමරි සිනාසුණා ය. ''අපි කවුරුත් ඉංග්‍රීසිකාරයන් අනුකරණය කරන්ටයි වෑයම් කරන්නේ. ඒ ගොල්ල අපට වඩා හොඳින් ඒක කරනවා.''

''එහෙනම් චමරි වජිරින්ට අකැමති උණේ කුමක් නිසා ද?''

''මම දන්නේ නැහැ.''

මාලින් අනතුරුව අරවින්දට බණින්ට පටන් ගත්තේ ය. ඔහු මෑතක සිට අරවින්ද හා තරහෙන් ඉන්නා බව චමරි දනියි. ඔහු අරවින්ද හා අමනාපයෙන් ඉන්නේ දේශපාලන මත භේද නිසා ය.

Scanned by CamScanner

"අරවින්ද එංගලන්තේදී නම් බොහොම හොඳ මිනිහෙක්. දැන් ඒ මිනිහාගේ ආසාව කොහොම හරි ලොක්කෙක් වෙන්න. ඉහළ සමාජයේ බැබළෙන්න. තක්කඩියා! ලංකාවට ආවාම වඩාත් නරක් වන්නේ හොඳ මිනිස්සු" යි මාලින් කෝපයෙන් කී ය.

"අරවින්දට පුළුවන්ය මාලින් අයියාට වගේ දේශපාලන කලහයට යන්න?"

"ඇයි බැරි? සමාජයේ පයට පෑගෙන මිනිස්සුන්ට සේවය කරන්න එයාට බැරි ද?

"ආණ්ඩුවේ රාජකාරි කරන කෙනෙක් දේශපාලන වැඩවලට යන්නේ කොහොම ද?"

"එයා ආණ්ඩුවේ රාජකාරියක් බඳගත්තේ මොකොට ද? තක්කඩියා! එයා එංගලන්තෙදි කිවුවේ ආණ්ඩුවට බැඳෙන්නේ නැත. දුප්පත් පොදු ජනයා වෙනුවෙන් වැඩ කරනවාය කියා!"

Scanned by CamScanner

# 16

පෙරටත් වඩා ළැදිව කම්කරු හවුලට අනුබල දෙන මාලින් දූන් මහා ජනයාගේ සිත් අදනා පරිදි සිංහලෙන් කතා කිරීමෙහි දක්ෂයෙකි. කර්මාන්තශාලා හා වෙළඳ සාලා හිමි ධන්වතකු වන තම පියාත් ඔහුගේ ධනයත් නොතකා දිළින්දන් උදෙසා සේවය කරන මාලින්ට පැහැදුණු ජනයා කම්කරුවන් අතර පමණක් නොව අනායයන් අතර ද වැඩි වෙති.

කම්කරු හවුල යුරෝපීය කර්මාන්ත කාරයන් ද වෙළඳ සැල් ද හා මෙතෙක් කල් කම්කරුවන් උදෙසා කළ හටන්වලින් ජය ගත්හ. තර්ජනය නිෂ්ඵල වූ විට වැඩ නැවැත්වීමෙන් යුරෝපීය වෙළඳ සමාගම් මෙල්ල කිරීම කම්කරු හවුලට එතරම් අමාරු කාරියක් නොවී ය. එහෙත් කම්කරු හවුලත් කම්කරු-වනුත් පරාජයව පසු බැස්සේ සවිමන් කබලාන හා ගැටුණු අවස්ථාවෙහි ය. සවිමන් කබලානගේ වැඩපළෙහි වැඩ නැවැත්වූ කම්කරුවන්ගෙන් කිහිප දෙනෙක් අස් කරනු ලැබූහ. ඉතිරි කම්කරුවෝ පසු ද සේවයට ගියෝ ය. උපායෙහි දක්ෂ කබලා-නගේ කුමන්ත්‍රණ නිසා කම්කරු හවුල දුර්වල වී ය. කම්කරු හවුලේ නායකයා පැවැත්වූ ආධිපත්‍යය ක්‍රමයෙන් අඩු වී ය. එහෙයින් කබලානගේ කර්මාන්ත ශාලාවේ කම්කරුවන් ලවා වැඩ නවත්වා ජයගෙන කම්කරු හවුලෙහිත් තමන්ගේත් ආධි-පත්‍යය නඟන අදහසිනි කම්කරු හවුලේ නායකයන් දූන් වැඩ කරන්නේ. මාලින් කම්කරු හවුලේ නිලධාරියකු නොවූව ද පොදුවේ කම්කරුවන්ට අනුබල දෙන්නෙකි. මේ අවස්ථාවෙහි ඔහු නිසා කම්කරු හවුල අමුතු ශක්තියක් ලැබී ය.

කම්කරුවන් හා දිළිඳු ජනයා අතරට යන මාලින්ට නිතරම තිස්ස හමු වෙයි. තිස්ස දිළින්දන්ට අනුකම්පා කරතත් කම්කරු හවුලෙහි එකෙක් නොවේ. කම්කරුවන් හා ධනවතුන් ද ගැටුණු විට තිස්ස කම්කරුවන්ගේ පක්ෂය ගනියි. අනික් අවස්ථාවලදී ඔහු කම්කරුවන්ගේ වැරදි කියමින් ඔවුන්ට බැණවදියි.

කම්කරු හවුලේ නායකයන්, තමාගේ කර්මාන්තශාලාවේ සේවකයන් ලවා එක වර වැඩ නවත්වන අදහසින් ක්‍රියා කරන බව කබලාන දනියි. ඔවුන් රහසේ කරන කතාබහ පවා එදම කබලාන දූනගනියි. හවුලේම සාමාජිකයන්ගෙන් දෙතුන් දෙනෙක් කබලානගේ ඔත්තුකාරයන් මෙන් ක්‍රියා කරයි. ඒ ඔත්තුකාරයන්



Scanned by CamScanner

නොදන්නා තොරතුරු ඔහු දැනගන්නේ මුදල් වියදම් කිරීමෙනි. කබලානගේ කෝපයටත් සැකයටත් බියටත් හේතුව මාලින් කම්කරුවන්ට අනුකම්පා කරමින් ඔවුන්ගේ පක්ෂය ගැනීමයි. තමාට මහත් අවාසියක් වතොත් වන්නේ මාලින් නිසා ය. කබලාන නොයෙක් වර මාලින්ට අවවාද කෙළේ ය; තර්ජන කෙළේ ය.

"මාලින් නුඹ කම්කරු හවුලේ නිලධාරියෙක් ද?"යි වරක් කබලාන ඇසුවේ ය.

"නැහැ".

"සාමාජිකයෙක්?"

"නැහැ."

"එහෙනම් නුඹ උන් ආශ්‍රය කරන්නේ කුමට ද? උන්ට වැඩ කරන්නේ කුමට ද?"

"මම වැඩ කරන්නේ දුප්පත් මිනිස්සුන් උදෙසා."

"නුඹ උන්ට එක්කාසු වෙලා දුප්පත් මිනිස්සුන් නැති කරන්ට හදනවා! දැන් කම්කරුවන්ට ගෙවන්නේ වැඩි පඩි; දැන් එකෙකුට ගෙවන පඩිය ගෙවා දෙන්නෙක් ගන්ට පුළුවනි. රක්සාව නැති මිනිස්සු තවම ඉන්නවා."

"කර්මාන්ත හිමියන් ලක්ෂ ගණන් ලාබ ලබන්නේ කම්කරුවන්ගේ ශ්‍රම ශක්තිය නිසා. ලක්ෂ ගණන් ලාබ ඔවුන්ටත් බෙදී යන්ට ඕනෑ. ඒ ලාබ අයිති ඔවුන්ටයි."

කබලාන සිනාසුණේ කෝපයෙනි.

"උන්ට කර්මාන්තශාලාත් ලාබත් බාර දීලා උන් කියන හැටියටයි අපි වැඩ කරන්ට ඕනෑ!"

පිඹීමෙන් මෙලවුණු පුළිඟු දෙකක් මෙන් කබලානගේ දෙඇස දිලිසිණ. එහෙත් ඔහුගේ මුහුණ වෙනස් නොවී ය.

"දිනෙත්ති රවිසේන මම මගේ වහලෙක් කරගන්නවා. එයාට වෙන්නේ මොකදැයි නුඹ පැත්තකට වෙලා බලා ඉඳපන්."

"මම දිනෙත්ති රවිසේන නෙවි" යි මාලින් කෝපයෙන් කීවේ ය.

"නුඹට සල්ලි ඕනෑ නම් උවමනා තරමක් අම්මාගෙන් ඉල්ලා පන්."

මේ වචන කබලානගේ කටින් පිටවත්ම ඔහුගේ මුහුණ වෙනස් වී ය. තර්ජනයෙන් තමාගේ සේවකයකු මෙල්ල කළ නොහැකි වූ විට තම පියා ක්‍රියා කරන සැටි මාලින්ට සිහි වීය.

"මට සල්ලි ඕනෑ නැහැ."

''තුඹට කාර් එකක් ඕනෑ නම් ගනින්.''

''මට ඕනෑ නැහැ.''

කම්කරු හවුල තමාට විරුද්ධව මහා හටනක් කිරීමට කුමන්ත්‍රණ කරන බව දන්නා කබලාන තමාගේ සේවකයන්ට වෙනදා නොදක්වන අනුකම්පාවක් නොදක්වයි. මේ අවස්ථාවෙහි එවැනි අනුකම්පාවක් දක්වන්ට ගියොත් කම්කරුවන් වඩාත් සාහසිකයන් වන බව ඔහු දනියි. එහෙයින් ඔහු වෙනදටත් වඩා දැඩි සිතින් කම්කරුවන්ගේ පැමිණිලි සලකා බලන්නේ. කර්මාන්තශාලාවෙහිදී පිළිපැදිය යුතු සුළු විනය රීතියක් වුව ද කඩ කළ සේවකයා දඬුවම් ලැබී ය.

කබලාන වරක් තමාගේ විශාල පොල් වත්ත බැලීමට ගියේ ය. වත්තෙහි දෙවැනි ලියන්නා වැඩි වැටුප් ඉල්ලා කබලානට ලියුමක් දුන්නේ ය.

''මේ ලියුම මට එවන්ට ඕනෑ සුපිරින්ටැන්ඩන්ගේ මාර්ගයෙන්'' යි කබලාන කී ය.

ලියන්නා තමා කබලානගේ නෑයෙකියි සිතයි. ඔහු එසේ සිතන්නේ බිරිඳ කබලානගේ දුර නෑයකු වන බැවිනි.

''මගේ නෝනා යෝජනා කළා ඔබට මේ ලියුම දීලා ඔබට ආයාචනයක් කරන්නය කියා.''

කබලාන ලියුම අතට ගෙන මුල සිට අග දක්වා නැවතත් කියවූයේ ය. ලියන්නා, තම බිරිඳ කබලානගේ නෑයකු වන බව එහි සඳහන් කරන ලද නමුත් පළමු වර ඒ වාසගම කබලානගේ දෙනෙතට හසු නොවී ය. ඔහු පළමු වර කියවූයේ වැඩි වැටුප් ඉල්ලා කරන ලද ආයාචනය පමණි. සේවකයන් තමාට දෙන ලියුම්වල ඇතුළත් ආයාචනය වහා වෙන් කොට ගැනීම කබලානට ඉතාම හුරු කාරියකි.

''නෑයන් පත් කර ගත්තාම මෙහෙම තමයි. තුඹට රුපියල් දහයක් පඩි වැඩි කරලා මාස හයක් ගියේ නැහැ. දැන් තුඹට ගෙවන පඩිය ගෙවා තුඹ කරන වැඩේ කරන්ට දෙන්නෙක් ගන්ට පුළුවනි.''

කබලාන කීවේ බොරුවක් නොව ඇත්තකි. රක්සාව නැතිව ළතවන ඉංග්‍රීසි උගත් තරුණයන් හතර පස් දෙනකුගෙන් කබලානට ලියුම් නොලැබෙන්නේ එහෙමත් සතියක ය. රක්සාව නැති තරුණයන්ගේ ගණන දහුදු වැඩිවන බව ලියන්නා ද දනියි. එහෙත් අවුරුදු කිහිපයක් සේවය කරන ලද බැවින් තමා වැඩි වැටුප් ලැබීමට අයිතිකම ඇත්තෙකියි ලියන්නා තරයේ සිතයි. අඩු වැටුප්වලට සේවය කිරීමට උගත් තරුණයන් සිය ගණන් පොරෙ

කමින් තමාට ආයාචනා කරද්දී තමාගේ ලියන්නා වැඩි වැටුප් ඉල්ලීම අයුත්තක්යැයි සිතූ කබලාන කෝප වූයේ ය. ඔහුගේ පඩිය හමසකට පෙර රුපියල් දහයකින් වැඩි කරන ලදින් ඔහු සන්තුෂ්ටියෙන් තමාට සේවය කළ යුත්තෙකියි කබලාන සිතයි.

"නුඹට ගෙවන්නේ අඩු පඩියක් නොව වැඩි පඩියකි. නුඹ වැඩට ගනිද්දී අලුතෙන් බැඳෙන්නෙකුට සිරිත් වශයෙන් ගෙවන පඩියෙන් සතයකුදු අඩු නොකොට ඒ පඩියම ගෙවන්ට කැමැති උණා. අලුත් ලියන්නෙකුගේ පඩිය රුපියල් දහයකින් අඩුවෙලා තියෙනවා. වැඩි පඩි ඉල්ලන්න නුඹට කිසිම යුතුකමක් නැහැ. පඩිය——" කියමින් කබලාන ලියන්නාගේ මුහුණ බැලුවේ ය.

කෝපයෙන් දිලෙන ඔහුගේ දෙනෙතත් එකට ඇනී තදවුණු දත් දැන්ද ඇති මුහුණත් දුටු කබලාන කතාව නැවැත්තුවේ ය. ඉතාම ශූර ව්‍යාපාරිකයකු වන කබලාන වීදුරුව අතරින් ඉන් ඔබ ඇති දේ දකින්නකු මෙන් ලියන්නාගේ මුහුණට ආරූඪ වුණු කෝපයටත් සාහසික භාවයටත් හේතු වූ සිතිවිලි දුටුවේ ය. ලියන්නා කම්කරු හවුලේ කිසිවකු විසින් කුප්පන ලද්දෙකියි කබලාන සිතී ය. බිරිඳගේ නෑකම ද මතක් කොට ඔහු ලියන්නා නොමඟ යැවී ය. ඔහු මේ ලියුමෙහි බිරිඳගේ නෑකම සඳහන් කරන ලද්දේ එහෙයිනියි කබලාන සිතුවේ ය.

"නුඹට සල්ලි හිඟ ද?"යි කබලාන ඇසී ය. "හොඳයි මම නුඹට රුපියල් දෙසීයක් දෙන්නම්. ඒකෙන් හිඟ පාඩු පිරිමසා ගනින්."

කබලාන ලියුම් පතක් ගෙන එහි ලියා එය ලියන්නා අතට දුන්නේ ය.

"මේක සුපිරින්ටැන්ඩන්ට දුන්නාම රුපියල් දෙසීයක් දේවි."

ලියන්නා ලියුම් පත අතට නොගත්තේ ය. කබලාන මේසය උඩ ලියුම් පත තබා පුටුවෙන් නැගී ගමන් කෙළේ ය.

කබලාන තමාට රුපියල් දෙසීයක් දුන් තුන් වන වතාව මෙය බව ලියන්නා කල්පනා කෙළේ ය. මීට පෙර දෙවතාවේ රුපියල් දෙසීය බැගින් දුන්නේත් තෑගි දෙන්නාක් මෙනි. එහෙත් ඒ දෙවතාවෙහිම මසකට රුපියල් විස්ස බැගින් පඩියෙන් අඩුකිරීමෙන් ඒ මුදල ඔහු ආපසු ගත්තේ ය. තමා අමාරුවේ වැටුණේ ඒ මුදල් අතමිට දිගහැර වියදම කිරීමත් අනතුරුව මසකට රුපියල් විස්ස බැගින් අඩු කරන ලද පඩිය ගැනීමත් නිසායයි ලියන්නා කල්පනා කෙළේ ය. කෝපයෙන් නටවනු ලබන කල්පනාව ඇති ලියන්නා කන්තෝරුවේ අනික් කාමරයට ගොස් තුවක්කුව ගෙන කබලාන පස්සේ ගියේ ය. ඔහු සැක කළ මුරකාරයා ඔහු පස්සෙන් දිවුවේ ය.

Scanned by CamScanner

ලියන්නාගේ සාහසික වේෂය දුටු කබලාන වහා මොටෝරථය බලා ගියේ ය.

ලියන්නා තුවක්කුව උර තලයට තබා අල්ලා ගෙන කබලානට එල්ල කොට කොකා ගැස්සුවේ ය. වෙඩිපහර ඉලක්කයෙහි නොවැදුණේ දිව ආ මුරකාරයා අතට ගැසූ පොලු පහර නිසාය. ලියන්නාගේ අතින් තුවක්කුව බිම වැටිණ. වෙඩි සැරය කබලානගේ රථයෙහි බොනට්ටුව පුපුරවමින් ඇතුළුවී ය.

කබලාන යළිත් කන්තෝරුවට ගොස් පොලිසියට ටැලිෆෝන් කෙළේ ය. ඔහු ලියන්නා පොලිස් නිලධාරීන්ට භාර කොට සාක්කි කියා ආපසු කොළඹ බලා පිටත් විය.

පොලිසිය විසින් පවරන ලද නඩුව තුන් මසකට පසු විභාගයට ගත් අවස්ථාවෙහි කබලානත් මුරකාරයාත් සාක්කි කීහ. විනිශ්වයකාරයා ලියන්නා තුන් අවුරුද්දකට සිරගෙට යවමින් මෙසේ කී ය. 'ඔහු සමහර ගෝසාකාරයන් විසින් කුප්පා නොමඟ යවනු ලැබූ වෙකි.'

ලියන්නාගේ බිරිඳත් ඇගේ මවත් ඔහු නඩුවෙන් බේරන ලෙස ආයාචනා කළ නමුත් කබලාන ඔවුන්ට කන් නුදුන්නේ ය. එහෙත් ඔහු වැරදිකාරයා වී සිරගෙට ගිය ලියන්නාගේ බිරිඳට රුපියල් දහසකින් උපකාර කෙළේ ය.

වෙනදට වඩා කලින් කන්තෝරුවේ වැඩ අවසාන කළ සවිමන් කබලාන සවස හතරට පමණ ගෙදර පැමිණ වහාම ඇතුළු වූයේ තමාගේ පුස්තකාලයට ය.

''පියසේන.''

ලියන්නා, කබලානගේ කාමරයට ඇතුළු වූයේ ය.

''මහාවංශයේ මම කිව් පරිච්ඡෙද දෙක කියෙවුවා ද?''යි කබලාන පියසේනගෙන් ඇසී ය.

''ඔව්'' යි කියමින් ඔහු කඩදසි කොළයක් දුන්නේ ය. ''එතරම් ප්‍රයෝජන විය හැකි කරුණු ඒ පරිච්ඡෙද දෙකේම නැහැ.''

''පූජාවලිය ?''

''පූජාවලියෙන් කරුණු ටිකක් උපුටාගත්තා. ඒවා ඉංගිරිසියට පරිවර්තනය කළා.''

''ශිලා ලිපි ?''

''ශිලා ලිපිවලින් කරුණු ටිකක් උපුටා ගත්තා'' යි කියමින් පියසේන කඩදසි කොළ හතක් පමණ කබලාන අතට දුන්නේ ය.

''රාජකීය ආසියාතික සමිතියේ පරණ සඟරා කලාපවල මොකුත් තිවුණා ද?''

"කොඩරිංටන් මහතාගේ ලිපි දෙකකින් හෝ තුනකින් කරුණු උපුටා ගත්තා."

කබලාන තමාගේ ලියන්නා සපයා දුන් සටහන් සියල්ලම කියවූයේ ය. අනතුරුව ඔහු රාජකීය ආසියාතික සමිතියේ සංග්‍රහයේ කලාප දෙක ගෙන, කොඩරිංටන් මහතාගේ ලිපි දෙකම කියවූයේ ය. ලියන්නා පිටපත් කරදුන් කරුණුවලින් තමාට වුවමනා කරුණු පමණක් කඩදාසි කොළ කිහිපයක සටහන් කරගෙන ඒ සටහන්වලට යටින් තමාගේ විවේචනය ද ඉතා සැකෙවින් ලියුවේ ය. අනතුරුව ඔහු තමා සම්පාදනය කළ ඒ පිටපත තවත් වරක් කියවූයේ ය.

කබලාන නාන කාමරයට ගොස් ඇඟ සෝදාගෙන ඇවිත් අලුත් ඇඳුම් හැඳගත්තේ ය. සවස 5.45 ට රියකරු මෝටෝරථය පෝටිකෝව යටට ගෙනෙන ලදින් කබලාන එහි නැඟී කවුගෙයි සභා ශාලාවට ගියේ ය.

අණ්ඩුකාර තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු සභාවෙහිදී රණදේව දුන්හිඳ 'පැරකුම්බා රජුගේ සේනාව' යන හිසින් ලිපියක් කියවූයේ ය. ලංකාව වඩාත් ධනයෙන් පිරිහෙන්ට වූයේ දෙළොස් වන ශතවර්ෂයෙන් පසු යයි ඔහු කීවේ ය. මහා පැරකුම්බා රජ, පැරණි ග්‍රාමීය සභ්‍යත්වයෙහි තෘප්ත නොවූ යසස් කාමයෙන් මඩනා ලද කායශූර පුද්ගලයෙක් වී ය. පොළොන්නරුව නගරාංගයන්ගෙන් හා නාගරික සභ්‍යත්වයෙන් සියලු ආධ්‍යාත්මික බාහිර අංගයන්ගෙන් ද යුතු මහා නගරයක් කිරීම ඔහුගේ අධිෂ්ඨානය විය. ඔහු පිට රටවලට යුද්ධ සේනාව යැවුවේ ඔහුගේ මේ අදහස මුදුන් පමුණුවා ගනු පිණිස ය. එකල පිට රටවලට සේනාව යවා යුද්ධ කිරීම වස්තුව රැස් කළ හැකි එක් මහක් වී ය. ජයගත් සේනාව එහි වස්තුව අතපත ගාගෙන සිය රට බලා ගියෝ ය. ලංකාවට වරින් වර යුද්ධ සේනාව පැමිණියේ මෙහි තුබුණු වස්තුවට ලෝභයෙනි. පැරකුම්බා රජු කළ සමහර යුද්ධ ලාභ ලැබිය හැකි ව්‍යාපාරයෝ වූහ. ඔහු ගොවිතැන් කරවීමෙන් ධාන්‍ය සුලභ කළ නිසා රටට එතරම් හානියක් ද නොවී ය. එහෙත් පැරකුම්බා රජුගෙන් පසු අර්ථ ක්‍රමය සුන්බුන් වී ගියේ ය. දෙවැනි පැරකුම්බා රජු සංස්කෘත සාහිත්‍ය කලා ප්‍රිය කෙළේ ය. මහා පැරකුම්බා රජ තනා තැබූ අලුත් අර්ථ ක්‍රමය සුන්බුන් වී යාම නිසා රජ ක්‍රමයෙන් දිළිඳු විය.

රණදේව කළ දීර්ඝ විවේචනයෙහි ප්‍රස්තාවනාව මෙය වී ය. ඔහු පොතින් පතින් හා ශිලා ලිපියෙන් ද උපුටා ගත් කරුණු දැක්වීමෙන් මේ අදහස් ඔප්පු කරන්ට වෑයම් කෙළේ ය.

ඔහුගේ කථාව විවේචනය කළ උගත්තු, ඔහුගේ මත බිඳීමට වෑයම් කළෝ ය. ඔහු කොඩරිංටන් මහතාගේ මතයක එල්ඹ

Scanned by CamScanner

ගෙන ඒ අනුව අලුත් මත කිහිපයක් පහළ කෙළේ ය. අනතුරුව ඒ අලුත් මත තහවුරු කළ හැකි කරුණු පමණක් පොතින් පතින් හා ශිලා ලිපියෙන් ද උදුරාගත්තේයයි එක් විචේචකයෙක් කීවේ ය.

පැරකුම්බා රජු වීරයකු කොට සලකන සවිමත් කබලාන රණදේවගේ විචේචනයට තුඩු දුන් මූලික මතය අනුමත කරමින් කථා කෙළේ ය. පැරකුම්බා රජුගේ යුද්ධ සේනාව වැටුප් පිට සේවය කළ සෙබළුන්ගෙන් සැදුණකි. එහෙයින් ඒ සේනාවෙහි සිංහලයන්ට වඩා අනික් ජාතිකයෝ බහුල වූහ. යුද පිණිස පිට රටගියේ සිංහල සෙනෙවියන් විසින් මෙහෙයනු ලැබූ අනික් ජාතිකයන් ප්‍රමුඛ සේනාවකි. වැටුප් පිට සේවය කරන සේනාවක් මෙහි තබාගෙන වැටුප් ගෙවීම අන්තරායකර අමාරු කාරියක් වී ය. එහෙයින් පැරකුම්බා රජ, ඔවුන් යුද පිණිස පිටරටවලට යැවී ය; සිංහල ජනයා ගොවිතැන දියුණු කරනු පිණිස යෙදුවේ ය. පැරකුම්බා රජුගෙන් පසු වැටුප් පිට සේවය කළ සේනාව ක්‍රමයෙන් අඩුවූහ. ගොවියන්ගේ චරිතය අරබයා පූජාවලියෙහි එන විවරණයෙන් හෙළිවන්නේ ඒ පොත ලියන කාලයෙහි ලංකාවේ සේනාව වැටුප් පිට සේවය කළ සෙබළුන්ගෙන් තොර වූවක් බවයි. කබලාන මේ කියුම් ඔප්පු කරනු පිණිස ශිලා ලිපියෙන් ද පූජාවලියෙන් ද පාඨ ඇද බෑවේ ය.

පසු ද නාලිකාත් චමරීත් සමඟ කලා භවනයෙහි චිත්‍ර ප්‍රදර්ශනය සඳහා ගිය සවිමත් කබලාන එහි වූ ඇතැම් චිත්‍ර ගැන විචාරකයන් හා කතාබහ කෙළේ චිත්‍ර කලාව විචේචනයට හුරුකම් ඇත්තකු ලෙසිනි. විචාරකයන් කබලානගේ ඇතැම් විචේචනයකට කන් දුන්නේ ඔහු ධනවතකු වූ නිසාම නොවේ; සිත්තමක හොඳ නරක කීමට ලත් දැනුමක් ඇත්තකු ලෙස ද සලකා ය.

කලා භවනයට යන්නෝ විශාල දෙමහල් මැඳුරක් වන කටුගෙය දකිති. ඇතැමුන් කලා භවනයට ඇතුළු වන්නේ කටුගෙය පසුකොට යාමෙනි. එහෙයින් නාන කොටුවක් වැනි කලා මැඳුරෙහි කුඩා බව එහි ඇතුළු වන්නන් සිහි කරන්නේ නිතැතිනි.

කුරුඳුවත්තේ දෙමහල් මැඳුරු ද විශාල පිටිය ද ඒ පිටිය එක් කොනක පිහිටි නගර මන්දිරය ද පුළුල් පාරවල් ද ඒ පාරවල් සෙවණ කරමින් විහිදුණු අතු පතර ඇතුව නැඟී සිටින දැවැන්ත ගස් ද නිසා කලා භවනය, දැවැන්තයන් අතරට නොදැන බැස ලජ්ජාවෙන් මිරිකෙන අඟුටුමිට්ටකු වැන්න. කයින් කෙසේ වෙතත් සිතින් දැවැන්තයකු වූ කබලාන එහි ඇතුළු වූයේ නමාගත් බෙල්ල ඇතුව ය. කලා භවනයේ දොරටුවට පැමිණි ඔහුගේ බෙල්ල නැමුණේ එහි කුඩා බව සිහි කළ ඔහුගේ සිත ද නැමුණු බැවිනි.

Scanned by CamScanner

එකකට එකක් ළංව එල්ලෙන සිත්තම් කිහිපයක් එක වර ඇසට හසු වේ. එහෙයින් එකක් වෙන් කොට ඇසට තරයේ ඉලක්ක කොට ගත හැක්කේ සිතත් ඇසත් වෙහෙසීමෙනි.

ලංකාවේ සිත්තරුන්ගේ සිත්තම් පමණක් නොව බටහිර පැරණි මහා සිත්තරුන්ගේ සිත්තම්වල පිටපත් ද ප්‍රදර්ශනයෙහි වී ය. 'මිසිස් සිඩන්ස්' නමැති නාටිකාංගනාවගේ විද්ධ චිත්‍ර දෙකෙන් එකක් කබලානගේ සිත ඇදගත්තේ ය. ජොෂුවා රෙනෝල්ඩ්ස්ගේ චිත්‍රයක් වූ එය මයිකල් ඇංජිලෝගේ නොමිනිස් රූපවල මුද්‍රාව සිහි කරන්නකි. අනික ගේන්ස්බරෝ විසින් අඳින ලද සිඩන්ස් නාටිකාංගනාවගේම චිත්‍රයයි. දෙම්නසින් මැලවුණු නමුදු උදර බැල්මකින් යුතු සුන්දර මුහුණක් දක්වෙන සේ ඇඳුණු එහි ස්වරූපය වෙනස් වූයේ ගේන්ස්බරෝගේ හැඟීම් ආරූඪ වීම නිසායයි කබලාන කී ය.

වේලාස්කාත්, රෙම්බ්‍රාන්ට් යන ඕලන්ද සිත්තරුන්ගේත් ඇල්බ්‍රෙක්ට් ඩූරර් යන ජර්මන් සිත්තරාගේත් විද්ධ චිත්‍ර ද කබලාන හැඳිනගත්තේ ය. ඩූරර්ගේ Portrait of Holzshuher නමැති චිත්‍රය කබලානගේ සිත් ගත්තේ ය. කෙස්ගස් ගණන් කළ හැකි තරම් පැහැදිලිව දක්වෙන සේ මහන්සියෙන් අඳින ලද ඒ සිත්තමේ දෙඇසත් මුහුණත්, දැඩි සිත හඟවන දෙතොලුත්, කබලානගේ සිත් ගැන්ම පුදුමයක් නොවේ.

''රූපයකට නඟන ලද දෘෂ්ටාන්ත සිහි කරවන වොට්ස්ගේ චිත්‍ර අන්න''යි ජස්ටින් නාගස්තුඩුව කී ය.

''සිත්තරා ධර්මානුශාසකයා වීමේ ප්‍රතිඵලයකි''යි සවිමන් කබලාන කී ය.

වොට්ස්ගේ සිත්තම් අරබයා චිත්‍ර විචාරකයකුගේ පොතක එන කියුම ජස්ටින් නාගස්තුඩුවට මතක් වී ය. මුදල් ගොඩ ගසනු පිණිස උදේ සිට හවස් වන තුරු වෙහෙසෙන කබලාන චිත්‍ර කලාව පිළිබඳ පොත් මෙතරම් හොඳින් උගත්තේ කෙසේ ද?

''ඔබ, කලාව පිළිබඳ පොත් අපටත් වඩා හොඳින් කියවීම මගේ පුදුමයට හේතුවක්''යි නාගස්තුඩුව කීවේ ය.

කබලාන සිනාසුණේ ය.

''මම කලාව පිළිබඳ පොතක් මුල සිට අගට කියවන්නේ නෑ.''

''එහෙනම් ඒ පොත්වල තිබෙන විවේචන මතක හිටින්නේ කෙසේ ද?''

''අද ප්‍රදර්ශනයට එන නිසා මම සර් ආර්. සී. විටගේ පොතත් තවත් පොත් දෙකකුත් ගෙන අතරින් පතර පෙරළා බැලුවා. මේ

පින්තූර ගැන ඔවුන්ගේ විවේචන කියවා සිතිමෙන් පහළ වුණු හැඟීම් තමා මම කීවේ''යි කබලාන සෘජුව කීවේ ය.

''ඔබේ වැටහෙන නුවණ පුදුම සහිතයි. ඔබ කලා විවේචනය උගැන්මට සිතුවා නම් ශ්‍රේෂ්ඨ විචාරකයෙක් වෙනවාට සැක නැහැ.''

''මිනිහෙකුගේ කාලය ගතකරන්ට වුවමනා කාරියක් නොවේ කලා විවේචනය!''

මියෝ, කොරෝ යන ප්‍රන්ස සිත්තරුන් දෙදෙනාගේ සිත්තම් දෙකක් අරබයා ජස්ටින් කළ වර්ණනාව ඇසූ කබලාන මෙසේ කී ය.

''ස්ථල චිත්‍රවලට මගේ සිත ඇදෙන්නේ නැහැ.''

කලාව අරබයා කබලාන සමඟ තර්ක කිරීම නිෂ්ඵල ය. ඔහු මුදල් සැපයීම හැර අනික් හැම කාරියක් දෙස බලන්නේ නරුමයකු ලෙස ය.

නාලිකා කබලාණ හා මදිරා දෙමාලසිංහ ද ලංකාවේ ලොකු මිනිසුන්ගේත් ඔවුන්ගේ භාර්‍යාවන්ගේත් විද්ධ චිත්‍ර බල බලා සන්තෝෂ වූහ.

''සර් නිව්ටන්ගේ පින්තූරය බොහොම ලක්ෂණ!'' යි මදිරා කීවා ය.

''සර් කුමාරසිංහගේ පින්තූරය එයිටත් වඩා හොඳ නොවේ ද? එයාගේ නිකට කෙළවර යන්තම් වළ ගැසෙනවා. ඒක ඕනෑ කමින් බැලුවොත් තමයි පෙනෙන්නේ. ඒ වළ ගැසීමත් මේ පින්තූරේට අහුවෙලා තියෙනවා!

සාවුරුද්දක් වියෝව සිට කෙලෙසුන් නසා මහණ වෙසින් පැමිණි බුදුන් වහන්සේගේ දෙපා වැළඳගෙන, හද දවමින් එතෙක් කල් පැවැති වියෝ දුකත් තම සැමියා දැකීමෙන් ළය උතුරුවමින් නඟින්ට වූ හර්ෂයත් වගුරුවන යසෝධරාව දැක්වෙන චිත්‍රය, අජන්තා චිත්‍ර අනුකරණයෙන් අඳින ලද්දකි. දෙමාලසිංහ නෝනා ඒ චිත්‍රයෙහි යශෝධරාවගේ පියයුරු දෙස බැලුවේ ඊර්ෂ්‍යාවෙනි. මෙකල යුරෝපයෙන් එන තන පටින් සහ ඇඳුම්වලින් පවා ගැහැනියකගේ ළයට නොදිය හැකි විලෝභනයක් පැරණි කතුන් ආරූඪ කරගත්තේ කෙසේ ද? මෙය සිත්තරුන්ගේ මායාවක් මිස එකල කතුන් කෙරෙහි වූ ලකුණක් ද?

චමරිටත් නීලාටත් චිත්‍ර ප්‍රදර්ශනයෙන් ලැබිය හැකි සන්තෝෂය සම්පූර්ණයෙන් නොලැබිය හැකි වූයේ වජිරින් නිසා ය. වජිරින් ඔවුන් දෙදෙනා හමුවූ තැන් පටන් නොනවත්වා කතා කරයි. ප්‍රශ්න අසයි. සිනාසෙයි. චමරී ඉඳහිට කියන ඇනුම්පද අසා ඔහු කරබා නොගනියි. ඔහු සිනාසෙමින්ම එකටෙක කීමෙහි ශූරයකු බැවින්, චමරී ඇනුම් පද කීමෙහි ආසාව මැඩගත්තා ය.

නීලා, වජ්රින් සන්තෝෂ කිරීමට මිස අසන්තෝෂ කිරීමට වෑයම් නොකළා ය.

චමරී, අරවින්ද දුන්වා දුන් විට වජ්රින් හිස කෙළින් කොට මදක් සෙලවී ය.

''එංගලන්තෙ කටුස්සෝ ඉන්නවා ද?'' යි චමරී අරවින්දගෙන් ඇසුවා ය.

අරවින්දට පෙර වජ්රින් පිළිතුරු දුන්නේ ය.

''කටුස්සො බොහොම ඉන්නේ ලංකාවේ! කොළඹටත් වඩා ඉන්නේ පිටිසර පළාත්වල!''

''කටුස්සන් හිස සලන්නේ නැහැ; උන්ගේ හිස් සෑලෙනවා!''යි අරවින්ද කී ය.

''නීලා අද කථාකරන්නේ නැත්තේ ඇයි?'' චමරී ඇසුවා ය. ඈ අනතුරුව නීලාගේ කනට කට ළංකොට ඉතාමත් සෙමින් මෙසේ කීවා ය. ''වජ්රින්ට බයේ ද?''

''නැහැ''.

''එහෙනම් ආදරේ හීන්ද ද?''

''කාට ද?''යි වජ්රින් ඇසුවේ ය.

''අපේ අම්මාට!''යි කියමින් නීලා සිනාසුණා ය. ඈ වහාම මෙසේ කීවේ චමරීට දෙඩන්ට ඉඩ නොදෙන අදහසිනි.

පෙරදිග රමණීය රේඛා චිත්රයක් වජ්රින්ගේත් අරවින්දගේත් නෙත් සිත් ඇදගත්තේ ය. දෙකකුල් දෑතට දමා මුහුණට මුහුණ දී දෙවියකුගේ ඇකයෙහි හිඳගත් දෙවඟනකගේ ඒ රූපයෙන් අදහස් කෙරෙන්නේ කුමක්දැයි වජ්රින්ට නොවැටහෙයි; අරවින්දට ද නොවැටහෙයි.

''මේ සිත්තමේ මාතෘකාව කුමක් දැයි'' වජ්රින් අරවින්දගෙන් ඇසුවේ ය.

''මම දන්නේ නැහැ.''

''චමරී දන්නවා ඇති.''

''අපි දන්නේ කොහොම ද?''යි කියමින් චමරීත් නීලාත් සිනා සෙන්ට වූහ.

ඔවුන්ගේ කතාවත් සිනාවත් ඇසූ තිස්ස ඔවුන් අතරට ගියෙන් චමරීත් නීලාත් යන්ට හැරුණෝ ය. ඔවුන් යන්ට හැරුණේ තිස්ස, පාෂණ්ඩයකු මෙන් නිර්මාලාප කියන බව දන්නා හෙයිනියි සිතූ අරවින්ද හරස් කැපී ය.

''ඉන්න ඉන්න —— යන්න එපා!''

Scanned by CamScanner

''මම ආවේ මේ පින්තූරේ විස්තර කියන්ට''යි කියමින් තිස්ස නීලාත් චමරීත් දෙස බලා සිනාසුණේ ය. ''මේ තරුණ නෝනාලා දෙන්නාම දන්නවා, නමුත් ඒකෙ විස්තර ලජ්ජාවේ කියන්නේ නැහැ!

''අපි දන්නේ නැහැ. ඔය වගේ සිත්තම්වල විස්තර සොයන්නේ තිස්ස! අපි නෙවි.''

වජ්රින් පමණක් නොව අරවින්දගේ ද කුහුල වැඩි වී ය.

''මේ සිත්තමෙ මේ වැල්වටාරම නැති නම් එක පාරටම තේරුම් ගන්ට පුළුවනි''යි තිස්ස කී ය. ''මේ වැල්වටාරම් වගේ පෙනෙන්නේ මේ රූප දෙකේ සළුපිළි ආභරණ හා ඔවුන් අතින් හා හිසින් ගත් දේ ද පෙන්වීමට අඳින ලද රේඛා. ඒවා සිතින් වෙන් කොටගෙන බැලුවාම සිතියමෙන් අදහස් කරන ලද්දේ කුමක්දැයි වැටහේවි.''

වජ්රින් ළංව සිත්තම බැලී ය. අරවින්ද ද ළංවී රේඛාවෙන් රේඛාව බැලීය. ඔවුන් දෙදෙනාගේම කට කොන්වලට සිනා නැඟෙන්ට වී ය. ඔවුහු තරුණ කතුන් දෙදෙනා දෙස බලා තිස්ස දෙස බැලූහ.

''ප්‍රන්ස කාඩ් පත්වලත් ඔය මුද්‍රාව තියෙනවා නෙව ද''යි තිස්ස ඇසුවේ ය.

''තිස්ස කුණුසරූප කියන්ට යන නිසා අපි යනවා!''

මෙසේ කියූ චමරීත් නීලාත් සිනාසෙමින් අනික් කොනට දිවුවෝ ය.

''එක් කලක ඉන්දියාවේ සමහරුන්ගේ භාවනාවට ස්ත්‍රිය ද අරමුණක් උණා''යි තිස්ස කීවේ ය. ''ඉඳින් ස්ත්‍රිය නිසා ලබන ආස්වාදයත් බ්‍රහ්මාස්වාදයත් යන දෙකම සමාන ලෙස ඔවුන් දැකීම පුදුමයක් ද? බටහිර කවීන් ස්ත්‍රිය ගුප්ත ධර්ම පිණ්ඩයක් කරන්ට නැත් කෙළේ බොළඳ මනස්ගාත කල්පනා කවි බසින් කීමෙනි. ඉන්දියාවේ සමහරුන් ස්ත්‍රිය ආත්ම කණිකාවක් කරන්ට නැත් කෙළේ ආත්ම වාදය දූෂණයෙන් නිපදවූ ගුහ්‍ය වාදයත් යටි සිතෙහි සැඟවී සිටි කාමාශාවත් දූෂණය වූ සමාජයත් ආශ්‍රයෙනි. ගුහ්‍ය වාදයෙහි එල්බගත් සමහර බමුණන් කාමාස්වාදය බ්‍රහ්මාස්වාදයට නෑකම් ඇත්තක් කොට දැක්වීමට ආත්ම වාදීන්ගේ වාග්මාලාව වහල් කොට ගත්තා. උසස් ප්‍රංශ නවකථා කාරයෙක් වූ රොමෙන් රොලාන් ගුහ්‍ය වාදය මහත් කොට සැලකුවා. තන්ත්‍රවාදය බටහිර පැතිරවුවහොත් බැබිලෝනියාවට වුණු දේ යුරෝපයටත් සිදු වෙනවා ඇත.''

''තිස්ස ගුහ්‍ය වාදය අතිශයෝක්තියට නගා තාන්ත්‍රිකයන්ට ගරහන්ට හදනවා''යි අරවින්ද කී ය.

Scanned by CamScanner

"නැහැ" යි තිස්ස කී ය. 'දැන් කාලේ ගැනු ගුණ තැන් සළුපිළි-වලින් වසා ගන්නවා! ඉතාම ඉස්සර කාලේ ඉන්දියාවේත් ලංකා-වේත් ගැනුන් හොඳටම ගුණ තැන් හැර අනික් ගුණ තැන් සළුපිළි-ගෙන් වසා ගත්තේ නැහැ. නොවසන ලද ඒ තැන් සමහරුන් ගුණ වාදයෙන් වැසීමෙන් එහි විලෝභනය වැඩි කළා! ස්ත්‍රිය ගුණාත්මයක් උණේ ඊට පස්සේ——බුදුන්වහන්සේගේ කාලේ නෙවි.''

Scanned by CamScanner

# 17

''මේ ඔක්කොම දිනෙත්ති රවිසේන අපෙන් පළිගන්න අදහසින් කරන වැඩ''යි කළමනාකාරයා කී ය.

''දිනෙත්ති රවිසේනය කියන්නේ කම්කරු හවුලේ නායකයා?''

''ඔව්—ඒ මිනිහා ගෙන්නා කතාබහ කරලා බලන එක නරකද?''

''කම්කරු හවුලේ එකෙක්වත් සමඟ අපට කතාවක් නැහැ''යි කබලාන කෝපයෙන් කී ය. ''මගේ කන්තෝරුව අහලකටවත් ඔවුන් ගෙන්වන්නේ නැහැ.''

කබලානගේ වැඩපළේ කම්කරුවන් මේ වර වැඩ නවත්වා දවස් තුනක් වෙයි. පන්සීයක් පමණ කම්කරුවන්ගෙන් එකසිය විසිපස් දෙනෙක් එහි වැඩ කරති. ඒ එකසිය විසි පස් දෙනා ලවා ද වැඩ නැවැත්වීමට දිනෙත්ති රවිසේන හැමදම කුමන්ත්‍රණය කරයි. කබලාන තවත් කම්කරුවන් ගෙන්වාගෙන නොනවත්වා වැඩ කිරීම සඳහා දැඩි අධිෂ්ඨානයෙන් සටන් කරයි.

''ගිය වතාවේ යුරෝපීය කර්මාන්ත සාලාවල කළමනාකාරයන් ඔහු ගෙන්වා කතාබස් කරලා තීරණයකට බැසගෙන සමාදන උණා. අපි ඒ වතාවේ ඔවුන් ගෙන්නුවේ නැහැ; ඔවුන් පරාජය කළා. මේ පාර වැඩ නවත්වා තියෙන්නේ ඒකට පළිගැනීමට.''

''ඒ නිසා තමයි ඔවුන් එකෙක්වත් එක්ක සාකච්ඡා නොකරන්ට තීරණය කෙළේ. වැඩපළේ අද කී දෙනෙක් වැඩ කරනවා ද?''

''එකසිය දහ දෙනෙක් වැඩ කරනවා. වැඩ කරන්ට එන මිනිසුන්ගේ ගණනත් දවසින් දවස අඩුවෙනවා: වැඩ නවත්වා සිටින කම්කරුවන් තර්ජන කරනවා. ඔවුන්ට ගසා තුවාල කරන්ට හදනවා.''

''පොලිසියේ උදවු ඇතිව ඔවුන් ආරක්ෂා කරන්ට ඕනෑ. දවස් පහමාරම මෙහේ නැවතී වැඩ කරන්ට කැමැති මිනිසුන් ඔක්කොටම තුන් වේලටම නොමිලේ කෑම දෙන බව දන්වන්න. වැඩපළට කිට්ටුව තිබෙන ලොකු ගෙයක් කීයක් හරි ගෙවා මාසෙකට කුලියට ගන්න. බූරු ඇඳන් හා කොට්ට පැදුරු ගෙන්වන්න. සුමානයක් නැවතී වැඩ කරන්ට කැමති මිනිස්සුන් සෙනසුරාද දෙකට ලොරියෙන් ඔවුන්ගේ ගෙදරවලට යවනවා පොලිස්කාරයෙකුත් සමඟ. රතු බාස් ඉන්නවා නොවේ ද?''



Scanned by CamScanner

"ඔව්".

"ඒ මිනිහා මේකට හපනා. එයා මා ළඟට එවන්න."

කළමනාකාරයා ගොස් රතු බාස් නමින් හැඳින්වෙන ජේම්ස්-මන් කබලාන වෙත එවූයේ ය.

"ජෝන්" යි කබලාන ඔහුට හඬගෑවේ සේවකයෙකුට නොව හිතවත් මිත්‍රයකුට හඬගාන්නාක් මෙනි.

"ජෝන්, උඹ මේ පාර ගිය පාරටත් වඩා මහන්සි වෙලා වැඩ කරන්න ඕනෑ. කම්කරු හවුලේ ඇයන්ට ඉන්ඩ දෙන්න හොඳ නැහැ."

"ඔව් සර්——"

"වැඩපළේ නැවතිලා වැඩ කරන්ට කැමැති මිනිස්සුන් ඔක්-කොටම නොමිලේ තුන් වේලටම කන්න දෙන්න ඕනෑ. අනිත් මිනිස්සුන්ට දවල් කෑම දෙනවා. නිදගන්ට ඇඳවල් තියා ගේ සූදානම් කරන්ට ඕනෑ. මැනේජර් මහත්තයා ගෙයක් කුලියට ගනීවි."

"හොඳයි සර්; දිනෙත්තිත් එයාගෙ මිනිස්සුත් මහන්සි ගන්-නවා දැන් වැඩ කරන මිනිස්සුනුත් නවත්වන්න. එයාගේ මිනිස්-සුන් පාරේ ඇවිදිනවා."

"වැඩපළට එන්න දෙන්න එපා."

රතු බාස් ඔහුගේ යටි රැවුලත් නිකටත් අත ගා වටපිට බලා උඟුර පෑදුවේ ය. ඔහු එසේ කරන්නේ යමක් කිරීමට සිත දැඩි කරගනු පිණිස බව කබලාන දනියි.

"අස්වෙලා ඉන්න අපේ පරණ වැඩකාරයෝ ඉන්නවා නොවේ ද?" කබලාන ඇසී ය.

"ඔව්, හුඟක් ඉන්නවා."

"ඔවුන් ඔක්කොම උණත් පුළුවන් නම් වැඩට ගෙන්වා ගන්න බලන්න ඕනෑ. ඔවුන් අස්වෙද්දී ගෙවූ පඩිය කෑමත් සමඟ දෙනවා. මම මැනේජර් මහත්තයාට කියන්නම් අස්වුණු මිනිස්සුන්ගේ නම ගම ඔක්කොම ලියලා දෙන්න කියා. වියදමට සල්ලි ඕනෑ නම කැෂියර් මහත්තයාගෙන් ඉල්ලා ගනින්."

"හොඳයි සර්— —"

"කොහොම හරි වැඩපළේ වැඩ නවත්වන්නේ නැතිව කෙරෙන්න ඕනෑ."

"මම පුළුවන් මහන්සි ගන්නම්."

සතියක් ගෙවුණු තැන කබලානගේ වැඩපළෙහි වැඩ කරන මිනිසුන්ගේ ගණන් දෙසිය පනහ දක්වා නැංගේ ය. දැඩි සිතක්

ඇති රතු බාස්, පැරණි කම්කරුවන් පමණක් නොව වැඩ නැතිව සිටි මිනිසුන්ද පෙළඹුවේ ය. කබලානගේ වැඩපළෙන් විශ්‍රාම පිට අස්වූ මිනිසුන් පමණක් නොව අස්කරනු ලැබුවෝ ද වැඩට ආවෝ ය. එහෙත් රතු බාස්, වැඩ නැවැත්වූ කම්කරුවන් වැඩට එන බව කියමින් බොරු පතළ කෙළේ ය.

වැඩ නැවැත්වූ කම්කරුවෝ, සුන් වූ බලාපොරොත්තු ඇත්තන් සේ කම්කරු නායකයන්ගේ පාලනය ඉක්මවා කිසිම විනය රීතියක් නොතකා ක්‍රියා කරන්ට පටන්ගත්හ. කබලානගේ වැඩ පළ ඉදිරියට ගොස් කලහ කළ කම්කරුවන්ගෙන් දෙදෙනෙක් සිරගෙට යවනු ලැබූහ. කම්කරුවන් පාලනයෙන් ලත් අත්දැකීම ඇති දිනෙත්ති රවිසේන වහා ක්‍රියා කළ යුතු අවස්ථාව පැමිණියේ යයි සිතුවේ ය. වැඩ නැවැත්වූවන් ජයග්‍රාහකයන් ලෙස වැඩට නොගිය හොත් කම්කරු හවුල සුන්බුන් වෙයි. රවිසේනගේ ආධිපත්‍යය ද බිඳ වැටෙයි. යුරෝපීය කර්මාන්ත ශාලාවල කම්කරුවන් ලවා ද වැඩ නැවැත්විය යුතු ය. එසේ කිරීමෙන් මිස අනික් කිසි විධියකින් කබලාන මැඩිය නොහැකි ය.

දහවන දවසෙහි යුරෝපීය කර්මාන්තශාලා තුනක කම්කරුවෝ ද කබලානගේ වැඩපළේ කම්කරුවන්ට අනුකම්පාවෙන් වැඩ නැවැත්වූහ. මත භේදයෙන් භින්නව සිටි අනික් කම්කරු සමිති ද කම්කරු හවුලට අනුබල දෙන්ට වූහ. නිතර තමන්ගේ දිළිඳු කම ගැන සිතීම නිසා හටගෙන කැකෑරෙන ද්වේෂයත් ඊර්ෂ්‍යාවත් ඇති ගතානුගතික මිනිසුන් රාශියක් එක්වූ තැන ඔවුන් පාලනය කළ හැක්කේ අවි බලයෙනි. දවසින් දවස සාහසික වන කම්කරුවන්ගෙන් දෙතුන් දෙනකු මියගිය හොත් මහා ජනයා, කබලාන ඇතුළු ධනවතුන්ට කිපෙනු නිසැක ය.

කබලානගේ වැඩපළ අසල රැස්වූ කම්කරුවන්ගෙන් කිහිප දෙනෙක් කලහ කරන්ට වූහ. අනික් කම්කරුවෝ ගල් ගැසූහ. රතු බාස් මෙහෙයූ සාහසිකයෝ පිටත සිටි කම්කරුවන්ට ගැසූහ. මෙයින් හටගත් කලහය, කැරලි කෝලාහලයක් වී ය. කලහය මඩින ලද්දේ තුවක්කු ගත් පොලිස් භටයන් විසිනි. තුවාල ලැබූ කම්කරුවෝ ද එදිනම ඉස්පිරිතාලයෙන් පිට කරනු ලැබූහ.

කලහය නිසා දරුණු තුවාල ලැබුවේ තිස්ස පමණි, කම්කරුවකු හෝ කම්කරු හවුලේ එකකු හෝ නොවන ඔහු දරුණු තුවාලයක් ලැබීම දිනෙත්ති රවිසේනගේ බලාපොරොත්තු සුන් කරන්නක් වී ය. ඔහු දරුණු තුවාල ලැබීම කම්කරුවන්ගේ සංවේගය වැඩි කරන හේතුවක් නොවේ. පොදු මහජනයාගේ සංවේගයටද හේතු නොවේ. ධනවතුන්ට පමණක් නොව කම්කරුවන්ට ද දෙස් නාහමින් මැද පන්තියේ මිනිසුන්ට සරදම් කරන තිස්ස ලැබූ දරුණු

තුවාල නිසා සංවේග වන්නේ ඔහු දන්නා අඳුනන උගතුන් ටික දෙනකුන් පමණි. ඔහු ඉතා හොඳ හදවතක් ඇති අවංක මනුෂ්‍යයකු බව දන්නේ ළංව ඉත සිතින් ඇසුරු කරන ඒ ටික දෙනා පමණි. නරක නමක් ලැබූ හොඳ මිනිහෙක් නගරයෙහි වී නම් හේ තිස්ස ය.

වම් අත සම්පූර්ණයෙන් කැඩී පොඩිවුණු ඔහු යන්තම් සිහිය ලැබුවේ ඉස්පිරිතාලයෙහි දී ය. ඔහුට සැත්කම් කරනු පිණිස අරවින්ද කැඳවන ලද්දේ මාලින් විසිනි. ඔහුගේ තුවාල පරීක්ෂා කළ අරවින්ද කනගාටු වූයේ ය.

''තිස්සගේ වම් අත උරහිස ළඟින්ම කපා වෙන් නොකොට සුව කරන්න බැහැ''යි අරවින්ද කී ය. ''අතේ ඇට පොඩිවෙලා.''

''මිනිහෙකුට එක අතක් හොඳටම ඇති; අනික් අත කපා දමන්න. කබලාන එක අතක් ඇති මිනිහෙක් උණා නම් ඔහු කම්කරුවන් එක්ක මෙතරම් හටන් කරන්නේ නැහැ. මොළෙන් හොඳට වැඩ ගන්නා මිනිස්සුන්ට අත් දෙකක් වැඩියි. අත් දෙකක් ඕනෑ කරන්නේ මොළේ නැති මිනිස්සුන්ටයි. මොළේ නැති සත්තුන්ට අත් පා වැඩියෙන් තියෙන බව අරවින්ද කල්පනා කෙළේ නැද්ද? මිනිහෙකුට එක අතක් හොඳටම ඇති''යි කියූ තිස්ස සිනාසෙන්ට උත්සාහ කෙළේ ය. වේදනාවෙන් තැවුණු ඔහුගේ මුහුණ වඩාත් ශෝක උපදවන සේ වෙනස් වුණා මිස ඔහුගේ කටට සිනාවක් නොනැංගේ ය. එහෙත් අරවින්දට සිනාව මැඩගත නොහැකි විය.

''කඳකුමරුට අත් දෙළහයි. සිව දෙවියාට අත් හතරයි. සරසවියට අත් හතරයි. ඔවුන්ට මොළේ නැද්ද?''

''කඳකුමරුට මොළේ ඇත්නම් මයුරයා වාහනයක් කරගන්නවා ද? සිවට මොළේ ඇත්නම් මහලු ගොනෙක් වාහනය කරගෙන වීදගම හිමියන්ගේ සිනාවට ඉලක්ක වෙනවා ද?''යි කියමින් තිස්ස වැයමින් සිනාසුණේ ය.

''කුලල් කාගන්නා මිනිස්සු අතරට තිස්ස ගියේ කුමට ද?''

''ඔවුන්ට උදවු කරන්න.''

''වෙනද තිස්ස කුලල් කන්ට හදන කම්කරුවන්ට බණිනවා.''

''ඔවුන්ට බණින්නේ ඔවුන් එයින් වළකන්නයි. අමාරුවේ වැටුණාම ඔවුන්ට අනුකම්පා කරනවා. කබලානත් කම්කරු හවුලේ නායකයනුත් ඔවුනොවුන්ගේ හපන්කම් පෙන්වන්ට ගියාම අමාරුවේ වැටෙන්නේ ඒ මෝඩ මිනිස්සු.''

''තිස්සට කවුද ගැහුවේ?''

''කම්කරු හවුලේ එකෙක් වෙන්න ඇති!''

Scanned by CamScanner

''තිස්ස ඔවුන්ට අනුකම්පාවෙන් උපකාර කරන්ට ගියාට කදිම සංග්‍රහයක් නෙව කරලා තියෙන්නෙන්.''

''කබලාතගේ මිනිහෙක්ය කියා හිතාගෙන මට ගහන්න ඇති.''

''ගහන්න ඇත්තේ දැනගෙන.''

''කවුරු ගැහුවත් එකයි. මගේ අත කපා හොඳ කරන්ත පුළුවන් නම් හොඳ කරන්න.''

''මම එක අතක් ඇති මිනිහෙක් උණා නම් තිස්සට සැත්කම් කරන්නේ කොහොමද?'' යි අරවින්ද ඇසී ය.

''එක අතින් සැත්කම් කරන්ට මොළය උගන්නාවි. කටින් පෑන අල්ලාගෙන පොත් ලියූ මිනිහෙක් ගැන මම කියවා තිබෙනවා. එක අතින් බැරි නම් තවත් දෙස්තරෙක් ළංකරගන්නවා. එතකොට සමගිය වැඩිවෙනවා. මුදල් ගසා ගැනීමේ ආසාව අඩුවෙනවා!''

''මම කනගාටු වෙන්නේ තිස්ස වගේ අහිංසක මිනිහෙක් මේ කෝලාහලයට අසුවී වධ වේදනා විඳීමත්, සාහසික කම් කළ එක මිනිහෙක්වත් දඬුවම් නොලැබීමත් ගැනයි.''

''කෝලාහල කරන මිනිස්සුන් දන්නවා ඇඟ බේරාගෙන වැඩ කරන්න. කෝලාහල නොකරන මිනිස්සුන් කෝලාහල කරන තැන් වලට යන්ට ඕනෑ නැහැ.''

''තිස්ස ගියේ කෝලාහලය වළකන්න නෙවද?''

''වළකන්න විතරක් නෙවි. දුප්පත් මිනිස්සුන්ට අනුකම්පා කරන නිසා.''

''මහා අපරාධයක් නෙව.''

''අපරාධයක්? මොන අපරාධයක් ද?''

අතීතය මතක් කළ තිස්ස තමාගේ ජීවිතයෙහි ඇතැම් තොරතුරු අරවින්දට කී ය. තමා කුඩා කාලයෙහිදීම පියා මළේයයි තිස්ස කී ය. එතැන් සිට මේ වන තෙක් ඔහු උගැන්මටත් මුදල් සැපයීමටත් වෙහෙසෙන්නෙකි. ඔහු සැපයූ මුදල් ඉතිරි කරන ලද නම් ඔහු ධනවතෙකි. එහෙත් ඔහු දිළින්දන්ටත් දුප්පත් නෑ මිතුරන්ටත් මුදල් දුන්නේ ය. ඔහු කිසිවකුගෙන් රුපියල් දහයක් ණයට නොගත්තේය. හැට වයස් ඉක්මවා සිටීතත් ඔහු කිසිකලෙක තරුණියකට ආලය නොකෙළේ ය. තරුණ වියෙහිදී පවා ඔහු තරුණියක ආශ්‍රය නොකෙළේ කාමාශාවෙන් තොරවූවකු නිසා නොව ලජ්ජාව නිසා ය. ඉතා ආශාවෙන් ඔහු පැතූ තරුණියන්ගෙන් පවා ඔහු බියෙන් පලා ගියේ ය.

''එක තරුණ ස්ත්‍රියකට ආලය නොකළ නමුත් මම හැම ලස්සන ගැහැනුන්ට ආලය කළා!''යි තිස්ස කී ය. ''පොලුවේ

හැම ලස්සණ ගැනුන්ට ආලය කෙළේ ඔවුන්ගේ රූ සපුව හා අහර දහර බලා සන්තෝෂ වූ නිසා.''

සැත්කම් මඩුවට ගෙන ගොස් ඇස් බැඳ මුස වායුව නැහැයට අල්ලන තෙක් තිස්ස දෙඩවී ය. මීට පෙර ශාස්ත්‍රීය සාකච්ඡාවකදී හැර අනික් කිසිවිටක දෙඩමලු නොවූ තිස්ස, තමා පිළිබඳ තොරතුරු නොනවත්වා කියන්නේ කුමක් නිසාදැයි අරවින්ද තමාගෙන්ම ප්‍රශ්න කෙළේ ය. 'මිනිසෙකුට එක අතක් ඇතැ'යි තිස්ස කීවේ තමාගේ ශෝකයත් කලකිරීමත් යට කරගනු පිණිස විය යුතු ය. තිස්ස තමාගේ අතීත තොරතුරු කියන්ට වූයේ ද සිත සනසාගනු පිණිස ය. බොහෝ කොට උගැන්ම නිසා වැඩුණු බුද්ධිය, තිස්ස-ගේ නිසග ගති ගුණ වසාගත් දැඩි කබොල්ලක් වැන්න. ඒ කබොල්ල ඉවත් කළ විට දකින්ට ලැබෙන්නේ අහිංසක දරුවකුගේ හෝ ඇතැම් කෙලෙසුන් නැවුවකුගේ හෝ නිර්මල හදවත වැනි හදවතක් ඇති මනුෂ්‍යයෙකි. මීට පෙර අරවින්ද 'තිස්ස ලෝක-යටත් මනුෂ්‍යයන්ටත් ද්වේෂ කරන නරුමයකු' කොට සිතුවේ ය. ඒ විනිශ්චය වැරදි බව දැන් ඔහු දනියි.

මුස වායුව ආශ්වාස කරන තිස්ස සුෂුප්තියට වැටී විසංඥ වන්ට පෙර ක්‍රමයෙන් පිවිසියේ සිහින ලොවට ය. දුප්පත් ලෙඩුන්ට පවා අනුකම්පා නොකොට මුදල් ගැනීමෙන් දොස්තරුන් ධනවත් වෙතියි කියමින් දෙඩවන තිස්ස දොස්තරුන්ට බණිනු ඇසූ අරවින්ද සිනාසුණේය.

# 18

කබලාන තිස්ස දැකීමට ඉස්පිරිතාලයට ගියේ ඔහු තම බිරිඳගේ ළඟ නෑයකු වන නිසා නොව කම්කරු හවුලේ නායකයන්ට විරුද්ධව පොලිසිය විසින් පවරන ලද නඩුවට හොඳ සාක්කියක් සපයනු පිණිස ය. තිස්ස හිඟන වාට්ටුවෙන් ඉවත්කොට වතු-කාරයන්ගේ වාට්ටුවට යැවීමට කබලාන යෝජනා කළ නමුත් තිස්ස ඒ යෝජනාව නොඉවසුවේ ය.

''තනියම කාමරයකට වෙලා ඉන්නවාට වඩා මේ මිනිසුන් අතර ඉන්න එක සන්තෝෂයක්'' යි තිස්ස කී ය.

''ගෙවන වාට්ටුවට ගියාම හොඳ කෑම ලැබෙනවා. කරදරයක් නැතිව ඉන්ට පුළුවනි.''

''මට ඉංග්‍රීසි කෑම එපා වෙලා.''

''ඊෂ්‍යාව නිසා!'' කබලාන කී ය. කෝපය, අසන්තෝෂය යන හැඟීම් තබා කිසිම හැඟීමකුදු නො දක්වෙන කබලානගේ මුහුණ, පණ ගිය ශූර මිනිසකුගේ මුහුණ වැන්න. තිස්ස දෙතුන් වරක් කබලානගේ මුහුණ බැලුවේ ය. කබලාන ගැන තමා කලින් සිතූ සිතුම් සියල්ලම වැරදියයි තිස්ස කල්පනා කෙළේ ය. කබලාන කියන කියුම් යන්ත්‍රයකින් ගිලිහෙන වචන වැන්න. කබලාන සිතන්නෙත් කරන්නෙත් කියන්නෙත් යන්ත්‍රයක් ලෙසිනි.

කබලාන තිස්සට රුපියල් පන්සීයක් දුන්නේ ය.

''මොකොට ද?'' තිස්ස ඇසී ය.

''වියදමට ගන්න.''

තිස්ස මඳ වේලාවක් කල්පනා කොට රුපියල් පන්සීය කබලාන අතට දුන්නේ ය.

''රුපියල් පන්සීය මගේ ගණනේ බැංකුවේ දම්මන්න.''

''තිස්සට ගහලා තියෙන්නේ දිනෙත්තිගේ මිනිස්සු.''

''මහත්මයා දන්නේ කොහොම ද?''

''මගේ වැඩපළේ බාස් කෙනෙකුත් වැඩකාරයෙකුත් දැකල තියෙනවා.''

තමාගේ අත් කැඩූ එකා කම්කරු හවුලේ මිනිහෙකු විය යුතුයයි අරවින්දට තමා කී කියුම තිස්සට මතක් වී ය. එහෙත් එය අරවින්ද විසින් කබලානට කියන ලදැයි ඔහු නොසිතුවේ ය. තමාගේ අත



Scanned by CamScanner

නැඩු මිනිසා ගැන කබලාන සොයන්නේ කම්කරු හවුලේ මිනිසුන්ගෙන් පලිගැනීමට විය යුතු ය.

''මට ගැහැව්වේ කම්කරු හවුලේ එකෙක්යයි මම හිතන්නේ නැහැ.''

තිස්ස මෙසේ කීවේ කබලාන කියන්නේ කුමක්දැයි දැනගනු පිණිස ය. එහෙත් කබලාන කිසිවක් නොකීවේ ය.

''දෙස්තර අරවින්දට මම දවසක් මොකක්දෝ කීවා. ඒක කියවුණේ මම දෙඩවද්දී''

කබලාන ඉවත බලාගත් වනම උන්නේය. එහෙත් තිස්සගේ කට කොන් දෙක දෙකනට ළංවන තෙක් පළල් වනු කබලාන දිටී ය.

''ඒ දෙන්නාම සාක්කි කියනවා.''

''මොන දෙන්නා ද?'' යි තිස්ස පුදුමයෙන් ඇසී ය.

''මගේ බාසුත් වැඩකාරයාත්.''

කබලාන ගොස් ටික වේලාවකින් අරවින්ද වාට්ටුවල ලෙඩුන් බැලීමට පැමිණියේ ය.

''දැන් මට සනීප නෙවද?''

තිස්ස මේ ප්‍රශ්නය ඇසුවේ අරවින්ද තමාට ළංවන්ටත් පෙර ය.

''සනීප නම් ඇයි ඇඳෙන් බැහැලා නොයන්නේ''යි අසමින් අරවින්ද සිනාසුණේ ය.

තිස්ස සිනාසෙමින් ඇඳෙන් බැස දෙපයින් නැඟී සිටියේ ය.

තිස්සගේ තුවාල තමා සිතුවාටත් වඩා ඉක්මනින් සුව වන්ට ළංවීම ගැන අරවින්ද සන්තෝෂ වූයේ ය. එක අතක් නැති තිස්ස දකින හැම විටම අරවින්ද ශොක වෙයි.

''බොම්බායට ගොහින් තිස්සට අතක් දමාගන්න පුළුවනි''යි අරවින්ද කී ය.

''මොකොට ද? එක අතක් හොඳට ම ඇති!''

''කෝට් එක ඇන්දම එක අතක් එල්ලා වැටේවි.''

''එක අතක් ඇති කෝට් මස්සනවා!''

''එතකොට අත් කොටය පෙණේවි.''

''ඒක වැහෙන්න ඒ පැත්ත මස්සනවා.''

''තිස්සට ගහනවා කබලානගේ මිනිසුන් දැකලා තියෙනවා.''

''කවුද කීවේ.''

''කබලාන.''

කබලාන තමා හමුවීම පිණිස ඉස්පිරිතාලයට පැමිණියේ අරවින්දගෙන් තොරතුරු දැනගෙන විය යුතුයයි තිස්ස කල්පනා කෙළේ ය. කබලාන නිසැකවම කල්පනා කරන්නේ කම්කරු හවුලේ කිහිප දෙනකුගෙන් පළිගැනීමටය. 'තමාගේ අත කඩන්ට ඇත්තේ කම්කරු හවුලේ එකෙකි'යි තිස්ස කීවේ සිතාමතාවත් තමාට ගැසූ එකා දුටු නිසාවත් නොවේ. නර්මාලාප කියන්ට පුරුදු වූ තිස්සට ඒ වචන කියවුණේ කම්කරු හවුලට නොව මනුෂ්‍ය වර්ගයාට නින්දවක් කොට සන්තෝෂ වන පිණිස ය.

"අරවින්දට මම එහෙම කිවුවේ මට ගැහු මිනිහා දුටු නිසා නොවේ."

"මොනවා!"

"උන්ට නින්ද කරන්ට සිතූ නිසා ඒක කියවුණා."

"තිස්සගේ ඔය ප්‍රතිපත්තිය නිසා මිනිස්සුන් හොඳටම නරක් වෙනවා——උන් හොඳ වෙන්නේ නෑ"යි අරවින්ද කී ය. "දැන දැනම තිස්සට ගැහූ මිනිහා දඬුවම් විඳින්න ඕනෑ. ඔවුන්ට අනුකම්පා කිරීම වෙනම එකක්. නීතියෙන් ලැබෙන දඬුවමෙන් ඔවුන් බේරීම වැරදියි."

"ගැහු මිනිහා මම දැක්කෙත් නැහැ; දන්නෙත් නැහැ; ඇත්ත ඒකයි! එද අරවින්දට මම කිවුවේ මගේ කටට ආ කීමක්!"

"තිස්සට ගහනවා ඇහින් දැක්ක මිනිස්සුන් ඉන්නවා."

"කවුද සෙවිල්ලෙන් බලා සිටියේ!"

"සචිමන් කබලානගේ බාස් කෙනෙකුත් වැඩකාරයෙකුත් දැකලා තියෙනවා."

කම්කරු හවුල ඇදගැනීමට කබලාන මහා කුමන්ත්‍රණයක් කරතියි තිස්ස කල්පනා කෙළේ ය. අරවින්ද ද සාක්කි කාරයකු ලෙස උසාවියට කැඳවනු නිසැක ය.

තමාගේ පියා තිස්සට මුදල් දුන් බවත් 'මට ගැසුවේ කම්කරු හවුලේ එකෙකි'යි තිස්ස කියන බවත් ඇසූ මාලින් ඔහු බැලීමට ගියේ කෝපයෙනි.

"තිස්ස තාත්තා දුන් සල්ලි ගත්තේ මොකට ද?"යි මාලින් ඇසී ය.

"දුන්නේ මොකටදැයි තාත්තාගෙන් අහන්න" යි තිස්ස පිළිතුරු දුන්නේ ය.

"තාත්තා සල්ලි දෙන්ට ඇත්තේ තිස්සට කියා බොරු සාක්කි කියවන්න."

Scanned by CamScanner

"සල්ලි හම්බ කළ මිනිහෙක් බොරු සාක්කි කියවන්ට දුප්පත් මිනිහෙකුට සල්ලි දෙනවා නම් වැරදි කාරයා කවුද?"

"මම හිතුවේ තිස්ස අවංක කෙළින් මිනිහෙක්ය කියා."

"බඩගින්න නැති මිනිහා කෑම සොයන්නේ නැහැ. කවුරුවත් දෙන කෑම කන්නේත් නැහැ. බඩගින්න ඇති මිනිහා........."

"වංක කම් කරන මිනිහා තර්ක කරන්නේ ඔහොම තමා!"යි මාලින් කීවේ ය.

වාට්ටුවේ අනික් ලෙඩුන්ගේ නෙත් සිත්, තිස්ස හා මාලින් ද දෙසට ඇදී ගියේ ඔවුන් දෙදෙනාම කෝපයෙන් තර්ක කරන්ට වූ බැවිනි. ලෙඩුන්ගෙන් සියේට අනූනම දෙනකුත් තිස්සගේ පැත්ත ගත්තේ මාලින් ධනවතකුගේ පුතකු බව දැනගත් නිසා මිස ඔවුන් වාදයට එළඹූ කරුණ ගැන විනිශ්චයකට බැසගත් නිසා නොවේ.

"තිස්සට ගැහු මිනිහා තිස්ස දැක්කා ද?"

"මාලින් නඩුකාරයෙක් නෙවී."

"තිස්සගේ අත කැඩුවේ තාත්තාගේ වැඩපළේ මිනිහෙක්මයි. ඒ මිනිහා යැවුවේ රතු බාස් විසින්."

"මාලින් දැක්කා ද?"

"මම දැක්කේ නැහැ; තාත්තාගේ වැඩපළේ මිනිහෙක්ම දැකලා තියෙනවා. මිනිහා ඒ වෙලාවේ රතු බාස් ළඟ උන්නා. ඒ මිනිහා මට විශ්වාසයි."

"ඉතින් ඒ මිනිහා සාක්කි කියාවී නෙව."

"ඒ මිනිහා බයේ සාක්කි කියන්නේ නැහැ."

"ඒ මිනිහා බය නිසා මට බොරු සක්කි කියන්ට කියනව ද?"

"තිස්ස ඇත්ත කිව්වාම ඇති."

"එහෙනම් මම ඇත්ත කියන්ට ඕනෑ මාලින්ගේ කීමට!"යි කියූ තිස්සගේ කට දෙකොන, කන් දෙකට ළං වන තෙක් පළල් වූයෙන් දත් දැත්දම පෙනිණ.

"තිස්ස තාත්තා දුන් සල්ලි ගත්තේ මොකට ද?"

"දුන්නේ කුමටදැයි තාත්තාගෙන් අහන්න."

තිස්ස හා වාද කිරීම නිෂ්ඵල බව වැටහුණු පසු මාලින් තිස්සට ආයාචනා කෙළේ ය.

"තිස්සට ගැහුවේ වැඩපළේ මිනිහෙක්; මට ඒක සහතිකයි. ඒ මිනිහා යැවුවේ රතු බාස්".

මාලින් දන් වාසය කරන්නේ මවුපියන්ගේ ගෙදර නොව කම්කරු විශ්‍රාම ශාලාවක කාමරයක ය. ඔහු දකින්ට අනෝමා වෙත් යන්නේ චමරී පමණි. චමරී සමඟ බොහෝ විට නීලා ද යයි. අරවින්ද කම්කරු හවුලට විරුද්ධව සාක්ෂි කියන්ට යන බව ඇසූ මාලින් කෝප වී ය.

"චමරී! අරවින්ද නරක දුෂ්ට මිනිහෙක්; එයා සිතින් ඉවත් කරන්න."

"ඇයි එහෙම කියන්නේ? මම එයාට පොරොන්දුවක් උණේ නැහැ. නමුත් එයා මා ගැන බලාපොරොත්තු වෙනවා. කටින් පොරොන්දු නූණත් හිතින් පොරොන්දු උණායයි එයා සිතා ගෙන ඉන්නවා."

"ඒ මිනිහා මහා කපටියෙක්; එයාට ඕනෑ කරලා තියෙන්නේ චමරී බැඳගෙන ඉහළ සමාජයේ මිනිස්සුන් අතරට යන්ට."

"මාලින් අයියාට ඉහළ මිනිස්සුන් ඕනෑ නැති උණාට අරවින්දට ඕනෑ වෙලා තියෙනවා!"

"අරවින්ද බොරු සාක්ෂි කියන්න යනවා."

"බොරු සාක්ෂි කුමට ද?"

"කම්කරු හවුලට විරුද්ධව."

"කම්කරු හවුල නිසා එයාට වෙන පාඩුව මොකක් ද?"

"තාත්තාගේ කීමට සාක්ෂිය කීවාම චමරී පිළිබඳ යෝජනාවට තාත්තා කැමති වේවි."

"එහෙනම් තාත්තාගේ කැමැත්ත ගන්ට ද අරවින්ද බොරු සාක්ෂි කියන්ට යන්නේ"යි චමරී ඇසුවේ කෝපයෙනි.

"තාත්තා සන්තෝෂ කරන්ට වෙන්න ඕනෑ. නැති නම් එයා බොරු සාක්ෂි කියන්නේ මොකට ද? තක්කඩියා——"

අරවින්ද ඉහළ නැඟීමට කුහකකම් හෝ කපටිකම් හෝ කරන්නෙක්යයි චමරී නොසිතුවා ය.

Scanned by CamScanner

# 19

නීති ශිෂ්‍යයන්ගේ සාංවත්සරික උත්සවය සඳහා මහා හෝටලයෙහි රැස්වූ අමුත්තන් අතර මදිරා දෙමාලසිංහ නෝනා, මංගලිකා සැවුළුගල නෝනා, චමරී, නීලා, හා වජිරින් ද වූහ. ගැනුන් හා පිරිමින් ටික දෙනකුන් හැර අනික් අමුත්තන් අතර මත් පැනින් බැමෙන හිස් ඇත්තෝ හිඟ නොවූහ. භෝජන සංග්‍රහයට වාඩිවූවෝ පළමුව කාවාටි පිඟන් හිස් කොට අනතුරුව සුප් බී හ. තරුණියන් පමණක් නොව මැදි විය ඉක්මවූවෝ ද කාන්තාවන්ගේ සිත් ගනු පිණිස විකට කථා හා නර්මලාප පමණක් නොව නීතිඥයන්ගේත් වෙදුන්ගේත් ශබ්ද කෝශවලින් ගත් වචන වලින් වසන ලද ඇනුම්පද හා කුණු සරුප ද කියන්ට වූ හ. මාළු පිඟන් වලට පසු කුකුළු මස් පිඟන් සේවකයන් අතින් ගියේ මත් පැන් ද සමග ය.

කෑම පිඟන්වලින් නැගෙන සුවඳ, කතුන්ගේ හිස්, මුහුණු, සැට්ට හා ලේන්සු ආදියෙන් නඟින සුවඳ හා එක්වී සාලාව පුරා පැතිරෙයි. සීන් බුබුළු නඟන ෂැම්පේන්, වීදුරු බඳුන් තුළ, රන්පාටින් බබළයි. සමහරුන්ගේ සිත් යොමු වූයේ බීමට නොව කෑමට ය. බීමෙන් වැඩි සන්තෝෂය ලබන්නෝ කාන්තාවන් සිනැස්සීමට වෑයම් කරති.

"දැන් දෙස්තරු ඉස්සර වගේ නෙවි"යි අරවින්දට මදක් ඈතින් වූ පුටුවෙහි උන් මිනිසෙක් කී ය.

"ඉස්සර නඩු වැඩියි, ලෙඩ අඩුයි! දැන් නඩු අඩුයි ලෙඩ වැඩියි, දෙස්තරුන් සල්ලි ගරන්ට පටන් ගත්තේ ඒ නිසා" තවත් එකෙක් කී ය.

"සමහර දෙස්තරුන් ලෙඩා බලන්නේ සල්ලි පෙන්නුවාට පස්සේ!"

"කපටි මිනිස්සුන් ඒ දෙස්තර රවටන්ට ඇති"යි පළමුව කථා කළ එකාට මදක් ඈතින් සිටි අමුත්තෙක් කී ය. "සමහරු ලෙඩ බලවාගෙන දෙස්තරට රුපියල් පහක්වත් දහයක්වත් දී 'මම ළඟ තියෙන්නෙ මෙච්චරයි. ඉතුරු ගණන අනික් පාර ආවාම දෙනවා'යි කියනවා."

"ඒක ගම්වල සමහර පොහොසත් මිනිසුන් කරන කපටිකමක්!"

"දුප්පත් මිනිහෙකුගෙන් රුපියල් පහක් දහයක් අඩුවෙන් ගත්තාම මොකොද?"



Scanned by CamScanner

"ලෙඩ බලවාගෙන 'මෙච්චරයි ගෙනාවේ' කියමින් රුපියල් පහක් දෙන මිනිහා දුප්පතෙක් නොවි; කපටියෙක්."

"නීතිඥයන් නම් දැන් පොදු ජනයා උදෙසා සල්ලි වියදම් කරනවා. පොදු ජනයාට සේවය කරනවා. දෙස්තරලා සල්ලි පොදි බැඳගෙන ගැට තදකරනවා!" යි එකෙක් කී ය.

"නීතිඥයන් සල්ලි වියදම් කරන්නේ මන්ත්‍රී මංඩලේට යන්ට."

"නීතිඥයන් ගිනි කන්නේ අපරාධ කාරයන් බේරන්ට. දෙස්-තරුන් සල්ලි ගන්නේ අමාරුම ලෙඩ සුව කිරීමෙන් මිනිස්සුන්ගේ වද වේදනා නැති කිරීමට" යි ඇතින් සිටි තරුණයෙක් කී ය.

"ඒ කතා කෙළේ දෙස්තරෙක් වෙන්න ඇති!"

"පොහොසත් ලොකු දෙස්තරෙක් කළ වැඩක් දන්නවා ද?" යි අසමින් එකෙක් සිනාසුණේ ය.

"නෑ".

"පිට පළාතක මුදලාලි කෙනෙකුට අමාරු වෙලා දෙස්තරට එන්ට ටැලිපෝන් කළා. දෙස්තර උත්තර දුන්නා 'දවල් දෙකට පිටත් වෙනවා ය කියා.' දෙකට මිනිත්තු පහක් තියෙද්දී දෙස්තර මොටෝරියේ නඟින්ට ගියා. ටැලිපෝන් සීනුව හැඬෙනු අසා ඔහු ආපසු ගියා කාමරේට. 'අර මුදලාලි මැරුණාය දෙකට පිටත් වෙන්න එපායයි දෙස්තර මහත්තයාට කියන්න'යි අනික් පැත්තේ ටැලිපෝනය ගත් මිනිහා කිවුවා. "දැන් ඔන්න දෙස්තර මහත්තයා පිටත්වෙලා මිනිත්තු දහයක් උණෙත් නැහැ!" යි දෙස්තරම උත්තර දීලා කාර් එකෙන් පිටත් වෙලා ගොහින් රුපියල් හාරසීයක් ගාස්තුව වසයෙන් අයකරගෙන ආවා!"

අරවින්දට සිනාව මැඩගත හැකි නොවී ය.

"කවුදෝ මසුරෙක් ගොතාපු හැල්ලක්" යි අනිකෙක් කීවේ ය.

"හොරකමෙන් සල්ලි ගරාගත් මුදලාලි කෙනෙකුගෙන් අන්තිම මොහොතේ ඒ හාරසීය ගත්තු එක වැරදි නැහැ!" යි තවත් එකෙක් කී ය.

කෝපි බිවූ පසු කාන්තාවෝ ද පිරිමින්ගෙන් වැඩිදෙනෙක් ද නැඟී නැටුම් හල කරා ගමන් කළෝ ය. නැටුම් බිමට බට ගැ පිරිමි යුවළ රාශියක් යුගත් පද්දමින් පා නඟන්ට වූහ. මදිර දෙමාලසිංහ නෝනා ඇගේ පරණ යාළුවාගේ අතේම එල්ලි නැටුම් බිමට බැස්සාය. මංගලිකා සැවුළුගල. නැටුම් බිමට බැස්සේ චප්රින් සමඟ ය.

"චප්රින් මංගලිකාට අහු වෙලා" යි චමරි කීවා ය.

අරවින්ද සිනාසුණේ ය.

Scanned by CamScanner

"දැන් එයා නිතරම කාලය ගෙවන්නේ මංගලිකා සමඟ."

"වජිරින් හෝටලේ නවතින්න යනවාට සර් නිවටන් විරුද්ධ වෙලා වජිරින් එක්ක සංඩු උණායයි මදිරා දෙමාලසිංහ දවසක් මම එක්ක කීවා."

නීලාගේ කටින් මේ වදන් පිටවූයේ ශෝකාකුල ස්වරයෙනි.

"මංගලිකාට අහුවෙන මිනිහෙක් ලෙසියෙන් බේරෙන්නේ නැහැ" යි අරවින්ද කී ය.

"අරවින්ද දන්නේ කොහොමද? අරවින්ද එයාට අහුවෙලා යන්තම් බේරුණා ද?" යි අසමින් චමරී සිනාසුණා ය.

"අහුවෙන්ට ගියා!" යි නීලා කීවා ය.

"අරවින්ද කම්කරු හවුලට විරුද්ධව සාක්කි කියන්ට යනවා ද?" යි චමරී ඇසුවා ය.

"කාටවත් විරුද්ධව කියන සාක්කියක් නෙවි. ඒක ලොකු සාක්කියකුත් නෙවි. තිස්ස ඉස්පිරිතාලේදී කිව් කීමක් උසාවියෙහිදී කියන එක විතරයි."

"තිස්ස කිව් එක තාත්තා දැනගත්තේ කොහොම ද?"

"මම තාත්තාට කිවුවා."

"තිස්ස පසුව ඒ කීම බොරුය කිවුවා නෙවද?"

"ඔව, තිස්ස එහෙම කිවුවේ කම්කරුවන්ට අනුකම්පාවෙන් වෙන්න ඕනෑ."

"නැහැ" යි චමරී තරහයෙන් කීවා ය. "මාලින් අයියා කියන්නේ ඒක බොරුවක්ය කියා. තිස්ස ගේ අත කඩා තියෙන්නේ රතු බාස්ගේ මිනිහෙක්. මාලින් අයියාට ඒක හොඳටම විශ්වාසයි."

"ඒකේ වගක් මම දන්නේ නැහැ. මම කියන්නේ තිස්ස කිවු කීමයි."

"තිස්ස දැන් බොරුය කියන කීම උසාවියේදී කියන්නේ කුමටද?"

"චමරීගේ තාත්තාගේ ඕනෑකමට."

"තිස්ස බොරුය කීවොත් අරවින්දගේ කීම බොරු වෙනවා නෙව ද?"

"නැහැ. මම කියන්නේ තිස්ස කිවු කීම. ඒක ඇත්තද බොරුවද මම දන්නේ නැහැ."

"අරවින්ද ගැන වික්‍රමනායක සර් නිවටන්ට යෝජනාවක් කළා ද?"

"නැහැ."

Scanned by CamScanner

"අරවින්දගේ තාත්තා සර් නිවටන් හම්බ වෙන්න ගියා ද?"

"මම දන්නේ නැහැ."

අරවින්දට තම දුව විවාහ කර දෙන්ට සර් නිවටන් කැමැති ය. අරවින්ද පිළිබඳ යෝජනාව කරන ලද්දේ වික්‍රමනායක විසිනි. අනතුරුව වත්තුහාමි මුදලාලි සර් නිවටන් හමුවීමට ගොස් කතා බස් කොට අවසානයේ දැවැද්ද වශයෙන් මුදල් කොපමණ දෙනවාදැයි ඇසුවේ ය. සර් නිවටන් කිපී වත්තුහාමි මුදලාලිට හොඳටම බැණ 'ගෙයින් එළියට බහින්න' යයි අණ කෙළේ ය.

චමරී කියූ මේ කථාව ඇසූ අරවින්ද හොඳටම කෝප වී ය.

"කවුද ඔය බොරුව කිවුවේ?"

"මට කිවුවේ නීලා. නීලාට අහන්න ලැබී තිබෙන්නේ එයාගේ යෙහෙළියකගෙන්. ඒ ගැනිට කියා තියෙන්නේ මදිරා දෙමාලසිංහ."

"එයා පතුරුවා තිබෙන්නේ බොරුවක්; වික්‍රමනායකගෙනුත් මගෙනුත් පළි ගන්ට ගොතාපු කතාවක්."

චමරී කවුළුවෙන් එබී මහා පාර දෙස බැලුවා ය. වීථිය එළිය කරමින් විදුලි පහන් බබළයි. අහස, නිල්වන් ඇතුළු පටලයක් ඇති බුබුළක් සේ පිම්බෙයි. තාරකා ඒ බුබුළු තුළ වූ පණ ගැහෙන ඉස්ගෙඩියන් සේ සැලෙයි. වැළ නොකඩා ගමන් කරන මොටෝ-රියෙන් ලබන ගැහැටින් තොර වූ මහා පාර, රැල් බුරුල් නැති බුමුතුරුණු පටක් වැන්න. පාර දෙපැත්තේ තාවත්වන ලද දුවැන්ත මොටෝරථ දෙපේළිය ක්‍රමයෙන් කුඩා වීගෙන ගොස් නොපෙනෙන තරම් කුඩා රියවලින් කෙළවර වී ය. පාර අනික් පැත්තෙහි වූ දෙව් මැඳුරෙහි තොරණ අහසට නැඟුණු කොත් කැරැල්ලක් සේ චමරීට පෙනිණ. ගාළු මුවදොර ඉදිරියෙහි වූ පාර අනික් පැත්තෙහි පිහිටි ගෙවල් මුවා කෙරෙමින් හෙවුණු පඳුරු, පහන් කණුවලින් නික්මෙන එළිය නිසා පෙනෙයි.

නඟින බසින ගීතය පැතිරෙයි. ඔප් නගන ලද නැටුම් බිමෙහි පා තබන කාන්තාවෝ, තමතමන්ගේ සහකාරයන්ගේ අත්වල නැළවෙන්නාක් මෙන් සෙමින් යාත්‍රා කෙරෙති. අසුන්වල හිඳ-ගෙන කතා බහ කරන ඇතැම් කාන්තාවකගේ විජිනි පත සැලෙයි. ඇගේ ගෙල අලංකාර කෙරෙන රන් මාලයෙහි දියමන්ති කරාබු, රත් අඳුන් ගාන ලද දෙතොල් එළිය කෙරෙන කුඩා විදුලිය බුබුළු මෙන් රැස් කැන් විහිදයි.

වික්‍රමනායක මිතිසුන් හතර පස් දෙනකු අතර සිටිනු නීලා දුටුවා ය.

"අර ඉන්නේ වික්‍රමනායක!"

අරවින්ද වික්‍රමනායකට හඬ ගෑවේ ය.

"මම නටන්න—ඉගෙන-ගත්තා නම් අද මි–මංගලිකා සැවුළු-ගල නෝනාත් එක්ක නටනවා''යි වික්‍රමනායක කීය. "මම——එයා එක්ක— —කතාකර——කර ඉඳලා මේ පැත්තට—ආවා විතරයි.''

"නටන්න ඉගෙන ගන්න ඕනෑ නැහැ. දූන් ඔය නටන මහත්-තැන්ගෙන් හුඟක් දෙනෙක් නටන්න දන්නේ නැහැ. යන්න සැවුළු-ගල නෝනාත් එක්ක නටන්න. අපි බලා ඉන්න ආසායි'' චමරී කීවා ය.

"එයා පොහොසත්—මිනිස්සුන් යාළු කරගන්න—කැමතියි.''

"වික්‍රමනායකට හුඟක් සල්ලි තියෙනවා ද?''යි නීලා ඇසුවාය.

"මට සල්ලි කොයින් ද? මි—— මෙ දෙස්තර මහත්තයා— —තාත්තාට නම් හුඟක් සල්ලි තියෙනවා. සැවුළුගල නෝනා—දන්නවා——ඈත් මුදලාලි මගේ ——යාළුවෙක් වගේ!''

"එහෙනම් සැවුළුගල නෝනා වික්‍රමනායක යාළු කරගන්න හදන්නේ මුදලාලි හාදකරගන්න!''

"ඕ——ච''යි කියමින් වික්‍රමනායක හඬ නගා සිනාසුණේ ය.

"වික්‍රමනායක දෙඩවන්නේ නැතිව ඉන්නවා''යි අරවින්ද කීවේ ය.

"මි—මේ——දෙස්තර මහත්තයාගේ——තාත්තා ලොකු——නෝනලා අඳුනගන්න—ආසයි!''

"ඇත්ත!'' යි නීලා කීවා ය.

චමරී හොඳටම සිනාසුණා ය.

"වික්‍රමනායකට අද ටිකක් වැඩි වෙලා වගෙයි''කියමින් අරවින්ද රවා බැලී ය.

"නැහැ'' යි කියමින් වික්‍රමනායක හිසත් කඳත් කෙළින් කර ගත්තේ ය.

"වික්‍රමනායක සර් නිව්ටන්ගේ දූ ගැන යෝජනාවක් කළා ද?''

"ඔව්''.

චමරීත් නීලාත් සිනාසෙන්ට වූහ.

"තාත්තා දන්නවා ද?''

"තාත්තාට——මම පස්සේ කිව්වා——''

"තාත්තා සර් නිව්ටන් හම්බ වෙන්න ගියා ද?''

"නැහැ—කවදාවත්—ගියේ නැහැ.''

Scanned by CamScanner

''වික්‍රමනායක මොකොටද මගෙන් අහන්නේ නැතිව හිර කතාකරන්ට ගියේ''යි අරවින්ද කෝපයෙන් ඇසී ය.

මදිරා දෙමාලසිංහ නෝනා විසින් පතුරු වන ලද කතාව අරවින්ද කීය.

''හා——පෝයි!——හරි බොරුවක් නෙව පතල කරලා——තියෙන්නේ; බොරු——ඔක්——කෝම——බොරු——''

''නමුත් වික්‍රමනායක යෝජනාවක් කළ එක ඇත්ත!''

''ඔව්——ඇත්ත——එච්චරයි. මුදලාලිට කිව් එකත් ඇත්ත. සර් නිව්ටන් මැතිතුමා කැමැති උණු ඉකත් ඇත්ත. දෙස්තර මහත්තයාගෙන් අහන්න——බැරි උණ නිසා මම ගියේ නැහැ—''

''යන්න එපා''යි කියමින් අරවින්ද තර්ජන කෙළේ ය.

Scanned by CamScanner

# 20

තිස්ස ඉස්පිරිතාලෙන් පිට වූ තැන් සිට දෙසතියක් ගෙවුණු පසු කම්කරු හවුලට විරුද්ධව පවරන ලද නඩුව විභාග කරන ලදී. තමාට ගැසු එකා කවරෙක්දැයි නොදන්නා බව ඔහු නඩුකාරයාට කීය. තමාගේ අත කඩන්ට ඇත්තේ කම්කරු හවුලේ එකෙකියි ඉස්පිරිතාලයෙහිදී තමාට කියවුණේ එවේලාවේ හිතට නැඟුණු කෝපය නිසා විය යුතු ය. දිනෙත්ති රවිසේන විසින් තමාට ගහන්ට කිසිවකු මෙහෙයන ලදැයි යන කීම තිස්ස විශ්වාස නොකෙළේ ය.

නඩුකාරයා, කම්කරු හවුලේ නායකයාත් කම්කරුවන් දෙදෙනාත් නිදහස් කෙළේ ය.

නඩුවෙන් නිදහස් වූ නමුත් දිනෙත්ති රවිසේනගේ ආධිපත්‍යය බොහෙවින් අඩු වී ය. කම්කරු හවුලද බිඳ වැටිණ. වැඩ නැවැත්වූ කම්කරුවන්ගෙන් දෙළොස් දෙනකුන් හැර අන්‍යයන් පමණි කබලාන ආපසු වැඩට ගත්තේ. කම්කරු හවුල සුන්බුන් වූයේත් ඒ හේතුවෙනි.

බිඳ වැටුණු කම්කරු හවුල යළිත් නඟන ලද්දේ මාලින් විසිනි. කම්කරුවන් පමණක් නොව ඔවුන්ට අනුකම්පාව දක්වන මිනිස්සු ද මාලින්ට පැහැදුණෝ ය. කම්කරු හවුලෙන් ඈත් වූ දිනෙත්ති රවිසේන ටිකින් ටික කර්මාන්ත හිමියන් දෙසට ඇදෙන්ට වී ය. මාලින් කම්කරු හවුලේ නායකයා වීම නිසා බිය ගත් කබලාන, කම්කරු හවුල පරාජය කරනු පිණිස දිනෙත්ති රවිසේන අවියක් කොට ගැනීමට සිතාගත්තේ ය. චමරි තුළ මාලින්ට මහත් ඇල්මක් ඇති බවත්, ඈ ඔහුට උදවු කරන බවත් කබලාන දනියි. මීට පෙර මෙතරම් දරුණු අවස්ථාවකට මුහුණ නොපෑ කබලාන, වෙනදට වඩා පරෙස්සමින් ක්‍රියා කරන්ට සිතාගත්තේ ය.

මාලින් කම්කරු හවුලේ නායකයා වීම තමා ලත් පරාජයක් බව කබලාන දනියි. මෙතැන් සිට තමා සටන් කළ යුත්තේ කම්කරුවන් අතළොස්සක් සමඟ නොව මහා ජනයා ද සමඟ ය. තමාගේ පුතා විසින් පාලනය කරනු ලබන කම්කරු හවුල ගන්නා මඟ හරි වුවත් වැරදි වුවත් මහා ජනයාගේ සිත් ඇදෙන්නේ කම්කරු හවුල දෙසට ය. මාලින් කම්කරු හවුලේ ප්‍රතිපත්තිය ද සකස් කෙළේ ය. ගතානුගතික සමාජයෙහුත් සමාජයේ ආධිපත්‍යයට



Scanned by CamScanner

හසුවුණු ආණ්ඩුවෙනුත් පීඩා ලබන කවරකු උදෙසා වුව ද සටන් කිරීම මාලින්ගේ අලුත් ප්‍රතිපත්තිය විය.

ගතානුගතික නීති රීති නිසා පීඩා ලැබූවකු උදෙසා හටන් කරන කවර පුද්ගලයකුට වුව ද සමිතියකට වුව ද ඔහු උපකාර කෙළේ ය. ආණ්ඩුවේ අධිපතීන්ගේ ගතානුගතිකත්වයත් උදාසීනත්වයත් නිසා පීඩා ලැබූ පොලිසියේ සේවකයා, ලියන්නා යන ආදීන් උදෙසා ද ඔහු හටන් කෙළේ ය. හටන් කරන්නන්ට උදව් කෙළේ ය.

ගත් මග ගන්ට පුරුදු වූවෝ, සමාජයේත් ආණ්ඩුවේත් ගතානුගතිකත්වය නිසා මිනිසුන් විඳින පීඩා, නොදකිත්. ඒ පීඩා වහා දැකීමට පුරුදු වුණු ඇසුත් සිතකුත් තිස්සට ඇත්තේ ය. අන්‍යයන් පිස්සකු හෝ දිළින්දන්ගේ දෙස් දකින්නකු හෝ ලෙස සලකා නින්ද කොට බැහැර කළ තිස්සගේ හොඳ ගති මාලින් දුටුවේ ය. ඔහු උගත් කමින් හා තර්ක ඥානයෙන් දූෂණය වූ බුද්ධිය ඇත්තකු වුව ද ඒ නිසා වඩාත් නිර්මල වූ හදවතක් ඇත්තකු බව මාලින් ප්‍රත්‍යක්ෂයෙන් දනියි. කබලාන විසින් අල්ලසක් වශයෙන් දෙන ලද රුපියල් පන්සිය තිස්ස කම්කරු හවුලට පිදුවේ අස් කරනු ලැබූ කම්කරුවන්ට උපකාර කරනු පිණිස ය.

මාලින් ක්‍රමයෙන් ජන ප්‍රිය පොදු ජන නායකයකු වනු දුටු කබලානත් කර්මාන්ත හිමි අනිත් ලාංකිකයෝත් තැති ගත්හ. යුරෝපීය කර්මාන්ත හිමියන් මාලින්ගේ ආධිපත්‍යය නිසා තැති නොගත් නමුත් පාලන බලය අතට ගත් පක්ෂය ද තැති ගත්හ.

අස්කරනු ලැබූ කම්කරුවන්ගෙන් දස දෙනකුන් යළිත් වැඩට ගතයුතුයයි කම්කරු හවුල වෙනුවෙන් කබලානට යෝජනා කරන ලදී. කබලාන ඒ යෝජනාවට විරුද්ධ වූයේ ය. කම්කරු හවුලත් කබලානත් අතර ලියුම් කිහිපයක් ගනුදෙනු වී ය. මාලින්, දිනෙත්ති රවිසේන මෙන් වහා කිපෙන්නකු නොවන බව ඒ ලියුම් ගනුදෙනුවෙහිදී කබලාන වටහා ගත්තේ ය. කිසිම නින්දවකින් කුප්පන්ට බැරි තිස්ස වැනි නරුමයකු මාලින්ට එක්වීම නිසා කබලාන කම්කරුවන් අරබයා වෙනදට වඩා ඉවසිල්ලෙන් ක්‍රියා කරයි. අවසානයේ කබලාන කම්කරුවන් දසදෙනා වැඩට ගත්තේ එය තමා ලැබූ පළමු වන පරාජයය යන හැඟීමෙන් තොරව නොවේ.

කබලානගෙන් අනුබල ලැබූ දිනෙත්ති රවිසේන අලුත් සමිතියක් ආරම්භ කෙළේ ය. ඔහු, කර්මාන්ත හිමියන් හා සටන් කරනු වෙනුවට ඔවුන් හා හාදව කම්කරුවන්ගේ අයිතිකම් රැකීමට වෑයම් කෙළේය. 'වෙස් වලා ගත් ධන හිමියෙකි' යි කියමින් ඔහු මාලින්ට පරිභව කෙළේ ය. තිස්ස ගුණ දහම් හා ආගම ද ජාතියද බැහැර කොට ජීවත් වන භයානක මිනිසෙකි.

Scanned by CamScanner

ගමබද ජනකාය ගැන කිසිවක් නොදත් මාලින්ට තිස්ස හොඳ අනුශාසකයෙක් වී ය. ඔහු දිනෙත්ති රවිසේනත් කබලානත් කම්කරු හවුල නටබුන් කරන්ට අටවන උගුල්වල හසු නොවූයේ තිස්ස නිසා ය.

“මාලින් ගම්වල මිනිස්සුන් ගැන කිසිවක් දන්නේ නැ”යි තිස්ස කී ය.

“කොළඹ වැඩ කරන්නේත් ගම්වලින් ආ සිංහල මිනිස්සු නොවේද”යි මාලින් ඇසුවේ ය.

“නැහැ” යි තිස්ස කී ය.

නගරයේ වාසය කරන ධනවතුන් පමණක් නොව මැද පන්තියේ මිනිසුන් ද ඇඳුමෙන් පැළඳුමෙන් බසින් කම්කරුවන්ට වෙනස් වෙති. ඔවුන් දෙගොල්ල වාසය කරන්නේ එකම ජාතියක මිනිසුන් ලෙස නොව දෙබසක් කතා කරන ජාති දෙකක මිනිසුන් ලෙසිනි. නගරයේ ධනවතුන් වාසය කරන්නේ කම්කරුවන් අතර නොව ඔවුන්ට බොහෝ ඈතිනි. මේ කරුණු නිසා කම්කරුවෝ ගැමියන් නොදත් විරූ නොඇසූ විරූ බොහෝ පීඩා ලබති. ද්වේෂයෙන් මඩනා ලද ඔවුන් ප්‍රකෝප කිරීම පහසු ය.

“ගම්වල ජනයා මොවුන්ට වෙනස්ය” යි තිස්ස කී ය.

“ගම්වල ජනයාට උගන්වනවා” යි මාලින් කී ය.

“ඔවුන්ට ඉගැන්වීමෙන් ඔවුන්ගේ පරිසරයත් අතීතයත් ලෙහෙසියෙන් වෙනස් කරන්ට බැහැ. ගම්වල ධනවතුන් ඉස්සර ඇන්දේ සරම පමණි; සමහරු සරමක් හැඳ සරමක් කරට දමාගත්තා. දුප්පත් ගැමියාගේ ඇඳුමත් සරම තමා. ගමේ ධනවතා කතා කරන්නේ සිංහල. එය දුප්පතාගේ ද බාසාවයි. අවුරුදු දවස්වල ගමේ ධනවතුන්ගේ දරුවන් දුප්පතුන්ගේ දරුවන් හා එකට කනවා; එකට සෙල්ලම් කරනවා. කම්කරුවන් තුළ මෙන් ගැමියන් තුළ ධනවතුන්ට ද්වේෂයක් හට ගන්නේ නැහැ. ගැමියන් දිළිඳු කමින් පීඩා විඳින බව ඇත්ත. එහෙත් නගරයේ දිළින්දන් මෙන් ඔවුන්, තමන් පීඩා විඳින බව දන්නේ නැහැ.”

“නගරයේ ධනවතුන්ගේ දෙස් කියන කොට ඔවුන් කෝප වේවි” යි කියමින් මාලින් තර්ක කෙළේ ය.

“නැහැ.”

“සමාජ වාදයය කියන්නේ කුමක්දයි අපි ඔවුන්ට කියනවා.”

“ඒක මහ මෝල් වැඩක්!” යි තිස්ස කෝපයෙන් කී ය. “මාලින් එංගලන්තයේ විශ්ව විද්‍යාලයෙන් උගත් අර්ථ ශාස්ත්‍රය ද ඔවුන්ට කියන්ට යන්නේ? ඔවුන්ට අර්ථ ශාස්ත්‍රය උගන්නන්ට පුරවන් තම එළදෙනුන්ට ගණිතය උගන්වන්ටත් පුළුවනි! ඔවුන්ට

Scanned by CamScanner

ඔනෑ මාලින්ගේ සමාජ වාදය නෙවි. පණ්ඩිතයන්ගේ අර්ථ වාදය නෙවි. කන්න ආහාර; අඳින්න රෙදි; ලෙඩට බෙහෙත්; හොඳ උගැන්ම. පොතේ ගුරුන්ගේ පණ්ඩිත කම් කියා උන් දූෂණය කරන්ට එපා.''

''ඒවා සපයා දෙන්න තමයි අපි ඔවුන්ට සමාජවාදය කියනනේ''

''සමාජ වාදය උගැන්මෙන් සන්තෝෂය ලැබිය හැක්කේ කෑම බීමත් වස්තුවත් ඇති අහංකාර උගත් මිනිසුන්ට විතරයි.''

''තිස්ස කතා කරන්නේ මහා නරුමයෙක් වාගේ. තිස්ස පීඩා විඳින මිනිසුන් බලා සන්තෝෂ වෙනවා. තිස්ස නිරර්ථක බියසුලු ආත්මාර්ථ කාමියෙක්. ඇයි තපසට නොයන්නේ!''

''ආත්මාර්ථ කාමියෙක් නිසා!''

''තපසට යන්නේ පළමුවන පන්තියේ ආත්මාර්ථ කාමීන් තමා!''

''මිනිස්සුන්ගේ ඔලු පළා ලේ හලා මිසක් නැතිව සමාජය සකස් කරන්ට බැරිය කියන මිනිස්සුන් පමණක් ද නිර්භයව පොදු ජනයාට සේවය කරන්නේ? අනුකම්පා කරන්නේ?''

''තිස්ස අනුකම්පා කරන්නේ සිතින් පමණයි. අනුකම්පාව ක්‍රියාවට නැගිය යුතු අවස්ථාව පැමිණියාම තිස්ස වැනි මිනිස්සුන් පැස්බරුන් වගේ අහිංසා වැල්ලෙහි හිස් ඔබාගන්නවා!''

''මාලින් ඉදිරියට යන්නේ කඩුව හොටෙන් අරගෙන ද? නැති නම් පිහාටු දෙකින් අරගෙන ද? මාලින් ගිරවෙක් වගේ දෙඩනවා.''

තිස්ස තවත් කුප්පන්ට නොසිතූ මාලින් කර බාගත්තේ ය.

Scanned by CamScanner

# 21

නගරය වසා පැතිරෙන අඳුර ක්‍රමයෙන් දැඩි වෙයි. පැළඳිගින් නැඟුණු වලාකුළු, කළු දළ මහා වියන් පටක් මෙන් අහස වසා ගත්තේ ය. දවැන්ත සර්පයකු දික් කළ දෙදිව මෙන් අඳුර විදගෙන පත් වූ විදුලිය සැණකින් අතුරුදහන් වී ය. අජන්තා නිශාන්තයෙහි රැස්ව උන් ඇතැම් කතුන් නැති ගන්වමින් සෙණ හඬ පිපිරිණ. විදුලිය පහන්වලින් නික්මෙන දරා එළිය ද සැලිණ. වියන් තලය දෙදරිණ. විදුලිය බුබුළු ද සෙලවිණ. බොරලු අහුරු මෙන්, වහලෙහි පොකුරු වැහි වැටෙන්ට වී ය.

මිනිත්තු පහළොවකින් ඒ අකල් වැස්ස නැවතිණ. පිටත වූ දැඩි අඳුර ක්‍රමයෙන් තුනී වෙයි. පාරෙහි ගමන් ගත් මොටෝරථ නගන ඝෝසාව යළිත් ඇසෙයි. කැඩී බිඳී ගිය තැන්වල පිරුණු වැහි වතුර රථ රෝදවලට හසුව හඬ නගමින් විසිරෙයි.

ගැහැනුන් ද පිරිමින් ද දෙතුන් දෙනා බැගින් අරක් නොගත් එකම මේසයකුදු අජන්තා නිශාන්තයෙහි නොදක්නා ලදි. අරවින්ද හා වජිරින් යන දෙදෙනා විසින් අරක් ගත් මේසය එහි දකුණු පැත්තෙහි මුල්ලක වී ය.

"වජිරින්ට ගෙදර එපා වෙලාද" යි අරවින්ද ඇසී ය.

"නැහැ. මට ඕනෑ නිදහස."

"ගෙදර උන්නාම නිදහස නැති වෙන්නේ කොහොමද?"

"ගෙදර උන්නාම මට ඕනෑ විදියට ඉන්න බැහැ. මට ඕනෑ කෙනෙක් ගෙදරට එක්ක යන්න බැහැ. මට හිතුණු වෙලාවට යන්න බැහැ. තාත්තා හරියට නියම වේලාවට කනවා; නියම වේලාවට නිදගන්නවා; නියම වේලාවට වැඩ කරනවා."

"එහෙනම් වජිරින් කසාද නොබඳින බව කියන්නෙත් නිදහස නැති වන නිසා!"

"ඔව්-ගෑනියෙක් කසාද බැඳලා මට එයා බල බලා ඉන්න බැහැ. මට ඕනෑ ගෑනියෙක් එක්ක යන්න එන්න ආශ්‍රය කරන්න නිදහස තියෙන්ට ඕනෑ."

"එහෙනම් වමරි බඳින්ට කැමැත්තෙත් උන්නේ!"

වජිරින් සිනාසුණේ ය. අතකුරුව ඔහු සිගරැට්ටුව උරා උඩ බලා සිලිම දෙසට දුම් වලා පිට කෙළේ ය.



Scanned by CamScanner

''කැමැති උණේ නැන්දගේ වදේට.''

''දෙමාලසිංහ නෝනාගේ.''

''ඔව්; චමරී බැන්ද නම් මම එයාට ලැදිව ඉන්නේ තුන් මාසයයි!''

''එක ගැනියෙකුට තුන් මාසෙකට වඩා ආදරේ කරන්ට බැරි ද?

''ඇයි බැරි?''යි කියමින් වජිරින් සිනාසුණේ ය. ''මට ඕනෑ ගැනියෙක් ආශ්‍රය කරන්ට ඉඩ දෙනවා නම් පුළුවනි. නමුත් විවාහ උණාට පස්සේ ගැනියෙක් ඒකට ඉඩ දෙන්නේ නැහැ.''

''ඇයි නොදෙන්නේ? ඉස්සර කාලේ පොහොසත් මිනිසුන්ට අන්තඃපුරය බැගින් තිබුණේ කොහොමද?'' යි කියමින් අරවින්ද සිනාසුණේය.

''ඒ ඉස්සර කාලේ.''

''පිරිමින්ගෙන් සියේට අනූවකටත් වඩා කසාද බැඳලා සන්-තෝසෙන් ඉන්නවා නෙවැ.''

''බොරු! කසාද බැඳපු පිරිමින්ගෙන් සියේට අනූ දෙනෙක් කල්යවන්නේ සන්තෝසෙන්ම නෙවී.'' යි කියමින් වජිරින් සැන්ඩ-විච් එකක් කෑවේ ය.

ගෑනු සොඳුන්ට හිමි කුරිරුකම ප්‍රකට කෙරෙන දෙතොලත් කට කොනුත් ඇති වජිරින්ගේ මුහුණ ගෑනුන්ගේ සිත් අද්දන්නකි. චමරී මොහුට කැමැති නොවූයේ කුමක් නිසා ද?

''පිරිමින්ගෙන් සියේට අනූදෙනෙක් කුහකයන් බව මම දන්නවා. ඔවුන් වෙන ගෑනුන් ආශ්‍රය කරනවා. වෙන ගෑනුන් පතනවා. නමුත් ඒ සියල්ල සඟවාගෙන එක ගැනියක් පතන්නන් බව කියනවා.''

''වජිරින් කියන්නේ පොහොසත් මිනිසුන්ගෙන් සියේට අනූදෙනෙක් ගැන ද? නැති නම් පොදුවේ මිනිසුන්ගෙන් සියේට අනූදෙනෙක් ගැන ද?''

''මම කියන්නේ පොහොසත් මිනිස්සුන් ගැන. මම දන්නේ ඔවුන් විතරයි.''

''විවාහ වූවන්ගේ චිත්ත චෛතසික විභාගය වජිරින් විතර මම දන්නේ නැහැ''යි කියමින් අරවින්ද සිනාසුණේ ය.

''ඒ බොරු! අරවින්ද වගේ සමර්ථ දෙස්තර කෙනෙක් ඒ විභාගය මට වඩා හොඳින් දනගන්ට ඕනෑ. තමා ආසා කරන ගෑනුන්ට හිංසා කිරීමෙන් සන්තෝෂ වන්නේ දඩි රාගයෙන් පෙළෙන මිනිසුන් පමණක්යයි අරවින්ද හිතනවා ද? ඉතාම හොඳ ආදරවන්තයා උණත් තමාගේ බිරින්ද කොනිස්සීමෙන් මිරිකීමෙන්

එකීමෙන් සන්තෝෂ වෙනවා! ඒක හිංසා කිරීමෙන් ලබන සන්තෝෂයක් නෙවිද?''

''වජ්රින් දැන් කතාකරන්නේ දර්ශන වාදියෙක් වගේ නෙවැ'' කියමින් අරවින්ද සිනාසුණේ ය. ''ගැනු සොඬුන් වජ්රින් වගේ තාර්කිකයන් උණොත් වන්නේ මහා විපතක්!''

''තව අවුරුදු සීයකින් උගත් පිරිමින්ගෙන් සියේට අනූවක් පමණ තර්කයෙහි ගුර ගැනු සොඬුන් වන්නේ නැතැයි සහතික කොට කියන්ට පුළුවන් ද?''

බැළලියක් ඇතැම් විට තමා වැදූ පැටියා කයි. ඇ තම දරුවා කන්නේ ආදරය නිසා ද? මකුළුවා හා රාගයෙන් බැඳී එක්වන මැකිළිය ඇගේ වල්ලභයා කාදමයි. ඇ එසේ කරන්නේ තම වල්ලභයාට හිංසා කිරීමෙන් සන්තෝෂ වන නිසා ද? තමා නිසා ඇත කොටා ගන්නා පිරිමි සතුන් බලා සන්තෝෂ වන ගැනු සත්තු තිරිසන් ලොව බහුල වෙතියි කියමින් අරවින්ද තර්ක කෙළේ ය.

''අරවින්ද තර්ක කරන්නේ තමන්ගේ ආදරවන්තයන්ට හිංසා කිරීමෙන් ගැනුන් සන්තෝෂ වෙනවායයි ඔප්පු කරන්නද''යි වජ්රින් ඇසුවේ ය.

''නැ! මම ඒ කරුණු කීවේ මට ඒවා මතක් උණු නිසා. ඒ කරුණු අනුව අනුමාන මත පහළ කිරීම ගැනු සොඬුන් සතු කාරියක්'' යි කියමින් අරවින්ද සිනාසුණේ ය.

''ගැනු සොඬකු වන්ට ඕනැ සියලු ගති අරවින්දගේ යටි සිතේ තියෙනවා. ලජ්ජාවත් බයත් නිසා අරවින්දගේ යටි සිතෙන් උඩට එන්නේ නැහැ.''

''එහෙනම් වජ්රින් කියන්නේ මමත් උත්පත්තියෙන්ම ගැනු සොඬෙක්ය කියා ද?''

''ඔව්.''

''වජ්රින් නිතර පාර දිහාව බලන්නේ මොකොට ද? කවුද බලා පොරොත්තු වන්නේ?''

වජ්රින් සිනාසුණේ ය.

''මම වජ්රින් එක්ක කතා කර කර ඉන්න එක බාධාවක් නම් මං නැගිටලා යන්නම''යි අරවින්ද යළිත් කී ය.

''එපා.''

''වෙනද වජ්රින් මෙහි දකින්ට ලැබෙන්නේ මංගලිකා සැවුළු එක්ක. පාර බලන්නේ එයා එනවා දකින ආසාවෙන් ද?''

''නැහැ.''

'අද වජ්රින් බලා ඉන්නේ අනික් යහළු ගැහැනියක එනතුරු' යයි අරවින්ද සිතුවේ ය.

අජන්තා නිශාන්තයේ රඟ මඩල දෙසින් ගීත නාදය නැඟී පැතිරෙයි. රඟ මඩලට පිවිසි අයිරින් සහ ඩයනා යන ඉංග්‍රීසි නාටිකාංගනාවෝ නැටුමක් දක්වන්ට වූ හ. ගැහැනු ද පිරිමිහු ද නැඟී රඟ මඩල දෙසට ගියෝ ය. වජ්රින් සහ අරවින්ද ඇතුළු දහ දෙළොස් දෙනෙක් උන් උන් තැන්වලම උන්නෝ ය.

''ගැනුන් හාද කරගැනීම මෙතරම් පහසු යයි මම කලින් හිතුවේ නැහැ.''

වජ්රින් මේ වචන කීවේ පුරසාරම් දෙඩීමට ප්‍රස්තාවනාවක් වශයෙන් බව අරවින්දට වහා වැටහිණ.

''වජ්රින් කියන්නේ මංගලිකා ගැන ද?''

''නැහැ'' යි කියමින් වජ්රින් අරවින්ද දෙස බැලුවේ ඔහුට අවඥා කරන්නාක් මෙනි. ''මංගලිකාගේ සිත ගන්න මට ඕනෑ කෙළේ නැහැ. මංගලිකා මගේ සිත ගත්තා. මංගලිකාට මගේ සිත ඇදී ගියේ ඇගේ මුහුණත් බැල්මත් නිසා නෙවි. එයාගේ ඇඟට අත ගැහු මිනිහකුගේ සිත කාන්දමට ඇදෙන ඉඳිකටුවක් වගේ ඇදෙනවා.''

මංගලිකා හා වොල්ට්ස් නැටුම් නැටූ දවසේ තමා ඇගේ වහලකු කරන තරම් ආසාවක් තමා තුළ උපන් හැටි අරවින්ද සිහි කෙළේ ය. ඔහු ඈ ඇරලවන ව්‍යාජයෙන් ඈ සමඟ හෝටලයට ගොස් අනතුරුව දවසක ඈ හමුවීමට ගියේ ය. ඉන්පසු බියගත් අරවින්ද ඇගේ අහර-දහර අමතක කෙළේ ඉතා අමාරුවෙනි.

''වෙන යාළුවන් ආශ්‍රය කරනවාට මංගලිකා අසතුටු නැද්ද?''

''නෑ.''

නීලා ගැන සිතූ අරවින්ද කනගාටු වූයේ ය. ඈත් මොහුට හසුවෙයි ද? වජ්රින්ට ආලය කරන ඈ දැනුදු සිතන්නේ ඔහු විවාහ ජීවිතයට ඇතුළත්ව එකම බිරින්දකගේ සමාගම සෙවීමෙන් සන්තෝෂයෙන් වසන්ට ආසා ඇත්තකු කොට ය. වජ්රින් කාන්තාවන්ගේ සමාගම ප්‍රිය කරන්නේ ඔහුගේ සිත ගත් ස්ත්‍රියක ඔහුට හමු නොවූ බැවිනි. එහෙයින් ඔහුගේ සිත තමා කෙරෙහි රඳවා ගැනීම තමාට අපහසු කාරියක් නොවේය යනු නීලාගේ බොළඳ හැඟීම බව අරවින්ද සිහි කෙළේ ය.

''නීලා හොඳටම ආදරෙන් හිටි බව වජ්රින් දන්නවා ද?''

''නෑ. නීලාට ඕනෑ කරන්නේ කසාද බැඳලා ආදර බස් තෙපලමින් ගෙදර නැවතී ඉන්න මිනිහෙක්. මම නීලා මඟ ඇරියේ ඒ නිසා.''

Scanned by CamScanner

"ඇගේ යහළුකම පතන්නේ නැද්ද?"

"නීලා මා හා යහළු වීමට පතන තරුණියක නොවේ; මා සැමියා කරගන්ට පතන තරුණියක්. මම ඇගෙන් ඈත්වෙන්නේ ඒ නිසා."

කදිම තරුණියක තමන්ගේ මේසය කරා එනු දුටු වජ්රින් පමණක් නොව අරවින්ද ද නැඟී සිටියේ ය.

"මිනී එන කල් බලා උන්නා" යි වජ්රින් කී ය.

අරවින්ද දෙස බලා අනතුරුව වජ්රින් දෙස බැලූ ඇගේ දෑනෙතට නැඟුණේ ප්‍රශ්නයක් අසන්නකුගේ කුහුල පළ කරන බැල්මකි.

"මේ දොස්තර අරවින්ද විහාරහේන——මගේ යාළුවෙක්—"

අරවින්ද හිස නමා ආචාර කෙළේ ය.

"ඕ! දොස්තර විහාරහේන ද? සැත්කමට ශූරයකු ලෙස දූන් කා අතරත් ප්‍රකටයි" කියමින් මිනී පුටුවෙහි වාඩි වූවා ය.

ඇගේ මුහුණ සීන් ය. සුන්දර ය. දත් දෙපෙළම එක සේ සීන්ය. දෙබැම වෙනුවට ඇගේ ඇස් සෙවණ කරන්නේ අඳුන්වන් රේඛා දෙකකි. ඇගේ දෑතෙහි නිය පොතු උඩ රට ලැකර් සායමින් ඔප්නඟන ලද බොත්තන් මෙන් දූඩි පැහැයෙන් බබළයි. ඈ කථා කරන්නේ මඳක් හිස සලා සිනාසෙමිනි. සුන්දර නැහැයකුත් කටකුත් ඇති ඈ තරුණ විය ඉක්මවූ අවිවාහක ස්ත්‍රියක් ද නොඑසේ නම් විවාහක ස්ත්‍රියක් ද යනු අරවින්දට නිශ්චය කළ නොහැකි වී ය. වජ්රින් වඩාත් සන්තෝෂය ලබන්නේ විවාහ වූ ස්ත්‍රීන් හාද කර ගැනීමෙන් බව අරවින්ද දනියි.

පලතුරු ඉස්ම වීදුරුවෙන් ඇබිත්ත ඇබිත්ත බොන්ට වූ මිනී, ඉඳහිට කතා කළා ය. එහෙත් වරින් වර ඈ වජ්රින්ගේ මුහුණ බලනු දුටු අරවින්ද මෙසේ සිතීය: 'මෑ වජ්රින්ගේ මුහුණ බලන්නේ මේ දොස්තර ගෙන්වූයේ කුමටදැයි අසන්ට වෑයම් කරන්නාක් මෙනි.'

"අරවින්ද යන්න ද?"

"ඔව" යි කියමින් අරවින්ද මිනීට ආචාර කෙළේ ය.

අජන්තා නිශාන්තයෙන් පිට වූ අරවින්ද, තමාගේ මොටෝරිය කරා ගියේ ය. පැල්ලම් වැනි කළු වලා කඩින් සඳ මඩල වරින් වර වසයි. නිවෙමින් පත්තු වන විදුලිය පන්දම් එළියට හසුවන්නාක් මෙන් අඳුර වරක් තුනී වෙයි; වරක් දූඩි වෙයි. අතුපතර අතරින් ඇදෙන සඳරැස්, රිදී පැල්ලම් සේ රැප්පා එළිය කරමින් බබළයි. මද වැස්සෙන් තෙමුණු පොළොවෙන් දුඹුල් සුවඳ නඟියි. වාතය සිහිල්ය. අරවින්දගේ මොටෝරියේ ඇන්ජිම සෙමින් හඬ නැඟී ය. කමපු දෙකින් රිදී හී මෙන් විදුණු එළිය දරා රැප්පා එළිය කරමින් ඇතිරිණ.

# 22

වැඩ නැවැත්වූ කම්කරුවන් ඇතුළු දස දහසකට වැඩි පෙරහැරක් පෙරමුණේ මාලින් හා ඔහුගේ සහකාරයෝ ද ගමන් කරති. යුරෝපීය කර්මාන්ත ශාලාවක කම්කරුවන් ටික දෙනකුගේ වැඩ නැවැත්වීමෙන් හටගත් අවුල මෙවැනි මහා පෙරළියකට හැරෙතියි මාලින් සිහිනෙනුදු නොසිතුවේ ය. ඒ කම්කරුවන් ටික දෙනා වැඩ නවත්වන ලද්දේ කුමක් නිසාදැයි මාලින් දැන ගත්තේ ද දවස් කිහිපයකට පසු ය.

තවත් කම්මලක කම්කරුවෝ ඒ ටික දෙනාට එක්වූහ. ඒ කර්මාන්ත ශාලාවේ අනික් කම්කරුවන් වැඩට නොගියේ වැඩ නැවැත් වූ කම්කරුවන්ට බියෙනි. සුළු කර්මාන්ත ශාලාවක කම්කරුවන් මෙසේ වැඩ නැවැත්වීම නිසා හටගත් උනන්දුව ළැව්ගින්නක් සේ පැතිරිණ. දහ දවසක් ඇතුළත කර්මාන්ත ශාලා දෙළහක පමණ කම්කරුවෝ වැඩ නැවැත්වූහ. එක පිට එක නැගෙන රළ පෙළ මෙන් මහත් උනන්දුවකින් නඟින ජනකාය දුටු මාලින් ද සාහසික වේෂයක් ගෙන ඔවුන් තවත් උනන්දු කෙළේ ය.

ජය ගත් සේනාවක් මෙන් ගමන් කළ ජනකාය නූගත් දිළිඳු මිනිසුන්ගෙන්ම සැදුණක් නොවී ය. කිලිටි සරමෙන් සෙළුව ද බැනියමෙන් උඩු කය ද වසාගත් මිනිසුන් සමඟ උරෙන් උර ගැසී ගමන් කළවුන් අතර කලිසන් කෝට් හැඳගත් ලියන්නෝ ද විද්‍යාලයවල ගුරුවරු හා උගන්නා තරුණයෝ ද සුළු වෙළෙන්දෝ ද වූහ. පොලිසිය වුවද සටනට කැඳවන තරම් එඩිතර කමකින් ඔවුන් එක්වූයේ, නූගතුන් කරන ගාලාගෝට්ටිය නිසා උපන් කුහුල විසින් එළවනු ලැබූ අශික්ෂිතයන් ලෙස නොවේ. ඇතැම්හු දිළිඳුකමත් තමන් විඳින පීඩාත් මෙනෙහි කිරීමෙන් කිපී නැඟුණු ජනයා ය. මවුපියන්ගේ ආධිපත්‍යය මෙන් ගුරුවරුන්ගේ ආධිපත්‍යය නිසා කිපුණෝද ලොකු මිනිසුන්ගේ අහංකාර කම් දැක, නින්ද අසා කළකිරුණෝ ද සැමියන්ගේ හා මවුපියන්ගේ ආධිපත්‍යය කන්දෙස්කිරියාවක් ලෙස සලකන කාන්තාවෝ ද ඒ ජනකාය අතර වූහ. මවුපියන් අතර වැඩිහිටියන්ගේ ආඥා චක්‍රය ද ආණ්ඩුවේ නීති හා සමාජ නීති ද ඉක්මවන්ට ලැබීම ගැන ඔවුන්ගෙන් වැඩි දෙනා ඒ වේලාවේ සන්තෝෂ වූයේ මවුපියන් නිතර එපාය කියන දේ කිරීමෙන් සන්තෝෂ වන කුඩා දරුවන් ලෙසිනි.



Scanned by CamScanner

''එහෙම කරන්න එපා මෙහෙම කරන්න එපා'' යන ඇණවීම, කීකරුකම, යුතුකම ගරුකිරීම, පිදිය යුත්තාට පිදීම අරබයා කෙරෙන මහා ඝෝෂය; විදේශිකයන් අනුකරණයටත් බලතල හා නම්බු නාම ගසාගැනීමටත් එකිනෙකා කුළල් කමින් කරන පොරයද නිසා කිපී කලකිරුණු මිනිසුන් හා ගෑනුන් ද එක් කරගෙන නැඟුණු දිළිඳු ජනයා රජුන්ගේ කායික වධය ඉවසිය නොහැකිව නැඟුණ-වුන්ට නොදෙවැනි සාහසික වේෂයක් ගත්හ.

පොලිසිය විසින් නවත්වනු ලැබූ පෙරහැරෙහි නොසන්සුන් කම, සුළඟින් ඇළලුණු මුහුදෙන් නැඟී දිවෙන කුඩා රළ පෙළක් සේ දිවී ය. මාලින් ක්‍රියා කරන්නේ මේ රළ පෙළ මුදුනෙහි අරා සිටි ඉපිල්ලක් ලෙසිනි. මේ ජනකාය නඟින බසින සැටියෙන් මාලින්ද නැංග යුතු ය; බැසිය යුතු ය. මිනිසුන්ගේ හිස නැටෙයි; අත් ඉස්-සෙයි; කටවල් ඇරෙමින් පියවෙයි, ඝෝෂාව ක්‍රමයෙන් නඟියි. ක්‍රමයෙන් සාහසික වේෂයක් ගන්නා ජනකාය දුටු පොලිස් භටයෝ, බැටන් පහරින් ඔවුන් විසුරුවන්ට තැත් කරති. වී කෙටෙන තැනක නඟින බසින මෝල්ගස් මෙන් බැටන් පොලු උඩ ගොස් පාත් වෙයි; බොල් හඬ නඟියි; ලේ ගැලෙන තුවාලයක් ඇති එකෙක් අපසු දුවයි; තවත් එකකුගේ හිසෙහි වැදුණු බැටනය දෙදරිණ; පොල් බිඳෙන හඬ නැඟිණ. මිටියෙන් තැළුණු රත් යවටයෙන් මෙන් ඔහුගේ දෙනෙතින් ගිනි පුපුරු විසිරිණ; දත් සැපිණ; සිත දැඩි වත්ම අත් පා හා කය ද යකඩෙන් තැනුණු දේ මෙන් දැඩි වීය. මිට මෙලවුණු ඔහුගේ අත යකුලක් මෙන් පොලිස් භටයාගේ මුහුණෙහි වැදිණ; නැහැයෙන් ලේ ගැලී ය. හිස් ගොඩට උඩින් ආ ගලක් තවත් පොලිස් භටයකුගේ නළලෙහි වැදිණ; ඔහුගේ වම් අත, නළල් තළයෙන් නැඟුණු බුබුල හසු වී ය. ලේ සහිත ඇඟිලි තුඩු දුටු ඔහුගේ කෝපය නැංගේය. උඩ ගොස් පාත්වුණු හැකුණු අතෙහි බැටනය කලහකාරයකුගේ හිසෙහි වැදී දෙදරා යළිත් උඩ ගියේ ය. දිවි පුදන්ට වුව ද ඉටා ගෙන නැඟි නැඟී එන ජනකායගේ භයංකාර වේශය දැක තැති ගත් පොලිස් භටයෝ පසු බසින්ට වූහ. පොත් සිගරැට් ටින් සැරයටි හා ගල් ද හිස් ගොඩට උඩින් දිවෙයි.

කම්මුල ඔස්සේ ගලන ලේ පටක් ඇති, පදම් වුණු ඩාදියෙන් හා දූවිල්ලෙන් විවර්ණ වූ, මාලින්ගේ මුහුණ ඇතැමුන් දුටුවේ දරුණු වේශයකිනි. වඩාත් සාහසික වෙස් ගත් කිහිප දෙනෙකුගෙන් පහර ලැබූ පොලිස් භටයකු කෝප වුණු මිනිසුන් විසින් පාගා මරනු වැළැක් විය හැකි වූයේ වෙඩි තැබීමෙනි. වෙඩි හඬ ඇසූ කලහ කාරයෝ වට පිට බලන්ට වූහ. තුවාල ලැබූ කිසිවකු නුදුටු වුණු වඩාත් සාහසිකව පොලිස් භටයන් හා සටන් කළහ. දෙවැනි වරයෙහි වෙඩි සැර ඇසූ කලහකාරයෝ, මිනිසුන් දෙතුන් දෙනකු

වැටෙනු දුටහ. ලේ ගැලෙන තුවාල ඇති කිහිප දෙනකු දුවනු දුටු කම්කරුවෝ වඩාත් සාහසික වූහ. තුන් වන වෙඩි සැරයෙන් පසු කලහකාරයෝ පලායන්ට වූහ. පොලිස් භටයන්ට හසුවූයේ කලහකාරයන්ගෙන් හදෙනකුන් පමණි.

''මීළඟට අපි වැඩ නවත්වන්නේ කර්මාන්ත හිමියනුත් ආණ්ඩුවත් එක වරටම අකර්මණ්‍ය කරන්ට පුළුවන් අවස්ථාවක් බලා''යි මාලින් කම්කරුවන්ට කී ය.

මාලින් මුල සිට ම වෑයම් කෙළේ, කර්මාන්ත හිමියනුත් ආණ්ඩුවත් අකර්මණ්‍ය කොට ඔවුන් තැති ගැන්වීමට ය. මාලින්ගේ මේ කුමන්ත්‍රණය දැනගත් කබලාන එය සුන්බුන් කරනු පිණිස දිනෙත්ති රවිසේන යෙදී ය. රවිසේනගේ ඔත්තුකාරයෝ කර්මාන්ත ශාලාවක ටික දෙනෙකුන්ගේ සිත් දිනාගත්හ. අනික් කර්මාන්ත ශාලා කිහිපයක මිනිසුන් ද වැඩ නැවැත්වූයේ රවිසේනගේ ඔත්තුකාරයන් විසින් අවදි කරනු ලැබීමෙනි. එය තම පියා ඇටවූ උගුලක් බව මාලින් දැන ගත්තේ අවසාන මොහොතෙහි දී ය.

තමා සිතූ පරිදි තව අටමසෙකින් මේ පෙරළිය සිදුවී නම් ජය ලැබෙන්නේ තමාටයයි මාලින් කල්පනා කෙළේ ය. කබලාන දිනෙත්ති රවිසේන ලවා කම්කරුවන් ටික දෙනකු නොමඟ යැවීමෙන් කලින් ඒ පෙරළිය කරවූයේ මාලින්ගේ ආධිපත්‍යය බිඳිනු පිණිස ය. තමා පියාගේත් රවිසේනගේත් කුමන්ත්‍රණය වහා වටහාගත් මාලින් කලහය සමාදානයෙන් බේරාගත්තේ ය.

මාලින්ගේ කන්තෝරුව ඇතුළේත් එයින් පිටත් රැස්ව සිටි ජනයා ක්‍රමයෙන් අඩුවෙයි. වෙනාදා වැළ නොකඩා යන එන මොටෝර්රථ පෙළ නොදක්නා ලදි. වීථියේ දෙපැත්තේ පඩි පෙළවල ද කානුවල ද කඩදාසි කැබැලි, කුණු-කසල, කුණුවුණු පලතුරු හා අඹ ලෙලි ද බහුලව දක්නා ලදි. වසන ලද කඩ සාප්පු අතර වූ හෝටලයක විදුලි පහන් දැඩි එළියෙන් බබළයි. ගුවන් විදුලි මෙවලමෙන් නික්මෙන්නේ කන් නළවන ගීතයක් නොව කන් රිද්දන ගෝසාවකි. මේ ගෝසාව අසා කිපුණු තිස්ස, මාලින්ගේ කන්තෝරුවට ඇතුළු වූයේ ඇනුම්පදයක් කියමිනි. කන්තෝරුවෙන් පිට වූ දෙදෙනාගෙන් එකෙක් පිටු පා ගිය තිස්සට සරදම් කෙළේ ය.

''තිස්ස මාලින්ට උදව් කරනවා. දුප්පත් මිනිසුන්ගේ පැත්ත අරගෙන හටන් කරනවා. ඔනෑ දුප්පත් මිනිහෙක් සල්ලි ඉල්ලුවාම ළඟ තිබුණොත් දෙනවා. තමාගේ ඕනෑකමට සල්ලි නැති බව මිනිහට සිහිවන්නේ දුන්නාට පසුයි. සල්ලි ඉල්ලාගත් මිනිහාට බැණ බැණ තිස්ස පයින් යනවා! මාලින්ගේ කන්තෝරුවට එකතු වන කම්කරුවන්ට සමහර විට තිස්ස බණිනවා. මාලින්ටත් බණිනවා 'මෝඩයා' කියා!''

Scanned by CamScanner

"නමුත් කවුරුවත් මිනිහට බණින්නේ නැහැ. එයා කියන ඒවට තරහ වෙන්නේ නැහැ"යි අනිකා කී ය.

"තිස්සට පිස්සාය කියන්නේ ඒක නිසා තමයි" කියමින් ඔහු පාරට බැස්සේ ය.

"මාලින්ට මම කලින් කිවුවා නෙවද?" යි අසමින් තිස්ස පුටුවක වාඩි වූයේ ය. වැඩ නවත්වන්න මිනිසුන්ට අනුබල දෙන්න එපායයි මම කලින් කිවුවා. මාලින් අහුවුණේ තාත්තාගේ උගුලේ!"

"මම අහුවුණේ නැහැ; බේරුණා!"

"අහු වෙන්න ඉස්සර මම කිවුවා නෙවද?"

"තිස්ස කිවුවේ කම්කරුවන්ට වැඩ නැවැත්වීමට අනුබල දෙන්න එපාය කියා; උගුලක් ගැන නෙවි."

"වැඩ නවත්තන්ට අනුබල දුන්න නිසා නෙව උගුලට අසු-උණේ!"

"උචිත අවස්ථාවේ ඔවුන්ට අනුබල නොදී පටහැණිවීම මෝඩ කමක්."

"ඔවුන්ගේ කර උඩ නැගී බල තල ගසාගැනීමට ආසා නොකරන කෙනෙකුට නම් මෝඩ කමක් නෙවි."

"පොදු ජනයාට උදවු කොට ඔවුන්ගේ උදවුවෙන් බලතල අතට ගැනීමෙහි වරද කුමක්ද? මම වෑයම් කරන්නේ ඔවුන්ට අවංකව සේවය කොට බලතල අතට ගන්ට තමා. මම බලතල අපේක්ෂා කරන්නේ ඔවුන්ට වඩාත් සාර්ථක ලෙස සේවය කරන්ට පුළුවන් ආණ්ඩුවක් පිහිටුවනු සඳහා. තිස්ස ඔවුන්ට අනුකම්පා කරන බව මම පිළිගන්නවා. නමුත් තිස්ස වගේ මම ඔවුන්ගේ වැරදි දුටු විට ඔවුන්ට බැණලා ඇඟ බේරාගෙන පැත්තකට වෙන්නේ නැහැ."

"මාලින් නටන්නේ ඔවුන් කියන විදියටයි. ඔවුන් කියන දේ නොකිරීමෙන් තමා මම සන්තෝෂ වන්නේ."

"ඒක නොවෙන්නම් ඔවුන් තිස්සට පිස්සාය කියන්නේ!"යි පවසමින් මාලින් සිනාසුණේ ය. "තිස්ස ජීවත් වන්නේ අඩ පණ ඇත්තෙකු වගේ. ස්තුති ප්‍රසංසා ඇසීමෙන් තිස්ස සන්තෝෂ වෙන්නේ නැහැ; බණිනු ඇසීමෙන් කිපෙන්නේ නැහැ; බලතලවලට ආසා කරන්නේ නැහැ; කිසි දේකට ආසාවක් නැහැ. වස්තුවට ආසාවක් නැහැ. තිස්සට තියෙන්නේ ජීවිතයෙන් බාගයයි. අනිත් බාගෙ මැරිලා!"

"සම්පූර්ණ ජීවිතේ තියෙන්නේ මාලින්ගේ තාත්තාට! මාලිනුත් අනුකරණය කරන්නේ තාත්තා."

Scanned by CamScanner

''ලෝකෙ ගැන මිනිහෙක් කලකිරෙන්නේ ඔහුගේ ජීවිතෙන් බාගයක් ක්ෂය උණාම!'' යි කියමින් මාලින් තිස්සට සරදම් කෙළේය. ''කලකිරී වල් වදින මිනිහා ජීවිතෙන් බාගයක් අකාලයේ මරාගත්තෙක්. සම්පූර්ණ ජීවිතය ඇත්තන් අතර වසන්ට එවැනි මිනිහෙකුට යුතුකමක් නැහැ. එහෙයින් ඔවුන් වල් වැදීම තමා හරි; වල් වැදීම ඔවුන් විසින් කළ යුතු කාරියක්. තිස්ස වල් නොවැදී සිටීම තමා අපරාධය. කලකිරුණාම වල් වදින්ට නොයන්නේ ආත්මාර්ථ කාමි මිනිසා පමණයි.''

''මාලින් බණ දෙසන්ට ඉගෙන ගත්තේ කාගෙන්ද? අතට බලය ලැබුණාම මාලින් ආත්මාර්ථකාමි ධනවතාටත් වඩා නපුරු මිනිහෙක් වෙනවා. බලතල ලබන හැම එකාගේම ආසාව ඒකාධිපතියකු වීමටයි. එතකොට තමයි පොදු ජනයා මාලින්ට වයිර කරන්ට පටන් ගන්නේ. මාලින් සේවය කරන්නේ තමාටයි.''

''දෙගොල්ලන්ටම——පොදු ජනයාටත් මටත්——''

''කබලාන උගුල ඇටෙවුවේ මාලින් අල්ලන්ට නෙවි; කම්කරුවන් අල්ලන්ටයි. හරියට ඒ උගුලේ වැටුණා නම් මෝඩ මිනිසුන් හත් අට දෙනෙක් මැරෙනවා. මිනිස්සුන් හත් අට දෙනෙක් මැරුණාම අනිත් මිනිස්සුන් මාලින්ට පයින් ගහලා නැවතත් දිනෙත්ති රවිසේන සොයා යාවි. කබලාන කරවන්ට වෑයම් කෙළේ ඒකයි.''

''තිස්ස දැන ගත්තේ කාගෙන් ද?''

''කබලානත්, රවිසේනත් උගුල ඇටෙවුවේ ඔය අදහස හිතේ ඇතිව. නමුත් පොලිසිය ක්‍රියා කෙළේ කබලාන කී සැටියට නෙවි. පොලිසිය සිතා සිටියේ මාලිනුත් සමඟ දෙතුන් දෙනකු මරා දමන්ට''

''ඉඩ ලැබුණොත් පොලිසිය ඒක කරන බව මම දන්නවා— —''

''පොලිස්කාරයා මාලින්ගේ ඔලුවට ගැහුවේ මාලින් අඳුනාගෙන මිසක් අඳුනන්ට බැරිව නෙවි. ඊට පස්සේ ඇතිවූ කලහයෙහිදී පොලිසිය වෙඩි තබන්ට හිටියේ මාලිනුත් සමඟ දෙතුන් දෙනෙකුට වදින්ට. ඒකට පොලිසියට ඉඩක් ලැබුණේ නැහැ; පළමු වන වෙඩි සැරයට ඉස්සර වෙලා මිනිස්සුන් හුඟක් ඉදිරියට දිවූ නිසා.''

''ඒක පුදුමයක් නෙවි. ධනය හෝ බලය අතට ගත් මිනිස්සුන් එය අත නැර අල්ලා ගෙන සිටීමට මිනිස්සුන් තුන් හතර දෙනෙක් නෙවි. හත් අට දහසක් උණත් මරන්ටත් මරවන්ටත් ප්‍රමාද වෙන්නේ නැහැ.''

''මාලින් හා මාලින්ගේ හිතවතුන් බලතල ලැබූ විට ක්‍රියා කරන්නේ ඊට වෙනස්ව ද?''

"මම බලතල පතන්නේ අතළොස්සකගේ සුව පහසුකම් උදෙසා නොවේ."

"ඒ දැන්" යි තිස්ස කීවේ තරහයෙනි. "බලය ලැබුණාම එය සාවචච් කරන්ට ඕනෙන්නේ ටික දෙනකු උදෙසා මිස වැඩි දෙනකු උදෙසා නොවේ. වැඩි දෙනා ඒ ටික දෙනාට කීකරු වෙන්ට ඕනෑ."

"තිස්ස දෙඩවනවා!" යි මාලින් කෝපයෙන් කීවේ ය.

"මාලින් හා මාලින්ගේ අදහස් ඇතියන් ටික දෙනෙක් බලතල අතට ගත්තාම කුඹුරු වැඩ, කර්මාන්ත ශාලා වැඩ, වතුවල වැඩ කරවන්ට බලා ඉන්නේ කවුරුන් ලවා ද?"

"පොදුවේ සියලු දෙනාම ලවා. සියලු දෙනාම වැඩ කරනවා. අඟහිඟ නැතිව කන්ට බොන්ටත් දරුවන්ට උගන්වන්ටත් ඔවුන්ට ආදයම් ලැබෙනවා."

"එතකොට එකෙක්වත් මහන්සි වෙලා වැඩ කරන්නේ නැහැ!" යි කියමින් තිස්ස සිනාසුණේ ය. "දැන් මිනිස්සුන් වැඩ කරන්නේ අඟහිඟ ඇති නිසා! බඩගිනි දැනෙන නිසා. ඒ දෙකම නොදැනෙන කොට මිනිස්සුන් වැඩ කරන්නේ නැහැ. කන්ට බොන්ට ලැබෙනවා නම් කිසිම මිනිහෙක් මහන්සි වෙලා වැඩ කරන්ට කැමැති නැහැ. මිනිස්සුන් දැන් වැඩ කරන්නා වාගේ තුන් ගුණයක් මහන්සිවෙලා වැඩ නොකළොත් ලංකාවේ දැනට උපදවන දේ ජනගහනයෙන් හතරෙන් පංගුවකටත් මදි."

"දැන් වැඩ කරන මිනිස්සුන් වගේ තුන් ගුණයක් රක්සාව නැතිව ඉන්නවා."

"ඔවුන්ගෙත් සියේට අනූවක් වැඩ කරන්ට කැමැති නැහැ; යන්තම් කන්ට ලැබෙන නිසා. මගේ කීම ඔවුන්ගෙන් ස්ථිර වෙනවා."

"බොරු. එහෙනම් කර්මාන්ත හිමියන් උදේ සිට හවස් වන තෙක් මහන්සි වෙලා වැඩ කරන්නේ කුමට ද? ඔවුන්ට කන්ට අඳින්ට හිඟ නැහැ."

"මාලින් ඔහොම කීවේ තාත්තා ගැන හිතාගෙන වෙන්ට ඇති!" යි කියමින් තිස්ස, සරදම් කෙළේ ය. "කැමැත්තෙන් වැඩ කරන්නේ වස්තුවට ආසා ඇති ටික දෙනෙක් විතරයි. ඒ මිනිස්සු වැඩට ගුරයන්ව, ඉහළ නඟින්ට ආසාව ඇතිව, උපදිනවා. ඔවුන් මුදලාලිකරුවන් මෙන් ජීවිතය පටන්ගෙන ඉහළ නැඟීමෙන් මහා ධනවතුන් වෙනවා. මුලදී අඟහිඟ නැතිව කන්ට අඳින්ට ලැබුණා නම් ඔවුන් මහන්සි වෙලා වැඩ කරන්නෙ නැහැ. ධනවතුන්ගේ දරුවන් පරම්පරා දෙකකින් තුනකින් පිරිහෙන්නේ කුමක් නිසා ද?"

Scanned by CamScanner

"ලෝකෙට ඕනෑ කරන්නේ මහන්සි වෙලා අනික් මිනිසුන්ගේ ශ්‍රම ශක්තිය සූරාගෙන වස්තුව ගොඩ ගසන මිනිස්සු නෙවි."

"එහෙනම් ලෝකෙට ඕනෑ කරන්නේ අලසයෝ ද? මාලින් වෑයම් කරන්නේ සියලු මිනිසුන් අලසයන් කරන්ට!"

"නැහැ. ඔක්කොම මිනිසුන් ලවා වැඩ කරවන්න."

"ධනවතුන්ටත් වඩා හිතුවක්කාර ඒකාධිපතියන් අතලොස්සක් හැදිලා අන්‍යයන් ලවා වැඩ කරවන්න!"

මාලින් පුටුවෙන් නැංගේ කෝපයෙනි.

"තිස්ස මහා නපුරු මිනිහෙක්. තිස්ස කිසිවක් විශ්වාස කරන්නේ නැහැ. කිසිවකට ලැදිත් නැහැ. පොඩි දරුවන් කුරුමිනියන්ගේ කකුල් හා ඔළු ඇද කඩා කබොලු උගුල්ලා බලා සන්තෝෂ වෙනවා. තිස්ස ලෝකෙත් මිනිස්සුන්ගෙත් නරක පැත්ත අවුස්ස අවුස්සා සන්තෝෂ වෙනවා."

"මාලින් අවුස්සන්නේ හොඳ පැත්ත ද?"

"මම නරක පැත්ත අවුස්සන්නේ සන්තෝස වන අදහසින් නෙවි. කණගාටු වන අදහසින්. නරක පැත්ත නැති කරන්ට හටන් කරන පිණිස. තිස්ස නරක පැත්ත අවුස්සා අත් පා හකුළාගෙන සන්තෝස වෙනවා?"

"මාලින් නරක පැත්ත අවුස්සන්නේ අනාගතයෙහි සන්තෝස වන අදහසින්!"

මාලින් දෙරටුව කරා ගියේ තිස්සට බණිමිනි.

"හොඳ නරක දෙකටම සිනාසෙන්ට පුරුදු කරගත් මිනිස්සුන්ට පමණයි ලංකාවෙහි සන්තෝසෙන් ඉන්ට හැක්කේ!"යි තිස්ස කී ය.

"අනිත් රටවලත් තිස්ස වගේ නරුමයන් සන්තෝසෙන් ඉන්නේ හොඳත් නරකත් යන දෙකටම සිනාසීමෙන් තමයි. පණ අදින සතුන් දෙස බලා සන්තෝෂ වන වැද්දන් මෙන් නරුමයන් දුකින් තැවෙන ලෝකය දෙස බලා සිනාසෙනවා"යි කියමින් මාලින් වීථියට බැස්සේ ය.

"ඔහෝ, මිනිස්සුන් සසර දුකින් ගලවන්ට උපන් පණ්ඩිතයෙකු මෙන් මාලින් බණ දෙසන්ට හදනවා!"

හිස් අඳුන් බහුල විදුලිරිය, සීනුව හඬව හඬවා පාර දෙදරවමින් තිස්ස පසු කොට ගමන් කෙළේ ය. බී මත් වූ රික්සෝකාරයෙක්, වට පිට බල බලා දෙඩවමින් හිස් රථය ඇදගෙන යයි. රා තැබෑරුම වසා පැ ගණනක් ඉකුත් වූ නමුත් තොරිස් පාර හන්දියට ළඟා වන්ට පෙර තිස්සට රා ගඳ දැනිණ. හතර වන හරස් විදිය පටන් ගන්නා තැන වසාගත් මූසල වාතාවරණය රථයෙහි ද අඩු නොවී ය. මදක්

ඇතින් වූ බෝ රුක ඉඳ හිට මහා සුසුමක් හෙළන්නාක් මෙන් සර සර හඬ නඟා වෙවුලයි. බෝ ගස වටා බැඳි පවුරත් මලසුන් ගෙයත් තිස්සට සිහි කෙළේ ගම්බද පාළු පාරක් හා පන්සලකි. තමාගේ ළමා කාලය පිළිබඳ සිතිවිලි ඔහුගේ සිතට නැඟුණේ ය. පාළු වුණු බස් නැවතුම් පළ මැද පිහිටි වැසිකිළියෙන් නඟින දුගඳට අනුරූව. පරණ වීමෙන් දූෂණය වූ ලේ ගඳ මස් කඩයෙන් පැතිරෙයි. පල් වුණු මැලවුණු එළවළු ගඳ එළවුළු කඩ පෙළෙන ද පාර දෙපැත්තෙන් ද නඟියි. මහා ගෑස් ටැන්කි, ආණ්ඩුවේ පරණ කම්මල නැඟී සිටි බිම වටකර ගත් ගරා වැටුණු පවුර. බිම් ගෙවල් වැනි කුඩා බිම සාප්පු හා අපිරිසිදු තේ වතුර කඩ පිටකොටුවේ අසුන්දර මුහුණුවර තියුණු කරන පැල්ලම් ලෙසිනි තිස්ස දුටුවේ. ඔහු වෙල්ල වීදිය ඔස්සේ ගොස් දකුණට හැරුණේ ය. පොලිස් උසාවිය අසල පිහිටි පල්ලිය. ගසින් සෙවණ වුණු මිදුල දෙපැත්තේ පිහිටි උසාවි හා නීතිඥයන්ගේ නම් ලෑලි හත අට බැගින් එල්ලී සිටි ගෙවල් ද දෙස බලමින් ගමන් කළ තිස්සගේ සිතට නැඟුණේ ශෝකාකුල සිතිවිලිය. ඔහු යළිත් වමට හැරී මරදාන බලා ගමන් කෙළේ ය.

Scanned by CamScanner

# 23

මහා වැස්සත් සුළඟත් මඳක් අඩු විය. නගරය වසා ගත් අඳුරද ටිකින් ටික තුනී වෙයි. අහස් තලය පුරා පැතිර සිටි වැහිවලා බිඳගෙන මතු වන හිරු මඩල තුනී අඳුරු තිර පටින් වැසුණු පහන් එළියක් සේ පෙනෙයි. කානු උතුරවමින් නඟින වැහි වතුර දෙපැත්තට විදිමින් ගමන් කළ මොටෝරියක් හා බස්රියක් ද හැර අනික් වාහනයක් හෝ මගියකු මහා පාරෙහි යනු, සිරිපාල සැවුළුගල නුදුටුවේය.

හෝටලයෙහි වසනු ලද දොර ද අරිනු ලද කවුළුව ද ඇති කාමරය මැද නැඟී සිටි සිරිපාල සැවුළුගල වැස්සට සිතින් ශාපකොට තම බිරිඳට කෝපයෙන් තර්ජන කරයි. එක් පැත්තක බිත්තිය අද්දර වූ කණ්ණාඩිය දෙස බලා ගත් මංගලිකා, අඳුන් කූරකින් තොල රතු කරයි.

''උඹ මොකොටද අරූ එක්ක හම්බන්තොට ගියේ?''

''අරූය කියන්නේ කවුද?''

''වජ්රින්——ඌ එක්ක මොකොට ද උඹ ගියේ''

''මට ඕනෑවට''යි කියමින් මංගලිකා රවා බැලුවා ය.

''උඹට ඕනෑවට!''

සැවුළුගලගේ කෝපය වැඩි වී ය.

''ඔව්——''

සැවුලුගල පැන මංගලිකා උරහිසින් අල්ලා ඇද්දේ ය. ඇගේ පට සැට්ටය මැදින් පැළිණ. ඈ මේසය උඩ තුබුණ බුරුසුව දඩිව අල්ලාගත්තා ය. එය සැණකින් උඩ ගොස් පාත් වූයේ සැවුළුගලගේ උරහිසක් උඩට ය. ඔහු පෙරළා මංගලිකාට ගැසී ය. ඈ ඇලවී ගොස් කන්නාඩි මේසයෙහි හැපිණ. අඳුන් කූරු, පූයර ටින් බිම වැටිත.

''ඒ බල්ලා එක්ක යන උඹත්..............''

කෝපයෙන් සැලෙන මංගලිකා, තම සැමියා තල්ලු කළා ය. මත් පැනින් මඳක් බැමෙන හිස ඇතිව සිටි සැවුළුගල බිම ඇද වැටුණේය. ඔහු යළිත් නැඟී සිටියේ අඩු වූ කෝපයෙනි. මංගලිකා, ඔහු අල්ලා ඇද යන්තම දොරවුවෙන් පිට කොට වහා දොර වසා යතුර කරකැවුවා ය.



Scanned by CamScanner

මංගලිකා යළිත් මුහුණ සෝදගෙන පහර වැදීමෙන් තැළී රතු වුණු දෙතුන් තැනක බෙහෙත් ගා අතගෑවාය. අලුත් පුයර දමා ඇකිල්ලීමෙන් මුහුණ යළිත් ඔප් නඟා අඳුන් කූරෙන් දෙතොල් රතු කරගෙන අනික් සාරියක් හා සැට්ටයක් ඇඳ ගත්තා ය. කාමරයේ දොර මදක් හැර එබී බලා බරාඳයේ කිසිවකු නොසිටි බැවින් ඈ එළියට බැස්සා ය.

මංගලිකාගේ කෝපය තුනී නොවී ය. ඈත් සැවුළුගලත් කලහ කළ පළමු වන වතාව මෙය නොවේ. මීට පෙර, දහ දොළොස් වරක් ඔවුහු කලහ කළහ. පස් වරක්ම ඔවුන් කලහ කෙළේ වජ්‍රින් ගැන කථාවට බැසීමෙනි. සැවුළුගල තම යහළුවන් පමණක් නොව අනික් පිරිමින් ආශ්‍රය කිරීම ගැන මංගලිකා සමඟ කලහ කෙළේ ඉතා කලාතුරකිනි. එහෙයින් වජ්‍රින් ආශ්‍රය කරන්ට වූ තැන් සිට ඔහු නිතර තමා හා කලහ කරන්නේ ඊර්ෂ්‍යාවෙනියි මංගලිකා සිතුවා ය. ඔහු කුප්පන්ට සිතූ මංගලිකා වඩ වඩාත් වජ්‍රින්ගේ සමාගම සෙවුවාය. මීට පෙර එකම පිරිමියකුදු නිසා ඇගේ හද පුබුදු නොවී ය. ඈ ඇගේ තරුණ විය ද, එකල නැළවූ සිතුම් හා පැතුම් ද සිහි කරන්නේ වජ්‍රින් ආශ්‍රය කරන්ට වූ පසු ය.

මංගලිකා තම සැමියා හැර සුදු මිනිසකු සමඟ ඉන්දියාවට ගියේ ඒ වේලාවේ ඇගේ සිතට නැඟුණු හැඟීමකට වහල් වීමෙනි. ඈ පෙරළා ලංකාවට පැමිණියේ දික්කසාද වනු පිණිසය. වජ්‍රින් නිසා ඈ තුළ හටගත්තේ වෙනස් හැඟීම් ය. තමාට ළංව සිටින තාක් වජ්‍රින් තමාගේ වහලකු බව මංගලිකා දනියි. සැවුළුගලගෙන් දික්කසාද වුවහොත් වජ්‍රින් තමා වෙතම රඳවාගැනීම එතරම් අමාරුකාරියක් ද?

මංගලිකා හෝටලයෙන් නික්ම අජන්තා නිශාන්තයට ගියේ වජ්‍රින් හමුවන අටියෙනි. ඈ ගොස් පැ කාලකට පසු ඔහු එහි පැමිණියේ ය.

"මංගලිකා ඇවිත් හුඟක් වෙලා ද"යි අසමින් වජ්‍රින් ඇගේ දකුණු පැත්තෙහි වූ පුටුවෙහි වාඩි ගත්තේ ය.

"නෑ! මිනිත්තු දහයක් විතර වෙනවා."යි කියමින් ඈ උණු තේ පෝච්චිය ඉස්සුවා ය. "වජ්‍රින්ටත් තේ කෝප්පයක් හදන්නම."

"මමත් ආවේ තේ එකක් බීලා යන්ට හිතාගෙන. තව පැ බාගෙකින් මම ආපසු යන්න ඕනෑ."

"පැ බාගෙකින් කොහේද යන්නේ?"

"නැන්දලයි ගෙදරට යන්න ඕනෑ. අද එහි යන්ට මං නැන්දට පොරොන්දු උණා."

මදිරා දෙමාලසිංහ................"

''ඔව්.''

''සිරිපාල දැන් බොහොම බොනවා'' යි මංගලිකා කීවා ය. ''වෙනදට වඩා බොනවා; බීගෙන මා එක්ක සංඩු කරනවා''

''සංඩු කරන්නේ ඇයි'' අසමින් වජ්රින් තේ උගුරක් බීවේ ය.

''වජ්රින් ආශ්‍රය කරනවාය කියා.''

වජ්රින්ගේ ආශාව දැඩි වී ය.

''අද මම සිරිපාල දෙරට දමා කාමරය වසා ගත්තා'' යි මංගලිකා කෝපයෙන් කීවා ය. ''මම හිතාගෙන ඉන්නේ වෙනින් හෝටල-යක කාමරයක් අරගෙන එහි නවතින්ටයි.''

''හොඳයි'' වජ්රින් කී ය.

මංගලිකා මුහුණ වෙනදටත් වඩා සුන්දර ය; රතු දෙතොල් ආදරය නමැති මී උතුරුවයි. කොපුල් තල දෙක සොළොසැවිරිදි තරුණියකගේ කොපුල් තල මෙන් නව පැහැයෙන් බබළයි. ඇගේ මුහුණත් කයත් සුවඳ කරඬුවක් මෙන් වජ්රින්ගේ ආසාව උද්දීපනය කරයි.

ඔහු කවුළුවෙන් පිටතට නෙත් යොමු කෙළේ ය. කොළයක් පවා නොසොල්වමින් නැඟී ඒ ඒ තැන්වලම ගල් වුණාක් මෙන් සිටි සෙවණ ගස් රුකඩ ගස් වැන්න. අඬන්ට හදන දරුවකුගේ මුහුණ වැනි අහස, තරුවලින් තොර වී ය. තෙතමනයෙන් බර වූ වාතය, තෙමුණු පට දුහුල් පටක් වැන්න. අජන්තා නිශාන්තයේ මේ වට පිටාව මහා තාන්තුවාවක් සේ වජ්රින්ගේ සිත පෙළයි.

ඔහු මංගලිකාගේ මුහුණ බැලුවේ ය.

''අද කොහේ හරි යන්ට ඇත්නම්.''

''මමත් කැමතියි.''

''මම දැන් නැන්ද හම්බ වෙන්ට යන්ට ඕනැ—ඒකයි බාධාව. කොයි වේලාවේ එන්න ලැබේදැයි කියන්න බැහැ. මම තාන්තු-වාවෙන් කල්පනා කෙළේ ඒ නිසා''යි කියමින් වජ්රින් අසුනෙන් නැංගේ ය.

''මංගලිකා හෝටලෙට ගෙන ගොස් බස්සන්නම්.''

''මම අද ආවේ කුලී කාර් එකකින් තව ටිකක් වෙලා ඉඳලා යනවා.''

''කලින් එන්ට ලැබුණොත් මම මංගලිකා සොයා ගෙන එනවා. රෑ කෑමට අපි මහා හෝටලේට යමු.''

වජ්රින් අජන්තා නිශාන්තයෙන් නික්ම ගොස් රථයෙහි නැංගේ ය.

Scanned by CamScanner

මදිරා දෙමාලසිංහ වජ්රින් දුටු සැටියේ සැනසුම් සුසුමක් පිට කළා ය.

"වජ්රින් සුමාන දෙකකින් ගෙදර ගියේ නැහැ නෙව ද?"

"දවස් දහයකින් විතර ගියේ නැහැ."

"වජ්රින් ගැන අම්මා බොහොම කණගාටු වෙනවා. දවස් තුනකට උඩදී අම්මා මා එක්ක කතා කෙළේ අඬමින්."

"ඇයි?"

"තාත්තා හුඟක් තරහෙන් ඉන්නවා."

"මම දන්නවා; අම්මා කණගාටු වෙන්නේ කුමක් නිසාද? මම අම්මාට කළ වරද මොකක්ද? මම ගෙදරට යන්නේ අම්මා නිසා."

"වජ්රින් කසාද බඳින්න ඕනෑ කාලේ පහුවෙලා. අම්මාත් තාත්තාත් කළ යෝජනාවලට වජ්රින් කැමැති නොවූ නිසා අම්මා බොහොම කණගාටු වෙනවා. තාත්තා හොඳටම තරහවෙලා ඉන්නෙත් ඒ නිසා."

"අම්මාත් තාත්තාත් කියන පලියට මට කසාද බඳින්න පුළුවන ද? කසාද බැඳීම, බඳින මිනිහාගේ ඕනෑකමටයි සිද්ද වෙන්න ඕනෑ."

වජ්රින් කසාද නොබැඳ ඉන්නේ මන්ද? වජ්රින් යම්කිසි තරුණියෙක් බඳින්ට පොරොන්දුවෙලා ඉන්නවා ද?"

වජ්රින් සිනාසුණේ ය.

"නෑ නැන්ද; මට සෑහෙන ආදයමක් ලැබෙන ඉඩමක් ලියා දෙන්ට තාත්තා කැමති නැහැ. තාත්තාගෙන් සල්ලි ඉල්ලාගෙන ජීවත් වෙනවා දකීමට තාත්තා බොහොම ආසයි. මම නිවටයෙකු කරලා තාත්තා මගෙන් පළිගන්න හදනවා.

"ඇයි එහෙම කියන්නේ? අම්මා ලියා දුන් ඉඩමේ ආදයම වජ්රින්ට ලැබෙනවා නෙව."

"කසාද බැඳලා ඒ ආදයමෙන් ජීවත් වෙන්න බැහැ."

"කසාද බැන්දම තාත්තා බූදලෙන් කොටසක් දෙනවාය කියනවා නෙව."

"ඇයි කලින් ලියා දෙන්ට බැරි?"

"තුඹ කසාද බඳින්නේ නැයි කියන නිසා."

"ලියා දුන්නොත් කසාද බඳිනවායයි මම අම්මාට කිවුවා.

"තාත්තා ඒක විශ්වාස කරන්නේ නැහැ."

"එහෙනම් මම තාත්තාගේ කීම විස්වාස කරන්නේ මොකොවද?" යි වජ්රින් කෝපයෙන් ඇසී ය.

නුදුරුව පිහිටි බංගලාවෙන් නික්මෙන පියානෝ හඬ ඇසූ මදිරා දෙරටුව දෙස බැලුවා ය. ඉඳහිට හමන සීත සුළඟට හසුවන උළුවහු රෙදි, පක්ෂීන්ගේ අත්තටු මෙන් සෙලවී උඩගොස් නැවත පාත්වෙයි.

"පියානෝව ගහන්නේ නීලා. නීලා වජිරින්ට හොඳටම ආලය කරන බව දන්නවා ද?"යි නැන්ද ඇසුවා ය.

"නීලා මට කවදාවත් කිවුවෙ නැහැ."

පියානෝ නාදයට කන් දුන් වජිරින් එය ෂෝපාන්ගේ ගීතයක් ලෙස හැඳිනගත්තේ ය.

"නොකිවුවාට වජිරින්ට වැටහුණේ නැද්ද? එයා වජිරින්ට හොඳටම ආදරෙයි. යෝජනා කීපයක් ආ නමුත් ඒ එකකටවත් නීලා කැමති උණේ නැහැ. වජිරින් අම්මාත් තාත්තාත් එක්ක අමනාපෙන් ඉන්නවාටත් එයා කණගාටු වෙනවා. හැම දම මම හම්බ උණාම නීලා කතා කරන්නේ වජිරින් ගැන."

නැන්ද තමා කැඳවූයේ නීලාගේ ගුණ කියනු පිණිසයයි වජිරින් නොසිතුවේ ය. මවත් පියාත් පිළිබඳ කථාව, දැන් කෙරෙන කථාවට උචිත ප්‍රස්තාවනාවක් සේ තම නැන්ද කලින් සිතාමතා සම්පාදනය කරගත්තක්යයි ඔහු නොසිතුවේ ය.

"මම එහෙම අදහසකින් නීලා ආශ්‍රය කෙළේ නැහැ."

"වජිරින් ඒ අදහස ඇතිව නීලා ආශ්‍රය කරන්න ඕනෑ."

වජිරින්ගේත් මංගලිකාගේත් මිත්‍රකම මදිරා හැම විටම සිත් කෙළේ සංවේගයෙනි. මංගලිකා නියම කාමිනියකි. ඇගේ පාශයෙහි බැඳුණු තරුණයකු තබා විවාහකයෙක් වුව ද ඇගේ වහලෙක් වෙයි. මංගලිකා තම සැමියා හා කලහ කරන බව මදිරා දනියි. ඈ සැවුළුගලගෙන් වෙන් වුව හොත්, වජිරින් මංගලිකාගෙන් වෙන් කළ නොහැකි වෙතියි සිතූ මදිරා බියගත්තා ය. වජිරින් විවාහ නොවන බව කියන්නේ මංගලිකා ආශ්‍රය කරන්ට වූ පසුය. වජිරින් මේ විපතින් බේරා ගැනීමට ශූර තරුණිය වමරී නොව නීලා යයි මදිරා කල්පනා කළා ය.

පියා හා වජිරින් ද අතර භේදය දවසින් දවස දියුණු වෙයි. මව වජිරින් ගැන ශෝක වෙයි. නීලාට වජිරින් ද වජිරින්ට නීලා ද වඩ වඩාත් ළං කළ යුතු යයි දෙමාලසිංහ තෝනා සිතුවා ය.

Scanned by CamScanner

# 24

සර් නිවටන් දමෝරාසිංහ නික්ම ගොස් ටික වේලාවකට පසු නාලිකා තම සැමියාගේ කන්තෝරු කාමරයට ගියා ය. පොතින් පිරුණු රාක්කවලින් වට වුණු කාමරයට ඇතුළු වුණු නාලිකාට කඩදසි ගඳත් තාප්තලින් ගඳත් දැනිණ. සීලිමේ එල්ලී සිටි විදුලි පවන් පත වාතය සිහිල් කරමින් 'කීස් කීස්' හඬින් කැරකෙයි. කබලානගේ හිසින් විසිර නැඟුණු කෙස් රොද කිහිපයක් සුළඟට හසුව නැටෙයි.

සමින් වැසුණු කොට්ට ඇති පුටුවක වාඩි වූ නාලිකා, තම සැමියා දෙස බැලුවේ ප්‍රශ්නයක් නඟන්නාක් මෙනි.

''එමරී එක්ක කතා කළා ද?'' යි කබලාන ඇසුවේ ය.

''තාම නැහැ.''

''තව වරක් කතා කරලා බලන්න.''

''එමරී දූත් නීලාත් එක්ක මාලින් ඉන්න තැනට නිතරම යනවා.''

''නිතරම යනවා විතරක් නෙවී; ඒ දෙන්නා මන්ත්‍රී තරඟය නිසා මාලින්ගේ පැත්ත ගෙන වැඩ කරනවා'' යි කබලාන කෝප-යෙන් කිවේ ය.

''මටත් අහන්න ලැබුණා; මම විශ්වාස කෙළේ නැහැ.''

'උඹරි මාලින් වෙනුවෙන් වැඩ කරනවා' යයි දිනෙත්ති රවිසේන මා සභය කිවුවා. දිනෙත්ති රවිසේනත් ඒ ආසනයට තරඟ කරනවා. ඔහුට වියදම් කරන්නේ අපි.''

''මාලින් තවත් තරඟවේවි.''

''එයා මන්ත්‍රී මණ්ඩලයට ගියොත් අපට තවත් අමාරු වෙනවා. සමහර විට කර්මාන්ත ශාලා වසා දමන්ටත් වේවි.''

''එමරී වඩාත් නරක් වෙන්නේ මාලින් නිසා.''

''යන්ට එපයි කියා එමරී නවත්තන්න. මාලින්ගේ පැත්තට වැඩ කරන ඔක්කොටම බැණුම් අහන්නත් ගුටි කන්නත් වේවි මාලින්ට වැඩ කරන ඔක්කෝම බය කරන්ට මැරයන් යවාවී. රවි-සේන ලවා අපි එයා කොහොම හරි පරද්දනවා''යි කබලාන දැඩි ස්වරයෙන් කී ය.



Scanned by CamScanner

වඩාත් බියගත් නාලිකා කබලාන, චමරී මාලින්ගෙන් වෙන් කළ නොහැකියයි සිතුවා ය. ඔවුන් දෙදෙනා කුඩා කල පටන් වැඩුණේ ඔවුනොවුන් නිසා හටගත් දෘඩි ඇල්මක් ඇතිවයි. පොත-පත උගැන්මෙහිදී චමරී මාලින් ද සමාජයෙහිදී මාලින් චමරී ද අනුකරණය කළෝ ය.

කුඩා කල මාලින් හා චමරී වඩාම ආශ්‍රය කළේ පියා නොව මව ය. ඔවුන් පියා සමඟ කථා කෙළේ කලාතුරකිනි. නෑ මිතුරන්ට සංග්‍රහයටත් අනික් උත්සවයන්ටත් කබලාන නොමසුරුව මුදල් වියදම් කරතත් එයින් එතරම් ප්‍රීතියක් නොලබන බව නාලිකා දනියි. ඔහුගේ රක්සාව මුදල් සැපයීම වෙයි. ඔහුගේ කෙළි සෙල්ලමත් එයම වෙයි; විනෝදයත් එයම වෙයි.

සමාජයේ ස්ත්‍රීන් හා පුරුෂයන් ළැදි කමින් ආශ්‍රය කරන තමාගේ සෙවණෙහි වැඩුණු මාලින් හා චමරී සමාජයට පටහැණිව යන්ට පුරුදු වුණේ කෙසේදැයි නාලිකා තමාගෙන්ම ප්‍රශ්න කළා ය.

කබලානගේ කාමරයෙන් පිට වූ නාලිකා, ගෙයි පස්සා පැත්තේ බරාඳයට පිවිසියා ය. කුස්සියේ දුම් ටැඹින් නගින දුම් වලා සුළඟින් විසිරී අතුරුදහන් වෙයි. උයන ලද ආහාරයෙන් නගින සුවඳ ඇසූ ඈ හැරී ඔර්ලෝසුව දෙස බැලුවා ය. ඔර්ලෝසුව දෙළහ හඬත්ම චමරී ගෙට පිවිසියා ය.

''චමරී දෙළහ වන කල් මොනවා කළා ද'' යි නාලිකා ඇසුවා ය.

''නීලාත් මමත් මාලින් අයියා වෙනුවෙන් වැඩ කරන්ට ඇවිද්දා.''

''මාලින්ට වැඩ කරන්ට මුඩුක්කුවල ඇවිදින්නේ කුමට ද? ලැජ්ජා නැද්ද? කැත නැද්ද?''

''දුප්පත් මිනිස්සුන් අතරට යෑම ලැජ්ජා වන්ට කාරණයක් ය?''

''මුඩුක්කුවල ඉන්නේ වල් මිනිස්සු.''

චමරී සිනාසුණා ය.

''අම්මා හැම දම ඔය කතාව කියනවා; නරක වැඩ කරන මිනිස්සු ලොකු ගෙවල නැද්ද?''

''නැහැ'' යි නාලිකා තරහයෙන් කීවා ය.

''කිලුටු ඇඳුම් ඇඳගෙන කබල් ගෙවල ඉන්න මිනිස්සුන් කරන නරක වැඩ විතරයි වල්කම් වන්නේ. දුප්පත් මිනිස්සුන් බොහෝ විට නරක වැඩ කරන්නේ දුප්පත්කම නිසා; නැති නම් රක්සාව උදෙසා. පොහොසත් මිනිස්සුන් නරක වැඩ කරන්නේ වැඩිපුර සන්තෝෂවන්ට; නැති නම් වැඩිපුර සල්ලි හම්බ කරන්ට!''

"උඹ ඔවා තමයි මාලින්ගෙන් ඉගෙනගන්නේ. එයා වෙනු-වෙන් වැඩ කරන අදහසින් මුඩුක්කුවල ඇවිදින්ට යන්න එපා. නාත්තා දැනගත්තොත් හොඳටම තරහ වෙවී."

"නාත්තා තරහ වෙන්නේ මොකොට ද?"

"අනිත් පැත්තට වැඩ කරන නරක මිනිස්සු උඹට නින්ද කරාවී; බණීවී."

"නින්ද නොවීද, බැණුම් අහන්නේ නැතිව, ඉන්න බැහැ."

නාලිකා තම දුව සමඟ තර්ක නොකළා ය. ඈ මාලින් ගැනත් මුඩුක්කු ගැනත් කතා කෙළේ අනික් කතාවකට බසින අදහසිනි. තර්ක කිරීමෙන් දුව තවත් කෝප කිරීමට ඒ කතාවට බාධාවක් වන බැවිනි නාලිකා කර බාගත්තේ.

"අද උදේ සර් නිව්ටන් ඇවිත් ගියා" යි නාලිකා කඹලාන කීවා ය.

"මොකොට ද?"

චමරී මේ ප්‍රශ්නය කටින් පිට කෙළේ සිතාමතා නොවේ.

"සර් නිව්ටන් ආවේ උඹ ගැන කතා කරන්න."

"මම මුඩුක්කුවල ඇවිදිනවායයි කියන්ට ඇත්තේ එහෙනම් සර් නිව්ටන්."

"සර් නිව්ටන් ආවේ උඹත් වජ්රිනුත් පිළිබඳ යෝජනාව ගැන කතාකරන්න."

"එහෙනම් මම මුඩුක්කුවල ඇවිදින බව කතා කරන්න විතරක් නෙවී!" යි කියමින් චමරී සිනාසුණා ය.

"උඹ මුඩුක්කුවල ඇවිදින වගක් සර් නිව්ටන් දන්නේ නැහැ."

"ඇයි අම්මා නොකිවුවේ? ඒක කිවුව නම් සර් නිව්ටන් කර බාගෙන ගෙයින් පිට වෙලා යාවී නෙව!"

"ඉස්සර උඹ ඔය වගේ පැහිච්චකම් කතා කෙළේ නැහැ. උඹ ඔය ඔක්කොම ඉගෙනගෙන තියෙන්නේ මාලින්ගෙන්."

"කතා කරන්න කවුරුවත් උගන්නන්න ඕනෑ නැහැ. අම්මලා මම කොලීජියට යවා මට ඉගැන්නුවා. ගුරුවරුත් පොතුත් මට හිතන්න ඉගැන්නුවා. මම කතා කරන්නේ සිතාලා මිසක් සිතන්-නේ නැතිව නෙවී. අම්මා බලාපොරොත්තු වන්නේ මම නොසිතා කතා කරනවා ඇසීමට. එහෙනම් කොලීජියට යවා මට ඉගැන්-නුවේ මොකොට ද?"

"කොලීජිවලට ගොහින් ඉගෙනගත් අනිත් ගෑනු ළමයින් උඹ වගේ කතා කරන්නේ නැහැ."

Scanned by CamScanner

"අම්මා දන්නේ කොහොම ද?"

නාලිකා තම දුව සමඟ වාද කිරීමට අකැමැති ය. කබලාන මෙන් ඈ ද සන්තෝෂ වන්නේ තමා කියන කතාවක් අසා කරබා ගන්නත් නිසා ය. සර් නිව්ටන් ආවේ කුමක් නිසා—ද යන වග චමරීට කියන්ට වෑයම් කළ හැම විට ඈ ඊට පටහැණිව ඇනුම්පද කීවා ය.

"සුමාන හතරකට ඉස්සර සර් නිව්ටන්ට අන්තිම වචනයක් කියන්ට ඕනෑ. වජ්රින් පිළිබඳ යෝජනාවට කැමැති වෙයන්."

"මට බෑ අම්මා".

"ඇයි බැරි?"

"මම එයාට කැමැති නැහැ."

"එහෙනම් උඹ අර ගොඩේ මුදලාලිගේ පුතා ගැන තවමත් බලාපොරොත්තුවෙන් ඉන්නවා!"

නාලිකා මේ ප්‍රශ්නය ඇසුවේ ආරූඪ කරගත් ගර්වයෙනි. ඒ ගර්වය එහි නොසිටි අරවින්දට එල්ල කළ පිළිකුල් බැල්මක් වැන්න.

චමරී පිළිතුරු නුදුන්නා ය.

"තාත්තාත් මමත් කරන යෝජනාවකට උඹ කැමැති වෙන්න ඕනෑ" යි නාලිකා තර්ජන ස්වරයෙන් කීවා ය.

"මම වජ්රින්ට කැමැති නැහැ"යි ඈ මැඩගත් කෝපයෙන් කීවා ය.

"ඇයි කැමති නැත්තේ?"

"කැමති නැත්තේ—කැමති නැති නිසා—"

"අපි කියන එහෙකට උඹ කැමැති වෙන්න ඕනෑ"යි කියමින් නාලිකා තම දුවගේ අත, මැණික් කටුව ළඟින් තද කොට අල්ලා ඈ ඇදගෙන, කාමරය දෙසට ගියා ය. තමාගේ අත යකඩුවකට හසුවුණු කලක මෙන් චමරී වේදනාවෙන් මිරිකුණා ය.

"වාඩි වෙයන්" නාලිකා අණ කළා ය.

චමරී ඇඳෙහි වාඩිවූවා ය.

"මුඩුක්කුවල ඇවිදින්ට යන්න එපා, මාලින් හමුව වෙන්ට යන්නත් එපා."

චමරී කතා නොකළා ය. නාලිකා වඩාත් කෝප වූවා ය.

"වජ්රින්ට අකැමති වෙන්නත් අර ගොඩේ මුදලාලිගේ පුතා බඳින්නත් උඹට කීවේ මාලින්—නේවද?"

"අම්මා—ගොඩේ මුදලාලිගේ පුතාය කියන්නේ කාව ද?"

Scanned by CamScanner

"දෙස්තර අරවින්ද."

චමරී සිනාසුණා ය.

"අම්මා අරවින්දට ගොඩේ මුදලාලිගේ පුතාය කියනවා. එයාගේ තාත්තා පාන් පෙට්ටිය ඔළුව උඩ තියාගෙන ගොහින් පාන් විකුණා පොහොසත් උණායයි කුලමල කියනවා. ඒවා ආරංචි වෙලාදෝ කොහේදෝ වික්‍රමනායක අපටත් කුලමල කිවුවා. මට ලජ්ජා හිතුණා."

"උඹලාට කියන්න කුලමලයක් නැහැ. උඹේ සීයා ඉංග්‍රීසි උගත් මුහම්දිරම් හාමුදුරු කෙනෙක්."

"එද වික්‍රමනායක කිවුවා—අම්මාලාගේ තාත්තාගේ තාත්තා —එලවළු කද කරින් ගෙන ගොස් විකුණා ජීවත් උණු කොග්ගල මිනිහෙක්ය කියා."

"ඒ මිනිහා කියා තියෙන්නේ බොරු. අපේ තාත්තාගේ තාත්තා ගැන මම මොකුත් දන්නේ නැහැ. තාත්තා නම් කොග්ගල මිනිහෙක් තමා."

"අම්මාලාගේ තාත්තා හෝටලවලට මස්, මාළු, බිත්තර විකුණා සල්ලි හම්බ කළාය කිව්වා. හරකුන්ට වතුර පොවා බඩ පුම්බා මැරුවාට පස්සේ ඒ මළකඳන් කිරුම් බරට විකුණා අපේ සීයා පොහොසත් උණාය.............."

"ඌ කියා තියෙන්නේ බොරු වෙන්න ඕනැ"යි නාලිකා කබලාන කෝපයෙන් කීවා ය. "ඔවා කියා තියෙන්නේ අපට නින්ද කරන්න. වික්‍රමනායක වැදගත් මිනිසුන්ට අපහාස කරන නරක මිනිහෙක්............"

"අම්මාලාගේ අම්මාගේ පවුලේ මිනිස්සුන් බෝතල ලාම්පුව පත්තුකරන්න ලාම්පු තෙල් ගන්න තුට්ටුව නැතිව ජීවත් උණායයි කියමින් වික්‍රමනායක සිනාසුණා. මම එයාට හොඳටම බැන්නා."

"ඌ මහ වනචර මිනිහෙක් වෙන්න ඕනැ. අපේ මුත්තලාගේත් මුත්තලාගේ තාත්තාලාගේත් විත්ති මම දන්නේ නැහැ. ඒවා අපි සොයන්නේ මොකොට ද? එහෙම සොයාගෙන ගියොත් දුන් ඉන්න කොයි පවුල්වල උදවියගේත් සීයාලා ඉගෙනීමක් නැති මිනිස්සුන් බව දැනගන්ට ලැබෙවි. ඒකත් කියන්න ඕනැ කුලමලයක් ය? ඒ කාලේ ඉංග්‍රීසි ඉගැන්වීම පැතුරුණේ නැහැ."

"එහෙනම් අම්මා අරවින්දට කුලමල කියන්නේ?"

"අරවින්දගේ තාත්තා දුන් ජීවත්ව ඉන්න මිනිහෙක්. එයා පොහොසත් උණ හැටි බොහෝ දෙනා දන්නවා. උඹ නරක් කෙළේ මාලින් තමයි."

"අරවින්ද ආශ්‍රය කරනවාට මාලින් අයියා තරහයි! මාලින් අයියා එයාට බණිනවා."

"උඹ කියන්නේ ඇත්ත ද?"

"මම අම්මාට බොරු කිවුවේ කවද ද?" චමරී කෝපයෙන් ඇසුවා ය. "මාලින් අයියා අරවින්ද එක්ක තරහයි. එයා අරවින්ද ට බණිනවා...................."

"ඉතින් උඹ මොකොට ද එයා ආශ්‍රය කරන්නේ?"

පිළිතුරු නුදුන් චමරී තමාගේ අතීතය සිහි කළා ය. බොහෙවින් ආයාගේ අතෙහි වැඩුණු ඈ කෙළිසෙල්ලම් කරනු පිණිස උයනට හෝ මුහුදු වෙරළට හෝ ගියේ ආයා සමඟ ය. ඈ මහලු උයන් ගොවුවාට දුනුදු දයාවක්, කරුණාවක් දක්වයි. ඔහු මහත් කරුණා-වෙන් හා ළැදිකමින් ඈ කුඩා කල ඇසූ හැම නිරර්ථක ප්‍රශ්නයකට, දෙඩවිල්ලකට, පිළිතුරු දෙමින් ඈ සන්තෝෂ කිරීමට වෑයම් කෙළේ ය. ඈ ඇතැම් විට 'මොටෝරථය දුවන්නෙ කෙසේ ද'යි ඔහුගෙන් ඇසුවා ය. ඇතැම් විට 'මොටෝරථය දුවන්නේ කුමට ද' යි ඇසුවාය; තාත්තා සල්ලි හම්බකරනනේ කුමට ද'යි ඇසුවා ය. කුකුළු පැටියා උපදින්නේ බිත්තරයෙනියි ඇසූ ඈ දවසක උයන් ගොවුවාගෙන් මෙසේ ඇසුවා ය.

"අපි උපන්නෙත් අම්මා දැමූ බිත්තරවලින් ද?"

මහලු උයන් ගොවුවා හොඳටම සිනාසුණේ ය. එහෙත් ඔහු හැම විටම ඈ ඇසූ ප්‍රශ්නවලට ඔහු දන්නා දෙමළ-සිංහල-ඉංගිරිසි-යෙන් පිළිතුරු දුන්නේ ය. ඔහුගේ පිළිතුරු අනන් මනන් දෙඩීමක් වුව ද චමරී එයින් අපමණ සන්තෝෂ වූවා ය. ඈ අසනීපයෙන් කාමරයට වී උන් අවස්ථාවලදී ඔහු කාමරය අසලට ගොස් ඈ ඇසූ අනන්මනන්වලට පිළිතුරු දීමෙන් ඈ සන්තෝෂ කෙළේ ය.

චමරී දෙලොස් ඇවිරිදි වියට පැමිණෙන තෙක් මවගේ සමාගම අපේක්ෂා කළා ය; ඇගේ ආදර සැලකිලි වලින් සන්තෝෂ වූවා ය. විද්‍යාලයෙහි දැරියන් හා යහළුව, ඔවුන් හා කරන කතාබහෙන් හා කෙළිසෙල්ලමෙන්ද වැඩි ප්‍රීතියක් ලබන්ට වූ තැන් සිට ඈ මවගේ සමාගමෙයන් ලැබූ සන්තෝෂය ටිකින් ටික අඩු වී ය.

"උඹලාට කවා පොවා ඇති දැඩි කෙළේත් උඹලාට ඉගැන්නුවේත් අපි උඹලාගේ වැඩී දියුණුව බලාපොරොත්තුවෙන් මිස වෙන කුමක් බලාපොරොත්තුවෙන් ද?" යි මව් ශෝකයෙන් ඇසුවා ය. ඇගේ දෙනෙතට කඳුළු නැඟුනු හිමු චමරී ද ශෝක සිහි කෙළේ වූවා ය. එහෙත් චන්ද්‍රින් පිළිබඳ යෝජනාව ඈ කෝපයෙනි.

# 25

චමරීත් නීලාත්, මලින් සමඟ ද ඇතැම් විට තනිව ද ඇතැම් විට තිස්ස සමග ද මුඩුක්කුවක්, අප්‍රකට වීථියක් පාසා ඇවිදිති. ඔවුන් මාලින් වෙනුවෙන් වැඩ කරන්නේ ඔහුට ඇති ළැදිකම නිසා ය. දිළින්දන් හා පහළ මැද පන්තියේ ජනයා ද වෙසෙන පෙදෙස්වලට ආශාවෙන් යන ඔවුහු පෙර නුදුටු විරූ රටකට යැමෙන් ලබන ප්‍රීතියත් සංවේගයත්, ශෝකයත් වැනි හැඟීම් එයින් ලබති. ඒ පෙදෙස්වල වෙසෙන ගැනුන් හා පිරිමින් සමඟ කතාබහ කිරීමෙන් ඔවුහු අජන්තා නිශාන්තයේ රැස්වන ගැනුන් හා පිරිමින් ද හා කතා-බහ කිරීමෙන් විඳින සන්තෝෂයට වෙනස් සන්තෝෂයක් විඳිති. අජන්තා නිශාන්තයෙහිදී ඔවුන්ට දකින්ට ලැබෙන්නේ අමුතු මුහුණු පමණි. එකම විදියේ ඇඳුම්වලින් නොහොත් කලිසන්-කෝට් ආදියෙන් වැසුණු දේහයන් ඇති ඔවුන් හඳුනාගත හැක්කේ මුහුණුවලින් පමණි. ඔවුන් කතාබහ කරන්නේ එකම ශිෂ්ට ශබ්ද කෝෂයෙන් ගත් වචනවලිනි; සිනාසෙන්නේ ද සමාන විදියෙනි. අජන්තා නිශාන්තයෙහි තබන ලද මේස, පුටු, මේස වසාගත් නොකිලිටි සුදු රෙදි, විදුලි එළිය හා විදුලි පවන් පත් ද හැම ද ඔවුන් දකින්නේ එක ම රූපයෙනි.

දූවිලි තවරාගත් කයින් යුතු කුඩා දරුවෝ, කිලිටි රෙදිකඩ ඇතිව ද ඇතැම් විට නැතිව ද මුඩුක්කුවල කුණු ගොඩවල් අසල කෙලි සෙල්ලම් කරති. දිරාගිය මුහුණු හා ලේ හිඳුණු ඇස් ද ඇති ගෑනු කලහ කරති. පීඩාවෙන් තැවුණු මුහුණත් ශරීරත් ඇති මිනිසුන් අතර, මුහුණින්, අතින්, පයින් හා ළයෙන් ද උතුරා යන තරම් පිරිමිකම් දක්වන ගල් වැද්දන් වැනි කදිම තරුණයෝත් මැදවියෙහි වූවෝත් දකින්ට ලැබෙති. පෝෂණ ආහාර නොලැබීම නිසා ගිරහෙනියෙන් වැරෙන කුඩා දරුවෝ චමරීගේත් නීලාගේත් සිත් අදිමින්, හදවත කකියවමින් ගරාවැටුණු ගෙවල දොරකඩවල බලා සිටිති.

ගරාවැටුණු ගෙවල්, කුණු ගොඩවල්, කුඩා දරුවන්ගේ මුහුණු හා කුසගින්නත් ද්වේශයත් නිසා දූවෙන ලේ නැති ඇස් ද දුටු, කානුවෙන් නඟින දුගඳ ඇසූ, චමරී තුළ පළමුව හටගත්තේ පිළිකුළට එක් වූ ශෝකයකි; සංවේගයකි; කළකිරීමකි. ඒ හැඟීම නිසා ඈ නැවත නැවතත් මුඩුක්කුවලට ගියා ය. ඇගේ දයාවත් අනුකම්පාවත් නඟින්ට වූයෙන් පිළිකුල අතුරුදහන් වී ය.

මේ කිලිටි දිළිඳු ලෝකයෙහි වසන ගෑනුන් ද දරුවන් ද තරුණයන් හා මහල්ලන් ද අතරින් සිනාව, ප්‍රීතිය, අනුකම්පාව හා මිත්‍රකම ද අතුරුදහන් නොවීම නිසා චමරී ලබන්නේ සන්තෝෂයකි. එහෙත් ඈ සමඟ ගමන් කරන තිස්ස දකින්නේ සිත් පෙළන, කලකිරවන, කුප්පන දුකුම් පමණි. ඔහු සිතින් අහන්නේ දත් සැපීමෙන් නඟින හඬ හා කෙඳිරිය ද පමණි.

''මේ මිනිස්සුන්ගේ දිළිඳුකම නැති කළොත්, ඔවුන්ට ලොකු බංගලාවල ඉන්න මිනිස්සුන් වගේ ප්‍රීතියෙන් ජීවත්වෙන්ට පුළුවන්-යයි මාලින් හිතනවා''යි තිස්ස කීවේ ය.

''මම හිතන්නෙත් එහෙම තමා''යි චමරී කීවා ය.

''සල්ලිවලින්ම ඔවුන් හරිගස්සන්න බැහැ.''

''මේ මිනිසුන් මෙහෙම ජීවත්වන්නේ දිළිඳු කම නිසා. මේ ජීවිතය ඔවුන් දිළිඳුකම නිසා හදගත් එකක්.''

''නැහැ''යි කියමින් තිස්ස තර්ක කෙළේ ය. ''නූගත්කමට එක්වුණු දිළිඳුකම නිසා. අර දොරකඩවල ඔවුන් කුණු කසළ ගොඩ ගහන්නේ සල්ලි නැති නිසා ද? අර ජනේලයේ ලෑල්ල ඇණයක් ගහලා සවිකරගන්ට පුළුවනි. ඒ ගෙයි මිනිස්සුන් ඒක නොකොට ලෑල්ල ගැලවී වැටෙන කල් බලා ඉන්නේ දුප්පත්කම නිසා ද? දරුවෙක් හරි ලොකු මිනිහෙක් හරි ලෙඩ උණාම ඔවුන් පළමුව ගෙන්වන්නේ යද්දෙස්සා; නැති නම් යකැදුරුකමත් වෙදකමත් දෙකම දන්නා වට්ටෝරු වෙදෙක්.''

''දොස්තර එක්ක එන්න සල්ලි නැති නිසා.''

''හොඳ වෙදෙක් ගෙන්නන්න සල්ලි ඕනෑ නැහැ. හොඳ වෙදෙකුට ගෙවනවාට වැඩි මුදල් මේ මිනිස්සුන් වට්ටෝරු වෙදුන්ට ගෙවනවා. මේ මූඩුක්කුවෙන් මයිල කාලකට ඇතින් හොඳ සිංහල වෙද්දු දෙන්නෙක් ඉන්නවා. යද්දෙස්සන් ලවා තොවිල් කරවන්න මොවුන් රුපියල් විස්ස තිහ වියදම් කරනවා.''

''හඬගාන්ට ගියාම ඒ වෙදුන් ඔවුන්ට සලකන්නේ නැහැ.''

''නෑ—ඒ නිසා නෙවි. ඔවුන් විශ්වාස කරන්නේ යද්දෙස්සාත් වට්ටෝරු වෙදත් පමණයි.''

''තිස්ස කතා කරන්නේ හිසින්. ඉන්ට හොඳ ගෙයක් නැති නම්, කන්ට අඳින්ට ඕනෑ දේ නැති නම් මිනිස්සුන් ඉගෙනගන්නේ කොහොම ද? අපට මෙන් ඉගෙනගන්ට පුළුවන් වන සේ ඔවුන්-ටත් සල්ලි හම්බවෙන්න ඕනෑ. වට්ටෝරු වෙදුන්ටත් යකැදුරන්-ටත් අනුබල දෙන්නේ ආණ්ඩුව. පොදු ජනයාට හිතවත් ආණ්ඩු-වක් ඇත්නම් හැමෝටම වෙදකම කරන්නේ හොඳ වෙද්දු; නැති නම් හොඳ දොස්තරලා. වට්ටෝරු වෙද්දුන්ට වෙදකම් කරන්ට ඉඩ දෙන්නේ නැහැ.''

Scanned by CamScanner

''එහෙනම් චමරී කියන්නේ ඒ මිනිස්සුන්ටත් මුදල් නාස්ති කර-මින් ජීවත් වෙන්ට රුපියල් දහේ දෙදහේ ආදයම් ලැබෙන මාර්ග සලස්සන්න ඕනැය කියා ද?''

''ඔවුන්ට හොඳ ගෙවල් සපයා දී කන්න අඳින්නත් ළමයින්ට උගන්වන්නත් ලෙඩට දුකට වියදම් කරන්නත් ආදයම් ලබා දුන්නාම ඔවුන්ගේ ජීවිතය සම්පූර්ණයෙන් වෙනස් වේවි. ධන-වතුන්ගේ ආදයමත් ඒ තරමට අඩු කරනවා. ඔවුන් නිසා ධනවතුන් රුපියල් දහ දෙළොස්දහ බැගින් මාසෙකට ආදයම් ලබනවා. ඒ ආදයමෙන් වැඩි කොටස යන්න ඕනැ ඒ මිනිස්සුන්ටයි. මැද පන්තියේ මිනිස්සුන්ට වගේ ඔවුන්ට උගන්වා අගහිඟ නැතිව ජීවත් වන්ට ආදයමක් ලැබෙන්ට සැලැස්සුවොත් ඔවුන් හොඳින් ප්‍රීති-යෙන් ජීවත් වේවි. තිස්සගේ ඔය අති පණ්ඩිත කම් බොරු මනස්ගාත..............''

''මේ මිනිහෙකුගේ ආදයම තව රුපියල් දෙසීයකින් වැඩි කළත් ඔහු දැන් ඉන්නා තැනින් නගින්නේ නැහැ. සල්ලි වැඩිය ලැබෙන කොට ඔහු දැනටත් වඩා විනෝදය සොයනවා; බොන්න පටන් ගන්නවා; සූදුවට යනවා. එක ගැනියෙකුගෙන් සෑහී ඉන්න බැරි වෙනවා.''

''ඇයි බැරි? පොහොසත් මිනිහාත් එක ගැනියෙකුගෙන් සන්තෝෂ වෙනව.''

''පොහොසත් මිනිහෙකුට එක ගැනියෙකුගෙන් සන්තෝෂ වෙලා ඉන්න පුළුවනි!''යි කියමින් චමරීට සරදම් කළ තිස්ස, තම දත් දෙපෙළ පෙන්නමින් දෙතොල් කොන් ප්‍රසාරණය කෙළේ ය.

''මොකද තිස්ස මට නියවන්නේ!'' යි අසමින් චමරී රවා බැලුවා ය.

''එක ගැනියකුගෙන් සෑහීමට පත් වන පොහොසත් මිනිහෙක් නැ!''

''තිස්ස දන්නේ කොහොම ද?''

තිස්ස තමාගේ දබරැඟිල්ලෙන් හිසට තට්ටු කෙළේ ය.

''මේකෙන්!''

''ඒක නිසා තමයි තිස්සට වරදින්නේ. පොහොසත් මිනිස්-සුන් ගැන මම තිස්සට වැඩිය දන්නවා. ධනපතිකම නැතිකළා ම ධනවතුන්ට ගෑනුන් උදෙසා වැඩිපුර වියදම් කරන්ට මුදල් නැති-වෙනවා.''

''බොහෝ මිනිස්සුන්ට ජීවිත දෙකක් තියෙනවා. එයින් එකක් නම් එක ගැනියෙකුගෙන් සන්තෝෂ වෙනවා. චමරීත්

Scanned by CamScanner

ලෝකයාත් දන්නේ ඔවුන්ගේ ඒ ජීවිතය තමා. ඔවුන්ගේ අනික් ජීවිතය එක ගැනියෙකුගෙන් සන්තෝෂ වෙන්නේ නැහැ.''

''පොහොසත් මිනිස්සුන් ගෙයින් පිට උණාම තිස්ස ඔවුන් පස්සේ යනවා!''

''නැහැ. ඔවුන්ගේ ඒ ජීවිතය පොදු ජනයා දන්නවා; රහස් පොලිසියත් දන්නවා! ඔවුන් ගෙයින් පිටව කරන දේ සමාජයෙන් පිට පැනලා ඉන්න මිනිස්සුන් දන්නවා! ඔවුන් කරන රහස් කතා ඔවුන්ට ඇහෙනවා.''

''මිනිස්සුන් කියන ඕපාදූප තිස්ස අහනවා! විස්වාස කරනවා.''

''මම විස්වාස කරන්නේ සාක්කි ඇති විට. ඔය එන්නේ රවිසේනගේ මිනිහෙක්'' යි තිස්ස කීවේ ය.

''ඒ මිනිහා මම දුටු තැන යන්නේ කුණු හරුපෙන් බැණගෙන!''

''අද ඔය මිනිසා බණින්නේ මටයි.'' කියමින් තිස්ස ඔහු දෙස බලා දත් දැන්දම පෙන්නමින් සිනාසුණේ ය. කර්කශ මුහුණක් ද ඉදලක් මෙන් සිහින් දේහයක් ද ඇති මිනිහකු ඔවුන් පසු කොට ගමන් කෙළේ තිස්සට බැණ වදිමිනි; ''අරුගේ අනිත් අතත් කැඩුණා නම් නොව හොඳ! ලොකු පවුල්වල කෙල්ලන්ගේ පා ඉඹින පෙරේතයා.''

''ඇහෙනවද?''

වමරී සිනාසෙමින් හිස හැරවූවා ය. ඔහු ඇට ද බැණවැදුණේය.

''තිස්ස ධනවතුන්ට බණින බව ඒ මිනිහා දන්නේ නැද්ද''යි විළියෙන් මිරිකෙන්ට වූ වමරී විචාළා ය.

''ඒ මිනිහා මට බණින්නේ ඒ මිනිහා විශ්වාස කරන සමහර දේට මම සරදම් කරන නිසා. මම ඒ මිනිහාගේ මත ඉවත දමන්නේ ධනවතුන්ගේ පැත්ත ගන්න නිසායයි ඒ මිනිහා සිතනවා. වමරීගේ මතයකට මම විරුද්ධ උණාම වමරී අසන්තෝස වෙනවා ඇති; නමුත් මට බණින්නේ නැහැ. ඒ මිනිහාගේ සමහර මතවලට මම සරදම් කරන නිසා ඒ මිනිහා මම එක්ක හැම දාම තරහයි! තරහ නිසා බණිනවා. ඒ මිනිහා වමරීට වඩා අවංකයි!''

''අවංක කම නිසා ද ඒ මිනිහා අශිෂ්ටයෙක් උණේ.''

''ඔව්—අවංක මිනිහෙකුට මෙලොවදී නම් ශිෂ්ටයෙක් වෙන්ට බැහැ.''

''ඒ මිනිහා මට කුණු හරුපෙන් බණින්නේ මන් ද? ඒ මිනිහාගේ මතයට මම සරදම් කරන්නේ නැහැ.''

Scanned by CamScanner

"ඒ මිනිහා චමරීට බණින්නේ ඊෂ්‍යාවෙන්, ධනවතෙකුගේ දුවෙක් නිසා."

"එහෙනම් ඒ මිනිහා තිස්සට ද්වේෂ කරන්නේ නැත්තේ මන්ද?"

"ඒ මිනිහා මා එක්ක තරහයි; නමුත් මට ද්වේෂ කරන්නේ නැහැ. මම ධනවතෙකුගේ පුතෙක් නොවන නිසා. චමරී එක්ක ඒ මිනිහා තරහ නැහැ. නමුත් ද්වේෂ කරනවා."

"තිස්සගේ අංඩර දෙමළ මට තේරෙන්නේ නැහැ."

"අංඩර දෙමළ තේරුම් ගන්ට නම් හුඟක් කල් මුඩුක්කුවල ඇවිදින්න ඕනෑ. ඒ මිනිහා චමරීට ද්වේෂ කළාට චමරී එක්ක තරහ නැහැ. චමරීට ඒ මිනිහා සමඟ බොහොම ලෙහෙසියෙන් හාද වෙන්ට පුළුවන්. ඔහු මම එක්ක හාද වෙන්නේ ඒ මිනිහාගේ මත මම පිළිගත්තොත් පමණයි."

"මම මොකට ද ඒ මිනිහා හාද කරගන්නේ? තිස්ස කට ඇරියොත් කියන්නේ ඇනුම්පද!"

"මම කිවුවෙ එහෙම හාද කමක් ගැන නෙවි!........."

"එහෙනම්?"

"ඒ මිනිහා මාලින්ගේ පැත්තට හරවා ගැනීම සඳහා හාද කරගැනීම ගැන."

"ඒ මිනිහා මාලින් අයියාට බණින්නේ නැත්තේ කුමක් නිසා ද? එයාත් ධනවතෙකුගේ පුතෙක්!"

"මාලින් ධනවතුන්ට බණින නිසා ඒ මිනිහා මාලින් විස්වාස කරනවා."

"මාලින් අයියා වගේම තිස්සත් ධනවතුන්ට බණිනවා."

"මම ධන්වතුන්ට බණින්නේ ධනවතුන් අතරට ගියාම. දිළින්දන්ට බණින්නේ දිළින්දන් අතරට ගියාම! මාලින් ධනවතුන්ට බණින්නේ දිළින්දන් අතරට ගියාම."

"තිස්ස මැද මගක් ගන්න. මමත් තිස්සට එක්කාසු වෙනවා!" යි කියමින් චමරී සිනාසුණා ය.

"මැද මගය කියා මගක් නැහැ! මැද මගය කියන්නේ ගමන් නොකරන්නන්ගේ නොහොත් අතින් නොව සිතින් බතල කොළ හිටවන්නන්ගේ මගටයි. සිතින් බතල කොළ හිටවන්නන්ට බීමක් ඕනෑ නෑ. ගමන් නොකරන්නන්ටත් මගක් ඕනෑ නැහැ. මැද මගත් සීතාම්බර පටත් දෙකම එකයි!"

"අපොයි! මැද මගට බැහැලා හෙලුවෙන් ඉන්න මම කැමැති නැහැ.!"

කුඩා කොලුවකු විසි කළ මඩ අහුරක් පිටු පා ගිය චමරීගේ සාරි කොනෙහි වැදිණ. මදක් ඈතින් සිටි ළමයි දෙදෙනෙක් දිව, අර මඩ ගැසූ එකාට ගහන්ට වූහ. චමරී තමාට මඩ ගැසූ එකා බේරා හැරියා ය.

''අපි මාලින් මහත්තයාගේ පැත්තේ''යි ළමයි දෙදෙනාම හතිදමමින් කීහ.

''අරයා ?''

''එයා රවිසේනගේ පැත්තේ. දර්මසේන එයාට උගන්නනවා නෝනාට මඩ ගහන්න!''

''අපට කුණු හරුපෙන් බැණ බැණ ගියේ ධර්මසේන''යි තිස්ස කීවේ ය. චමරීට මඩ ගැහුවේ අර කොලුවා නෙවී; තාත්තාගේ සල්ලි!''

''තාත්තාගේ සල්ලි!''

''ඔව්! චමරීගේ තාත්තා තමයි රවිසේනට වියදම් කරන්නේ; තාත්තා විතරක් නෙවි ධනවතුන් කීප දෙනෙක් එක්ව රවිසේනට වියදම් කරනවා.''

චමරී කෝප වූවා ය.

මාලින් පවත්වන රැස්වීම්වලට චමරී යන්නේ කලාතුරකිනි. එහෙත් නීලා හැම රැස්වීමකට යයි. මාලින්ගේ හැම මතයක් අවිවාදයෙන් පිළිගන්නා ඈ ධනවතුන්ට බණියි; ඔවුන්ගේ වාසස්ථාන දිළිඳු ජනයාගේ වාසස්ථාන හා සසඳයි. ඔවුන් දෙගොල්ලන්ගේ කෑම බීම, ඇඳුම් පැළඳුම් ආදියෙහි වෙනස කියයි.

නීලා කෙරෙහි ඇදී ගිය සිත් ඇති මාලින් ඈ තුළ මෙතරම් නිර්භයත්වයක් ස්වාධීනත්වයක් දිළින්දන් නිසා උපන් අනුකම්පාවක් ඇතැයි මීට පෙර නොසිතුවේ ය.

''මන්ත්‍රී තරඟයෙන් ජයගත්තොත් මම නීලා කසාද බඳිනවා!'' යි කියමින් මාලින් දවසක නීලාට සරදම් කෙළේ ය.

''පැරදුණොත්!'' යි නීලා පෙරළා ප්‍රශ්න කළා ය.

''මම පරදින්නේ නැහැ.''

''මම එහෙම ඇහුවේ බොරුවට.''

Scanned by CamScanner

# 26

මංගලිකා තම සැමියාගෙන් දික්කසාද වී කලකට පසු වජ්රින් හා විවාහ වූවා ය. ඔවුන් දෙදෙනාගේ විවාහය ගැන ඇසූ නීලා තමාගේ සිතෙහි හටගත් වේදනාව තුනී කරගත්තේ මාලින් ගැන සිතීමෙනි.

''වජ්රින් නැති උණා!'' යි මදිරා දෙමාලසිංහ නෝනා ශෝක-යෙන් කීවා ය. ''නීලා ටිකක් සලකා ක්‍රියා කළා නම් එයා ඒ ගැනීට අහුවෙන්නේ නැහැ. මම නීලා ගැන එයාට හැම විටම කිවුවා. එයා නීලාට කැමති වෙලායි හිටියේ. නීලා එයාට වැඩි ළැදි කමක් පෙන්නුවා නම් මේක සිද්ද වෙන්නේ නැහැ.''

''හැම විට මම එයා එක්ක සන්තෝෂෙන් කතා කළා. නමුත් මට එයා පස්සේ දුවන්න පුළුවන''යි නීලා කෝපයෙන් කීවා ය.

'මදිරා වැයම් කෙළේ මාත් මංගලිකාවක කරනු පිණිස ද?''යි නීලා තමාගෙන්ම ප්‍රශ්න කළා ය. 'ඇට වුවමනා කෙළේ වජ්රින් මංගලිකාගෙන් බේරා ගැනීම පමණි. මා වජ්රින්ගේ ඇහේ එල්-ලුණු විට ඔහුට තවත් ගැනියක කසාද බැඳිය නොහැකි ය. මදිරා මා වජ්රින්ට හඳුන්වා දී මා ගැන ඔහුට නැවත නැවතත් කීවේ මා සලකා නොව වජ්රින් බේරනු පිණිසය'යි කල්පනා කළ නීලා වඩා කිපුණා ය.

නීලා මදිරා දෙමාලසිංහට වඩා මංගලිකාට කැමැති ය. වජ්-රින් ඇ හා විවාහ වීම විපතකියි නීලා නොසිතුවා ය. වජ්රින්ට එමරී යෝජනා කරන ලද්දේ මදිරා විසිනි. ඔහු ඇ බලන්ට ගියේ, මදිරාගේ කරදරය නිසා බව නීලා දනියි; විවාහ ජීවිතයට ඇතුළත් නොවන්ට සිතා සිටි වජ්රින් මෙතරම් ඉක්මනින් මංගලිකා හා විවාහ වූයේ කුමක් නිසා ද?

වජ්රින් හා විවාහ වූ මංගලිකා වෙනස් ගැහැනියක් වූවා ය. ඇ අනික් කිසිවකු සමඟ මැතදී අජන්තා නිශාන්තයෙහි සිටිනු නොදක්නා ලදී.

''තාත්තා, බුදලේ ඔක්කොම වජ්රින්ට අහිමි කරන්ට යනවා නොවද? තාත්තා ඔය තරම් විරුද්ධ බවක් මම දන්නේ නැහැ. නැති නම—'' යි කියමින් මංගලිකා ශෝක වූවා ය.

''ඒ ගැන මගේ හිතට කිසි අමාරුවක් නැහැ. අම්මා මගේ නමට ලියූ වත්තක් තියෙනවා. මම මෙතෙක් කල් වියදම් කෙළේ



Scanned by CamScanner

ඒකෙන් ලැබුණු ආදායම; තාත්තාගේ සල්ලි නෙවි. මට සල්ලි හම්බ කරන්න පුළුවනි.''

''වජ්රින් කරන ඕනෑම කාරියකට මම උදවු කාරියෙක් වන්නම්.''

වජ්රින් සිනාසුණේ ය.

මංගලිකා තමාගේ අතීතය සිහි කළා ය. පළමු වන සැමියා ඇට හඳුන්වා දෙන ලද්දේ ඇගේ මවුපියන් විසිනි. ධනවත් වෙළෙන්දකු වන ඔහු හා මංගලිකා බලවත් ප්‍රීතියෙන් හා ආසාවෙන් විවාහ වූයේ සැප විඳින අටියෙන් පමණක් නොව, සමාජයෙහි බැබළෙන ආසාව ද ඇතිව ය. ඈ ඔහු මසුරකු බව දැනගත්තේ තුන් මසක් ගෙවෙන්නට පෙර ය. තරුණ වියෙහි දී ඇඳුම් පැළ-ඳුම්වලට බෙහෙවින් වියදම් කරන්ට පුරුදු වුණු මංගලිකා සමාජයෙහි ගැනුන් හා පිරිමින් රැස්වන තැන්වලට යාමෙන් ප්‍රීති වූවා ය. හමසක් ගත වූ තැන ඈ තමන්ගේ ඇඳුම් පැළඳුම්වලට මුදල් ලබා ගත්තේ සැමියා හා කලහ කිරීමෙනි. ඔහු වැඩිම ප්‍රීතිය ලැබුවේ මුදල් එකතු කිරීමෙන් මිස ඇගෙන් නොවී ය. ඈ සුදු මිනිසා හා හාද වී බුරුමයට ගියේ ඕපාදූප දෙඩීමෙහි ආසා ඇති ගැනුන්ගේ කටවල් වසා තබන අදහසිනි. සැමියා ඇගෙන් පළිගන්නා අදහ-සින් දික්කසාද නොකරනු ලැබූ නිසා ඈ යළිත් ලංකාවට පැමිණියාය. අනතුරුව දික්කසාද වුණු ඈ සැවුළුගල හා විවාහ වූයේ ඇගේ සිත් ගත් බැවිනි. ඔහු ඇගේ වහලකු වූ පසු ඈ ඔහු නොතැකුවා ය. වජ්රින් ආශ්‍රය කරන්ට වූ තැන් සිට ඇගේ ඒ උදාසීනත්වය ද්වේෂයට හැරිණ.

තරුණ කාලයේ තමා සිතූ සිතුම් හා පැතූ පැතුම් ඒ වේගයෙන්ම දූන් තමාගේ සිතට නඟින්නේ වජ්රින් නිසායයි සිතූ මංගලිකා, වජ්රින් හා විවාහ වූ පසු තමා අඩු වයස ඇත්තියක් වූවා යයි කල්පනා කළා ය. එහෙත් අනාගතය සිහි කළ ඈ තැති ගත්තා ය.

''වජ්රින් මට එපා වුණොත්!''

කනින් නොව සිතින් මේ වදන් ඇසූ මංගලිකා වජ්රින්ගේ මුහුණ බැලුවා ය.

''නෑ'' යි ඈ තමාටම කියාගත්තා ය.

මන්ත්‍රී තරඟයෙන් ජයගෙන පෙරහැරින් ගමන් කළ මාලින් සමඟ නීලා, චමරි, තිස්ස යන තිදෙනා ද වූහ. කබලානගේ බංගලාව ඉදිරියට පැමිණි පෙරහැරෙහි වූ ජනයා වඩාත් හයියෙන් ඔල්වර හඬ නැඟූහ.

බණින, තර්ජන කරන, ඔල්වර හඬ නඟන ජනයාගෙන් යුතු ඒ පෙරහැර ක්‍රමයෙන් ඈත් වෙයි. ඔවුන්ගේ ඝෝෂය ක්‍රමයෙන් අඩු

වෙයි. 'මෙතරම ජනකායක් මාලින්ට අවනත වූයේ කුමක් නිසා ද?' යන ප්‍රශ්නය නාලිකා කබලානගේ සිතට නැංගේ ය. තම සැමියා කියන කාරියක් කර බාගෙන කරන ජනයා ද මාලින්ගේ පෙරහැරෙහි වෙති. ඔවුන්ගෙන් සමහරුන් ජීවත් වන්නේ කබලානගෙන් ලබන වැටුප්වලිනි. ඔවුන් ඉත සිතින් සේවය කරන්නේ මාලින්ට ය. කබලාන ඔවුන්ගේ සිත් තැළීමෙන් සන්තෝෂ වෙයි; මාලින් සන්තෝෂ වන්නේ ඔවුන්ගේ සිත් නැළවීමෙනි.

පෙරහැරෙහි පහටිය ද නොපෙනී ගොස් මඳ වේලාවකින් චන්ද්‍රසෝම වැලිවලත් නෝනාත් අනෝමාවට පැමිණියෝ ය. තම සහෝදරයාත් ඔහුගේ බිරිඳත් පෙරහැරට මඳක් ඈතින් ගමන් කළවුන්ගෙන් දෙදෙනෙකු විය යුතුයයි නාලිකා සිතුවා ය.

''චමරීත් නීලාත් අන්න පෙරහැර එක්ක යනවා!'' යි කියමින් වැල්වල නෝනා සිනාසුණා ය.

''මම දන්නවා.''

නාලිකා පිළිතුරු දුන්නේ තරහයෙනි. මෑතක සිට ඇගේ සහෝදරයාත් ඔහුගේ බිරිඳත් මාලින් හා ඔහුගේ කම්කරු හවුල ද වර්ණනා කරති. ඔවුන් එසේ කරන්නේ කබලාන ඉදිරියෙහි නොව නාලිකා ඉදිරියෙහි ය. නාලිකා සිතන්නේ තම සැමියා සිතන සැටියෙනි. ඈ තම සහෝදරයා සමග තර්ක නොකරයි.

''නීලා මාලින් එක්කම ගියා!''

''මම දැක්කා.''

චන්ද්‍රසෝම, මාලින් වීරයකු කොට සලකා කථා කෙළේ ය. රුපියල් විසිතිස් දහස බැගින් වියදම් කළ මිනිසුන් හතර දෙනකු සමඟ තරඟ කොට මාලින් ජය ගැනීම කොතරම් අපූරුවක්ද? එවැනි ජයක් ලැබීම සඳහා මිනිසුන් වසඟ කරගන්නේ දහසකගෙන් එකකු පමණි. මාලින් රුපියල් දෙදහසක්වත් වියදම් කෙළේ ද?

''මාලින්ට අක්කා සල්ලි දුන්නා ද?''යි චන්ද්‍රසෝම ඇසුවේ ය.

''නැහැ. තාත්තා හොඳටම තරහයි.''

''මාලින් ගැන අපි ආඩම්බර වෙන්න ඕනෑ''යි චන්ද්‍රසෝම කීවේය. ''රුපියල් හැට හැත්තෑ දහස බැගින් වියදම් කොට දිනාගන්ට බැරි උණ ආසනයක් මාලින් රුපියල් දහසක්වත් වියදම් නොකර දිනා ගැනීම කොයි තරම් එකක් ද? මාලින්ට ඇමති කමක් ලබාගන්නත් බැරි නැහැ. අපි එයාගේ අදහස් ටිකක් වෙනස් කරන්ට මහන්සි ගන්ට ඕනෑ. එතකොට එයාට ඇමති කමක් නිකම්ම ලැබෙයි.

මහජන මන්ත්‍රණ සභාවට ඇතුළු වුණු මාලින් වැනි දක්ෂ තරුණයකුට ඇමති කමක් ලබා ගැනීම අමාරු කාරියක් විය

Scanned by CamScanner

නොහැකි ය. කබලාන මාලින්ට උදවු කරතොත් ඇමතියකු වී නයිට් පදවියක් වුව ද ලබාගැනීමට වැඩි කලක් නොයතියි නාලිකා සිතුවා ය. ඇගේ කල්පනාව පිබිදුණේ ය.

මැතිකම් ලැබූ පසු බොහෝ දෙන හිතුවක්කාර අදහස් හරිති; වයසින් පැසුණු තලතුනා මිනිසුන් කියන දේට කන් දෙති. එහෙයින් මාලින්, ඔහුගේ තාත්තා සමඟ සමාදනයෙන් වාසය කරන්ට නොසිතන්නේ ද?

''මාලින් ගෙදරට එන්නේ නැද්ද?'' යි චන්ද්‍රසෝම ඇසුවේ ය.

''මාස හත අටකින් ආවේ නැහැ.''

''මැතක සිට අපේ ගෙදරට ඉඳහිටලා එනවා''යි වැලිවල නෝනා කිවා ය.

''අක්කා මාලින් හම්බ වෙන්න යන්න; ගොහින් කතා කරන්න. දූන් මිනිහා ගෙදරට එන්ට කැමැති වේවි.''

චන්ද්‍රසෝම මෙසේ කීවේ තම සහෝදරිය මාලින් කරා යවනු පිණිස මිස මාලින් ගෙදරට එතියි සිතූ නිසා නොවේ.

තම සහෝදරයාත් නැනාත් ගිය පසු නාලිකා කබලාන මාලින් ගැන සිතුවා ය. තාත්තා මාලින්ට මෙතරම් විරුද්ධ කම් පාන්නේ කුමක් නිසා ද? හත්අට මසකින් ඔහුගේ කෝපය තුනී නොවූයේ කුමක් නිසා ද? මාලිනුත් ඔහුගේ පියාත් සමඟි කරනු පිණිස දූන් ක්‍රියා නොකළ යුතු ද? තමා පතන පුදන සමාජය උඩුයටිකුරු කොට පෙරළීමට මාලින් දැඩි අධිෂ්ඨානයෙන් ක්‍රියා කරන්නකු බව නාලිකා නොදනියි; අනිකකු කී විට ද විශ්වාස නොකරයි. එතරම් උමතු අදහසකින් මාලින් ක්‍රියා කරන්නේ කුමට ද? මාලින් ගෙදරට කැඳවාගෙන ආ යුතු ය.

පසු ද නාලිකා කබලාන ජගුවරයෙහි නැඟී මාලින් හමුවීමට ගියා ය. ඔහුගේ ගෙට ඇතුළු වූ ඈ පුදුමයෙන් හා ලජ්ජාවෙන් ගොළු වූවා ය. මන්ත්‍රීවරයකු වූ මාලින් ලොක්කකු මෙන් වාසය කරනු ඇතැයි යන හැඟීම ඇතිවයි ඈ ගෙදරින් පිටත් වූයේ. බරාදය, සාලය, කාමරය යන තුනින් යුතු කබල් ගෙයි වූ කුඩා කෑම මේසය ද කබලකි. ඒ මේසය හතර පැත්තේ කබල් පුටු හතරෙන් එකක් කකුල් පණ නැතව වැටෙන්ට යන්නකු වැන්න. සාලයෙහි පුටු හතරක් ද කැන්වස් හාන්සි පුටුවක් ද වී ය. කාමරයෙහි වූ කබල් යකඩ ඇඳ දුටු නාලිකාගේ දෙවුරය නිතැතින්ම සෙළවිණ. එහි වූ ඇඳුම් අල්මාරියක් හා බෑගයක් ද හැර අන් කිසිවක් ඈ නුදුටුවා ය.

නාලිකා මාලින් ගේ ළමා කාලය සිහි කළා ය. ඔහු ඉතා හොඳ ඇඳුම් ප්‍රිය කෙළෙල් ය. කබලාන පමණක් නොව තමා ද

අසුන්දර ලාබ ඇඳක් පුටුවක් ගෙදරට නොගත් බව නාලිකා සිහි කළා ය.

ගණිත ප්‍රශ්න සිතට නඟන මෝස්තරවල කණ්ණාඩි මේස, කෑම මේස, බේසන්, ජග්ගු, විදුලි පවන් පත්, එබෙමින් පිම්බෙමින් සිත කය නළවන මෙට්ට සහිත අලුත් පන්නයේ ඇඳින් හා ඇඳෙන් බැස්ස විගස දෙපා පිළිගන්නා මුදු සිනිඳු බුමුතුරුණු ද ඇති විශාල කාමරවල වාසයට පුරුදු වුණු මාලින් මේ සිරගෙයි ජීවත් වන්නේ කෙසේ ද? දිළින්දන්ගේ සිත් ගනු පිණිස ද? ඔහු දිළින්දන්ට ඉත සිතින් සේවය කරන්ට සිතූ නිසා ද? දිළින්දන්ට සේවය කරනු පිණිස දිළින්දකු මෙන් ජීවත් විය යුතු ද?

''අම්මා වාඩිවෙන්න''යි මාලින් කීවේ ය.

ඇගේ දෙකනට ඒ වදන් ඇසුණේ තමාට කළ සරදමක් ලෙසිනි. ඈ වාඩි නොවූයේ තමාගේ ඇඳුම් කිලිටි වෙතියි යන බියෙන් නොව ලජ්ජාවෙනි. ඈ යළිත් වට පිට බලා මාලින්ගේ කාමරයට ගොස් එහි වූ ඇඳෙහි වාඩි වූවා ය.

''ඇයි මාලින් උඹට ගෙදර ඉඩ මදි ද?''

''ගෙදර සැප වැඩි යි; ඒ නිසා මට ගෙදර එපා උණා. එකම විදියේ සැප වැඩි උණාම දෙවුලොවත් එපා වෙනවා!''

''එහෙනම් දෙවියන් මෙලොවට බහින්නේ නැත්තේ?''

''දෙවියන් මෙලොවට බහින්නේ හිඟන්නන්ගේ, තාපසයන් ගේ, නැති නම් පෙරළි කාරයන්ගේ වේසයෙන්!''යි කියමින් මාලින් සිනාසිණි.

මාලින්ගේ මුහුණෙහි සිට දෙපා තෙක් බැලූ නාලිකා වඩාත් ශෝක වූවා ය. මාලින්ගේ දෙඇස කොතරම් වෙනස් ද? වෙහෙසි-මෙන් මැලවුණු දෙනෙත වනාහි ඇතුළත බැබළෙන විදුලිය කණිකා සහිත ගොලෝව දෙකක් වැන්න. ඔහුගේ මුහුණත් කයත් දුන් හොඳ-වම සීන් ය. ඔහුගේ නැහැය, කට, ඇස් හා නිකට ද වඩාත් තියුණුව පෙනෙයි. පොමාද ගා නොපීරීම නිසා අවුල් වුණු කෙස් වැටියෙහි වඩාත් වකුටු කෙස් රොද බහුල ය. ඔහු රෙදි කඩකින් යටි කය පමණක් වසාගෙන වනයෙහි සිටින්නේ නම් කවුරුනුත් ඔහු තවුසකු ලෙස හඳුන්වනු ඇතැයි නාලිකා සිතුවා ය. ඔහු නිසා ඈ තුළ උපන්නේ මහත් වූ දයාවකි. මෙතෙක් කල් ගතානුගතික ජීවිතය නිසා යට වී තුබුණු මාතෘ ස්නේහය කවුව පුපුරවාගෙන මතුවන කුකුළු පැටවකු මෙන් නැංගේ ය.

නඟින්ට වූ ශෝකය හා පසුතැවිල්ල මදක් මැඩුණේ ඔහු මන්ත්‍රී-යකු වශයෙන් ලත් ජය ඈ සිහි කළ බැවිනි. පෙර ඈ හැම විට මාලින් ගැන සිතුවේ තරහයෙනි. ඔහු නූගත් අසික්කිත මිනිසුන්

අතරට යන්නේ උතුම් පරමාර්ථයක් ඇතිව යැයි ඈ මීට පෙර නොසිතුවා ය. තමාගේ පන්තියේ අනික් එකියන් ජීවත් වන ලෙස ජීවත් වීමත් දරුවන් තමා හා පියා අනුකරණය කරනු දකින ආසාවත් හැර අනික් පරමාර්ථයක් ඇට වී නම් එය ආගම ඇදහීම පමණකි. නාලිකා තම පුතාගේ සිත සනසන්ට වැයම් කළා ය.

''මාලින්ට සල්ලි එවන්ට බැරි උණාට කණගාටුයි.''

''අරවින්ද මට රුපියල් දෙදහක් එවුවා.''

ශෝකයෙන් පීඩිත නාලිකාගේ මුහුණ ලජ්ජාවෙන් හැකිළිණ. මාලින් ජයගත්තේ අරවින්දගෙන් උදවු ලැබීමෙනි. ඈ අරවින්ද හෙළාදක, අනෝමාවෙහි නැවතී පියා සමඟ සමාදනයෙන් වාසය කළ යුතුයයි තම පුතාට යෝජනා කළා ය. නූගත් මිනිසුන් අතර දූන් ජීවත්වන්නේ කුමට ද?

මාලින් සමාජයටත් ධනවතුන්ටත් බැණ 'සමාජය සුන්බුන් කරන්නෙමි'යි තර්ජන කෙළේ ය.

''අපි නුඹට කළ වරද කුමක් ද?'' යි ඇසූ නාලිකාගේ දෙනෙතට කඳුළු නැංගේ ය.

මාලින්ගේ කෝපය මඳක් තුනී වී ය.

''අම්මා මට කළ වරදක් නැහැ. මම තරහෙන් කතා කෙළේ අම්මා එක්ක තරහ නිසා නෙවි.''

''ඉතින් කවුරු එක්ක ද තරහ. තාත්තා එක්ක ද?.........''

''නැහැ'' යි කී මාලින්ගේ කෝපය යළිත් නැංගේ ය. ''අම්මාලා ප්‍රිය කරන ජීවිතය මට ප්‍රිය නැහැ. ඒ ජීවිතයෙන් සන්තෝෂ වීමට වඩා බෙල්ලේ වැළ ලාගෙන මැරෙන.........''

නාලිකා කබලාන ඇඳෙන් නැංගේ කෝපයෙන් නොව හද දවන ශෝකයෙනි. මාලින්ගේත් තාත්තාගේත් භේදය වඩාත් දැඩි වෙයි. ඔවුන් සමඟි කළ නොහැකි ය. ඔවුන් වෙන් කෙරෙන විවරය මකරකටක් තරම් විශාල වනු නාලිකා මනැසින් දුටුවා ය. පුත්‍රයා තමාගෙන් වෙන් වී ය. දුව ද තමාගෙන් වෙන්වනු වැළැක්විය නොහැකි ය.........

ගෙදරට ළඟා වූ නාලිකා වටනා කත කර බරණ ගළවා ඉවත් කළා ය. කැටපතෙහි පෙනුණු තම මුහුණ දුටු ඇගේ ශෝකය පමණක් නොව බිය ද වැඩි වී ය. කොපුල් තල දෙක ඔස්සේ ගලන කඳුළු බිඳු ඈ තම ලේන්සුවෙන් පිසදැමුවා ය.

ඈ මාලින්ගේ නිවෙසින් පිට වී එද්දී මාලින් කී මේ කියුම සිහි කළා ය.

''මම නීලා කසාද බඳිනවා.''

Scanned by CamScanner

ඇ සිහිනෙන් ඇවිදින්නියක මෙන් ඊට පිළිතුරු දුන්නේ මෙලෙසිනි.

"නීලා උඹත් එක්ක මේ මුඩුක්කුවල ඉන්න කැමති වෙන්නේ නැහැ."

"නීලා කැමතියි" යනු විසින් මාලින් දුන් පිළිතුර ඇට යන්තම් ඇසුණේ ය; දැන් ඒ පිළිතුර හොඳින් සිහි කළ හැකි ය. 'ඈ ඔහු හා කැමැත්තෙන් විවාහ උණත් හත් අට මසකින් කලහ කොට ගෙදර එති'යි නාලිකා සිතුවා ය. එසේ සිතුවේ තම සිත සනසාගනු පිණිස මිස නීලා එසේ කරතියි විශ්වාස කළ නිසා නොවේ.

අරවින්ද අජන්තා නිශාන්තයෙහි ඉතාම නොඉවසිල්ලෙන් ඉන්නේ චමරී හමුවනු පිණිස ය. නොඉවසිල්ලෙන් ඉන්නා ඔහුගේ මුහුණ සන්තෝෂයෙන් එළිය වී ආශාවෙන් පිම්බුණකි.

"මම ප්‍රමාද උණේ අම්මා සමඟ සංඩු උණ නිසා!"යි චමරී කීවා ය. "අම්මා දූනුත් විරුද්ධයි; තාත්තාත් විරුද්ධයි."

"මාලින් කියනවා කාගේවත් කැමැත්ත ගන්න ඕනෑ නැතෙයි කියා. මාලිනුත් නීලාත්, නීලාගේ අම්මාත්, තාත්තාත්, තිස්සත් අප බඳින දවසෙහි ඒවි."

"අරවින්දගේ අම්මාත් තාත්තාත්?"

"අම්මාත් තාත්තාත් කැමැතියි. අම්මා නම් හොඳටම කැමැ-තියි; චමරීට හොඳටම ආදරෙයි."

"ඒ මම අඳුනන්නේ නැතිව."

"නැහැ හොඳටම අඳුනන නිසා. හොඳ ගැනුත් නරක ගැනුත් අඳුනන්ට පුළුවන් උගත් ගැනුන්ට විතරක් ද?"

"ගෑනුන් අඳුනාගන්ට කාටවත් බැහැ."

"අප දෙදෙනා කසාද බඳින දවසේ පිට පළාතකට නොගොහින් ගෙදරම නවතිනවාට අම්මා කැමැතියි—මම කැමැති නැහැ......"

"මම කැමැතියි" චමරී සිනාසෙමින් කීවා ය. උපන්දා සිට පැරණි සිරිත්වලට වහල්ව පිටිසර වීසූ මවගේ යටි අදහස චමරී වහා දුටුවා ය.

"නෑ; මම කැමැති නැහැ. මම කැමැතියි ඉන්දියාවට යන්න."

"මම යන්නේ නෑ!"යි චමරී කීවා ය.

---

**හුදී ජන ප්‍රසාදය උදෙසා කොග්ගල-මලලගම මාර්ටින් වික්‍රමසිංහ විසින් වර්තමාන සිංහල ජන වංශයෙන් බින්දු මාත්‍රයක් කියනු පිණිස ලියන ලද 'යුගාන්තය' මෙයින් නිම වී ය**

Scanned by CamScanner